325 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 325 - இல. 07
Volume 325 - No. 07

2026 පෙබරවාරි 20වන සිකුරාදා
2026 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை
Friday, 20th February, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 1207]

පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 1207]

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1208]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1208]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1210-1238]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිසංස්කරණයන්හි වත්මන් තත්ත්වය [තීරුව 1239]

**2023-2025 දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ප්‍රසාරණය:**

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1242]

**අපරාධ මැඩලීම සඳහා රාජ්‍ය ආරක්ෂක යන්ත්‍රණය ශක්තිමත් කිරීම:**

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1248]

**කල්තැබීමේ යෝජනාව:**

විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ගැටලු [තීරු 1269-1396]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 1207]

மாகாண சபைத் தேர்தல்கள் எந்தத் தேர்தல் முறைமையின்கீழ் நடத்தப்பட வேண்டும் என்பதை ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம் [ப: 1207]

**நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை** [ப: 1208]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1208]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1210-1238]

**தனி அறிவித்தல் மூல வினா:**

இலங்கை விமான சேவை நிறுவன மறுசீரமைப்பின் தற்போதைய நிலை [ப: 1239]

**உரிமம் பெற்ற வணிக வங்கிகள் மற்றும் வங்கி அல்லாத நிதி நிறுவனங்களால் 2023-2025 வரை கடன் வழங்கல் அதிகரிப்பு:**

நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1242]

**குற்றச் செயல்களை ஒடுக்குவதற்கு அரச பாதுகாப்புப் பொறிமுறையை வலுப்படுத்தல்:**

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1248]

**ஒத்திவைப்புப் பிரேரணை:**

மின்சாரத்துறை தொடர்பான பிரச்சினைகள் [ப: 1269-1396]


---

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Speaker's Certificate [Col. 1207]

Select Committee of Parliament to Look into and Report to Parliament on the Matter of Selecting the Electoral System under which the Provincial Council Elections should be held and submit its Proposals and Recommendations in that Regard: Nomination of Members [Col. 1207]

REPORT OF THE COMMITTEE ON STANDING ORDERS [Col. 1208]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col.1208]

ORAL ANSWERS TO QUESTIONS [Cols.1210-1238]

QUESTION BY PRIVATE NOTICE:

Current Status of Restructure of SriLankan Airlines [Col. 1239]

EXPANSION OF CREDIT ISSUED BY LICENSED COMMERCIAL BANKS AND NON-BANKING FINANCIAL INSTITUTIONS FROM 2023-2025:

Statement by Deputy Minister of Finance and Planning [Col. 1242]

STRENGTHENING STATE SECURITY MECHANISM TO SUPPRESS CRIMES:

Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1248]

ADJOURNMENT MOTION:

Issues Relating to Power Sector [Col. 1269-1396]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 පෙබරවාරි 20වන සිකුරාදා***
*2026 பெப்ருவரி 20, வெள்ளிக்கிழமை*
*Friday, 20th February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 පෙබරවාරි 19 දින "ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
### மாகாண சபைத் தேர்தல்கள் எந்தத் தேர்தல் முறைமையின்கீழ் நடத்தப்பட வேண்டும் என்பதை ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு: உறுப்பினர்கள் நியமனம்
### SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE MATTER OF SELECTING THE ELECTORAL SYSTEM UNDER WHICH THE PROVINCIAL COUNCIL ELECTIONS SHOULD BE HELD AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය පිණිස ගරු විජිත හේරත් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මතු සඳහන් මන්ත්‍රීවරයන් මවිසින් පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි.

ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
ගරු චන්දන සූරියආරච්චි මහතා
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON STANDING ORDERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 119 සහ 120 සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව, එම කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන්, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

[ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා]

(i) 2024 වර්ෂය සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා තාක්ෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2023 සහ 2024 වර්ෂ සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන්, එම කාරක සභාව වෙත යොමු කරන ලද ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, හල්මිල්ලවැව, කෙවිටිය යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. රජිකා ජීවනී හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, හොරණ, මීවනපලාන, පුහුවල හන්දිය, 'සෙව්වන්දි' යන ලිපිනයෙහි පදිංචි යූ. සරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පානදුර, අළුබෝමුල්ල, පමුණුගම, ජයන්ති මාවත, අංක 120/ඒ/56 යන ලිපිනයෙහි පදිංචි අයි. දයාවංශ ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)

ගරු කථානායකතුමනි, ගලේවෙල, බඹරගස්වැව, මොරගොල්ල, 7 කණුව යන ලිපිනයෙහි පදිංචි ටී.ඩබ්ලිව් අජන්තා නිල්මිණී කුමාරි දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -206/2024- (2), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොළඹ, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය: විස්තර
## ஊழல் ஒழிப்புக்கான மூவரடங்கிய நிரந்தர நீதாய மேல் நீதிமன்றம், கொழும்பு: விபரம்
## THREE-JUDGE ANTI-CORRUPTION PERMANENT HIGH COURT, COLOMBO: DETAILS

228/2024

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) කොළඹ, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන ලද නීතිය කවරේද;

(ii) එම අධිකරණයේ කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම අධිකරණයේ මේ වන විට විභාග කරනු ලබන නඩු සංඛ්‍යාව සහ එම අධිකරණය මඟින් විභාග කර අවසන් කරන ලද නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම අකර්මන්‍ය වී ඇති බව පිළිගන්නේද;

(ii) අල්ලස්, මූල්‍ය අපරාධ සහ මූල්‍ය දූෂණ සම්බන්ධයෙන්වූ නඩු කඩිනමින් විභාග කර අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழல் ஒழிப்புத் தொடர்பாக கொழும்பில் இயங்கும் வகையில் தாபிக்கப்பட்டுள்ள மூவரடங்கிய நிரந்தர நீதாய மேல் நீதிமன்றம் தாபிக்கப்பட்ட சட்டம் யாது என்பதையும்;

(ii) மேற்படி நீதிமன்றத்தின் பணிகள் ஆரம்பிக்கப் பட்ட திகதி யாது என்பதையும்;

(iii) மேற்படி நீதிமன்றத்தில் தற்போது விசாரணை செய்யும் வழக்குகளின் எண்ணிக்கை மற்றும் மேற்படி நீதிமன்றத்தில் விசாரணை செய்து நிறைவு செய்துள்ள வழக்குகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) ஆரம்பிக்கப்பட்ட திகதி முதல் இதுவரையில் மேற்படி நீதிமன்றத்தில் தாக்கல் செய்யப் பட்டுள்ள வழக்குகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஊழல் ஒழிப்பு மூவரடங்கிய நிரந்தர நீதாய மேல் நீதிமன்ற வழக்கு நடவடிக்கைகளை ஆரம்பித்தல் மற்றும் நடாத்திச்செல்லுதல் செயலிழந்துள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இலஞ்சம், நிதிக் குற்றங்கள் மற்றும் நிதி மோசடி வழக்குகளைத் துரிதமாக விசாரணை செய்து நிறைவு செய்வதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) law under which the three-Judge Anti-Corruption Permanent High Court in Colombo was established;

(ii) date on which that Court commenced its activities;

(iii) number of cases pending before that court and the number concluded by that, separately; and

(iv) number of cases presented before the court since its inception in respect of each year, separately?

(b) Will he also inform this House -

(i) whether he admits that the commencement and the continuation of cases in the three-Judge Anti-Corruption Permanent High Court have become defunct; and

(ii) the steps that have been taken to expedite the hearing and conclusion of cases related to bribery, financial crimes, and financial corruption?

(c) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන පනතේ 12A (1) (a) වගන්තිය.

(ii) 2018 ජූලි මස 04 වන දින.

(iii) • ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය - අංක 01

පවතින නඩු සංඛ්‍යාව - 02

අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 04

• ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය - අංක 02

පවතින නඩු සංඛ්‍යාව - 02
(මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඇප මත මුදා හැරීමේ නඩු අංක 01)

අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 01

(iv)

| වර්ෂය | ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය - 01 | ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය - 02 |
|---|---|---|
| 2018 | 3 | - |
| 2019 | 2 | 2 |
| 2020 | - | - |
| 2021 | - | - |
| 2022 | - | - |
| 2023 | - | - |
| 2024 | 1 | - |
| 2025 | - | 1 |

(ආ) (i) නැත.

ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ අංක 1 මඟින් 2026.02.10 දිනැතිව මෙම අමාත්‍යාංශයට යොමු කරන ලද ලිපියට අනුව දැනට සක්‍රියව පවතින නඩු ප්‍රමාණය පහත පරිදි වේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නඩු කීයක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
නඩු තුනක් තිබෙනවා.

| | නඩු අංකය | ඉදිරි දිනය |
|---|---|---|
| 1. | HC/PTB/01/05/2019 | 2026.03.26 |
| 2. | HC/PTB/02/01/2025 | 2026.02.11 |
| 3. | HC/PTB/02/01/2019 | 2026.05.11 |

(ii) ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය නැවත පිහිටුවීමට සහ දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නඩු විශාල ප්‍රමාණයක් ගොනු කරනු ඇති බව මෙම රජයේ අපේක්ෂාව වේ.

2025.09.29 දිනැතිව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙතින් යොමු කරන ලද ලිපියට අනුකූලව දැනට එක් අධිකරණයක් ආරම්භ කරන ලද අතර, තවත් එක් අධිකරණයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත.

ඇත්තෙන්ම මා ඊයේ මේ ගැන වඩාත් හොඳින් පැහැදිලි කළා. අපි අලුතෙන් මහාධිකරණ 5ක් පිහිටුවනවා, අලුත්කඩේ අධිකරණ පරිශ්‍රය තුළ. ඒ වාගේම තව මහාධිකරණ 2ක් පිහිටුවනවා, අලුත්කඩේ අධිකරණ පරිශ්‍රයෙන් පිටත. ඒ අනුව තව මහාධිකරණ 7ක් පිහිටුවනවා. ඒ පිහිටුවන මහාධිකරණ 5හි තිබෙන වඩාත් වැදගත් දේ තමයි,

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා ]

ඒවා ඇතුළේ benches ඇතුළු අවශ්‍ය සියලු දේවල් හදලා තිබෙන්නේ අවශ්‍ය වෙලාවට ත්‍රිපුද්ගල මහාධිකරණ වශයෙන් කටයුතු කරන්නත්, නැත්නම් තනි පුද්ගල මහාධිකරණයක් වශයෙන් කටයුතු කරන්නත් පුළුවන් විධියටයි කියන එක. ඒ අනුව අපි බලාපොරොත්තු වනවා, මේ කටයුතු වේගවත් කරන්න. එය මේ වසර මැද වනකොට සිදු කරන්න තමයි අපි අපේක්ෂා කරන්නේ.

(ඇ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, අධිකරණ සංවිධාන පනතට 2018දී කරපු සංශෝධනය අනුව විශේෂ ප්‍රතිපාදන සලසා තිබෙනවා, දිනපතා නඩු විභාග කරන්න, day-to-day trials කරන්න. මෙවැනි නඩුවල චූදිතයින් තමන්ගේ නඩු කල් දමාගන්න විශේෂ උත්සාහයක් ගන්නවා. ඒ උත්සාහයන් වළක්වා ගන්න තිබෙන ක්‍රමය තමයි, දිනපතා නඩු ඇසීමට බල කරන ප්‍රතිපාදන ඇතුළත් කිරීම. ඒ වාගේම දිනපතා නඩු ඇසීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම. ඒ සඳහා නීතිඥවරුන්ට පහසුකම් දෙන්න ඕනෑ, විනිශ්චයකාරවරුන්ට පහසුකම් දෙන්න ඕනෑ, ඒ වාගේම සාක්ෂිකරුවන්ට පහසුකම් දෙන්න ඕනෑ. මේ සඳහා තමයි ත්‍රිපුද්ගල ස්ථිර මහාධිකරණ පිහිටෙව්වේ. ඔබතුමාටත් ඒක දකින්න පුළුවන්, ශ්‍රී ලංකා නීති විද්‍යාලය ඉස්සරහ ස්ථිරවම හදලා තිබෙන ගොඩනැඟිල්ල වෙනම හැදුවේම ඒකට. ඒ වාගේම තමයි, කලින් තිබුණු අධිකරණ පරිශ්‍රවලත් මේ කටයුතු පටන් ගත්තා. ඒ නිසා 2018දී පැවති නීතිය අනුව, ඒ වාගේම අග්‍ර විනිශ්චයකාරතුමාගේ අනුමැතිය ඇතිව තමයි මේ trial-at-bar සඳහා යොමු කරන්නේ. ඒක දේශපාලන පළි ගැනීමක් නොවෙයි. එහෙම කරන්නේ නඩුවේ තිබෙන වටිනාකම අනුව, නඩුවේ තිබෙන බරපතළකම අනුව. දැන් මේ ක්‍රියාදාමයෙන් පිට ගිහිල්ලා වෙනත් ක්‍රමයක් හදන්නයි පටන් ගන්නේ. ඒ ගැන රජයට අයිතියක් තිබෙනවා, මොන පාරේද යන්නේ කියලා තෝරා ගන්න. ඒ කියන්නේ, 2018දී ගෙනා පනත යටතේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ ක්‍රමවේදයට යනවාද, නැත්නම් සාමාන්‍ය ක්‍රමවේදයට trial-at-bar යනවාද කියන එක රජයේ තෝරා ගැනීමක්. මම ඒ ගැන යමක් කියන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, මේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ පිහිටුවීමෙන් පසුව, රජයේ මුදල්වලින් තමන්ගේ දෙමව්පියන්ගේ සොහොන ඉදිකිරීම ගැන හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට විරුද්ධව නඩුවක් පවරා තිබුණා. ඒ නඩුව අඛණ්ඩ විභාග වනකොට විත්තිකාරයා රෝගී බව කියලා විදේශගත වුණා. කාලයක් ඉඳලා ඔහු ලංකාවට ආවා. ඉන් පසුව ඔහු ජනාධිපති වුණා. ජනාධිපති වෙලා පහුවෙනි දවසේ ජනාධිපතිවරයාට තිබෙන මුක්තිය අනුව එම නඩුව අස් කර ගත්තා. දැන් ඔහුට මුක්තියක් නැහැ. ඔබතුමා ඒක දන්නවා. එතකොට ඒ අඛණ්ඩ විභාග කරපු නඩුව, මුක්තිය නිසා නතර කරපු නඩුව, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට විරුද්ධව මේ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ පවරපු නඩුව ඇයි නැවත ආරම්භ නොකරන්නේ, වසරක් ගත වෙලාත්? මේක බරපතළ නඩුවක්. මේ රටේ ආර්ථිකය විනාශ කරපු, රට අාපස්සට ඇදලා දාපු, ඒ වාගේම තමන් ජනාධිපති වෙන්න කලින්ම ලේකම් ධුරයේ ඉඳලා මේ බරපතළ දූෂණය කරපු ඒ තැනැත්තාට විරුද්ධව අඛණ්ඩ විභාග කරපු, මුක්තිය නිසා අඩාළ කරපු නඩුව නැවත පවරන්න මේ රජය කටයුතු කරනවාද, නීතිපතිවරයා එක්ක ඔබතුමා මේ සම්බන්ධව සාකච්ඡා කරනවාද? ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණවල වැඩ කෙරෙනවා. ඊට අමතරව මොන උසාවියේ, මොන නඩුද අහන්නේ කියන එක අධිකරණ සේවා කොමිෂන් සභාව සහ අග්‍ර විනිශ්චයකාරතුමා විසින් තීරණය කරනු ලබනවා. ජනතා මතය අනුව අධිකරණයේ නඩු අහන්නේ නැති වුණාට, ජනතා අභිලාෂය තේරුම් ගැනීම නිසා සමහර විට මේවායේ අල්ලස් සම්බන්ධයෙන් නඩු අහන එක වැඩි වෙන්න පුළුවන්. මම ඒක දන්නේ නැහැ. අධිකරණ අමාත්‍යාංශය භාර ඇමතිවරයා විධියට මට පුළුවන් වන්නේ අවශ්‍ය යටිතල පහසුකම් ටික ලබා දෙන්නයි. උසාවි හතක් දෙනවා. මොකක්ද trial-at-bar කරන්න ඕනෑ, මොකක්ද නැත්තේ කියන එක සම්බන්ධයෙන් නීතිපතිතුමාත්, අග්‍ර විනිශ්චයකාරතුමාත් මැදිහත් වෙලා තීන්දු තීරණ ගන්නවා. හැබැයි, මට එක දෙයක් සහතික කරලා කියන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි මට මතකයි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් -ඔබතුමා ළඟ වාඩි වෙලා ඉන්න අයත්- දිනපතා නඩු අහනකොට ඒ තුළින් අසාධාරණයක් වෙනවා කියලා කියපු බව. දැන් ඔබතුමා කියනවා, දිනපතා නඩු අහන්න කියලා. මම ඔබතුමාත් එක්ක එකඟයි. දිනපතා නඩු අහන්න ඕනෑ. ඒවා කෙරෙනවා. එකම දේ තමයි, අපි බලයට එනකොට අධිකරණවල තිබුණු පුරප්පාඩු සංඛ්‍යාවත් එක්ක බලනකොට ඒක කරන්න බැරි බව. ඔබතුමාත් දන්නවා, නඩුකාරතුමෙක් විතරක් හිටියා කියලා නඩු අහන්න බැහැ කියලා. ඒවාට stenographersලා ඇතුළු staff අවශ්‍ය වනවා. ඒ සඳහා බඳවා ගැනීම් දැන් කෙරෙනවා. මට සහතික කරලා කියන්න පුළුවන්, මේ වසර මැද වෙනකොට ඔබතුමාට අවශ්‍ය වේගයෙන්ම නඩු ටික ඇහෙනවා කියන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්නම්. නමුත්, එතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ නේ, ගරු කථානායකතුමනි. මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඇහුවේ, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ නඩුව ඉල්ලා අස් කර ගත්තා, දැන් ඒ නඩුව නැවත පවරනවාද, නැද්ද කියලායි. ඒකට උත්තරයක් දෙන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ප්‍රධාන ප්‍රශ්නයට අදාළව පැන නඟින්නේ නැති නිසා මම ඒ අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය පැන නඟින්න ඕනෑ. මෙතැනදී එහෙම එකක් වෙන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි නඩු තෝරන එක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ කාරණය විවාදයකට ගෙන යන්න බැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ කියන්නේ, නඩු පවරන්නේ කාටද, නැවත නඩු නොපවරන්නේ කාටද කියලා තෝරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න. නැත්නම් මම ඊළඟ කටයුතුවලට යනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. ඔබතුමා කලබල වෙන්න එපා.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. කවුරුත් දන්නවා, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඇතුළු තවත් බලගතු, ධනවත්, ශක්තිමත්, දූෂිතයන් විශාල පිරිසකට විරුද්ධව පවරා ඉල්ලා අස් කර ගත්ත නඩු නැවත පවරනවා කියලා පසුගිය ජනාධිපතිවරණයේ දී පොරොන්දු වුණු බව. ඔබතුමාත් ඒ ගැන දන්නවා. එවැනි නඩු 42ක් තිබෙනවා. ඒ නඩු නැවත පවරන්නේ නැත්තේ ඇයි? හයද? නැත්නම් වෙන ඩීල් එකක් තිබෙනවාද? මොකක් හරි ගැටලුවක් තිබෙනවාද? මොකක්ද තිබෙන ප්‍රශ්නය? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, එය දෙවැනි අතුරු ප්‍රශ්නය ලෙස අරගෙන අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ සභාවේ රීතිය අනුව මූලික ප්‍රශ්නයෙන් පැන නඟින විෂයයට අදාළව අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න මම බැඳිලා ඉන්නවා. ඒ පිළිබඳ ගැටලුවක් නැහැ. *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නඩු ගැන නේ ඇහුවේ?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
නැහැ. ඔබතුමා ඇහුවේ සංඛ්‍යා දත්ත ගැන මිසක් පුද්ගලයන්ගේ නඩු ගැන නොවෙයි. ඒ නිසා මම ඒකට පිළිතුරු දෙන්නේ නැහැ. හැබැයි, මම එක දෙයක් කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* ගෝඨාභය රාජපක්ෂ බලයේ ඉන්නකොට ඒ නමවත් කියන්න හයේ ඇඳන් යට හිටපු කට්ටිය දැන් වීරයෝ වෙන එක තමයි ප්‍රශ්නය. *[බාධා කිරීම්]* එපමණයි. *[බාධා කිරීම්]*

## මහපොළ භාරකාර අරමුදල: විස්තර
## மஹபொல நம்பிக்கை நிதியம்: விபரம்
## MAHAPOLA TRUST FUND: DETAILS

472/2025

3. **ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) මේ වනවිට එම අරමුදලේ මුළු වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) මහපොළ භාරකාර අරමුදල ආරම්භයේ සිට මේ දක්වා -

(i) එම අරමුදලට වාර්ෂිකව ලැබුණු අරමුදල් ප්‍රමාණය සහ එම අරමුදල්වල මූලාශ්‍ර කවරේද;

(ii) එම අරමුදලේ වාර්ෂික පුනරාවර්තන වියදම කොපමණද;

(iii) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා සහ පුනරාවර්තන නොවන වියදම් සඳහා එම කාර්යය ඉටු කිරීම වෙනුවෙන් අරමුදල විසින් වාර්ෂිකව සිදු කරන ලද ගෙවීම් ප්‍රමාණය කොපමණද;

(iv) උපාධි අපේක්ෂකයින්ට වාර්ෂිකව ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

(v) ශිෂ්‍යත්ව ලබා ඇති මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹபொல நம்பிக்கை நிதியத்தின் பணிப்பாளர்கள் சபையின் உறுப்பினர்களின் பெயர்களையும்;

(ii) அப்பணிப்பாளர்கள் சபையை நியமிக்கும் அதிகாரம் யாருக்கு உள்ளது என்பதையும்;

(iii) இன்றுள்ளவாறாக, நிதிகளின் மொத்தப் பெறுமதியையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) அந்நிதியம் தொடங்கப்பட்டது முதல் இற்றைவரை -

(i) வருடாந்தம் அந்நிதியத்துக்குக் கிடைத்த நிதியையும் அதன் நிதியிடல் மூலங்களையும்;

(ii) அந்நிதியத்தின் வருடாந்த மீண்டெழும் செலவையும்;

(iii) புலமைப்பரிசில்களுக்காகவும் மீண்டெழாத செலவுக்காகவும் அவற்றை நிறைவேற்றுவதற் காகவும் நிதியத்தால் வருடாந்தம் செய்யப்பட்ட கொடுப்பனவுகளையும்;

[ගරු රවී කරුණානායක මහතා]

(iv) பட்டப்படிப்பு மாணவர்களுக்கு வருடாந்தம் வழங்கப்பட்ட புலமைப் பரிசில்களின் எண்ணிக்கையையும்;

(v) புலமைப்பரிசில்களைப் பெற்றுக் கொண்ட மாணவர்களின் மொத்த எண்ணிக்கையையும்;

வெவ்வேறாக அவர் இச்பைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the names of the members of the Board of Directors of the Mahapola Trust Fund;

(ii) the appointing authority of the Board of Directors; and

(iii) the total value of the Fund as of now?

(b) Will he also inform this House, from its inception to date, separately, the -

(i) funds received annually by the Fund and its sources of funding;

(ii) annual recurrent expenditure of the Fund;

(iii) payments made by the Fund annually for the purpose of granting scholarships and non-recurrent purposes, in respect of such purposes;

(iv) number of scholarships awarded to undergraduates annually; and

(v) total number of students who have received scholarships?

(c) If not, why?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද කියලා කියන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මේ කටයුතු බැහැර වෙලා තිබෙනවා. අධිකරණ ඇමතිවරයාගෙන් අහලා තිබෙන්නේ නඩු ගැන. ඒ නඩු විස්තර අහන එක විෂය කටයුත්තක් නොවෙයි, එම ප්‍රශ්නයට අදාළ නැහැ කියන කාරණය කියමින් ඔබතුමාව නොමග යවනවා මේ අධිකරණ ඇමති. නඩු ගැනයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ. මොකක්ද, මේ බොරු කරන්නේ?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු කථානායකතුමනි, එතුමා ස්ථාවර නියෝග 92 (2)(ආ) යටතේ point of Order එකක් ඉදිරිපත් කළා. මෙතැන යම්කිසි ගැටලුවක් පැන නැඟුණාට පසුව ඇමතිතුමා උත්තර දීපු විධිය ගැන නේ මෙතුමා ප්‍රශ්න කරන්නේ. ඒක ඇමතිතුමා සහ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා බලා ගන්න ඕනෑ එක වෙනම දෙයක්. දැන් මේ ප්‍රශ්න වාරය බොහොම පැහැදිලියි. මට තිබෙන ප්‍රශ්නය, එතුමාට දෙන්න point of Order එකක් නැහැ කියන එකයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඇයි නැත්තේ?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
එතුමා හැම එකකටම "point of Order" කියලා ගන්න එකේ අදාළත්වය මොකක්ද? එහෙම බැලුවොත්, අපිත් ඒ වෙලාව ගන්නම්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා, ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-*[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
දාන්න නඩුවක්, පුළුවන් නම් හිරේ යවන්න. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සභාව නිශ්ශබ්ද කර දෙනවා නම් මට මේ උත්තර ටික කියවන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

2015 - 2020 නඩු ටික හරියට ඇහුවා නම් මෙච්චර කෑ ගහන්න වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නිශ්ශබ්ද වෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

2015 - 2020 හරියට නඩු ටික ඇහුවා නම් එහෙම සාක්ෂි අලුත්ව තියාගෙන වැඩේ කරන්න තිබුණා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ලලිත් ඇතුලත්මුදලි මහපොළ භාරකාර අරමුදලේ භාරකාර මණ්ඩල සාමාජිකයින්ගේ නම්,

- සභාපති - විජිත් කේ. මලල්ගොඩ මහතා, විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
- ප්‍රාරම්භක - ගරු වසන්ත සමරසිංහ මහතා, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය
- උසස් අධ්‍යාපනය සහ අධ්‍යාපනය යන විෂයයන් පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා - නාලක කළුවැව මහතා
- වෙළඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා - කේ.ඒ. විමලේන්තිරරාජා මහතා
- පත්කළ සාමාජික - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කපිල සෙනෙවිරත්න මහතා, සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
- පත්කළ සාමාජික - චන්දන කුමුදු කුමාර මහතා

(ii) ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකාර මණ්ඩල සාමාජිකයින් පත් කෙරෙනුයේ 2022 අංක 1 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනතේ 4වන වගන්තිය මඟින් සංශෝධිත, 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ 3 (2)වන උපවගන්තිය අනුවය.

ඒ අනුව, භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීමේ බලධාරීන් මෙසේයි. ප්‍රාරම්භක හෝ ඔහුගේ නාමිකයෙකු පත් වන්නේ නිල බලයෙන්. සභාපති පත් කරන්නේ ජනාධිපතිවරයා. උසස් අධ්‍යාපනය සහ අධ්‍යාපනය යන විෂයයන් පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, වෙළඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාත් පත් වන්නේ නිල බලයෙන්. පත්කළ සාමාජික පත් කරන්නේ ප්‍රාරම්භක.

(iii) 2025.12.31 දිනට අරමුදලේ මුළු වටිනාකම රුපියල් මිලියන 21,600කි.

(ආ) (i) මහපොළ භාරකාර අරමුදලට වාර්ෂිව ලැබුණු අරමුදල් ප්‍රමාණය

| වර්ෂය | 2022 රුපියල් මිලියන | 2023 රුපියල් මිලියන | 2024 රුපියල් මිලියන | 2025 රුපියල් මිලියන (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු පොලිය | 272 | 258 | 156 | 169 |
| භාණ්ඩාගාර බැඳුම්කර පොලිය | 727 | 614 | 611 | 698 |
| භාණ්ඩාගාර බිල්පත් පොලිය | 629 | 1,514 | 942 | 762 |
| ණයකර පොලී (Debenture) | 111 | 10 | - | - |
| සංවර්ධන ලොතරැයි ලාභාංශ සියයට 50 කොටස | 1,382 | 1,519 | 1,418 | 3,062 |
| මාලබේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් ලැබෙන බදු කුලිය | 25 | 25 | 25 | 25 |
| කෙටි කාලීන (REPO) ආදායම් | 5 | 35 | 98 | 47 |
| වෙනත් ආදායම් | 28 | 30 | 8 | 5 |
| **එකතුව** | **3,179** | **4,005** | **3,258** | **4,768** |

අවසන් ගිණුම් දත්ත පරිගණකගත කර ඇති 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලැබී ඇති මුදල් පිළිබඳ විස්තර ඇමුණුම 1හි දැක්වේ. ඇමුණුම සභාගත කරමි.

මහපොළ ශිෂ්‍යත්ව ගෙවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව ලැබුණු අරමුදල් ප්‍රමාණය 2022 සිට පහත පරිදි වේ.

| | වර්ෂය | 2022 රු.මි. | 2023 රු.මි. | 2024 රු.මි. | 2025 රු.මි. (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|---|---|
| 1 | විශ්වවිද්‍යාල සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදෙන භාණ්ඩාගාර ආයක මුදල | 1,389 | 1,477 | 1,500 | 2,143 |
| 2 | උසස් තාක්ෂණ ආයතන සිසුන්ට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදෙන මුදල | - | - | - | 67.5 |
| | **එකතුව** | **1,389** | **1,477** | **1,500** | **2,210.5** |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) මහපොළ භාරකාර අරමුදලේ පුනරාවර්තන වියදම් (2022 සිට 2025 නොවැම්බර් මස දක්වා)

| වර්ෂය | 2022 රු.මි. | 2023 රු.මි. | 2024 රු.මි. | 2025 රු.මි. (ඇස්තමේන්තුගත) |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 66 | 58 | 57 | 51 |

(iii) මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදාන වියදම සහ පුනරාවර්තන නොවන වියදම (2022 සිට 2025)

| වර්ෂය | 2022 රු.මි. | 2023 රු.මි. | 2024 රු.මි. | 2025 නොවැ. දක්වා රු.මි. |
|---|---|---|---|---|
| ශිෂ්‍යත්ව සඳහා වියදම (මහපොළ අරමුදලේ දායකත්වය) | 1,288 | 1,540 | 1,564 | 2,215 |
| පුනරාවර්තන නොවන වියදම් (ප්‍රාග්ධන වියදම්) | නැත. | නැත. | නැත. | නැත. |
| **එකතුව** | **1,288** | **1,540** | **1,564** | **2,215** |

(iv) ප්‍රදානය කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව (ශිෂ්‍යත්වලාභී සිසුන් සංඛ්‍යාව)-(2021 සිට 2025)

| වර්ෂය | 2021 | 2022 | 2023-2024 | 2025 | 2025 |
|---|---|---|---|---|---|
| අධ්‍යයන වර්ෂය | 2019/20 | 2020/21 | 2021/22 | 2022/23 | 2023/24 |
| විශ්ව විද්‍යාල සිසුන් සංඛ්‍යාව | 16,000 | 16,000 | 16,000 | 17,000 | 17,000 |
| උසස් තාක්ෂණ ආයතන සිසුන් සංඛ්‍යාව | 1,500 | 1,500 | 1,500 | 1,500 | 1,500 |
| අනෙකුත් ආයතන සිසුන් සංඛ්‍යාව | 1,000 | 1,000 | 1,000 | 1,000 | 1,000 |
| එකතුව | **18,500** | **18,500** | **18,500** | **19,500** | **19,500** |

(v) මහපොළ අරමුදලේ ආරම්භයේ සිට මේ දක්වා (1981 සිට 2025 දක්වා) ලබා දී ඇති මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව (ශිෂ්‍යත්වලාභී සිසුන් සංඛ්‍යාව) 418,637කි. ඒ අනුව, 1981දී විශ්වවිද්‍යාල සිසුන් 422කට ලබා දුන් ප්‍රමාණය 2025 වන විට එක් අධ්‍යයන වර්ෂයක් සඳහා 17,000ක් හැටියට අධ්‍යයන වර්ෂ දෙකට, - 17,000 ගාණේ දෙකක් - 34,000කට ලබා දීලා තිබෙනවා.

1981 සිට 2025 දක්වා වාර්ෂිකව ලබා දී ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව ඇතුළත් ලේඛනය ඇමුණුම 2හි දැක්වේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ඇමුණුම් 1 සහ 2 ඇතුළුව සවිස්තරාත්මක පිළිතුර මා **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඉතාම විශිෂ්ට දේශපාලනඥයෙකු වශයෙන් ලලිත් ඇතුලත්මුදලි මහතාගේ මේ වැඩ පිළිවෙළ යටතේ මේ වන විට අපේ රටේ සහජ හැකියාව තිබෙන, ආර්ථික අපහසුතා තිබෙන ශිෂ්‍යයන් 418,637කට ආධාර ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මට මේ අවස්ථාවේදී ඔබතුමා හරහා වෙළෙඳ ඇමතිවරයාගෙන් අහන්න අවශ්‍ය වෙන්නේ මෙයයි. ලලිත් ඇතුලත්මුදලිට සිහිනයක් තිබුණා විශ්වවිද්‍යාලයක් ඇති කරන්න මේ තිබෙන හැකියාව තුළ. අගමැතිතුමියත් මේ වෙලාවේ ගරු සභාවේ සිටිනවා. ගරු කථානායකතුමනි, 177,000ක් උසස් පෙළ සමත් වුණාට 55,800ක් විතරයි University Grants Commission එක හරහා රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නේ. ඒ නිසා ලලිත් ඇතුලත්මුදලි මහතා වෙනුවෙන්, එවැනි අදහසක් ඉදිරිපත් කරලා තිබෙන දේශපාලනඥයෙකු වෙනුවෙන් අපට විශ්වවිද්‍යාලයක් ඇති කරන්න පුළුවන්ද කියන එක මා මේ අවස්ථාවේදී ඔබතුමා හරහා අගමැතිනියගෙන් හෝ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමතිවරයාගෙන් අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වන්නට පෙරාතුව වරාය විෂය භාර ඇමතිවරයා හැටියට ඉන්න කාලයේත්, ඊට පසුව අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාව සිටි කාලයේත් ආරම්භ කළ ඉතා විශිෂ්ට වැඩ පිළිවෙළක් තමයි මහපොළ ශිෂ්‍යත්ව අරමුදල. මම හිතන විධියට, මේ පාර්ලිමේන්තුවේ දැන් ඉන්න අයගෙනුත් යම් ප්‍රමාණයක් ඒ ශිෂ්‍යත්වයේ ප්‍රතිලාභ ලබා ගන්නට ඇති. ඒක අපේ දරුවන්ට වැදගත් සේවාවක් වුණා. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන ඇමතිවරයා මහපොළ භාරකාර අරමුදලේ සාමාජිකයෙක් හැටියට අනාගතයේදී ඒකට පිළිතුරක් ලබා දෙයි. මම ඔබතුමාගේ අදහස එතුමාට ඉදිරිපත් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙවැනි ආකාරයට ශිෂ්‍යයන් 418,000කට ශිෂ්‍යාධාර ලැබුණත්, අවුරුදු 4කට ඉස්සෙල්ලා පේරාදෙණියේදී ඉතාම ඛේදජනක තත්ත්වයක් ඇති වුණා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ statue එක කඩා බිඳ දමලා, මේ මහපොළ ශිෂ්‍යාධාර ක්‍රමය ඇති කළේ කවුද කියන ප්‍රශ්නය නඟලා පේරාදෙණියේ ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. මේ අවස්ථාවේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යවරිය වශයෙන් ගරු අගමැතිතුමියත් මේ ගරු සභාවේ සිටින නිසා, මම කාරුණිකව ප්‍රශ්නයක් අහනවා. ඒ අයට discipline එකක් ඇති කරන්න පුළුවන් විධියේ කටයුත්තක් ක්‍රියාත්මක කරන්නත්, එම සංකල්පය ආරම්භ කළේ කවුද කියන එක හඳුන්වා දෙන්නත් පුළුවන්ද කියන එක ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ ගෝලයෙකු වශයෙන් මම කාරුණිකව ඔබතුමාගෙන් අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ බහුතරයක් ජනතාව මේ ශිෂ්‍යත්ව අරමුදල පිළිබඳව සහ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා පිළිබඳව දන්නවා. ඒ නිසා එතුමාට එහි නිසි ගරුත්වය හිමි වෙනවා. අනාගතයේදීත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන ගරුත්වය එතුමාට ලැබේවි. මම හිතන්නේ නැහැ, කවුරුවත් ඒ සම්බන්ධයෙන්

කෙළෙහි ගුණ අමතක කරයි කියලා. ඉතිහාසයේ අමාත්‍ය ධුර දරපු අය, වගකීම් දරපු අය එකතු කරපු දේවල වටිනාකම් වර්තමානයට, අනාගතයට අරගෙන යනවා. මා හිතන විධියට, ඒ ගැන අපේ ගරුත්වය කවදත් හිමි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -883/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා තවත් එක දෙයක් කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙකම අහලා අවසන්.

ප්‍රශ්න අංක 5 -1124/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -1244/2025- (2), ගරු සුසන්ත කුමාර නවරත්න මහතා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2024 සැප්තැම්බර් 21 සිට සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම්: පවරා ගත් නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ වත්කම්

2024 செப்ரெம்பர் 21 முதல் மேற்கொள்ளப்பட்ட போதைப்பொருள் சுற்றிவளைப்புகள்: பறிமுதல் செய்யப்பட்ட சட்டவிரோத போதைப்பொருட்கள் மற்றும் ஆதனங்கள்
DRUG RAIDS CONDUCTED SINCE 21ST SEPTEMBER, 2024: ILLEGAL DRUGS AND ASSETS SEIZED

1649/2025

**7. ගරු රවින්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2024 සැප්තැම්බර් 21 දින සිට මේ දක්වා කරන ලද වැටලීම්වලදී අත්අඩංගුවට ගනු ලැබූ නීති විරෝධී මත් ද්‍රව්‍ය ප්‍රමාණය සහ සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ ක්‍රියා මඟින් උපයා ගන්නා ලදුව අත්පත් කරගන්නා ලද දේපළ හා වත්කම්වල ප්‍රමාණය සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම දේපළ හා වත්කම්වල අයිතිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024 செப்ரெம்பர் 21ஆம் திகதியிலிருந்து இற்றைவரை மேற்கொள்ளப்பட்ட சுற்றி வளைப்புகளில் கைப்பற்றப்பட்ட சட்டவிரோத போதைப்பொருட்களின் அளவு மற்றும் சந்தேக நபர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) இந்தக் காலப்பகுதியில் போதைப்பொருட்கள் மற்றும் ஒழுங்கமைக்கப்பட்ட குற்றச் செயல்களால் ஈட்டப்பட்டு, பறிமுதல் செய்யப்பட்ட சொத்துக்கள் மற்றும் ஆதனங்களின் அளவு மற்றும் பெறுமதி வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி சொத்துகள் மற்றும் ஆதனங்களின் உரிமையாளர்கள் யாவர் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) separately, the quantity of illegal drugs and the number of suspects who have been arrested in the raids conducted from 21st September, 2024 up to now;

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

(ii) separately, the quantity and value of the properties and assets that have been acquired through drug trafficking and organized crime and have been seized and suspended during the said period; and

(iii) the names of the owners of the said properties and assets?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| 2024.09.21 දින සිට 2026.01.26 දින දක්වා | | | | | |
|---|---|---|---|---|---|
| මත්ද්‍රව්‍ය වර්ගය | ප්‍රමාණය | | | | සැකකරුවන් ගණන |
| | කිලෝග්‍රෑම් | කරල් | පෙති | පැළ | |
| හෙරොයින් | 1,468.061 | - | - | - | 1,829 |
| ගංජා/කේරළ ගංජා | 5,344.954 | - | - | 9,486,100 | 829 |
| කොකේන් | 39.369 | - | - | - | 52 |
| හෂිස්/කුෂ් | 832.319 | - | - | - | 280 |
| අයිස් | 3,022.258 | - | - | - | 2,275 |
| මත්පෙති/කරල් | - | 663,033 | 287,140 | - | 237 |
| වෙනත් | 10,706.961 | - | - | - | 22 |

(ii) ඇමුණුමෙහි තීරු අංක 03 හා 02හි දක්වා තිබේ.

(iii) ඇමුණුමෙහි තීරු අංක 01හි දක්වා තිබේ.

ගරු කථානායකතුමනි, දීර්ඝ විස්තර සහිත ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඉතා වැදගත් එකක්. ඒ නිසා, ප්‍රශ්නයේ (අ) (ii) යටතේ අසා තිබෙන ආකාරයට එම වත්කම්වල මුළු වටිනාකම කොපමණද යන්නත්, (අ) (iii) යටතේ අසා තිබෙන එම දේපළ හා වත්කම්වල අයිතිකරුවන් කවුරුන්ද කියන එකත් මේ වෙලාවේ ප්‍රකාශ කරන්න පුළුවන් නම් එය ඉතා වැදගත් කියා මා හිතනවා.

---
*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මා ඒ විස්තර සඳහන් කරන්නම්.

01. හපුගොඩ ආරච්චි කම්කානම්ගේ දුමින්ද දිල්රුක්, අංක 42/ ඒ, කිරිමැටියාව, ඕවිලිකන්ද, මාතලේ. අක්‍රිය කළ දේපළ වටිනාකම මිලියන 23යි; දේපළ ප්‍රමාණය - වෑන් රථ 01යි, යතුරු පැදි 01යි, නිවස සහ රෝල ගේට්ටුව.

02. කන්දයියා කලාමෝගන්, අංක 25, සෙන් පැට්‍රික් පාර, ගුරුනගර්, යාපනය. දේපළ වටිනාකම තක්සේරු කර නොමැත; දේපළ ප්‍රමාණය - මෝටර් බෝට්ටු 02යි.

03. දිලුම් තාරක බාලසූරිය, අංක 71, මීරිගම. දේපළ වටිනාකම - මුහුණත වටිනාකම ලක්ෂ 8යි; දේපළ ප්‍රමාණය - පර්චස් 15ක ඉඩම සහිත දෙමහල් නිවස.

04. මොහොමඩ් හරීෂ් මොහොමඩ්, වල්පොලදෙණිය, මාවනැල්ල. දේපළ වටිනාකම - 2026.01.21 දින සිට ක්‍රියා විරහිත කර ඇති අතර, වටිනාකම තක්සේරු කර නොමැත; දේපළ ප්‍රමාණය - CBO-0510, ABY-1025, CAE-9444, CAA-5196 යන වාහන. දේපළ අක්‍රිය කර තිබෙනවා.

05. මොහොමඩ් ෂියාම්, A/187/B, වල්පොලදෙණිය, මාවනැල්ල. දේපළ වටිනාකම - 2026.01.21 දින සිට ක්‍රියා විරහිත කර ඇති අතර වටිනාකම තක්සේරු කර නොමැත; දේපළ ප්‍රමාණය - CBQ-6780 රථය.

06. විජේසූරිය මහදුරගේ උදිත ඉරෝෂන් විජේසිරි, නො.105, පස්වන පටුමග, වලස්ගල වත්ත, වලස්ගල. දේපළ වටිනාකම - රුපියල් මිලියන 5ක වත්කම්; දේපළ ප්‍රමාණය - ලොරි රථ 01යි.

07, 08. නාවුරුන්නන්ගේ ඉන්දික පත්මකුමාර, අංක 543, ධීවර ගම්මානය, පල්ලේරොට, මාමඩල. දේපළ වටිනාකම - රුපියල් මිලියන 2.5යි; දේපළ ප්‍රමාණය - බොලෙරෝ කැබ් රථ 01යි. ඊට අමතරව රුපියල් මිලියන 1ක් සහිත ගිණුමක් තිබෙනවා.

09. විරිත්තමුල්ල ගමගේ හාෂි ලහිරු සම්පත්, සුවඳආරච්චිගේ වත්ත, පොල්වත්ත, දෙනිපිටිය. දේපළ වටිනාකම - රුපියල් මිලියන 1.8යි; දේපළ ප්‍රමාණය - ත්‍රිරෝද රථ 01යි.

10. හෙට්ටිආරච්චිගේ දෝන ශ්‍රියානි චන්ද්‍රලතා, අංක 546, වීදිමාවත, කඳාන. දේපළ වටිනාකම - රුපියල් කෝටි 6යි; දේපළ ප්‍රමාණය - පර්චස් 14.75ක ඉඩම හා සිව්මහල් නිවස.

1 1,12.කෝරලගමගේ මන්දිනු පද්මසිරි නොහොත් කෙහෙල්බද්දර පද්මේ, අංක 08/04, ඉහළ කුඹුර, කෙහෙල් කුඹුර, උඩුගම්පොල. දේපළ වටිනාකම - රුපියල් මිලියන 30යි; දේපළ ප්‍රමාණය - අඩක් නිම කරන ලද ගොඩනැඟිල්ල සහිත පර්චස් 20ක ඉඩම. ඊට අමතරව රුපියල් මිලියන 20ක වටිනාකමක් සහිත අඩක් නිම කර ඇති කාමර 06ක් සහිත ගොඩනැඟිල්ල.

13,14. පටබැඳි මද්දුවාගේ ෂෙහාන් සත්තර නොහොත් දෙහිබාලා, ජොග්ගුආයාවත්ත, සිංහාසන පාර, මඩන්වැල්ල, දෙවිනුවර. දේපළ වටිනාකම - රුපියල් මිලියන 200යි; දේපළ ප්‍රමාණය - බහුදින යාත්‍රා 05යි; ඊට අමතරව රුපියල් මිලියන 5ක වටිනාකමක් සහිත පර්චස් 15.8ක ඉඩම හා දෙමහල් නිවස.

15. ජයසිංහගේ මධුරංග සම්පත්, අමාලි නිවස, හංගමුව, ඉබ්බාගමුව/ කයියාහේන, බතීගම, දික්වැල්ල. දේපළ වටිනාකම - රුපියල් මිලියන 5.4යි; දේපළ ප්‍රමාණය - කැබ් රථ 01යි. ඊට අමතරව රුපියල් මිලියන 14.5ක වටිනාකමක් සහිත වෑන් රථ 01ක් සහ රුපියල් මිලියන 73.03ක මුදල් ප්‍රමාණයක් ඇති ගිණුම් 05යි; තව රුපියල් 168,323.88ක මුදල් ප්‍රමාණයක් - විදේශ මුදල් US Dollars 544.66 ඇති - ගිණුම් 01යි. ඊට අමතරව රුපියල් මිලියන 283ක මුදල් අක්‍රිය කරලා තිබෙනවා.

රීළඟට ඉන්නවා, අධිකාරි සමන්ත පෙරේරා, අංක 55, දෙහිවල - රුපියල් මිලියන පහයි. පර්චස් 10.10ක ඉඩම සහ ඊට අමතරව රුපියල් මිලියන 13ක අක්කර එකයි, පර්චස් 1.5ක ඉඩම ක්‍රිය කරලා තිබෙනවා. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ සහ පාතාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මේ වනවිට ඒ අයගේ වත්කම් අක්‍රිය කරලා තිබෙනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ ජාවාරම්කාරයන් වාගේම මත්ද්‍රව්‍යත් අත්අඩංගුවට ගන්නවා අපි දැක්කා. මේ වන විට සැපයුම අඩාළ කරන්න පියවර අරගෙන තිබෙනවා. මත්ද්‍රව්‍යවල ඉල්ලුම අඩාළ කිරීමට ගෙන තිබෙන පියවර සහ එහි ප්‍රගතිය මොකක්ද කියලා ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව, පොලීසිය, STF එක යොදවා වැටලීම් සිදු කරනවා. මත්ද්‍රව්‍ය සඳහා රට අභ්‍යන්තරයේ ඉල්ලුමක් තිබෙනවා. එම ඉල්ලුම අවම කිරීමට සහ ඉල්ලුම නැති කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. මේ වනවිට සමස්ත සමාජයම ජාලගත කරලා සංවිධානය කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික සභාව පිහිටුවා තිබෙනවා. දෙවැනි තලය හැටියට අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පදනම් කරගෙන දිස්ත්‍රික් සභාව පිහිටුවා තිබෙනවා. තුන්වැනි layer එක හැටියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පදනම් කරගෙන ප්‍රාදේශීය කමිටුව නිර්මාණය කරමින් යනවා. පහළ තලයේ මහජන ආරක්ෂක කමිටු 14,000ක් ගම් මට්ටමින් හදලා මේ වැඩ පිළිවෙළට බද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය ඉල්ලුම අඩාළ කිරීම සඳහා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ බෙදා හරින්නන් අත්අඩංගුවට ගැනීම නිරන්තරයෙන් අඛණ්ඩව සිදු කරනවා. STF එක සහ පොලීසිය මේ සඳහා නිරන්තරයෙන් යොදවා තිබෙනවා. මේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සිරගත කිරීමේ අපේක්ෂාවක් නැහැ. මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හෝ ප්‍රතිකාර ක්‍රම සඳහා යොමු කිරීමට කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන් පාසල් මට්ටමේ සිට සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හරහාත්, රාජ්‍ය ආයතන හරහාත් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනවා. එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් සිදු කිරීමට සැලසුම් කරලා තිබෙනවා.

ඊට අමතරව, පුනරුත්ථාපනය සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න අවස්ථාව සලසා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථාන 25ක් මේ වනකොට දිස්ත්‍රික්ක 25ක් පාදක කරගෙන නිර්මාණය කරමින් යනවා. දැනටමත් පුනරුත්ථාපන මධ්‍යස්ථාන 12ක් පමණ ස්ථාපිත කර තිබෙනවා. දැනට අතරමැදි නිවෙස්නයක් මිහින්තලේ සහ අම්පාර යන දිස්ත්‍රික්කවල ස්ථාපනය වෙලා තිබෙනවා. ඊට අමතරව කාන්තාවන් සඳහා මධ්‍යස්ථානයක් කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථාපිත වෙලා තිබෙනවා. ඊට අමතරව ඉදිරියේදී සෑම දිස්ත්‍රික්කයටම මුදල් වෙන් කරලා ඒවා ස්ථාපිත කරනවා. මාර්තු මාසයේ අලුතින් තවත් දෙකක් විවෘත කිරීමට හැකියාව ලැබෙනවා. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය හෝ ප්‍රතිකාර සඳහා යොමු කිරීම තමයි මෙහි අරමුණ. එහි level එක හඳුනා ගැනීම සඳහා තමයි අතරමැදි මධ්‍යස්ථාන පිහිටුවා තිබෙන්නේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙන් ඒ සඳහා counsellorsලා 250දෙනෙක් විශේෂ පුහුණුවක් සඳහා යොමු කළා. ඒ counsellorsලා හරහා මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්ගේ මට්ටම - level එක - පරීක්ෂා කර, ඔවුන් නිවසේ තබා පුනරුත්ථාපනය කරනවාද, එහෙම නැත්නම් දින 14ක අතරමැදි නිවෙස්නයක තබා පුනරුත්ථාපනය කරනවාද, එහෙමත් නැත්නම් මාස 6ක කාලයක් සඳහා පුනරුත්ථාපන වැඩ පිළිවෙළකට යොදවනවාද, එහෙම නැත්නම් පුනරුත්ථාපන වැඩ පිළිවෙළින් එහා ගිහින් ප්‍රතිකාර සඳහා රෝහල්ගත කරනවාද කියන කාරණය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමෙන් අනතුරුව මේ වැඩ පිළිවෙළ සමස්ත රට පුරාම දියත් කරන වැඩසටහන මේ වනකොට ආරම්භ කර තිබෙනවා. ඒ හරහා මත්ද්‍රව්‍ය සැපයුම අඩාළ කරනවා වාගේම, මත්ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුම අඩාළ කරන්නත් අවශ්‍ය පියවර රාශියක් අරගෙන තිබෙනවාය කියන එක මම මේ සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, පාතාලය සහ මත්ද්‍රව්‍ය විනාශ කරද්දී අපි කවුරුත් දැකපු දෙයක් තමයි, මත්ද්‍රව්‍ය, පාතාලය සහ දේශපාලනය අතර සම්බන්ධයක් තිබෙනවාය කියන එක. එම දේශපාලන සම්බන්ධය මත යම් අත්අඩංගුවට ගැනීම් සහ ප්‍රශ්න කිරීම් සිදු වුණා අපි දැක්කා, කෙහෙල්බද්දර පද්මේ අත්අඩංගුවට ගැනීමෙන් පසුව. එම විමර්ශනවල වර්තමාන ප්‍රගතිය කොහොමද කියලා ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, විශේෂයෙන් කෙහෙල්බද්දර පද්මේ ඇතුළු පාතාල ක්‍රියාකරුවන් කිහිපදෙනෙක් පොලිස් අත්අඩංගුවට පත් වීමෙන් පසුව අපි දිගින් දිගටම විමර්ශන කරමින් පවතිනවා. ඔහු සතු දුරකථන 30ක් සම්බන්ධයෙන් මේ වනකොට විමර්ශන ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එම දුරකථන හරහා ලබා ගත් තොරතුරු සහ ඔවුන්ගේ ප්‍රකාශ හරහා, ඔවුන් සමඟ සබඳතා පැවැත්වූ දේශපාලකයන්, ඔවුන් සමඟ ක්‍රියාකාරකම්වල යෙදුණු දේශපාලකයන් පිළිබඳව තොරතුරු අනාවරණය වෙලා තිබෙනවා. එම දේශපාලනඥයන් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා; ප්‍රකාශ සටහන් කරගනිමින් ඉන්නවා. සම්පූර්ණ විමර්ශනයකින් පසුව තමයි මේ පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් කරන්න හැකියාව තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මේ වනකොට විමර්ශන ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතිනවා.

## පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක ගමනාන්ත: සංවර්ධනය

### புத்தளம் மாவட்டத்திலுள்ள சுற்றுலாத் தளங்கள்: அபிவிருத்தி

### TOURIST DESTINATIONS IN PUTTALAM DISTRICT: DEVELOPMENT

1653/2025

**8. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සංචාරක ආකර්ෂණය රටේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමාවී ඇති බවත්;

[ගරු අජිත් ගිහාන් මහතා]

(ii) සංචාරක කර්මාන්තය සඳහා වැඩි විභවයක් ඇති පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක ගමනාන්තයක් ලෙස දියුණු කිරීම සඳහා මේ දක්වා වැඩ පිළිවෙළක් නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගෙන ඇති සංචාරක ගමනාන්ත කවරේද;

(ii) ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுற்றுலா ஈர்ப்பு நாட்டின் சில பிரதேசங்களுக்கு மாத்திரமே மட்டுப்படுத்தப்பட்டுள்ளது என்பதை யும்;

(ii) சுற்றுலாத் தொழிற்துறை சார்ந்து அதிக வாய்ப்புடைய புத்தளம் மாவட்டத்தைச் சுற்றுலாத் தளமாக அபிவிருத்தி செய்வதற்குத் தற்போதுவரை வேலைத் திட்டமொன்று இல்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) புத்தளம் மாவட்டத்தில் சுற்றுலாத் தொழிற் துறையை மேம்படுத்துவதற்காக இனங் காணப்பட்டுள்ள சுற்றுலாத் தளங்கள் யாவை என்பதையும்;

(ii) அதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Is he aware that -

(i) tourist attractions are currently concentrated within only a few geographical regions of the country; and

(ii) no programme has thus far been established to develop the Puttalam District, which has great potential for the tourism industry, as a tourist destination?

(b) Will he inform this House the -

(i) tourist destinations that have been identified to develop the tourism industry in the Puttalam District; and

(ii) steps that will be taken for the purpose referred to above?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සංචාරක ආකර්ෂණය රටේ ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී නොමැති අතර, රට පුරා සංචාරක ආකර්ෂණීය ස්ථාන ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශ සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ii) වැඩ පිළිවෙළක් පවතී.

(ආ) (i)

| | | |
|---|---|---|
| 1 | ආණමඩුව | • තෝනිගල සෙල්ලිපිය<br>• පරමාකන්ද රජමහා විහාරය<br>• මහඋස්වැව |
| 2 | ආරච්චිකට්ටුව | • ආනවිලුන්දාව රැම්සා තෙත්බිම |
| 3 | හලාවත | • මුන්නේස්වරම් දේවාලය |
| 4 | කරුවලගස්වැව | • තබ්බෝව ජලාශය සහ අභය භූමිය<br>• විලදගොඩ පුරාවිද්‍යා භූමිය |
| 5 | මාදම්පේ | • ශ්‍රී මුරුගන් කෝවිල |
| 6 | මාරවිල | • Golden Beach මාරවිල<br>• මාරවිල කුරුස පල්ලිය |
| 7 | වෙන්නප්පුව | • වෙන්නප්පුව කලපුව<br>• St. Joseph පල්ලිය |
| 8 | කල්පිටිය | • Kite surfing<br>• බත්තලන්ගුන්ඩුව<br>• ලන්දේසි කොටුව<br>• කුඩාව වෙරළ<br>• Dolphin watching<br>• තලවිල පල්ලිය<br>• ආලන්කුඩා වෙරළ<br>• කුදිරමලේ |
| 9 | වනාතවිල්ලුව | • ගංහේවාඩිය<br>• විල්පත්තුව<br>• The Biobab tree<br>• මල්විල රජමහා විහාරය |

(ii) වයඹ පළාත් ප්‍රධාන සංචාරක සැලැස්ම

වයඹ පළාත් සංචාරක සංවර්ධනය උදෙසා 2025 වර්ෂයේදී විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ඊට අයත් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ප්‍රධාන සැලැස්ම සකස් කිරීම ආරම්භ කර ඇති අතර, එම කටයුතු 2026 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිතය. එම සැලැස්මට අනුව වයඹ පළාත සඳහා සංචාරක සංවර්ධන කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර, ඒ යටතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල හඳුනා ගත් සංචාරක ගමනාන්ත සංවර්ධනය සඳහා සැලසුම් හා නිර්මාණ සකස් කරමින් පවතී.

මීට අමතරව පහත දැක්වෙන සංවර්ධන ව්‍යාපෘති පුත්තලම දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය නඟා සිටුවීම වෙනුවෙන් ආරම්භ කර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(1) හලාවත වෙරළ උද්‍යානය, වයඹ සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකරමින් පවතිනවා. ඒ සඳහා රුපියල් මිලියන 55ක් යෙදවෙනවා.

(2) හලාවත මහ වැව සහ තනි වැල්ල දේවාලය ආශ්‍රිත සංචාරක කලාපය සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර තිබෙනවා.

(3) "Discover Kalpitiya" නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම (වයඹ සංවර්ධන අධිකාරිය)

- සංචාරකයින්ගේ ගමනාගමන පහසුව වෙනුවෙන් කල්පිටිය ප්‍රදේශයේ අභ්‍යන්තර මාර්ග 24ක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත.
- සංචාරකයින් වැඩි වශයෙන් භාවිත කරන "ටානියා හෝටල් පාර" සංවර්ධනය කර ඇත.
- ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන් මඟින් ජීවිතාරක්ෂකයින් 113 දෙනෙකු පුහුණු කර ඇත.
- වෙරළාශ්‍රිත සංචාරක මාර්ගෝපදේශකයින් සඳහා ජීවිතාරක්ෂක උපකරණ ලබා දී ඇත.
- Site Guide පාඨමාලාව හරහා 2025 වර්ෂය තුළ සංචාරක මාර්ගෝපදේශකයින් 30 දෙනෙකු පුත්තලම දිස්ත්‍රික්කය සඳහා ක්ෂේත්‍රගත කර ඇත.
- සංචාරක මහ පෙන්වන්නන්, හෝටල් හිමියන්, බෝට්ටු හිමියන්, සංවිධානගත කිරීම හා සේවා ගුණත්වය ඉහළ නැංවීම සිදු කර ඇත.

(4) Kite surfing ප්‍රදේශයට ආසන්නයේ නවීන වැසිකිළි පද්ධතියක් සවි කර තිබෙනවා.

(5) ඉලන්තඩිය සංචාරකයින් බහුලව ගැවසෙන ප්‍රදේශයේ සනීපාරක්ෂක පද්ධතියක් ඉදිවෙමින් පවතිනවා.

**යෝජිත ව්‍යාපෘති**

- ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ 2026 වර්ෂය තුළ කල්පිටිය kite surfing ප්‍රදේශය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.
- ගඟේ වාඩිය සංචාරක කලාපයක් බවට පත් කිරීම සඳහා පරිසර අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.
- කුඩාව සහ ආනවාසල වෙරළ උද්‍යාන සඳහා පාවෙන ජැටි ඉදි කිරීමට යෝජිතයි.
- විල්පත්තු එළුවන්කුලම පිවිසුම සංවර්ධනය කිරීමට සැලසුම් සකස් කර ඇත.
- ආනවිලුන්දාව සංවර්ධන සංවර්ධන ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker
ප්‍රශ්න අංක 9 -1710/2025- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## 2015 සිට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සේවා නියුක්තිය: විස්තර

2015 முதல் கமத்தொழில் துறையில் வேலைவாய்ப்புகள்: விபரம்

EMPLOYMENT IN AGRICULTURAL SECTOR SINCE 2015: DETAILS

206/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha )

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය පහළ ගොස් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙත තරුණයන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் கமத்தொழில் துறையின் தொழில்நிலை வீதம், 2015ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் கமத்தொழில் துறையின் தொழில்நிலை வீழ்ச்சியடைந்திருப்பின் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) இளைய சமூகத்தினரை கமத்தொழில் துறையின்பால் ஈர்க்கும் பொருட்டு வேலைத்திட்டமொன்று வகுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා ]

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the percentage of employment in the agricultural sector in Sri Lanka from 2015 up to now, separately in respect of each year;

(ii) if employment in the agricultural sector has declined during that period, the reasons for it;

(iii) whether a programme has been formulated to attract youth to the agricultural sector; and

(iv) if so, of such details?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

****සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | සේවා නියුක්ති ප්‍රතිශතය (%) |
|---|---|
| 2015 | 28.7 |
| 2016 | 27.1 |
| 2017 | 26.1 |
| 2018 | 25.5 |
| 2019 | 25.3 |
| 2020 | 27.1 |
| 2021 | 27.3 |
| 2022 | 26.5 |
| 2023 | 26.1 |
| 2024 | 26.0 |

(ii) 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශයන්හි සේවා නියුක්තිකයන්ගේ සංයුතියෙහි වෙනස්වීම ප්‍රතිශතයන් ලෙස පහත වගුවෙහි දක්වා ඇත.

| වර්ෂය | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
|---|---|---|---|
| 2015 | 28.7 | 25.8 | 45.5 |
| 2016 | 27.1 | 26.4 | 46.5 |
| 2017 | 26.1 | 28.4 | 45.5 |
| 2018 | 25.5 | 27.9 | 46.6 |
| 2019 | 25.3 | 27.6 | 47.1 |
| 2020 | 27.1 | 26.9 | 46.0 |
| 2021 | 27.3 | 26.0 | 46.7 |
| 2022 | 26.5 | 26.5 | 47.0 |
| 2023 | 26.1 | 25.5 | 48.4 |
| 2024 | 26.0 | 25.6 | 48.5 |

සේවා අංශයේ සේවා නියුක්තිකයන්ගේ වැඩිවීම කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිශතය සුළු වශයෙන් පහළ යාමට හේතුවක් වේ.

කාර්මික හා සේවා අංශයන්හි රැකියා අවස්ථා පුළුල්වීමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවත් සමඟ තරුණ පරපුර වෘත්තීය රැකියාවලට නැඹුරුවීම හේතුවෙන් කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිකයන්ගේ සුළු පසුබෑමක් නිරීක්ෂණය වේ. කෘෂිකාර්මික අංශයේ රැකියාවල පවතින අස්ථාවර බවද මෙයට හේතුවක්ව ඇත.

(iii) ඔව්.

(iv) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ කෘෂිකර්ම ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් හා අනුගතව කටයුතු කිරීම වෙනුවෙන් රට තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙත තරුණයන් ආකර්ෂණය කර ගනිමින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා එළැඹෙන 2025/26 මහ කන්නයේ සිට "පුනරුදයට

අරුණළු" ජාතික ආහාර භෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ පහත යෝජිත විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- රට තුළ සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා "නිෂ්පාදන යාය" ජාතික වැඩසටහන
- රට තුළ බීජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා බීජ නිෂ්පාදන ප්‍රවර්ධන ජාතික වැඩසටහන
- අතිරික්ත නිෂ්පාදනයක් සහිත ආහාර භෝග සඳහා අගය එකතු කිරීමේ සහ අපනයනය ප්‍රවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන.
- කෘෂි යාන්ත්‍රීකරණ ජාතික වැඩසටහන.
- ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණ ජාතික වැඩසටහන.
- ආරක්ෂිත ගෘහ තුළ භෝග වගාව සහ නව කෘෂිකාර්මික පද්ධති ප්‍රවර්ධන ජාතික වැඩසටහන
- බඩ ඉරිඟු, මුං, කවුපි, රටකජු, අර්තාපල්, ලොකුලූනු, රතුලූනු, උඳු, කුරක්කන්, මිරිස් සහ සෝයා බෝංචි ආදී මූලික අවධානය යොමු වී ඇති අතිරේක ආහාර භෝග වෙනුවෙන් ජාතික නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් හා ආහාර භෝග නිෂ්පාදන ප්‍රවර්ධන කාර්යයන්හිදී ස්වේච්ඡා ව්‍යාප්තිකාරකයන් ලෙස සේවය ලබා ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් සුදුසු ප්‍රමුඛ ගොවීන් හඳුනා ගැනීම සහ සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන.

තවද, කෘෂිකර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර ආරම්භ කිරීමට මුලපුරන සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයන් සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් "කෘෂිකාර්මික හා කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම" 2026 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන අතර ඒ සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කර ඇත.

මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ද තරුණයන් ආකර්ෂණය කර ගැනීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ලංකාව පුරා දැනට පිහිටුවා ඇති ලියාපදිංචි තරුණ ගොවි සමාජ 612ක් හා පාසල් තරුණ ගොවි සමාජ 24ක් මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රදර්ශන හා අලෙවිපොළ සම්බන්ධ කිරීම)
- කෘෂි තාක්ෂණය හඳුන්වා දීම සඳහා පාසල් කෘෂි සමාජ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- තරුණ ගොවි සමාජ සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    i. ගොවිපළ යන්ත්‍රෝපකරණ පුහුණු
    ii. මී මැසි පාලන වැඩසටහන්
    iii. බිම්මල් පුහුණු වැඩසටහන්
    iv. භෝග වගා තාක්ෂණ පුහුණු වැඩසටහන්

v. ආහාර තාක්ෂණය හා අගය එකතු කළ නිෂ්පාදන වැඩසටහන

vi. අදාළ ආයතනය සම්බන්ධීකරණය කරමින් පුහුණු වැඩසටහන්

උදා: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

- අභිප්‍රේරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

  උදා: කෘෂිකර්මය, සන්නිවේදනය හා නායකත්වයට අදාළ පුහුණු.

- නවීන තාක්ෂණය හා යාන්ත්‍රිකරණය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- සුහුරු කෘෂිකර්මය පිළිබඳ තරුණයන් දැනුවත් කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -883/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2024 නොවැම්බර් මාසයෙන් පසු ලැබුණු ආයෝජන: විස්තර
2024 நவம்பர் மாதத்தின் பின்னர் கிடைத்துள்ள முதலீடுகள்: விபரம்
INVESTMENTS RECEIVED AFTER NOVEMBER, 2024: DETAILS

1710/2025

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිත අබේගුණවර්ධන මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohitha Abeygunawardhana)
මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා ලැබී ඇති ආයෝජන, එම ආයෝජන ප්‍රමාණය සහ ලබා දුන් රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම රටවල්වලින් ආයෝජනය කරනු ලැබූ සම්පූර්ණ මුදල ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණද;

(iii) එම ආයෝජන අතරින් මේ වනවිට ආරම්භ කර ඇති ව්‍යාපෘති කවරේද;

(iv) මේ වනවිට ආරම්භ කර නොමැති ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024 நவம்பர் மாதத்தின் பின்னர் இதுவரை கிடைத்துள்ள முதலீடுகள், அத்தகைய முதலீடுகளின் அளவு மற்றும் வழங்கியுள்ள நாடுகள் வெவ்வேறாக யாவை;

(ii) மேற்படி நாடுகளிலிருந்து முதலீடு செய்யப் பட்டுள்ள மொத்தத் தொகை அமெரிக்க டொலர்களில் எவ்வளவு;

(iii) மேற்படி முதலீடுகளுள் இதுவரை ஆரம்பிக்கப் பட்டுள்ள கருத்திட்டங்கள் யாவை;

(iv) இதுவரை ஆரம்பிக்கப்படாதுள்ள கருத்திட்டங் கள், அவ்வாறு ஆரம்பிக்கப்படாமைக்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Development:

(a) Will he inform this House -

(i) the investments received after November, 2024 to date, including the specific amounts and their countries of origin;

(ii) the total value of those investments from such countries, in US Dollars;

(iii) as to which of the aforementioned investment projects have already commenced operations; and

(iv) the reasons for the non-commencement of the remaining projects?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2024 නොවැම්බර් සිට 2026 ජනවාරි 31 දක්වා අනුමත කරන ලද ආයෝජන ව්‍යාපෘති

| වර්ගය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත ආයෝජනය (ඇමෙරිකානු ඩොලර් මිලියන) | | |
|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව |
| නව ව්‍යාපෘති | 78 | 541.4 | 957.4 | 1,498.8 |
| පවතින ව්‍යාපෘති පුළුල් කිරීම | 92 | 419.0 | 524.7 | 943.7 |
| එකතුව | 170 | 960.4 | 1,482.1 | 2,442.5 |

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

2024 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා ලැබී ඇති ආයෝජන එම ආයෝජන ප්‍රමාණය සහ ලබා දුන් රටවල් වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01හි සඳහන් වේ.

ඇමුණුම 01

Countrywise breakdown of the estimated foreign Investment of approved projects during November, 2024 to 31st January, 2026

| Country | No. of Projects | Estimated Foreign Investment (US$ Mn) |
|---|---|---|
| United Arab Emirates | 1 | 19.1 |
| Australia | 2 | 5.1 |
| Switzerland | 1 | 3.0 |
| Spain | 1 | 3.0 |
| France | 1 | 0.2 |
| United Kingdom | 4 | 24.7 |
| India | 7 | 25.4 |
| South Korea | 1 | 0.5 |
| Luxembourg | 3 | 54.8 |
| Malaysia | 3 | 114.9 |
| Netherlands | 1 | 159.0 |
| Sweden | 1 | 6.0 |
| USA | 1 | 0.6 |
| Germany | 1 | 1.0 |
| Mauritius | 1 | 1.8 |
| **Total** | **29** | **419.0** |

US$ 419 Mn is the Estimated Investment of "Approved expansions" projects and not the 'expansion projects commenced implementation."

| Country | No. of New Projects | Estimated Foreign Investment (US$ Mn) |
|---|---|---|
| Australia | 3 | 3.14 |
| Canada | 1 | 9.75 |
| Denmark | 1 | 4.53 |
| France | 1 | 0.35 |
| Hong Kong | 1 | 1.00 |
| India | 11 | 373.40 |
| Iran | 1 | 8.81 |
| Japan | 1 | 2.00 |
| South Korea | 1 | 0.30 |
| Malaysia | 1 | 12.06 |
| Netherlands | 1 | 0.73 |
| Saudi Arabia | 1 | 0.35 |
| Singapore | 4 | 68.07 |
| Spain | 1 | 0.15 |
| UK | 2 | 24.47 |
| United Arab Emirates | 2 | 17.00 |
| USA | 4 | 15.28 |
| **Grand Total** | **78** | **541.38** |

(ii) ප්‍රශ්න අංක (i)හි පිළිතුර අදාළ වේ.

(iii)

| වත්මන් තත්ත්වය | එකතුව |
|---|---|
| ඉදිකිරීම්/ක්‍රියාත්මක වෙමින් පවතින | 31 |
| වාණිජ මෙහෙයුම් | 14 |
| මුළු එකතුව | 45 |

ඇමුණුම 02හි ව්‍යාපෘතීන් 45 පිළිබඳව සඳහන් කර ඇත.

ඇමුණුම 02

**Projects Approved from Nov 2024 to Jan 2026 and Commenced Implementation/Operation**

| No. | Type | Project_Name |
|---|---|---|
| 1 | New Project | NATIONAL SCHOOL OF BUSINESS MANAGEMENT (GUARANTEE) LTD. |
| 2 | New Project | SKIPOD MANUFACTURE (PVT) LTD. |
| 3 | New Project | BCF LANKA (PVT) LTD. |
| 4 | New Project | CEYLON SPECIALITY CHEMICALS (PVT) LTD. |
| 5 | New Project | BLUE ARC MANUFACTURING (PVT) LTD. |
| 6 | New Project | REVITA GLOBAL (PVT) LTD. |
| 7 | New Project | AOD SOUTH ASIA (PVT) LTD. |
| 8 | New Project | ACCESS MEDICAL TRACERS (PVT) LTD. |
| 9 | New Project | DSL TIKIRI ESSENCE (PVT) LTD. |
| 10 | New Project | BLUE OCEAN BREEZE (PRIVATE) LTD. |
| 11 | New Project | NATEX EXTRACTS (PVT) LTD. |
| 12 | New Project | SHENGDA INDUSTRIAL COMPANY (PVT) LTD. |
| 13 | New Project | S M I POINT (PVT) LTD. |
| 14 | New Project | POLESTAR (LANKA) GARMENTS (PVT) LTD. |
| 15 | New Project | CEYLANKA SRF (PVT) LTD. |
| 16 | New Project | JOVERA BRUSH INDUSTRIES (PVT) LTD. |
| 17 | New Project | AGRO GLOBAL SOLUTIONS (PVT) LTD |
| 18 | New Project | AD PRINTERS AND PACKAGING (PVT) LTD. |
| 19 | New Project | BLUE OCEAN CAPITAL (PVT) LTD. |
| 20 | New Project | MELWA CEMENT (PVT) LTD. |
| 21 | New Project | PUNSIRI GEMS (PVT) LTD. |
| 22 | New Project | 12404001CEYLON (PVT) LTD. |
| 23 | New Project | AUTOLINK GLOBAL LANKA (PVT) LTD |
| 24 | New Project | ONE 2 ONE (PVT) LTD. |
| 25 | New Project | TRUE FOAM (PVT) LTD. |
| 26 | New Project | ROSSLI CLOTHING (PVT) LTD. |
| 27 | New Project | EVERCORE PROPERTIES (PVT) LTD. |
| 28 | Expansion | CEYLON BEVERAGE CAN (PVT) LTD. - EXP 3 |
| 29 | Expansion | THE COLOMBO ICE COMPANY (PVT) LTD. - EXP. 01 |
| 30 | Expansion | SUNRICH CONFECTIONERY (PVT) LTD. EXP3 |
| 31 | Expansion | ALCHEMY HEAVY METALS (PVT) LTD. -EXP 2 |
| 32 | Expansion | HYOSUNG ONB (PVT) LTD. - EXP 2 |
| 33 | Expansion | PRIME LANDS RESIDENCIES PLC - EXP-3 |
| 34 | Expansion | DIALOG AXIATA PLC - EXP .15 |
| 35 | Expansion | DIALOG BROADBAND NETWORKS (PVT) LTD. -EXP11 |
| 36 | Expansion | CEYLON STEEL CASTING (PVT) LTD. - EXPANSION |
| 37 | Expansion | WALTERS BAY TEA GROWERS (PVT) LTD. - EXP 2 |
| 38 | Expansion | W.N.S. GLOBAL SERVICES (PVT) LTD. EXP2 |
| 39 | Expansion | INFORMATICS INSTITUTE OF TECHNOLOGY LTD. - EXP1 |
| 40 | Expansion | BOEHM & LECKNER MULTI MOULDS (PVT) LTD. - EXP 2 |
| 41 | Expansion | PHOENIX INDUSTRIES LTD. - EXP 5 |
| 42 | Expansion | FLEXI PRINT (PVT) LTD. - EXP3 |
| 43 | Expansion | AMINOVIT (PVT) LTD. - EXPANSION |
| 44 | Expansion | SUN INDUSTRIAL TYRES (PVT) LTD. - EXP 1 |

(iv) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - BOI - විසින් අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වේගය, එවා නිම කිරීමට ගතවන කාලය, අදාළ බලයලත් ආයතනවලින් බලපත්‍ර ලබා ගැනීම, පාරිසරික අනුමැතිය, අවශ්‍ය කරන ඉඩම් තෝරා ගැනීම සහ ආයෝජකයන්ටම ආවේණික වූ අභියෝග වැනි කරුණු මත වෙනස් විය හැකිය. ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට පූර්ණ ලෙස අනුකූල වෙමින් මෙම ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සියලුම අදාළ ආයතන සමඟ අඛණ්ඩව සම්බන්ධීකරණ කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 32 යටතේ මං ප්‍රශ්නයක් යොමු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්න න්‍යාය පත්‍රයට යොමු වන්නේ නැහැ. මම ඔබතුමාට දිගින් දිගටම මේක ගැන කිව්වා. ගරු කථානායකතුමනි, මම ඊයේ දිනයේ ඇහුවේ තුන් වතාවක් කල් ගිය ප්‍රශ්නයක්. තුන් වතාවක් කල් ගියා කිව්වාම එක වතාවකදී සති දෙකක් කල් ගන්නවා කියලා ඔබතුමා දන්නවා. ඒ කියන්නේ, පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන සති තුනක් ගත වුණාට පසුවයි එම ප්‍රශ්නය නැවත න්‍යාය පත්‍රයට එන්නේ. එතකොට මාස 6කින් තමයි මට ඒ ප්‍රශ්නය අහන්න අවස්ථාව ලැබුණේ. ඒකෙන් මට අසාධාරණයක් සිද්ධ වෙනවා. ස්ථාවර නියෝග 32 යටතේ මා යොමු කරලා තිබෙන ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇවිල්ලා නැහැ. ගරු කථානායකතුමනි, එක්තරා නිලධාරියෙක් හිතාමතා මගේ ප්‍රශ්න ටික න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ නැහැ කියලා මම කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මේක බලන්නකෝ. ඔබතුමාම මේක තේරුම් ගන්න. තුන් වතාවක් න්‍යාය පත්‍රයට ආපු ප්‍රශ්නයක් තමයි මම ඊයේ ඇහුවේ. ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්න ටික න්‍යාය පත්‍රයට ඇතුළත් දෙන්න කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාරණාව අවධානයට අරගෙන, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ශ්‍රී ලන්කන් ගුවන් සේවය ප්‍රතිසංස්කරණයන්හි වත්මන් තත්ත්වය
### இலங்கை விமான சேவை நிறுவனத்தின் மறுசீரமைப்பின் தற்போதைய நிலை
### CURRENT STATUS OF RESTRUCTURE OF SRILANKAN AIRLINES

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය, ප්‍රතිසංස්කරණ මාර්ගය සහ රජය මත ඇති මූල්‍ය භාරය පිළිබඳව විශේෂයෙන්ම රුපියල් බිලියන 25.3ක් - ඒ කියන්නේ, රුපියල් මිලියන 25,300ක ප්‍රතිපූරණය - recapitalization - සිදු කර ඇති පසුබිම තුළ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF - සමඟ ඇති විස්තීර්ණ අරමුදල් පහසුකම - EFF - යටතේ රාජ්‍ය ව්‍යාපාර වාණිජකරණය කර අර්ධ-රාජ්‍ය මූල්‍ය අවදානම් අඩු කිරීමට ඇති බැඳීම සැලකිල්ලට ගනිමින් රජයෙන් හදිසි ප්‍රකාශයක් ඉල්ලා සිටිමි.

මෙහිදී පහත සඳහන් කරුණු පිළිබඳ පැහැදිලි සහ සම්පූර්ණ පිළිතුරු ඉල්ලා සිටිමි.

1. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ප්‍රතිසංස්කරණය හෝ වාණිජකරණය සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය කුමක්ද? කැබිනට් මණ්ඩලය විසින් ස්ථිර මාර්ගයක්, හවුල්කාරිත්වයක්, අර්ධ කොටස් විකිණීමක්, පොදු - පෞද්ගලික හවුල් ව්‍යාපෘතියක් - public-private partnership එකක් - කළමනාකරණ ගිවිසුමක් හෝ සම්පූර්ණ රාජ්‍ය අයිතිය තබා ගැනීමක් අනුමත කර තිබේද? ක්‍රියාත්මක කිරීමේ නිශ්චිත කාලසටහන කුමක්ද?
2. Going concern ලෙස, ඒ කියන්නේ ඉදිරියට පැවැත්වීමේ අරමුණ අනුව ගුවන් සේවය ඉදිරිපත් කරනු ලබන්නේ කුමන විගණන පදනමක් මතද? රජයේ භාරකාරිත්වය හා භාණ්ඩාගාර ඇප නැතිව මෙය පවත්වාගෙන යාම පිළිබඳ විගණකවරුන් විසින් සැලකිය යුතු මූල්‍යමය අවිනිශ්චිතතාව - material uncertainty - සටහන් කර තිබේද?
3. නවතම වාර්තාකරණ දිනයට අනුව ශ්‍රී ලංකා ගුවන් සේවයේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද? එය භාණ්ඩාගාර ඇප සහිත ණය, ගුවන් යානාවල lease වගකීම්, බැංකු ණය සහ සමූහ අභ්‍යන්තර වගකීම් ලෙස වෙන්කර, රුපියල් සහ ඇමෙරිකානු ඩොලර්වලින් සඳහන් කරන්නේ කෙසේද?
4. රුපියල් බිලියන 25.2ක ප්‍රතිපූරණය කොපමණ ආකාරයකින් ව්‍යුහගත කර තිබේද? හිමිකම් ප්‍රතිඵලයක් ලෙසද, ණය පරිවර්තනයක් ලෙසද, රජය විසින් වගකීම් භාර ගැනීමක් ලෙසද, නැතහොත් ඇප නිරවුල් කිරීමක් ලෙසද? එය අනුමත කර ඇත්තේ කුමන අය වැය ශීර්ෂය හෝ අතිරේක මුදල් ඇස්තමේන්තුව යටතේද?
5. 2021 සිට 2025 දක්වා සෑම මූල්‍ය වසරකටම වෙන්ව,
   (a) SriLankan Airlines Limited
   (b) SriLankan Catering Limited
   (c) SriLankan Ground Handling Limited

   සම්බන්ධයෙන් විගණනය කළ හෝ කළමනාකරණ ගිණුම් අනුව ලාභ/අලාභ සංඛ්‍යා දක්වන්න. ඒ subsidiary කොම්පැනි තුනේ group එකේ ප්‍රශ්නයක් ලෙස තමයි මා මෙය අහන්නේ.
6. වාර්තා අනුව මාර්ගවල සියයට 70කට ආසන්න ප්‍රමාණයක් අලාභදායක වන අතර, ගුවන් යානාවකට සේවක අනුපාතය ඉහළ මට්ටමක පවතින බවත්, මගී පිරවුම් අනුපාතය සියයට 80ක් වුවද, breakeven load factor එක ඉහළ බවත් සඳහන් වේ. මෙම රෝධාභාසයට හේතු වන ව්‍යුහමය අඩුපාඩු මොනවාද? ඒවා නිවැරදි කිරීමට ගෙන ඇති ප්‍රමාණවත් ප්‍රතිසංස්කරණ කවරේද?
7. ඉහත සඳහන් වසරවලදී ශ්‍රී ලංකාවට පැමිණි සමස්ත සංචාරකයින්ගෙන් කොපමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංකා ගුවන් සේවය මඟින් රැගෙන ආවාද?
8. ඉදිරි වසර තුන තුළ රජයට ඇති විය හැකි මූල්‍ය භාරය, ඇප, lease වගකීම් සහ නැවත මුදල් සපයා ගැනීමේ අවදානම් ඇතුළුව කොපමණද? එය IMF සමඟ එකඟ වූ මූල්‍ය සංකෝචන ඉලක්ක සමඟ ගැළපෙන්නේ කෙසේද?

   ජාතික මුදල් තත්ත්වය දැඩි පීඩනයකට ලක් වී ඇති අවස්ථාවක පූර්ණ පැහැදිලිභාවය අත්‍යවශ්‍ය කරුණකි.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]* ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, සුපුරුදු පරිදි ඔබතුමා හැම මොහොතේම කැමැති ස්ථාවර නියෝග යටතේ වැඩ කටයුතු කිරීමටයි. නමුත් පිටු දෙකක තිබුණු ප්‍රශ්න, පිටුවකට අඩු කරලාත් අපට ඒ සඳහා අදම උත්තරයක් ලැබෙන්නේත් නැහැ. මට පෙනෙන විධියට නලින්ද ජයතිස්ස ඇමතිතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න තව කාලයක් ඉල්ලන්නයි හදන්නේ. ප්‍රශ්න අඩු කිරීමේ ඔබතුමන්ලාගේ අරමුණ වුයේ එදාම උත්තර ලබා දීමයි. ඊයේ Leader of the House නැඟිටලා කිව්වා, දෙන උත්තරය මිනිත්තු 5කට අඩු කරන්න ඕනෑ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විවාදයකට නොයා ඉඳිමු.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Leader of the House තමයි ඒක කිව්වේ. මේ තුළින් අර්ථ කථනය කරන්න හදන්නේ මොකක්ද? පාර්ලිමේන්තුව යම් විධියකට ප්‍රාදේශීය සභා මට්ටමට ගේන්න හදනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය උපරිම වශයෙන් ආරක්ෂා කිරීමට පාර්ලිමේන්තුව ඉහළ සම්ප්‍රදායයෙන් පවත්වාගෙන යෑම තමයි අපේ බලාපොරොත්තුව. ගරු මන්ත්‍රීතුමනි, මම කලිනුත් කිව්වා, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ප්‍රශ්නවලට පුළුවන් තරම් එදාම උත්තර දෙන්න කියලා තමයි අපි ඇමතිවරුන්ට උපදෙස් ලබා දී තිබෙන්නේ. ඒ අනුව ඇමතිවරුන් ඒකට උත්සාහ කරනවා. නමුත් ඔබතුමා දන්නවා, සමහර ප්‍රශ්නවල අන්තර්ගතය දිහා බැලුවාම ඒ ප්‍රශ්නවල විෂය පථය හරිම පුළුල් බව. ඔබතුමන්ලාත් ඒවා අධ්‍යයනය කරලා බලන්න. යම් නිශ්චිත කරුණකට අදාළ ප්‍රශ්න කිහිපයක් අහනවා නොවෙයි. ඒකට අදාළ තව අමාත්‍යාංශ කිහිපයකිනුත් සමහර තොරතුරු එකතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. කෙසේ නමුත්, මම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට ඔබතුමන්ලා අහපු ප්‍රශ්නවලට ඉතාම ඉක්මනට පිළිතුරු ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අදත් අමාත්‍යාංශ නිවේදන යටතේ ප්‍රශ්න දෙකකට පිළිතුරු ලබා දෙනවා. ඒ අනුව ඉතාම කෙටි කාලයක් ඇතුළත අපි මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙනවා. අපි බලාපොරොත්තු වන්නේ එදාම උත්තර ලබා දෙන්නටයි. නමුත්, පිළිතුරු දීමට ප්‍රමාද වුණු ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ඒවාට කඩිනමින් උත්තර ලබා දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි විවාදයකට නොයා ඉඳිමු. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. මොකද, ආණ්ඩුවක් කටයුතු කරනකොට ඒ වාගේ ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. නමුත්, අද "Daily News" පත්තරේ සහ "දිනමිණ" පත්තරේ බලනකොට පෙනෙනවා, මේ ප්‍රශ්නවලට කලින්ම උත්තර ලබා දෙන බව. අද නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේකේ වැඩි shares ටික රජය තියාගන්න ඕනෑ කියලා. නමුත්, මීට මාස 9කට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වේ මොකක්ද? ඒවා ප්‍රශ්න නොවෙයි. මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න කල් ගන්නවා ද, මේවායේ ස්වරූපය කොහොමද කියලා හොයා බලා මේ ගරු සභාවට ඇවිල්ලා උත්තර දෙන්න කියලායි මම කියන්නේ. ඇයි, මේ නියෝජ්‍ය ඇමතිතුමා පත්තරවලට මේවා ගැන කියන්නේ? මීට පෙර ජනාධිපතිතුමා කියලා තිබුණේ "අපි වාණිජකරණයට ලක් කරනවා" කියලා. කරුණාකරලා ඒ ස්වරූපය හොයා බලා කියන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි ඊළඟ රැස්වීම් සතියේ දී මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනකොට එතුමාගේ අතුරු ප්‍රශ්නයක් හැටියට එය ඉදිරිපත් කරන්න හැකියාව ලැබේවි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## 2023-2025 දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ප්‍රසාරණය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## உரிமம் பெற்ற வணிக வங்கிகள் மற்றும் வங்கி அல்லாத நிதி நிறுவனங்களால் 2023-2025 வரை கடன் வழங்கல் அதிகரிப்பு: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## EXPANSION OF CREDIT ISSUED BY LICENSED COMMERCIAL BANKS AND NON-BANKING FINANCIAL INSTITUTIONS FROM 2023-2025: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
Hon. Speaker, the Answer to the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 18th December, 2025 is as follows:

1. With regard to outstanding credit to the private sector by LCBs for the three years, I will just read out the absolute amount and the percentage, but the details are given in the table.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Are you tabling that table?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
The table can be given.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
But, we do not get those, Hon. Minister.

Hon. Speaker, I have raised this matter previously also. For saving time, certainly, there are tables that need to be tabled. But, we do not get copies of those. On the day we get the Answer, we should simultaneously get those into our hands.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
I will read the Answer.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
No, you can table it, but my point is, those tables should also come along.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, Hon. Minister, you read the Answer.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

1.

| | Outstanding credit to the private sector by LCBs (Rs. bn) | Y-o-Y change in absolute terms (Rs.bn) | Y-o-Y change in percentage terms (%) |
|---|---|---|---|
| End 2023 | 7,366.4 | -45.0 | -0.6 |
| End 2024 | 8,156.0 | 789.6 | 10.7 |
| End 2025 | 10,212.2 | 2,056.1 | 25.2 |

2.

| | Outstanding credit to the private sector by the non-bank financial sector (Rs. bn) | Y-o-Y change in absolute terms (Rs.bn) | Y-o-Y change in percentage terms (%) |
|---|---|---|---|
| End 2023 | 1,322.7 | -24.2 | -1.8 |
| End 2024 | 1,599.8 | 277.1 | 21.0 |
| End 2025 | 2,388.7 | 788.9 | 49.3 |

3.

| | Outstanding Pawning/ Gold Backed Credit as at end of period (Rs. bn) | | | Growth (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | Sep 25 | 2023 | 2024 | Jan-Sep, 2025 |
| LCBs [(a)] | 546.7 | 658.8 | 792.0 | 33.0 | 20.5 | 20.2 |
| LSBs [(b)] | 149.7 | 188.5 | 227.6 | 29.8 | 25.9 | 20.8 |
| All Banks | 696.4 | 847.3 | 1,019.6 | 32.3 | 21.7 | 20.3 |
| FCs [(b)] | 219.7 | 286.8 | 403.5 | -4.4 | 30.5 | 40.7 |

4. Total outstanding value of leasing facilities by banks, which include vehicles, machinery and all other types of leases are as follows:

| | Outstanding Amounts on Leasing Facilities as at end of period (Rs. bn) | | |
|---|---|---|---|
| | 2023 | 2024 | Jan-Sep, 2025 |
| LCBs [(a)] | 237.5 | 295.8 | 422.8 |
| LSBs [(a)] | 6.9 | 9.2 | 13.4 |
| All Banks | 244.4 | 305.0 | 436.2 |

Total outstanding value of leasing facilities including vehicles, machinery and all other types of leases, and hire-purchase facilities of FCs are as follows:

| | Outstanding Amount as at end of period (Rs. bn) | | |
|---|---|---|---|
| | 2023 | 2024 | Jan-Sep, 2025 |
| Finance Leasing [(a)] | 526.8 | 609.1 | 727.6 |
| Hire Purchase [(a)] | 36.9 | 35.8 | 24.6 |
| Total | 563.6 | 644.8 | 752.2 |

5.

| | Outstanding Amounts on Credit Cards (Rs. bn) | | |
|---|---|---|---|
| | 2023 | 2024 | Jan-Sep, 2025 |
| All Banks [(a)] | 156.1 | 169.0 | 179.5 |
| FCs [(b)] | 7.0 | 8.6 | 9.6 |

6. The summarized answer with regard to annual increase in terms of Pawning/Gold loans, Leasing and Credit Cards expressed in rupee terms and percentage growth is as follows;

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

| | Product | Increase in Volume Terms (Rs.bn) | | Growth (%) | |
|---|---|---|---|---|---|
| | | End 2023 to End 2024 | Jan-Sep 2025 | End 2023 to End 2024 | Jan - Sep 2025 |
| All Banks | Pawning/ Gold Loans | 150.9 | 172.3 | 21.7 | 20.3 |
| | Leasing | 60.6 | 131.2 | 24.8 | 43.0 |
| | Credit Cards | 12.9 | 10.6 | 8.3 | 6.2 |
| FCs | Pawing/ Gold Loans | 67.1 | 116.7 | 30.5 | 40.7 |
| | Leasing | 81.2 | 107.4 | 14.4 | 16.7 |
| | Credit Cards | 1.6 | 0.9 | 22.7 | 10.5 |

7. The Non-Performing Loan (NPL) Ratios associated with Pawning, Leasing and Credit Cards lending for each year is as follows;

| | Product | NPL(Stage 3 Loans to Total Loans) Ratio (%) as at end of period | | |
|---|---|---|---|---|
| | | 2023 | 2024 | Jan-Sep 2025 |
| All Banks | Pawning/ Gold loans | 0.7 | 0.3 | 0.3 |
| | Leasing | 9.2 | 4.2 | 2.7 |
| | Credit Cards | 6.7 | 5.1 | 4.3 |
| FCs | Pawning/ Gold loans | 6.0 | 1.8 | 1.0 |
| | Leasing | 20.2 | 12.6 | 8.4 |
| | Credit Cards | 17.5 | 13.4 | 29.2 |

8. The annual increase with regard to Pawing, Vehicle Leasing and Credit Cards from 2023 to 2025 expressed in rupee terms and percentage growth is as follows;

| | Product | Increase in Volume Terms- Jan - Sep 2025 (Rs.bn) |
|---|---|---|
| LCBs | Pawning/Gold Loans | 133.2 |
| | Leasing | 127.0 |
| | Credit Cards | 10.6 |
| LSBs | Pawning/Gold Loans | 39.1 |
| | Leasing | 4.2 |
| FCs | Pawning/Gold Loans | 116.7 |
| | Leasing | 107.4 |
| | Credit Cards | 0.9 |
| (A) Total increase in pawning/gold loans, leasing and credit cards | | 539.1 |
| (B) Change in credit to the private sector (M4 ) | | 1944.3 |
| (C) Combined contribution = (A/ B)*100 | | 27.7% |

9. The Central Bank continues to monitor the behaviour of credit on a continuous basis. In view of the significant year-on-year credit growth in the vehicle-backed loan portfolios of financial companies and the lease rental portfolios of banks, the Central Bank tightened the caps on Loan to Value - LTV - ratios applicable to credit facilities granted in respect of motor vehicles.

10. The Central Bank has been publishing a detailed breakdown of credit extended to key sectors of the economy on a quarterly basis since June 2010. Furthermore, with effect from April, 2025, the Central Bank commenced publishing the Monthly Survey on Loans and Advances by Licenced Commercial Banks - LCBs - to the private sector on a monthly basis. This data can be accessed from the Central Bank's official website through the three links given below.

(i) Monthly Bulletin - Monthly Bulletin, Central Bank of Sri Lanka

(ii) Monetary Sector Statistics - Monetary Sector, Central Bank of Sri Lanka.
· Table- table_sectoral credit

(iii) Monthly Bulletin of Monetary and Interest Rate Statistics - Money, Credit and Interest Rate Developments

Monetary Survey and Financial Survey with monthly private sector credit information has been publicly available since December, 1991 and December, 1998, respectively.

Thank you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් සවිස්තර උත්තරයක් ලබා දුන්නාට ස්තුතියි.

ගරු කථානායකතුමනි, මේකෙන් හෙළිදරව් වෙන්නේ මහ බැංකුවේ තිබෙන ක්‍රියාදාමය. මොකද, අපි මුල ඉඳලාම පෙන්නුවේ මේ රටේ ආර්ථිකය වර්ධනය වෙලා තිබෙනවා නම් ඒකේ ණයගත කිරීම තුළ උකස් කිරීම - pawning, ලීසිං ඒ කියන්නේ vehicles, ඒකෙත් සම්පූර්ණ ප්‍රාග්ධනය දමන්නේ නැහැ. බැංකු ණය ගන්නවා. ඒක tax එක අනුව වෙන්න පුළුවන්.

ඊළඟ එක credit cards. මේකත් ණයක් ඇති කිරීමක්. මහ බැංකුව සම්පූර්ණ මූල්‍ය පද්ධතිය පවත්වාගෙන යන නිසා හැම අවස්ථාවේදීම අහලා තිබෙනවා, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, තරුණයන්ට වාගේම මේ රටේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් ණය දෙන්නේ නැත්තේ ඇයි කියලා. ඒ කාරණා සම්බන්ධයෙන්, ණය දෙන්නේ නැතුව රටේ සියයට 25ක මූල්‍ය වර්ධනයක් වෙලා තිබෙනවාය කියලා පෙන්වනවා, ගරු කථානායකතුමනි. නමුත්, ඒවා ගිහිල්ලා තිබෙන්නේ වැරදි

දේවල්වලට. ඒ කියන්නේ, උකස් කිරීමට, credit cardsවලට සහ ලීසිංවලට. මේ ස්ථාවරය මේ ආණ්ඩුව වෙනස් කරන්න. මුල ඉඳන්ම මම මේ ප්‍රශ්නය ඇහුවේ මේ කාරණය හෙළිදරව් කර ගැනීමටයි. මේ ප්‍රශ්නය අහලා මේ වනකොට මාස තුනක් වෙනවා. මේකට එදාම පිළිතුරක් දෙන්න තිබුණා. හැම දෙයක්ම computerize කරලා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්නේ නැත්තේ මෙන්න මේ වාගේ බොරු දේවල් සඳහා මහ බැංකුව මුල්‍ය පැත්තෙන් කටයුතු කිරීම නිසායි.

මම ඉතාම ඕනෑකමින් අහන්නේ, මේ රටේ ආර්ථිකය ශීඝ්‍රයෙන් සංවර්ධනය කරන්න ඕනෑ නම්, අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක්, 9ක්, 10ක් දක්වා ගෙන යන්න ඕනෑ නම් ඔබතුමන්ලා ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ නියෝජිතයින්ට අත් දෙකම දීලා බදා ගත්තාම මොනවාද වෙන්නේ කියායි. ජෝර්ජීවා මැතිනිය කිව්වේත් reserves ඇති කරන්න ඕනෑ කියලා තමයි. හැබැයි, අන්තිමට මහ බැංකුව මොනවාද කරන්නේ? ඒ කියන්නේ, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ලංකාවේ ශාඛා manager වෙන්නේ අපේ මහ බැංකු අධිපතිතුමායි. මොනවාද මේ සම්බන්ධයෙන් කරන්නේ, ඇමතිතුමා? ඉතාම ශෝචනීය තත්ත්වයක් තමයි මෙතැනින් පෙන්වන්නේ. කරුණාකර මේ ස්ථාවරය වෙනස් කරන්න. අපට credit ඇති කරන්න අවශ්‍ය වෙන්නේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට, අපේ තරුණයන්ට, කාන්තාවන්ට සහ ප්‍රාග්ධන වියදම්වලට. එහෙම නැතුව credit cardsවලට, pawningවලට නොවෙයි.

ඒ කියන්නේ, තමන්ගේ වත්කම උකස් කරලා මේ රටේ ආර්ථිකය පවත්වාගෙන යන්න හදනවා නම් ඒක රටේ භයානක තත්ත්වයක් විධියට තමයි මට පෙන්වන්න වෙන්නේ, ගරු කථානායකතුමනි. මම දන්නවා, අනිල් ජයන්ත ඇමතිතුමාත් උත්තර දෙන්නේ මහ බැංකුවේ තිබෙන ක්‍රියාදාමය සම්බන්ධයෙන් බව. මේක එතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. එතුමාගෙන් මේ ප්‍රශ්නය ඇහුවොත් එතුමා සම්පූර්ණයෙන් වෙනස් උත්තරයක් දෙයි. එහෙම නම්, අපි හිර වෙලා තිබෙනවා නොවෙයිද? මේ තත්ත්වය අපි වෙනස් කරන්න ඕනෑ නැද්ද? අපි විපක්ෂය හැටියට අදහසක් ලබා දෙනවා, ආණ්ඩුවේ තිබෙන කාර්යභාරය සම්බන්ධයෙන් මෙතැනදී වෙනස් කිරීමක් කරන්න ඕනෑය කියලා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මෙය විශ්ලේෂණය කර බැලුවාම ඇත්තටම ඒ ගැන පැහැදිලි කිරීමක් කර ගත යුතු වනවා. අපි හිර වෙලා තිබෙන තැන ඉඳලා ස්ථාවරත්වයෙන් ආර්ථික වෘද්ධිය ලබා ගන්නකොට විශේෂයෙන්ම 2025 වර්ෂයේදී කැපී පෙනෙන වෘද්ධියක් තමයි ලබා තිබෙන්නේ. මම ඒ සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කළා. ඒ අනුව, 2023දී ඍණ. Credit වර්ධනයක් වෙලා නැහැ. 2024දී සියයට 10යි. නමුත්, 2025දී සියයට 25ක වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. එතකොට පෞද්ගලික අංශයට credit ලබා දීමේදී මේ සැම ක්ෂේත්‍රයක්ම නියෝජනය වනවා. නමුත්, සියයට 25ක් තමයි pawning, leasing සහ motor vehicles වෙනුවෙන් ගිහිල්ලා තිබෙන්නේ. නමුත්, motor vehicles ගත්තොත්, පෞද්ගලික පරිභෝජනයට තිබෙන motor vehiclesවලට අමතරව අවුරුදු ගණනාවක් -අවුරුදු දෙක තුනක් විතර - හිර වෙලා තිබුණු commercial vehicles විශාල ප්‍රමාණයක් එනවා, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, භාණ්ඩ ප්‍රවාහනය - transportation - සඳහා. ඒ ප්‍රමාණය ගත්තත්, ඒක විශාල බලපෑමක්. නමුත්, අපි ඒක අත්හැරියොත් මොකද වෙන්නේ? ඇත්තටම සියයට 75ක් විතර තිබෙන්නේ සුළු, මධ්‍ය පරිමාණයේ සහ අනෙකුත් ව්‍යාපාරික ක්ෂේත්‍රයේ. මේ ප්‍රගතිය මේ සංඛ්‍යාලේඛන අනුව මොන විධියට අර්ථ කථනය කළත්, අවසානයේදී නිරූපණය වෙන්නේ ආර්ථික වර්ධනයත් එක්කයි. ඒ නිසා තමයි අපට 2025 වර්ෂයේදී වර්ධනයක් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. අඛණ්ඩව සැම කාර්තුවකම ආර්ථික වර්ධනය සියයට 5 ඉක්මවන මට්ටමට ගෙනැල්ලා ඉදිරියට ගමන් කරන්න අපි බලාපොරොත්තු වනවා. අවසාන සංඛ්‍යාලේඛන ගත්තාම, අපේ මේ ප්‍රතිපත්තිය තුළ ආර්ථික වර්ධනයට උදවු වන ප්‍රවණතාවක් තමයි තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය, ගරු ආනන්ද විජේපාල මහතා.

## අපරාධ මැඩලීම සඳහා රාජ්‍ය ආරක්ෂක යන්ත්‍රණය ශක්තිමත් කිරීම: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## குற்றச் செயல்களை ஒடுக்குவதற்கு அரச பாதுகாப்புப் பொறிமுறையை வலுப்படுத்தல்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று
## STRENGTHENING STATE SECURITY MECHANISM TO SUPPRESS CRIMES: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ඊයේ දින ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයෙන් ටිකක් සංකීර්ණ සහ පුළුල් කාරණා රාශියක් තමයි විමසා තිබෙන්නේ. අපි ඊයේ දිනයේ මේ සඳහා පිළිතුරක් සකස් කළා. එම පිළිතුර තමයි මේ අවස්ථාවේදී මම ඉදිරිපත් කරන්න අදහස් කරන්නේ.

ඒ වාගේම විශේෂයෙන් පසුගිය දිනෙක සිදු වූ නීතිඥවරයාගේ ඝාතනය පිළිබඳ විමර්ශන සම්බන්ධව කරුණු කිහිපයකුත් මම මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි.

පළමුවෙන්ම මම ගරු විපක්ෂ නායකතුමා විසින් 2026.02.19වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

01. පොලිසියේ සාමාන්‍ය සේවයේ පුරප්පාඩු 35,116ක් තිබෙනවා. විශේෂ කාර්ය බලකායේ 3,815ක් තිබෙනවා. සහායක සේවයේ 1,682ක් තිබෙනවා.

    2026.02.17 දිනට එක් එක් තනතුරුවල පවතින පුරප්පාඩු අසා තිබෙනවා. නියෝජ්‍ය පොලිස්පති - කාන්තා - පුරප්පාඩු 01යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඒ විස්තර සභාගත කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
හොඳයි. සමස්ත පුරප්පාඩු ප්‍රමාණය ඇතුළත් ලේඛනය ඇමුණුම 01 ලෙස මා **සභාගත*** කරනවා.

මෙම පුරප්පාඩු දීර්ඝ කාලයක සිට ඉදිරියට ගණනය වන පුරප්පාඩු වන අතර, එම පුරප්පාඩු ඇති වීම සඳහා පහත සඳහන් කරුණු බලපා තිබෙනවා.

* 2021.12.21 වන දින නිකුත් කර ඇති අය වැය චක්‍රලේඛ අංක 03/21 මඟින් සියලුම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමා කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ඇති වන පුරප්පාඩුවලට සාපේක්ෂව විවෘත බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වීම.
* විශ්‍රාම යාම, මිය යාම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයෙන් පහ කිරීම, පත්වීම අවසන් කිරීම, පත්වීම අවලංගු කිරීම සහ සේවය අතහැර යාම මත ඔවුන්ගේ නම් ලේඛනයෙන් කපා ඉවත් කිරීම වැනි හේතුන් මෙම පුරප්පාඩු ඇති වීමට බලපා තිබෙනවා.
* ගරු කථානායකතුමනි, පසුගිය රජයන් කාලයේ පොලිස් ස්ථාන සංඛ්‍යාව 438 සිට 608 දක්වා වැඩි කළා. හැබැයි, ඒ සඳහා අවශ්‍ය නිලධාරින් බඳවා ගත්තේ නැහැ. ඒ වාගේම යටිතල පහසුකම් වැඩිදියුණු කළේ නැහැ. මේ පුරප්පාඩු සංඛ්‍යාව වර්ධනය වෙන්න ඒකත් එක හේතුවක් වෙලා තිබෙනවා. මොකද, පොලිස් ස්ථාන සංඛ්‍යාව වැඩි කරනකොට ඊට අනුගතව නිලධාරින් බඳවා ගැනීම ඒ කාලයේ කළ යුතුව තිබුණා.

02. මෙම ප්‍රශ්නයෙන් වෙඩි තැබීම් පිළිබඳව දශකයක තොරතුරු අසා තිබෙනවා.

| අනු | වර්ෂය | 2015 සිට 2025 දක්වා මනුෂ්‍ය ඝාතන වාර්තා වීම | | | |
|---|---|---|---|---|---|
| | | වෙනත් | වෙඩි තබා | එකතුව | විසඳූ |
| 1 | 2015 | 433 | 43 | 476 | 432 |
| 2 | 2016 | 458 | 44 | 502 | 466 |
| 3 | 2017 | 419 | 33 | 452 | 419 |
| 4 | 2018 | 432 | 61 | 493 | 439 |
| 5 | 2019 | 443 | 38 | 481 | 451 |
| 6 | 2020 | 438 | 26 | 464 | 438 |
| 7 | 2021 | 500 | 22 | 522 | 497 |
| 8 | 2022 | 504 | 63 | 567 | 493 |
| 9 | 2023 | 520 | 81 | 601 | 530 |
| 10 | 2024 | 515 | 74 | 589 | 524 |
| 11 | 2025 | 495 | 102 | 597 | 489 |

සිදුවන අපරාධ අතුරින් සංවිධානාත්මක අපරාධ ලෙස හඳුනාගත් අපරාධ වෙනම ම වාර්තා කර අපරාධ වාර්තා කොට්ඨාසයේ දත්ත පද්ධතියට ඇතුළත් කරගෙන යාම ආරම්භ වී තිබෙන්නේ 2022 වර්ෂයේ. එම නිසා 2022 වර්ෂයේ සිට මේ දක්වා සංවිධානාත්මක අපරාධ මඟින් සිදුකරන ලද සිදුවීම්වල තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරනවා.

| වර්ෂය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව | මිය ගිය ගණන |
|---|---|---|---|
| | වෙඩි තැබීම් | 63 | 45 |
| 2022 | තියුණු ආයුධවලින්/ පහර දී සිදුකළ අපරාධ | 13 | 08 |
| | වෙනත් | - | - |
| **එකතුව** | | **76** | **53** |
| | වෙඩි තැබීම් | 81 | 40 |
| 2023 | තියුණු ආයුධවලින්/ පහර දී සිදුකළ අපරාධ | 21 | 14 |
| | වෙනත් | - | - |
| **එකතුව** | | **102** | **54** |
| | වෙඩි තැබීම් | 74 | 51 |
| 2024 | තියුණු ආයුධවලින්/ පහර දී සිදුකළ අපරාධ | 19 | 06 |
| | වෙනත් | 01 | - |
| **එකතුව** | | **94** | **57** |
| | වෙඩි තැබීම් | 102 | 53 |
| 2025 | තියුණු ආයුධවලින්/ පහර දී සිදුකළ අපරාධ | 17 | 09 |
| | වෙනත් | 12 | 01 |
| **එකතුව** | | **131** | **63** |
| | වෙඩි තැබීම් | 09 | 08 |
| 2026 (2026 .02.17 දක්වා) | තියුණු ආයුධවලින්/ පහර දී සිදුකළ අපරාධ | - | - |
| | වෙනත් | 03 | - |
| **එකතුව** | | 12 | 08 |
| සමස්ත එකතුව | | 415 | 235 |

03. i. නැත, මේ වන විට ශ්‍රී ලංකා පොලිසියට නිලධරයන් 10,000ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති අතර, එම තනතුරුවලට පොලිස් උපසේවයේ නීතිඥවරුන් 100ක්, වෛද්‍යවරුන් 25ක් හා සහයක සේවය සඳහා තනතුරු 1,390ක් ද ඇතුළත් වන අතර, ඊට අදාළ බඳවා ගැනීම් මෙම වර්ෂය තුළ සිදුකිරීමට නියමිතව ඇත.

ii. ශ්‍රී ලංකා පොලිසිය තුළ රාජකාරියේ නියුතුව සිටි නිලධාරින් අතුරින් මේ වන විට සේවය අතහැර ගිය නිලධාරින් 2,411ක්, වැඩ තහනම් නිලධාරින්

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

1,153ක්, විදේශ නිවාඩු ලබා සිටින නිලධාරින් 467ක්, දේශීය නිවාඩු ලබාගෙන සිටින නිලධාරින් 467ක්, සාමසාධක රජකාරි සඳහා ගිය නිලධාරින් 18ක්, ආබාධිත නිලධාරින් 4,245ක්ද ඇතුළුව අනුමත නිලධාරින් සංඛ්‍යාවට වඩා නිලධාරින් 40,890ක පමණ හිඟයක් පවතිනවා.

iii. ඉහත පරිදි ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින්ගේ හිඟයක් පැවතියද ඔවුන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් වඩාත් ඉහළ කාර්ය සාධනයක් සහිතව පවත්වාගෙන යාමට හැකි වී තිබෙනවා. එම කාර්යක්ෂමතාව හේතුවෙන් පසුගිය වසරට වඩා මත්ද්‍රව්‍ය, නීති විරෝධී ගිනි අවි හා උණ්ඩ මෙම වසර තුළ අත්අඩංගුවට ගැනීමට හැකියාව ලැබී තිබෙනවා, නිලධාරි හිඟය මධ්‍යයේ වුණත්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමස්ත හිඟය කියන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
සමස්ත හිඟය ගත්තොත්, 35,116ක් පුරප්පාඩු හැටියට තිබෙනවා. හැබැයි, පුරප්පාඩුවලට වඩා ප්‍රමාණයක් ඉන්නවා. මොකද, සමහර අය විදේශගත වෙලා තිබෙනවා, නිවාඩු පිට. ඒවාත් එක්ක ගත්තාම භෞතිකව හතළිස්දහස් ගණනක් පෙනුණාට ඇත්ත පුරප්පාඩු විධියට බඳවා ගැනීමට තිබෙන්නේ 35,116යි.

2025 වර්ෂයේ සිට 2026 වර්ෂයේ මේ දක්වා වූ කාලය තුළ සංවිධානාත්මක අපරාධවලට අදාළ අත්අඩංගුවට ගැනීම්.

| වර්ෂය | වෙඩි තැබීම් සම්බන්ධයෙන් | | තියුණු ආයුධවලින් පහරදීම්/ වෙනත් සිදුවීම් සඳහා සෘජුව සම්බන්ධ වූ | අනුබල දීම | මත්ද්‍රව්‍ය ජාවාරම හා ගිනි අවි සන්තකය | විදේශයන් තුළින් අත්අඩංගුවට ගෙන මෙරටට රැගෙන එන ලද | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙඩික්කරු | පැදිකරු | | | | | | |
| 2025 | 44 | 37 | 24 | 304 | 238 | 17 | 15 | **679** |
| 2026.02.16 දක්වා | 05 | 02 | - | 31 | 34 | 04 | 01 | **77** |
| **එකතුව** | **49** | **39** | **24** | **335** | **272** | **21** | **16** | **756** |

2024, 2025 හා 2026 යන වර්ෂ තුළ අත්අඩංගුවට ගෙන ඇති ගිනි අවි සම්බන්ධ විස්තර.

| වර්ෂය | අවි වර්ගය | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | T56 | AK47 | SMG | T81 | පිස්තෝල | රිවොල්වර | රිපීටර් | බෝර 12 | ගල්කටස් | බෙහෙත් කොටන තුවක්කු/ බඳින තුවක්කු/ වෙනත් | |
| 2024 | 24 | 0 1 | - | - | 42 | 39 | 03 | 236 | 44 | 2,025 | 2,414 |
| 2025 | 75 | - | 02 | 01 | 88 | 62 | 08 | 237 | 48 | 1,854 | 2,375 |
| 2026 | 03 | - | - | - | 04 | 10 | - | 24 | - | 177 | 218 |

2025 වර්ෂය පුරාත්, 2026 වර්ෂයේ ගත වූ මේ දින 50 තුළත්, නිලධාරින් හිඟය මධ්‍යයේ වුවත් කාර්යක්ෂම නිලධාරින් යොදවා මේ මෙහෙයුම් හරහා ඉහත සඳහන් පරිදි අත්අඩංගුවට ගැනීම් කර තිබෙනවා.

2025.01.01 දින සිට අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණයන් පහත දැක්වෙනවා.

| හෙරොයින් (kg) | අයිස් (kg) | ගංජා (kg) | කොකේන් (kg) | මත්පෙති හා මත් කරල් | සිගරට් |
|---|---|---|---|---|---|
| 2,020.168 | 4,013.563 | 15,564.788 | 43.374 | 4,875,712 | 2,157,540 |
| මෙයට අදාළව සැකකරුවන් 281,320දෙනෙකු අත් අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත. | | | | | |

2024 වර්ෂයත් එක්ක 2025 වර්ෂය සංසන්දනාත්මකව බැලුවාම අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව පහත පරිදි වනවා.

| 2024.01.01 සිට 2024.12.31 දක්වා | | | 2025.01.01 සිට 2025.12.31 දක්වා | | |
|---|---|---|---|---|---|
| හෙරොයින් (kg) | අයිස් (kg) | ගංජා (kg) | හෙරොයින් (kg) | අයිස් (kg) | ගංජා (kg) |
| 832.360 | 1,364.254 | 8,359.501 | 1,821.174 | 3,865.710 | 17,189.377 |

2025 වර්ෂය සමඟ සැසඳීමේදී 2024දී හෙරොයින් කිලෝග්‍රෑම් 832යි, 2025දී වැටලීම් වැඩි කරලා හෙරොයින් කිලෝග්‍රෑම් 1,821ක් අත් අඩංගුවට ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා. හෙරොයින් අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 1,000කින් වැඩි වෙලා තිබෙනවා. 2024 වර්ෂයේ අත්අඩංගුවට ගත් අයිස් සහ ගංජා ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් 2025දී අත්අඩංගුවට ගැනීමට සමත් වෙලා තිබෙනවා.

04. ගරු කථානායකතුමනි, මේ වන කොට ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙනවා. මම ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

i. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ඒ වාගේම අපි මෑතකදී පිහිටවපු මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය ප්‍රතිසංවිධානය කළා. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන කොට්ඨාසය, පළාත් අපරාධ විමර්ශන කොට්ඨාස ආරම්භ කරලා, එම අංශයන්හි කාර්යක්ෂමතාව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනවා.

මොන තරම් නිලධාරි හිඟයක් තිබුණත්, නව ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් ඇති කරලා, ඒ කොට්ඨාස සක්‍රිය කර තිබෙනවා; කාර්යක්ෂම කර තිබෙනවා.

ii. සංවිධානාත්මක අපරාධ හා පාතාල ජාවාරම් මර්දනය කිරීම සඳහා කලාපයේ සෙසු රටවල් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සහ එම කාර්යයන්ට අදාළව ඔවුන් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹිලා තිබෙනවා.

iii. අපරාධ හා මත්ද්‍රව්‍ය මෙහෙයුම් තීව්‍ර කිරීම හේතුවෙන් එම අපරාධ හා ජාවාරම් මෙහෙයවන පුද්ගලයන් විදේශගතව ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශන සිදු වෙමින් පවතිනවා.

iv. විදේශ රාජ්‍යයන් හා විදේශ පොලිස් ආයතන සමඟ පවත්වාගෙන යනු ලබන සබඳතා මත අපරාධ මර්දනය කිරීමේ නවීන ක්‍රම පිළිබඳ පුහුණුව ලබා දීම සඳහා ඉතිහාසයේ වැඩිම පොලිස් නිලධරයන් සංඛ්‍යාව ලෙස නිලධරයන් 550ක් විදේශීය පුහුණුව සඳහා අපි ගිය වසරේ යොමු කරලා තිබෙනවා. ඒක තමයි එක වර්ෂයක් තුළ යවපු වැඩිම නිලධාරින් සංඛ්‍යාව.

[ගරු ආනන්ද විජේපාල මහතා]

v. ඉන්දුනීසියාවේදී සිදු කරන ලද සාර්ථක මෙහෙයුමක් මඟින්, මෙරට සිදු කරන ලද අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් අපරාධකරුවන් 5දෙනෙකු අත්අඩංගුවට ගෙන මෙරටට රැගෙන ආවා.

vi. බුද්ධි අංශයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කර, සාර්ථක බුද්ධි තොරතුරු ලබා ගැනීම මඟින් සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රාශියක් මේ වනකොට අරගෙන තිබෙනවා. ඒ සමහර ක්‍රියාමාර්ග මේ සභාවට හෙළි කරන්න පුළුවන්. සමහර ඒවා සම්බන්ධයෙන් එසේ කිරීම අවශ්‍ය නැහැ කියලා මම විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි.

vii. සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ ඔවුන්ගේ සහායකයන් පිළිබඳ දත්ත පද්ධතියක් - database එකක් - පවත්වාගෙන යනවා.

viii. පොලිස් නිලධරයන් විසින් සිදු කරනු ලබන සාර්ථක වැටලීම් සඳහා ත්‍යාග මුදල් වශයෙන් රුපියල් මිලියන 1,918ක මුදලක් සහ ප්‍රශංසා ලබා දීලා තිබෙනවා.

ix. සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම් සිදු කරනු ලබන බහුතරයක් වූ අපරාධකරුවන් ත්‍රිවිධ හමුදාවෙන් පලා ගිය හෝ යුද පුහුණුව ලබා ඇති පුද්ගලයන් වන බැවින්, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් පවතිනවා.

x. සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ක්‍රියාකාරකම් මර්දනය කිරීම සඳහා පවතින නීතිමය අඩුපාඩු මඟ හරවා ගැනීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරීම.

xi. අපරාධකරුවන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් උපයා ගන්නා ලද ඉතිහාසයේ වැඩිම දේපළ ප්‍රමාණය තහනම් කරලා තිබෙනවා; රාජසන්තක කරලා තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඊට අදාළව දීර්ඝ ලේඛනයක් තිබෙනවා. එම ලේඛනය ඇමුණුම 02 වශයෙන් **සභාගත*** කරනවා.

xii. අපරාධකරුවන්ගේ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ක්‍රියාකාරකම් මර්දනය කිරීමේදී දේශපාලන බලපෑමක් හෝ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා කිසිදු අනුග්‍රහයක් ලබා නොදෙන පරිසරයක් අපි මේ වනකොට පොලීසියට නිර්මාණය කර දීලා තිබෙනවා. කිසිදු දේශපාලන අනුග්‍රහයක්, බලපෑමක් නැහැ මේ කාරණයේදී. විශේෂයෙන්ම මෙම මෙහෙයුම් ඉතා ස්වාධීනව කරන්න අවශ්‍ය වටපිටාව සකස් කර දීලා තිබෙනවා.

xiii. ත්‍රිවිධ හමුදාවට, පොලීසියට හෝ දේශපාලනයට සම්බන්ධ පුද්ගලයන් විසින් සිදු කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කිසිදු අයුරකින් අපි පසුබට වෙන්නේ නැහැ. ඕනෑම තරාතිරමක පුද්ගලයෙක් නීතියේ රැහැනට හසු කරගෙන ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න අපි කිසිසේත් පසුබට වෙන්නේ නැහැ. එම කාරණා ශක්තිමත් කර තිබෙනවා.

xiv. පොලිස් නිලධරයන්හට ගෙවනු ලබන වැටුප් හා දීමනා යම් පහළ මට්ටමක පවතින බැවින්, එම වැටුප් හා දීමනා ඉහළ නැංවීමට ඇති හැකියාව සම්බන්ධයෙන් මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරලා සොයා බැලීමක් කරමින් පවතිනවා.

xv. ශ්‍රී ලංකා පොලීසිය සහ මහජන සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා පොලිස් නිලධරයන් ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් 2025.10.25 දින නිකුත් කරන ලද පොලිස්පති චක්‍රලේඛ අංක 2578/2023 (ll) සහ පාලන චක්‍රලේඛ අංක 07/2023 (ll) යටතේ පිහිටුවන ලද මහජන ආරක්ෂක කමිටු ක්‍රමවත් හා විධිමත්ව පවත්වා ගෙන යාම මඟින් එහි කාර්යක්ෂමතාව වැඩි කිරීමට කටයුතු කරමින් තිබෙනවා.

xvi. තෝරාගත් ප්‍රබල සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් හඹා යාම සඳහා සහ ඔවුන් පිළිබඳ විමර්ශන කටයුතු සඳහා පොලිස් විශේෂ කාර්ය බලකායේ වෙන් වෙන් වූ කණ්ඩායම් පත් කර තිබෙනවා. සංවිධානාත්මක අපරාධ කල්ලි හඳුනා ගෙන එක් එක් කල්ලි පසුපස හඹා යාම සඳහා මේ වන විට STF කණ්ඩායම් 17ක් යොදවා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම පසුගිය දවසකත් කිව්වා, අකුරේගොඩ සිද්ධිය ගැන. එය හුදකලා සිදුවීමක් බව කියමින් මා ඒ ගැන පැහැදිලි කළා. මොකද, අපරාධ සිද්ධි විවිධ ආකාරයෙන් වෙනවා. සංවිධානාත්මක අපරාධකරුවන්, සංවිධානාත්මක අපරාධ කල්ලි විශාල ප්‍රමාණයක් ඉන්නවා. සක්‍රිය කල්ලි ඉන්නවා, අක්‍රියව ක්‍රියාත්මක වන කල්ලි ඉන්නවා. ඒ අය අතර ඇති වන සමහර ගැටුම් හේතුවෙන් සහ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඇති වන සට්ටන හේතුවෙන් යම් යම් සිද්ධීන් වෙනවා. ඒ සියල්ල තැන තැන සිද්ධ වුණත්, ඒ සියල්ල එකිනෙකට සම්බන්ධ නොවුණත්, පාතාල ක්‍රියාකාරකම් හැටියට තමයි අපට මේ වන විට විමර්ශනවලින් අනාවරණය වෙලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, පිළිතුර කෙටි කරන්න හැකියාවක් නැහැ. මට කාලය අවශ්‍යයි. ගරු විපක්ෂ නායකතුමා දීර්ඝ පිළිතුරක් දිය යුතු ප්‍රශ්නයක් අසා තිබෙන්නේ. හැම දාම අපට විනාඩියක් දෙකක් අරගෙන මේවාට උත්තර දෙන්න හැකියාවක් නැහැ. ඒ නිසා පැයක් දෙකක් ගන්න වෙනවා, මේ කාරණයට. ගරු කථානායකතුමනි, මෙයට උත්තරයක් සැපයිය යුතුමයි.

මා මුලින් සඳහන් කළා වාගේ, තෝරාගත් ප්‍රබල සංවිධානාත්මක අපරාධකරුවන් හඹා යාම සඳහා විශේෂයෙන්ම STF එකේ කණ්ඩායම් 17ක් මේ වන විට ස්ථාපිත කර, අපරාධකරුවන් - එක් එක් කණ්ඩායම් - පසුපස හඹා යන ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා. ඒවා සක්‍රියව ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

xvii. සංවිධානාත්මක අපරාධකරුවන් පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම හා ඇඟිලි සලකුණු සටහන් දත්ත එම දත්ත පද්ධතිය තුළ ස්ථාපිත කර තිබෙනවා.

xviii. ශ්‍රී ලංකා පොලීසිය හා බන්ධනාගාරය එක්ව සතිපතා සාකච්ඡා පවත්වමින්, බන්ධනාගාරය ආශ්‍රිතව සිදු වන අපරාධ මැඩලීම සඳහා පියවර ගැනීම හා බන්ධනාගාර තුළින් සොයා ගන්නා ලද ජංගම දුරකථන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත්, බුද්ධි අංශවලටත්, රාජ්‍ය බුද්ධි සේවාවන්වලටත් යොමු කරලා ඒවා විශ්ලේෂණය කිරීමේ කටයුතු මේ වන කොට සිදු කරමින් පවතිනවා.

xix. ත්‍රිවිධ හමුදාව සමඟ සම්බන්ධීකරණය වෙමින් විශේෂ සෝදිසි මෙහෙයුම් නිරන්තරයෙන් සිදු කරනවා.

xx. නාවික තාක්ෂණය හා WhatsApp මෘදුකාංගය භාවිත කරමින් දිවයිනේ සිදු වන අපරාධවලට අදාළ තොරතුරු ක්ෂණිකව සියලු පොලිස් ස්ථාන වෙත දැනුම් දීමට කටයුතු කර තිබෙනවා. එමඟින් සියලු කොට්ඨාස සම්බන්ධීකරණය කර තිබීම හා එමඟින් ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට විශේෂ පහසුකමක් සලසා දීම සිදු කර දී තිබෙනවා.

xxi. ජාත්‍යන්තර පොලීසිය මඟින් මේ වන විට දිවයිනෙන් බැහැරව සිටින සැකකරුවන් හා චූදිතයන් 225දෙනෙකු වෙනුවෙන් ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන නිකුත් කර තිබෙනවා. දිවයිනෙන් බැහැරව සංවිධානාත්මක අපරාධකරුවන් 91දෙනෙක් ඉන්නවා. එම 91දෙනා වෙනුවෙන් ජාත්‍යන්තර පොලීසිය හරහා රතු නිවේදන නිකුත් කර තිබෙනවා.

xxii. නඩු පවරා නොමැති විදේශගත සැකකරුවන් 95දෙනෙකු සඳහා ජාත්‍යන්තර පොලිස් නිල නිවේදන ප්‍රසිද්ධියට පත් කර තිබෙනවා.

xxiii. 2024.09.21වන දිනෙන් පසුව ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන මත මෙරටට සැකකරුවන් 20දෙනෙක් රැගෙන ඇවිත් තිබෙනවා.

xxiv. 2024.09.21වන දිනෙන් පසුව ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන නොමැතිව රාජ්‍ය තාන්ත්‍රික සහයෝගිතාව මත මෙරටට පිටුවහල් කරන ලද සැකකරුවන් සංඛ්‍යාව 12යි.

xxv. මේ වන විට ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන නිකුත් කර ඇති සැකකරුවන් 31දෙනෙකු ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, රුසියාව, ප්‍රංශය, කැනඩාව හා තායිලන්තය වැනි රටවල රැඳී සිටින බවට හඳුනාගෙන තිබෙනවා. ඔවුන්ගෙන් කොටසක් දැනට එම රටවල අත්අඩංගුවේ පසු වනවා. එබැවින් එම රටවල් සමඟ සම්බන්ධීකරණය වෙමින් ඔවුන් කඩිනමින් ඒ රටවලින් මෙරටට පිටුවහල් කරවා ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග මේ වන විට ගෙන තිබෙනවා; ඒ සඳහා ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

xxvi. ජාත්‍යන්තර පොලිස් රතු නිවේදන මත විදේශීය රටවල් මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංවිධානාත්මක අපරාධකරුවන් 11දෙනෙකු වෙනුවෙන් උද්ර්පණ ඉල්ලීම් යොමු කර තිබෙනවා.

xxvii. මෙසේ එම සැකකරුවන් ප්‍රධාන වශයෙන් රැඳී සිටින රටවල් වන එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තායිලන්තය, මැලේසියාව, ඉන්දියාව වැනි රටවල නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ සම්බන්ධ වී මෙම කටයුතු කඩිනමින් සම්බන්ධීකරණය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ නිලධාරියකු බැගින් යොමු කිරීමට මේ වන කොට පොලීසිය කටයුතු කරමින් සිටිනවා.

xxviii. සංවිධානාත්මක අපරාධකරුවන් මෙරටින් පලා යෑම වැළැක්වීමට ඔවුන් හඳුනා ගැනීම සඳහා ගුවන් තොටුපළ තුළ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. නවීන තාක්ෂණය සමඟින් එය තවදුරටත් පුළුල් කිරීමේ කටයුතු සූදානම් කරමින් තිබෙනවා.

xxix. ගුවන් තොටුපොළ පර්යන්තයට යාබදව සවිකොට ඇති මුහුණු හඳුනාගැනීමේ ස්වයංක්‍රීය කැමරා පද්ධතිය යාවත්කාලීන කිරීම සහ මෙම පද්ධතිය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට මේ වන විට කටයුතු යොදමින් තිබෙනවා.

ඒ අනුව පොලීසියත්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවත්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධව මේ මුහුණු හඳුනා ගැනීමේ ස්වයංක්‍රීය කැමරා පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සඳහා මේ වනකොට කටයුතු කරමින් තිබෙනවා.

05. විපක්ෂ නායකතුමා මෙම ප්‍රශ්නයෙන් අහන්නේ, පසුගිය කාලයේ රජයේ පොරොන්දුවක් වුණු මාධ්‍යවේදීන්ගේ ඝාතන සහ දේශපාලනඥයින්ගේ ඝාතන සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න කියන එක. ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් වූ යම් විමර්ශන ප්‍රමාණයක ප්‍රගතිය මා ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

1. 2006.11.10 දින පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතා සහ ඔහුගේ ආරක්ෂක නිලධාරි - පොලිස් කොස්තාපල් 30636- ඝාතනය කිරීම හා සම්බන්ධ විමර්ශනය - දැනට මෙම විමර්ශනය සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණ අංක 1හි 8331/16 යටතේ චූදිතයන් හත්දෙනෙකු වෙත චෝදනා ගොනු කරලා තිබෙනවා. 2016.11.22 දින නඩුව කැඳවීමෙන් පසු විශේෂ ජූරි සභාවක් ඉදිරියේ පුරා මාසයක කාලයක් නඩුව විභාග කිරීමෙන් පසුව, ජූරි සභාවේ ඒකමතික තීරණය අනුව 2016.12.23වන දින 01 සිට 06 දක්වා වූ සැකකරුවන් සියලුම චෝදනාවලින් නිදොස් කොට නිදහස් බවට තීන්දුවක් ලබා දීලා තිබෙනවා. 07වන සැකකරු පළමුවන අවස්ථාවේදීම සාක්ෂි නොමැති බැවින් නීතිපති උපදෙස් මත නිදොස් කොට නිදහස් කරලා තිබෙනවා. ඉහත තීන්දුවට එරෙහිව ගරු නීතිපතිතුමා විසින් අංක CA(PHC)APN 11/17 යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එම නඩුව ඉදිරියේදී කැඳවීමට නියමිතව තිබෙනවා.

2. ඒ වාගේම 2010.01.24වන දින මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩ මහතා ශ්‍රී ලංකා යුද හමුදාවේ බුද්ධි අංශයේ නිලධාරීන් විසින් පැහැර ගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධ පරීක්ෂණය - කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු අංක 725/19 යටතේ අධිචෝදනා ගොනු කරලා තිබෙනවා. ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් පත් කිරීමට නියමිතව තිබෙනවා. නඩුව විභාග වෙමින් පවතී. ඉදිරි නඩු දිනය 2026.05.04වන දින.

[ගරු ආනන්ද විජේපාල මහතා]

3. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කිරීම - සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙනවා. 2020.02.11වන දින CR 140/20 යටතේ ගරු නීතිපතිතුමා වෙතට උද්ධෘත යොමු කරලා තිබෙනවා. ගල්කිස්ස මහාධිකරණයේ බී. 92/09 දරන නඩුව 2026.02.27දින කැඳවීමට නියමිතව තිබෙනවා.

4. 2012.05.17 දින අලුයම් කාලයේදී නාරාහේන්පිට පොලිස් වසමේ පාර්ක් පාර, ශාලිකා ක්‍රීඩාංගණය අසලදී ප්‍රවීණ රගර් ක්‍රීඩක මොහමඩ් වසීම් තාජුඩීන් යන අය කාර් රථයක් තුළ සැක කටයුතු ලෙස පිළිස්සී මිය යාම හා සම්බන්ධ විමර්ශනය - සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, ඉදිරි නීතිමය පියවර ගැනීම සඳහා සිදු කරන ලද සියලු විමර්ශනයන්ට අදාළ විමර්ශන උද්ධෘත ගොනුවක් සකස් කර යොමු අංක CR1/111/15 CM යටතේ ගරු නීතිපතිතුමා වෙත යොමු කරලා තිබෙනවා.

එම විමර්ශන උද්ධෘත පරිශීලනය කිරීමෙන් පසුව ගරු නීතිපතිතුමා විසින් පළමුවන සැකකරු වන අංගොඩගේ දොන් සුමිත් ධම්මික පෙරේරා යන අය මෙම නඩුවේ රජයේ සාක්ෂිකරුවකු ලෙස නම් කරලා ඔහු මෙම නඩු කෘත්‍යයෙන් නිදහස් කර තිබෙනවා. මෙම නඩුවේ දෙවන සහ තෙවන සැකකරුවන් වන තෝල්ක මුදලිගේ අනුර සේනානායක සහ වෛද්‍ය ආනන්ද සමරසේකර යන අයවලුන්ට විරුද්ධව ගරු නීතිපතිතුමා විසින් පිළිවෙළින් කොළඹ මහාධිකරණයේ නඩු අංක 352/19 හා 634/19 යටතේ අධිචෝදනාපත් ගොනු කොට ඇති අතර, මෙම නඩු විභාග වීමට පෙර ඉහත නම් සඳහන් චූදිතයින් දෙදෙනා මිය යාම හේතුවෙන් ගරු අධිකරණය විසින් නඩු කටයුතු අවසන් කර තිබෙනවා. මේ හා සම්බන්ධ කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 849/12/03 දරන නඩුව 2025.08.28වන දින කැඳවා, 2026.02.06 දිනට කල් තබා තිබෙනවා. එදිනට සිද්ධිය සම්බන්ධව ගරු නීතිපතිතුමාගේ ස්ථාවරය ගරු අධිකරණය වෙත දැනුම් දීමට නියමිතව තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මට තවත් පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි, පසුගිය දිනක සිදු වූ අවාසනාවන්ත ඝාතනය සම්බන්ධයෙන්.

2026.02.13 දින අකුරේගොඩදී වෙඩි තබා ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - අපරාධය සිදු වූ දිනය 13වැනි දා. අපරාධය සිදු වූ වේලාව පැය 16ත්, 17ත් අතර. තලංගම පොලිස් බල ප්‍රදේශයට අයත් අකුරේගොඩ ප්‍රදේශයේ පිහිටි කීල්ස් සුපර් සුපිරි වෙළෙඳ සැල ඉදිරිපිට තමයි මෙම සිදුවීම වුණේ. අපරාධය සිදු වූ රථය තමයි, CBM-6040 දරන Toyota Yaris කාර් රථය. මරණකරුවන්, බුද්ධික මල්ලවආරච්චි, බක්මීගහ පාර, අතුරුගිරිය සහ නිසංසලා මාලි මහත්මිය. නඩු අංකය, කඩුවෙල මහෙස්ත්‍රාත් උසාවිය 7516/26. විශේෂයෙන් මේ වනකොට මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර, ඒ සඳහා පොලිස් කණ්ඩායම් 12ක් යොදවා තිබෙනවා.

අපරාධය සඳහා වෙඩික්කරුවන් පැමිණි වාහනය වූ KI-7738 දරන මෝටර් රථය බද්දේගම ප්‍රදේශයේදී ගිනි තබා විනාශ කර තිබියදී අත්අඩංගුවට ගෙන තිබෙනවා. අපරාධය සඳහා ගිනි අවි ලබා දීමට පැමිණි අංක KS-8987 දරන රථය කොට්ටාව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන තිබෙනවා. වෙඩික්කරුවන් අපරාධය සිදු කිරීමට ප්‍රථම නවාතැන්පොළ වෙත කැඳවාගෙන පැමිණි අංක KW-8733 දරන රථය අත්අඩංගුවට ගැනීමට විමර්ශන කටයුතු ආරම්භ කර තිබෙනවා. එහි හිමිකරු මේ වනකොට හඳුනාගෙන තිබෙනවා. ඒ වාගේම ගිනි අවි ප්‍රවාහනය කර වෙඩික්කරුවන් වෙත ලබා දුන් සනෝජ් කෝකිල ලියනආරච්චි යන පුද්ගලයා මේ වනකොට අත්අඩංගුවට අරගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. ගිනි අවි ප්‍රවාහනය කර වෙඩික්කරුවන් වෙත ලබා දුන් දෙවැනි සැකකරුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. තුන්වැනි සැකකරු වන්නේ හපුආරච්චිගේ දොන් ඩිලීන ප්‍රමෝද හපුආරච්චි නොහොත් "ඩිලා" නමැති පුද්ගලයායි. ඉහත අංක 1 සහ 2 යන සැකකරුවන් වෙත මෝටර් රථයක් කුලියට ලබාගෙන ප්‍රවාහන කටයුතු මෙහෙය වූයේ මේ පුද්ගලයායි. මේ පුද්ගලයා දැන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම මෙම අපරාධය සිදු කිරීම සඳහා රිවෝල්වර් වර්ගයේ ගිනි අවියෙන් වෙඩි තැබීම සිදු කරන ලද සැකකරු අංක 102/9, පන්සල පාර, මීවල, රුක්ගහවිල යන ලිපිනයෙහි පදිංචි රුබස් සුරේෂ් යන අය බවට මේ වනකොට හඳුනාගෙන තිබෙනවා. ඔහු අත්අඩංගුවට ගැනීමට මේ වනකොට පුළුල් විමර්ශන ආරම්භ කර තිබෙනවා, ගරු කථානායකතුමනි. වෙඩික්කරුවන් අපරාධය සිදු කිරීමට ප්‍රථම නවාතැන්පොළ වෙත කැඳවාගෙන පැමිණි අංක KW-8733 දරන රථයේ හිමිකරු වන 'රසික' නිවස, පරණ කොලනිය, ඇත්කඳුර, ගාල්ල ලිපිනයේ පදිංචි වන්නිආරච්චිගේ සිහින දිල්සර යන අය බවට තොරතුරු අනාවරණය කරගෙන තිබෙනවා. ඒ අනුව, එම සැකකරු සහ කාර් රථය අත්අඩංගුවට ගැනීමට මේ වනකොට පුළුල් විමර්ශන ආරම්භ කර තිබෙනවා.

විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධකරුවකු හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන "ටුටු" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන උග්ගල්ල ආරච්චිගේ තරිඳු මධුශංක නමැති අය විසින් මෙම අපරාධය මෙහෙයවා ඇති බවට මෙතෙක් සිදු කරන ලද විමර්ශනයේදී තොරතුරු අනාවරණය කරගෙන තිබෙනවා. පොලිස් කණ්ඩායම් මේ වනකොට මේ සම්බන්ධයෙන් පුළුල් විමර්ශන දියත් කර මේ වෙඩික්කරුවන් අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පැහැදිලි කර ගැනීමට පෙර පුංචි ඉල්ලීමක් කරනවා, අපේ අනිල් ජයන්ත ඇමතිතුමාගෙන්. ගරු ඇමතිතුමනි, ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ලබා දෙන දීමනාව මේ මාසයේත් පරක්කු වෙලා තිබෙන්නේ. ගිය මාසයේත් 10වැනි දාත්, 15වැනි දාත් අතර ලබා දෙන්න ඕනෑ මෙම දීමනාව 26වැනි දා තමයි දීලා තිබෙන්නේ. මේ මාසයේත් තවම එම දීමනාව ලබා දී නැහැ. කරුණාකර ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කර ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ලබා දෙන එම දීමනාව කලට වේලාවට ලබා දෙන්න කටයුතු කරන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මගේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමා සවිස්තර පිළිතුරක් ලබා දුන්නා. සවිස්තර පිළිතුරට සමගාමීව සවිස්තර පැහැදිලි කර ගැනීමකටත් ඉඩ ලැබෙයි කියා මා බලාපොරොත්තු වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කෙටි පැහැදිලි කර ගැනීමක් කරන්න. සවිස්තර පිළිතුරක් ලැබෙනකොට පැහැදිලි කර ගැනීම කෙටි කර ගන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එහෙම බැහැ නේ, වෙලාව තිබෙනවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලැබුණා. සවිස්තරාත්මක පැහැදිලි කරගැනීමකටත් ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න. ඔබතුමාට දෙවිධියකට මන්ත්‍රීවරුන්ට සැලකීමේ අවස්ථාවක් නැහැයි කියන එකත් මම මතක් කර දෙන්න කැමැතියි. ඒක රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වාගේම මගේ මූලික අයිතිවාසිකම් ද උල්ලංඝනය කිරීමක්. ඔබතුමාට හිතුණු හිතුණු ආකාරයට රාජ්‍ය පාර්ශ්වයට වැඩි විනාඩි ගණනකුත්, මට අඩු විනාඩි ගණනකුත් ලබා දෙන්නට හැකියාවක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අතුරු ප්‍රශ්න අහන්න බැහැ නේ, පැහැදිලි කර ගැනීමක් කරන්නේ. ඔබතුමා කියනවා නම් මම අතුරු ප්‍රශ්න අහන්නම්. බොහොම ස්තුතියි. *[බාධා කිරීමක්]* තව අහන්නම්. ඔබතුමා දැන් මට අවසර දුන්නා නේ, අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමා පැහැදිලි කර ගැනීම කර ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අතුරු ප්‍රශ්න ඇසීම ද, පැහැදිලි කර ගැනීම ද, මොකක්ද අහන්න පුළුවන්?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීම කරගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හැබැයි, මට ඒ අවස්ථාව ලබා දෙන්න. ගරු අමාත්‍යතුමාට ඒ කාල වේලාව ලබා දුන් එක හොඳයි. ඊට සමගාමීව මටත් අවස්ථාව ලබා දෙන්න.

ගරු ඇමතිතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පළමුවෙන්ම මට ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්නට අවශ්‍යයි. විශේෂයෙන්ම 35,116ක් පුරප්පාඩු තිබෙන තත්ත්වයක් තුළ 10,000ක් බඳවා ගැනීමට කටයුතු කරන්න ඔබතුමන්ලා මුල පුරනවාය කියලා ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා. ඇත්තවශයෙන්ම වර්තමානයේ රට තුළ තිබෙන නීතිය හා සාමය පිළිබඳව බැලුවාම, මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය බැලුවාම; යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට, නීතියේ ආධිපත්‍යයට, ඒ වාගේම ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් එල්ල වෙලා තිබෙන මොහොතක, මම ඔබතුමාට මේ යෝජනාව කරන්න කැමැතියි. අපිත් මේ වෙනුවෙන් අපේ සහයෝගය ලබා දෙන්නම්. මේ 35,116ක් පුරප්පාඩු තිබෙන තැනක 10,000ක් නොව, ඊට වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමේ ක්‍රියාවලියකට යොමු වෙන්නය කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ඒ වාගේම, විශේෂයෙන්ම ඔබතුමන්ලා ස්ථාපනය කරපු මහජන ආරක්ෂක කමිටු හරහා ලොකු කාර්යභාරයක් ඉෂ්ට සිද්ධ කරනවාය කියලා ඔබතුමාගේම පිළිතුරේ ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම ඔය community policing, ඒ කියන්නේ ප්‍රජාව කේන්ද්‍රීය කර ගත් ආරක්ෂක ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කිරීම කියන එක ගත්තොත්, ඒක ලෝකයේ පිළිගත්ත සාර්ථක ක්‍රියාදාමයක්. හැබැයි ඔබතුමාගේ පිළිතුරේම කිව්වා, මේ අපරාධකරුවන් හඹායෑමේ ක්‍රියාවලියක ඔබතුමන්ලා රජයක් හැටියට නියැළී සිටිනවාය කියලා. ඒක හොඳයි. අපරාධකරුවන් හඹායෑමේ, අපරාධකරුවන් අල්ලා ගැනීමේ, ඒ අයට දඬුවම් කිරීමේ ක්‍රියාවලියට අපේ පූර්ණ සහයෝගය තිබෙනවා. කනගාටුවෙන් වුණත්, මම මේ අවස්ථාවේදී ඔබතුමාට මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමන්ලා අපරාධකරුවන් හඹායෑමේ ක්‍රියාවලිය විතරක් නොවෙයි, මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන් පසුපස හඹා යෑමේ ක්‍රියාවලියකුත් ක්‍රියාත්මක කරනවා නේ, ගරු ඇමතිතුමා. මම මේ ගැන බොහොම සද්භාවයෙන් නම් ගම් එක්කම මේ පාර්ලිමේන්තුවේ සඳහන් කළා, යසන්ත ආරියසේන කියන මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිතුමා,- පොලිස් වාර්තාවක් ලබා ගැනීම සඳහා දැන් මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්ගෙන් චරිත සහතිකයක්, නිර්දේශයක් ගන්න සිද්ධ වෙලා තිබෙනවා. රජය කිව්වා, "නැහැ, එහෙම දෙයක් නැහැ" කියලා. හැබැයි, අද රටේ බොහෝ බලප්‍රදේශවල - හැම එකකම කියලා මම කියන්නේ නැහැ- මහජන ආරක්ෂක කමිටුවල තනතුරු ලබා දී තිබෙන්නේ පක්ෂග්‍රාහීවයි. පක්ෂග්‍රාහීව මහජන ආරක්ෂක කමිටුවල සංයුතිය නිර්මාණය වෙනකොට, අපරාධකරුවන් අල්ලා ගැනීමේ ක්‍රියාවලියට ඒක ඉමහත් බාධාවක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sajith Premadas, you may continue.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, මගේ ගරු කථානායකතුමනි. මොකද, මම ඔබතුමාව සලකන්නේ මගේ කථානායකතුමා හැටියටයි.

මම මේ අවස්ථාවේදී ගරු අමාත්‍යතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. අමාත්‍යතුමනි, ඇත්තවශයෙන්ම අපරාධකරුවන් හඹා යෑම, අපරාධකරුවන්ට දඬුවම් කිරීම ගැන කිසිම විරෝධතාවක් අපේ නැහැ. ඒ දේ රටේ නීති රාමුව තුළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ. නමුත්, ඊට අමතරව මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරු චරිත සහතික ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මම මේ සභාවේදී හෙළිදරව් කළාට පස්සේ, ඒ අයව CID එකට කැඳවා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, චරිත සහතික ගත්ත තෙවුනි ජයවර්ධන, සකුෂා රොෂානි යන අයවත් CID එකට කැඳවා තිබෙනවා. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ තත්ත්වයට යන්න එපා කියලා. ඒක වැරැදියි. ඔබතුමන්ලාගේ වගකීම අපරාධකරුවන් ඇල්ලීම මිස, මේ චරිත සහතික ලබා දුන්නාය කියන කාරණාව මත මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවීම නොවෙයි. චරිත සහතික ගත්ත අයවත්, මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්වත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවලා ඒ අයට විරුද්ධව කටයුතු කිරීම නොවෙයි, ඇත්ත වශයෙන්ම යුතුකම වී තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මේ කාරණයත් මම ඔබතුමාට කියන්න කැමැතියි. විශේෂයෙන්ම අපරාධ ක්‍රියාත්මක වීම - සමාජය තුළ මිනීමැරුම්, මිලේච්ඡත්වය වර්ධනය වෙමින් තිබෙන තත්ත්වයක් තුළ- ඔබතුමාට තව අලුත් විධියකට නීතිය හා සාමය ස්ථාපනය කරන්නට, ඒ වාගේම රට තුළ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කරන්නට, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්නට අලුත් වැඩ පිළිවෙළකට යොමු වන්නට සිද්ධ වෙනවාය කියලා මම හිතනවා. මොකද, ඒ තරමටම අපරාධ ප්‍රවර්ධනය වෙලා තිබෙනවා. ඒ තරමටම මිනිස් ඝාතන - මිනී මැරුම් -, මිලේච්ඡත්වය නිර්මාණය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා අලුත් වැඩ පිළිවෙළකට යොමුවන්න, ප්‍රජා කේන්ද්‍රීය ආරක්ෂක වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන්, චරිත සහතික ලබාගත් අයව CID එකට කැඳවන්න එපා. ඒකෙන් කිසිම පලක් නැහැ. ඒ අය කරපු අපරාධයක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා එම කරුණු කාරණා පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අපේ පැත්තෙන් මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්නට, මහජනතාවගේ ආරක්ෂාව ශක්තිමත් කරන්නට, ඒ වාගේම ජාතික ආරක්ෂාව ශක්තිමත් කරන්නට අපිට ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. මොකද, අපට මිනිස් ජීවිත වටිනවා. මිනිස් ජීවිත ආරක්ෂා කිරීම, රටේ ආරක්ෂාව තහවුරු කිරීම සහ නීතිය හා සාමය ශක්තිමත් කිරීම තමයි පක්ෂ, විපක්ෂ අප සියලුදෙනාගේම වගකීම. ගරු ඇමතිතුමනි, ඒ නිසා අලුත් වැඩ පිළිවෙළකට යොමු වෙන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ අලුත් වැඩ පිළිවෙළට යොමු වෙනකොට සමාජය ජාති, ආගම්, කුලමල, පන්ති, පක්ෂවලට බෙදෙන්නේ නැතුව මේ හැමෝම එකතු කර ගත්තොත් තමයි අපරාධකරුවන්ගේ සුලමුල, අපරාධකරුවන් කරන ක්‍රියාදාමය, අපරාධකරුවන් ඒ අපරාධ නිර්මාණය කරන ආකාරය පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගන්නට පුළුවන් වන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් එම ඉල්ලීම කරමින්, පිළිතුරු ලබා දෙන්නට ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ සඳහා කාලය ලබා දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
වෙලාව දුන්නා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වෙලාව දුන්නා, වෙලාව දුන්නා. වෙලාව ලබාගත්ත ආකාරය මම කියන්නම්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. මගේ කථානායකතුමා මුලසුනේ සිටින නිසාත්, සභානායකතුමා වෙනුවට ඔබතුමා සිටින නිසාත් වෙලාව ලබා ගත්තා. මොනවා වුණත් අමාත්‍යවරයාට අහගෙන ඉන්න හැකියාව තිබෙනවා නේ. අහලා උත්තර දෙන්න එතුමාට හැකියාව තිබෙනවා. නොහැකියාවෙන් පෙළෙන කට්ටිය තමයි පැනලා දුවන්නේ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් එතුමාට අවස්ථාව දෙන්න. එතුමාට උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපරාධ විමර්ශන කටයුතු පිළිබඳව තොරතුරු රාශියක් මහජන ආරක්ෂක ඇමතිතුමා සතුව පවතින නිසා, ඒ තොරතුරුවලින් යම් ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න තමයි එතුමා කාලය ගත්තේ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා වෙලාව ගන්නකොට අපරාධකරුවන් ගැන එතුමා නොදන්න තොරතුරු ප්‍රමාණයක් ඔබතුමා කියාවි කියලා මම හිතුවා. එහෙම දෙයක් නොවෙයි වුණේ නේද? *[බාධා කිරීම්]* තව තොරතුරු තිබෙනවා නම් එතුමා වෙලාව අරගෙන ඒවා ඉදිරිපත් කරාවි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ananda Wijepala, you may respond now.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, *[බාධා කිරීම්]* විශේෂයෙන්ම මට පිළිතුරු සපයන්න හැකියාව තිබෙන්නේ මේ විමර්ශන ආශ්‍රයෙනුයි. ඒ හැර වගකීම් විරහිතව කිසිදු කාරණාවක් මේ සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් මට නැහැ. ඒ වාගේම, විපක්ෂයට ඕනෑ පිළිතුර ලබා දීමේ කිසිදු හැකියාවකුත් මට නැහැ. මේ කාරණයේදී රජයට උදවු කරන්න, පාතාල ක්‍රියාකරුවන් මර්දනය කරන්න ඉදිරිපත් වීම සහ ඒ සම්බන්ධයෙන් මේ සභාවේ ප්‍රකාශ කිරීම යන කරුණු පිළිබඳව විශේෂයෙන් ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාට ඒ සඳහා හැකියාවක් තිබෙනවා, මාර්ග රාශියකුත් තිබෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ පක්ෂයේ මේවාට සම්බන්ධ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉන්නවා. මම උදාහරණ වශයෙන් ලැයිස්තුවක්

නොකියා කරුණු දෙකක් විතරක් කියන්නම්. "රත්ගම විදුර" කියන පාතාල ක්‍රියාකරු සමඟ සම්බන්ධතා පවත්වන මන්ත්‍රීවරු ඉන්නවා. ඔවුන්ගේ නෑදෑයෝ ඉන්නවා; මස්සිනාලා ඉන්නවා. "කොස්ගොඩ සුජී"ගේ නංගි සජබයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක්. ඒ අය හරහාත් මේ වාගේ ඝාතනවලට සම්බන්ධ වන පිරිස් ඉන්නවා කියලායි මම කියන්නේ. කාගේ වුණත් ඒ ජීවිත අහිංසක ජීවිත. කිසිදු ජීවිතයක් අහිමි වීමට ඉඩකඩ නොතබන තත්ත්වයට අපි වැඩ කරමින් සිටිනවා කියලා මම කියනවා. හැබැයි නැවත නැවත එය සිදු වෙනවා. මේවා හුදෙකලා සිද්ධි කියලා කිව්වාට, හුදෙකලා සිද්ධිම නොවෙයි. මේවා තැන තැන සිද්ධ වෙනකොට අපි ඒවා වෙනම වෙන් කරලා ගත්තාට මේවායේ යම් පොදු සාධක ප්‍රමාණයකුත් තිබෙනවා. අපි මේ පිළිබඳව ගැඹුරු විමර්ශනයක් කරමින් තිබෙනවා. ඒ හින්දා ඔබතුමන්ලාටත් පුළුවන්, ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂවල එවැනි අය ඉන්නවා නම් ඉවත් කර ගන්න. ඒ අයට පණිවුඩ යවන්න පුළුවන්, ඝාතන සිදු කරන්න එපා කියලා. මම මේ රටේ ජනතාවටත් කියනවා, මේ පාතාල ක්‍රියාකාරකම් මර්දනය කිරීම සඳහා, මත්ද්‍රව්‍ය උවදුර මර්දනය කිරීම සඳහා අපි මොන තරම් පරිශ්‍රමයක්, වෙහෙසක් දරනවාද, ඒ වෙනුවෙන් අපි මොකක්ද කරන්නේ කියන එක ගැන හොඳ අවදියෙන් ඉන්න කියලා. ඒක අවංකව තේරුම් ගන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, ඒ වාගේම ඔබතුමා අහන්නේ ප්‍රශ්න, මම ලබා දෙන්නේ පිළිතුරු. එලෙස මම පිළිතුරු ලබා දෙන්නේ විමර්ශන ආශ්‍රයෙන්. එතකොට ඒ සඳහා විශාල කාලයක් ගන්න අවශ්‍ය වනවා. ඒක තමයි මම කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දෙවන වතාවටත් විමසීමක් කළා, පොලීසියේ පුරප්පාඩු 35,116ක් තිබෙනකොට 10,000ක් බඳවා ගැනීම ගැන. ගරු විපක්ෂ නායකතුමනි, අපි මේ බඳවා ගැනීම් අඛණ්ඩව සිද්ධ කරනවා. දැනට 10,000ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබිලා තිබෙනවා. මේ වනකොට 1,500ක් තෝරා අවසන්. ඉදිරි සති දෙක ඇතුළත Police Training Schools, නැත්නම් PTSs 5කට මේ අය යොමු කරනවා. SIsලා, එහෙම නැත්නම් උප පොලිස් පරීක්ෂකවරු 200ක් තෝරාගෙන අවසන්. මේ දවස්වල ඒ අය වෛද්‍ය පරීක්ෂණවලට භාජන කරමින් සිටිනවා. පොලිස් කොස්තාපල්වරුන් 1,300කුත් මේ වනකොට තෝරාගෙන අවසන්. ඒ අනුව අඛණ්ඩව සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙමින් තිබෙනවා. දෙවන වතාවටත් අපි ගැසට් නිවේදනය මේ සතියේ 28වෙනි දා හෝ මාර්තු මුල් සතියේ නිකුත් කරන්න බලාපොරොත්තු වනවා, කාන්තා පොලිස් සේවයට බඳවා ගැනීම්, STF එකට බඳවා ගැනීම් සඳහා.

ඒ අනුව දිගින් දිගටම අඛණ්ඩව මේ පුරප්පාඩු පිරවීමේ කාර්යය සිද්ධ වනවා. එහෙත් මේ සභාවට පැහැදිලි කරන්න අවශ්‍යයි, මේ කර්තව්‍යය ඉතා කෙටි කාලයකදී කරන්න බැහැ කියන කාරණය. මොකද, මූලික සම්මුඛ පරීක්ෂණය, ඊට පස්සේ විභාගය, විභාගයෙන් පසුව ප්‍රතිඵල අනුව නැවත සම්මුඛ පරීක්ෂණය, ඊට පස්සේ පසුබිම් වාර්තා, ඊට පස්සේ මත්ද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂණය, ඊට පස්සේ වෛද්‍ය පරීක්ෂණය, ඊටත් පස්සේ මාස හයක පුහුණුව ආදී වශයෙන් මෙහි පියවර ගණනාවක් තිබෙනවා. ඉතින් කොච්චර කාර්යක්ෂමව කළත් මේ සියලු කාර්යයන් සඳහා අඩුම වශයෙන් මාස 10ක වාගේ කාලයක් ගත වනවා. මේ සියලු කටයුතු මේ වනකොට කාර්යක්ෂමව සිදු කරමින් තිබෙනවා. ඒ හින්දා කිසිදු අවස්ථාවක මේ කටයුත්තේදී අඩුපාඩුවලට ඉඩ තියන්නේ නැහැ. අපි මේ සඳහා තාක්ෂණය භාවිත කරනවා; ඉන්න නිලධාරින්ගේ කාර්යක්ෂමතාව වැඩි කරනවා. ඒ සඳහා ඔවුන්ට අභිප්‍රේරණය සහිතව වැඩ කරන්න පුළුවන් පසුබිම හදලා දෙනවා. මෙවැනි දේ හරහා මේ කටයුත්ත කළමනාකරණය කරනවා. මේ විධියට අඛණ්ඩව බඳවා ගැනීම් අපි සිද්ධ කරමින් පවතිනවා. මේ බඳවා ගැනීම්වලට යම් කාලයක් අවශ්‍යයි. මේ අයට මාස හයක පුහුණුවකුත් අවශ්‍යයි. ඒ කාරණය හින්දා යම් ප්‍රමාදයක් සිද්ධ වුණත්, බඳවා ගැනීම් දිගින් දිගටම සිදු කරන්න අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා.

ඊළඟට, මහජන ආරක්ෂක කමිටු ගැනත් කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලිස්පතිතුමාගේ චක්‍රලේඛයක් මේ සම්බන්ධව පැහැදිලිවම අපි යවා තිබෙනවා. මේ මහජන ආරක්ෂක කමිටු කිසිදු ආකාරයකින් දේශපාලන කමිටු බවට පරිවර්තනය වන්නේ නැහැ. එදාත් මා පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළා, මෙහි ලේකම්වරයා එම ප්‍රදේශයේ සිටින ග්‍රාම නිලධාරි මහතා හෝ මහත්මිය බව. මෙහි කැඳවුම්කරු වන්නේ ප්‍රජා පොලිස් සේවයේ නිලධාරියා. කමිටුවේ 40ක් ඉන්නවා නම්, ඒ 40දෙනා අතරින් තෝරා ගන්නා පිළිගත් පුද්ගලයෙක් තමයි මෙහි සභාපතිවරයා වන්නේ. හැබැයි කාලයක් තිස්සේ එතුමන්ලාගේ ආණ්ඩු සහ පෙර පැවති ආණ්ඩුවල ප්‍රජා පොලිස් කමිටුවල සභාපතිවරුන් ලියුමක් දුන්නා, යම් පුද්ගලයෙකුට චරිත සහතිකයක් දෙනකොට. සමහර වෙලාවට මේ ප්‍රජා පොලිස් කමිටුවල හිටපු අය නැවතත් මහජන ආරක්ෂක කමිටුවලටත් පත් වෙලා ඉන්නවා. එහෙම තැන් දෙකක, තුනක එතුමා කියන සිද්ධීන් වෙලා තිබෙනවා. ඒ අය කලින් තමන් පවත්වාගෙන ආ පූර්වාදර්ශ නැවත අනුගමනය කරමින් ඉන්නවා. අපේ චක්‍රලේඛයේ මේ සම්බන්ධව පැහැදිලිව කියලා තිබෙනවා. ඒ වාගේම පොලිස් කණ්ඩායම් එකතු කර කර හැම පළාතකටම, හැම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා මේ සම්බන්ධව මම කථා කරලා තිබෙනවා. ඒ හැම අවස්ථාවකම මම පැහැදිලි කරලා තිබෙනවා, මේ පොලිස් මහජන ආරක්ෂක කමිටුවල වුවමනාව මොකක්ද කියලා. ඉතින් අපි මේ කමිටු හදලා තිබෙන්නේ සර්ව සාධාරණව. මේ කමිටු දේශපාලන කමිටු බවට පත් කර ගැනීමේ කිසිදු අවශ්‍යතාවක් අපට නැහැ.

ග්‍රාම නිලධාරිවරයා එහි ලේකම්වරයා; ප්‍රජා පොලිස් නිලධාරියා කැඳවුම්කරු; සභාපතිවරයා පත් කරන්නේ කමිටුවේ අය අතරින්. ඉතින් අපි කොහොමද, ඒවා දේශපාලන තනතුරු කරන්නේ? දැන් මම CID එකේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගෙන් විමසුවා, මම දැනුවත්ව එහෙම කවුරුවත් CID එකට කැඳවා නැහැ. මෙහෙම කැඳවීමක් කරලා තිබෙනවාද කියලා මම තවදුරටත් සොයා බැලීමක් කරන්නම්, ගරු විපක්ෂ නායකතුමනි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් මට දුරකථනයෙන් දැනුම් දුන්නා, දැනට එවැනි කැඳවීමක් කරලා නැහැ කියලා. ඒ වාගේ දේවල්වලට පොලීසිය යොදා ගන්න අවශ්‍ය නැහැ. එතුමන්ලාගේ කාලයේ හිටපු ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයෙක් මහජන ආරක්ෂක කමිටු සාමාජිකයා වෙලා පෙර පුරුද්දට ඒක ඉල්ලා හිටියා නම්, ඒක නොසැලකිය යුතු කාරණයක්. ඒක අපි එදා මේ සභාවට පැහැදිලි කරලා තිබෙනවා. මහජන ආරක්ෂක කමිටු 14,000ම අපි යොදවන්නේ මත්ද්‍රව්‍ය නිවාරණය, මත්ද්‍රව්‍ය මර්දනය, අපරාධ පාලනය වැනි දේවල්වලට සහාය ලබා ගන්නයි. ඒවා නීතිය ක්‍රියාත්මක කරන ආයතන නොවෙයි, කමිටු. ඒවා පොලීසියට සහාය දෙන කමිටු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම වේලාවේම අපට තිබෙනවා, ඉලක්කයක්, දැක්මක්, වැඩ පිළිවෙළක්. ඒකට අනුගතව තමයි අපි පොලීසිය මෙහෙයවන්නේ. එය දේශපාලනීකරණයෙන් නිදහස් කරලා, ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කරලා, වඩා සක්‍රිය කරලා තිබෙනවා. ඉතින් මේ ඇති වන අපරාධ පාලනය කිරීම සඳහා අපි දැඩි පරිශ්‍රමයක් යොදමින් ඉන්නවා කියන එක මේ සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, what is your point of Order? Let us not get into a debate on this, please.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම කථා පවත්වන්නට යන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේදි කිව්වා, ඔබතුමාත් තොරතුරු, කරුණු හොයලා කියන්නට ඕනෑ කියලා. මා ළඟ තොරතුරු තිබෙනවා. හක්මණ පොලිස් ස්ථානයෙන් දැනුම් දීලා තිබෙනවා, "අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ 2 මඟින් සිදු කරනු ලබන විමර්ශනයකට අදාළව ප්‍රකාශ ලබා ගැනීම සඳහා පහත අයවලුන්ට දැනුම් දෙන්න" කියලා. අංක 12, දෙනගම නැහෙනහිර, දෙනගම ලිපිනයෙහි පදිංචි පොලිස් ආරක්ෂක කමිටු සභාපති පී.අයි. යසන්ත ආරියසේන, 2026.02.20, උදෑසන 9.30ට. *[බාධා කිරීම්]* අංක 10, සිතුමිණ, දෙනගම නැහෙනහිර, දෙනගම පදිංචි අබේසේකර පතිරණගේ රොෂානි මහත්මියට, උදෑසන 9.30ට; අංක 1/21, කොන්ගහකොරටුව, දෙනගම නැහෙනහිර, දෙනගම පදිංචි තෙවුනි තෙසන්යා ජයවර්ධන මෙනෙවියට, උදෑසන 9.30ට. මෙය එවලා තිබෙන්නේ කවුද? ස්ථානාධිපති, විශේෂ විමර්ශන අංශ 2, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ananda Wijepala.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, නැහැ, මට විනාඩියක් දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක විතරක් නොවෙයි. මට එතුමා කිව්වා, සමගි ජන බලවේගයට සම්බන්ධ දේශපාලනඥයෝ දෙදෙනෙක් ගැන කියන්නම් ලු, ඒ දෙන්නාට කියන්න ලු, අපරාධ කටයුතුවලට සම්බන්ධ වෙන්න එපා, මිනී මරන්න එපා, මංකොල්ල කන්න එපා, වැරදි ක්‍රියාත්මක කරන්න එපා කියලා. ඇයි, ඔබතුමා ඒවා මට කියන්නේ? ඔබතුමාට පුළුවන් නේ, විමර්ශන ආරම්භ කරලා, පරීක්ෂණ පවත්වලා, අත්අඩංගුවට ගන්න, දඬුවම් කරන්න. *[බාධා කිරීම්]* ඔබතුමා මට මොකටද ඒවා කියන්නේ? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ananda Wijepala. - *[Interruption.]* Let the Hon. Minister reply you, Hon. Leader of the Opposition.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කිව්වා, සහාය දෙනවා කියලා. මේ විදියේ අපරාධ කටයුතුවලට සම්බන්ධ වන අය හා ඔවුන්ගේ ළඟම ඥාතීන් මේ දේශපාලන ව්‍යාපාරවල ඉන්නකොට, ඔවුන් අතර ගනුදෙනු සිද්ධ වන බව දුරකථන හරහා අපි විශ්ලේෂණය කරලා තිබෙනවා. අවශ්‍ය නම් ඒ සම්බන්ධව ඔබතුමාට මම පැහැදිලි කරන්නම්. යම් බුද්ධි තොරතුරක් තිබුණු පමණින් ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට අපි කටයුතු කරන්නේ නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා සහාය දෙන බව කිව්වා නිසායි මම මේ කාරණය කිව්වේ. දේශපාලන ව්‍යාපාර විධියට අපි නාම යෝජනා දෙනකොට යම් යම් අපරාධකරුවන්ගේ ඍජු සම්බන්ධතා තිබෙන පුද්ගලයින්ට නාම යෝජනා දීලා ඒ තනතුරුවලට පත් කරගැනීම වැරදියි කියන කාරණයයි මම කිව්වේ. *[බාධා කිරීම්]* සහාය දෙනවා කියලා ඔබතුමා මුලින් කියලා දැන් වෙනත් කාරණයක් කියන්න එපා.

විපක්ෂ නායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. ඔබතුමා මහජන ආරක්ෂක කමිටු සම්බන්ධයෙන් දැන් කරපු විමසීමට තමයි මම කිව්වේ මේ පිළිබඳව නැවත සොයා බලන්නම් කියලා. මුලින් මම මේ සම්බන්ධව සොයා බැලීමක් කළා. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා - Senior DIG - දැනුම් දුන්නා, ඔහුගේ දැනුවත්භාවයකින් තොරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව කිසිම පුද්ගලයෙකුට කැඳවීමක් කර නැහැ කියලා. මේ කාරණය කුමක්ද කියලා මම නැවත සොයා බලා දැනුම්දීමක් කරන්නම්. මම මහජන ආරක්ෂක ඇමතිවරයා විධියට මේ හැම අවස්ථාවකම පිළිතුරු දෙන්නේ වගකීම් සහිතවයි. මට ලැබෙන තොරතුරු, අපි විශ්ලේෂණය කරන දේවල් තමුන්නාන්සේලාට කිසිදු විධියකින් අගතියක් සිදු නොවන ආකාරයෙන් තමයි ඉදිරිපත් කරන්නේ. ඔබතුමා කිව්වා, මේකට සහාය දෙනවා කියලා. ඒ සඳහා විවිධ ක්‍රම තිබෙනවා. ඔබතුමන්ලා ඇතුළු හැම දේශපාලන පක්ෂයකටම, අනෙක් හැමෝටම මේ සඳහා සහාය දෙන්න පුළුවන්.

ඇත්තටම පාතාල ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍ය උවදුර මේ රටට භීෂණයක් වෙලා තිබෙනවා. හැම වෙලාවේම මේ දේවල්වලට විරුද්ධව හැමෝම එකතු වෙන්න ඕනෑ. මත්ද්‍රව්‍ය ජාවාරමටත්, පාතාලයටත් විපක්ෂයක් තිබෙන්න විධියක් නැහැ. මීට එරෙහිව මේ රටේ සියලුදෙනා එකතු වෙන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමාට සහය දෙන්න පුළුවන් ක්‍රමයක් තමයි මම යෝජනා කළේ. ඔබතුමන්ලා හැම වෙලාවේම දෙන සහාය අපි අගය කරනවා. ඔබතුමන්ලා අහන ප්‍රශ්න හරහාත් ජනතාවට මේ පිළිබඳව තොරතුරු කියන්න අපට අවස්ථාවක් ලැබෙනවා. සමහර තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අපේ විමර්ශනවලට දිගින් දිගටම බාධා වුණත්, යම් කරුණු ප්‍රමාණයක් ඔබතුමන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන්න අපි ඕනෑම වෙලාවක සූදානම්. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ඉල්ලීමට තමයි මම ඒ ප්‍රතිචාරය දැක්වුයේ. අප ළඟ තොරතුරු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම ඒ සියලු තොරතුරු මේ වෙලාවේ මේ සභාවට ඉදිරිපත් කරන්න අපේක්ෂා කරන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, I will give you a minute to make a clarification on that. - [Interruption.] The Hon. Minister has provided answers to your questions.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත වරක් ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාට කියන්න කැමැතියි, අපේ පක්ෂය පාතාලය ප්‍රවර්ධනය කරන්නේත් නැහැ, පාතාලය උනන්දු කරවන්නේත් නැහැ, මිනී මැරුම්, මංකොල්ල කෑම්, දූෂණය කියන සියල්ලක්ම පිටුදකිනවා කියලා. මට කියන්න එන්න එපා, අරයාට පණිවුඩය දෙන්න, මෙයාට පණිවුඩය දෙන්න, දුරකථන සංවාද තිබෙනවා, බුද්ධි පරීක්ෂණ තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට කියනවා, කරුණාකරලා එක තත්පරයක්වත් නාස්ති කරන්න එපා, දැන් පොලිස්පතිතුමාට නියෝගයක් දෙන්න, පාතාල කටයුතුවල නිරත වී සිටින අය ඉන්නවා නම් ඔවුන් ගැන පරීක්ෂණ පවත්වා, අත්අඩංගුවට අරගෙන නීතිය හමුවට ගෙන එන්න කියලා. ඒ ක්‍රියාවලියට අපි සහයෝගය ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Leader of the Opposition, we have closed this debate now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විනාඩියක්, විනාඩියක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

This is going to be a prolonged, dragged on debate.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, just take half a minute, please. We have been dragging this on. We are moving onto the Business of the House now.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා මට විනාඩි භාගයක් ලබා දුන්නාට බොහොම ස්තුතියි. මම දකිනවා, ආනන්ද විජේපාල ඇමතිතුමා telephone call එකක ඉන්නවා. ඔහොමම telephone call එකක් පොලිස්පතිතුමාට අරගෙන මේ ගැන කියන්න. ඔය අපරාධවලට සම්බන්ධ කවුරු හරි ඉන්නවා නම් ඔබතුමන්ලා පරීක්ෂණ කරලා ඒ අය අත්අඩංගුවට අරගෙන යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය, නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරන්න. ඒ වෙනුවෙන් සම්පූර්ණ සහයෝගය අපි ලබා දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, I can see you standing.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ point of Order එක ස්ථාවර නියෝග 29 (1) හා 29 (2) යටතේ urgent matter එකක්. අද උදේ මම කොළඹට ඇතුළු වනකොට Peliyagoda Exit එකේ මට විනාඩි 30කට වැඩිය පෝලිමේ ඉන්න වුණා. ඒ හේතුවෙන් මගේ Privileges කඩ වුණා. ඒ නිසා මට 30 minutes late වුණා. මම කලිනුත් මේ ගරු සභාවේදී කියා තිබෙනවා, ඒ exit එකේ ප්‍රශ්න ඇති වෙනවා කියලා. ඒ නිසා කරුණාකර ඊට අදාළ අමාත්‍යාංශයට ඒ ගැන කියලා ඒ ප්‍රශ්නය නිවැරදි කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, the House notes your matter of Privilege.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, what brings you to your feet?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, firstly, I thank the Hon. Minister Ananda Wijepala for answering exhaustively in this House.

Sir, I draw your attention to something that took place yesterday. There was a request that such Questions be restricted to five minutes. A senior Minister would be unable to provide an answer in five minutes because he has to fully and exhaustively give answers to Parliament. If that is the case, it cannot be implemented selectively for one or two; it should be so across the board. So, ensure that it is not implemented selectively in this House. Giving an exhaustive answer, we appreciate. So, please disregard such instructions that come from people who basically do not know how Parliament should be run.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Then, we move on to Motions at the commencement of Public Business. The Hon. Chief Government Whip.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Adjournment Motion to be moved by the Hon. S.M. Marikkar. You have 18 minutes.

## විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ගැටලු
### மின்சாரத்துறை தொடர்பான பிரச்சினைகள்
### ISSUES RELATING TO POWER SECTOR

[පූ.භා. 11.30]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා, ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව විගණකාධිපතිවරයාගේ නිර්දේශ මත පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් වැඩිමනත් ප්‍රතිපත්තිමය උපදෙස් සපයා දී තිබිය දී ද,
>
> '2025-2026 ගල් අඟුරු වාරය' සඳහා ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයට අවශ්‍ය වන ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 12.32ක ප්‍රමාණය සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාදාමය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව, සැපයුම්කරුවන්ගේ
>
> I. මූල්‍ය ශක්‍යතාව
> II. පළපුරුද්ද
> III. සැපයුමේ ගුණාත්මකභාවය
> IV. ප්‍රමාණවත් නෛතික බැඳීම්
>
> ඇතුළු මූලික අවශ්‍යතාවන් ආරක්ෂා කර ගනිමින් උපරිම තරගකාරිත්වයක් සහිතව සිදු කළ යුතුව තිබියදී ද,
>
> I. විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රියාදාමයට පටහැනිව දූෂිතව ක්‍රියා කිරීම මඟින් ද,
> II. ගල් අඟුරු මිලදී ගැනීමේ දී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රියාදාමය පිළිබඳව පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙන ලද උපදේශවලට පටහැනිව ක්‍රියා කිරීම මඟින් ද,
> III. සැපයුම්වල 'ගුණාත්මකභාවය සහතික කළ හැකි' විශ්වාසවන්ත ගල් අඟුරු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට අසමත් වීම මඟින් ද,
> IV. බලාගාරය වෙත ගල් අඟුරු සැපයීම නියමිත වේලාවට සිදු කිරීමට සැපයුම්කාර සමාගම අසමත් වී ඇති බැවින් ද,
>
> වර්තමාන රජය විසින් ශ්‍රී ලංකාවේ 'බලශක්ති සුරක්ෂිතභාවය' අනතුරට හෙළා ඇති බැවින්ද,
>
> එම ක්‍රියාදාමය මඟින් දැනටමත් අතිවිශාල මූල්‍ය අලාභයක් ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වී ඇති බැවින්ද, තවදුරටත් සිදු වෙමින් පවතින බැවින් ද,
>
> ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයේ ටර්බයින් නළ - Turbine Last Stage Blade - වායු පූර්ව තාපකය - APH -, බොයිලේරු නළ - boiler tube - සහ FGD පද්ධතිය ගුණාත්මකභාවයක් නොමැති ගල් අඟුරු භාවිතය නිසා අලුත්වැඩියා කිරීමේ තත්ත්වයකට පත් වී ඇති බැවින් ද, ඒ සඳහා අතිවිශාල මුදලක් වැය කිරීමට සිදු වී ඇති බැවින්ද,
>
> බලශක්ති විෂය භාර අමාත්‍යවරයා විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ කැබිනට් මණ්ඩලය නොමඟ යැවීම හේතුවෙන් දූෂිත ප්‍රසම්පාදනය අනුමත කිරීම තුළ ඉහත කී තත්ත්වයන් මතුව ඇති බැවින් ද,
>
> 1. ශ්‍රී ලංකාවේ 'බලශක්ති සුරක්ෂිතතාව' ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය වන සියලු පියවර කඩිනමින් ගන්නා ලෙස ද,
> 2. මේ වන තෙක් ඉහත කී දූෂිත ප්‍රසම්පාදන ක්‍රියාදාමය හේතුවෙන් ශ්‍රී ලංකා ජනරජයට සිදුව ඇති අලාභය වගකිව යුතු තැනැත්තන්ගෙන් අයකර ගැනීමට සහ ඉදිරියේදී සිදු වීමට නියමිත අලාභ වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද,
> 3. ඉහත කී දූෂිත සහ අනීතික ක්‍රියාදාමයට වගකිව යුතු සෑම තරාතිරමකම පුද්ගලයන්ගේ 'වගවීම' තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේ ආරම්භයේදීම මේ ගැන කියන්න ඕනෑ. ලංකාව පුරාම JVP cadre එකේ 3,000ක් විතර ඉන්නවා. ඔබතුමන්ලා අවංකවම ඔබතුමන්ලාගේ නිශ්චිත විප්ලවීය අරමුණු වෙනුවෙන් ජීවිත කැප කරලා සටන් කරද්දී ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න මේ ටයි කෝට් ගහපු සමහර තක්කඩි විසින් කරන හොරකම්වලින් විඳින සුරසැප ජීවිත පිළිබඳ මොළෙන් අවබෝධ කර ගන්නා ලෙස JVP cadre එකේ ඉන්න 3,000ක් පමණ වන මහත්වරුන්ගෙන් ඉතා ආදරයෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, ඩඩ්ලි

සිරිසේන Rolls-Royce කාර් එකක් ගෙනෙද්දි, "නිපුණ" සහල් මුදලාලි හෙලිකොප්ටරයක් ගෙනෙද්දි නිකමට හෝ අපේ ආණ්ඩුවක් තිබුණා නම් මෙතැන දෙන ලතෝනි ටික. එහෙනම් කුරුණෑගල නාමල් කරුණාරත්නත්, අපේ ජනාධිපතිතුමාත් උඩ පැන-පැන කථා කරන්නේ, "මෙන්න, ගොවියාට push bicycle එකක්වත් ගන්න නැහැ, ඩඩ්ලි සිරිසේන Rolls-Royce එකක් ගෙනැල්ලා" කියලා. හැබැයි, අද වගේ වගක් නැහැ. ජනාධිපතිතුමා හරියට මේසයට එක තට්ටුවයි දැම්මේ ඩඩ්ලි ගෙනාවා, Rolls-Royce එකක්; "නිපුණ" සහල් මුදලාලි ගෙනාවා, හෙලිකොප්ටරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඓතිහාසික දවසක්. රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැ කියලා පුනපුනා ජනාධිපතිතුමා කියනකොට, මේ තක්කඩි හොරකම් ටික පෙනෙන්නේ නැත්තේ කොහොමද කියලා අපිට එතුමාගෙන් අහන්න සිද්ධ වෙනවා.

අද පැලවත්තේ ඩෝබි බලකාය ලැහැස්ති කරගෙන ඇති. අපි භය නැහැ. අපිත් දමන්නම් ඒකට. දැන් වෙලාව හරි ඒක දමන්න. අද අපේ වගකීම තමයි, මේ හොරකම් ටික හෙළි කරන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරු සමාගමේ හිටපු සභාපතිවරයා මේ ටෙන්ඩර් එක දමද්දී විගණකාධිපතිවරයා විසින් 2022.09.30වැනි දා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දීලා, එම කාරක සභාව විසින් 2022.10.04වැනි දා අනුමත කර පාර්ලිමේන්තුවට ලබා දීපු දත්ත අනුව ක්‍රියා කළේ නැහැ. 2022දී පෝලිම් තිබෙනකොට, විදුලිය විසන්ධි කරනකොට හදිසි මිලදී ගැනීම් සඳහා පාවිච්චි කරපු ක්‍රමවේද මේ සඳහා පාවිච්චි කර තිබෙනවා. Normalized ක්‍රමවේදයක් තුළ පාවිච්චි කරන්න කියලා විගණකාධිපතිවරයා උපදෙස් ලබා දී තිබියදී ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 10ක් අවුරුදු 3ක් ඇතුළත supply කරන්න ඕනෑ කියන එක මෙට්‍රික් ටොන් ලක්ෂ 5ට අඩු කළා. කිලෝ කැලරි 5,900ට වැඩි ප්‍රමාණයක් ගල් අඟුරු ගෙනෙන්න ඕනෑ කියන එකේ අත්දැකීම ලක්ෂයට අඩු කළා. ඒ හරහා මොකක්ද කළේ? දූෂිත සමාගම්වලට මේක ඇතුළට එන්න අවස්ථාව ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, පිළිගත් සමාගම්වලට එන්න තිබෙන අවස්ථාව නැති කළා, දින 42ක කාල සීමාව දින 21කට අඩු කරලා. මෙහෙම සැලසුම් කරලා තමයි මේ වැඩේ පටන් ගත්තේ. සැලසුම් කරලා පටන් ගත්තේ ඔන්න ඔය විදියට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම පටන්ගෙන මොකක්ද කළේ? අනුමැතිය ගන්න කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. කැබිනට් මණ්ඩලය දැනුවත් කළේ නැහැ, විගණකාධිපතිවරයාගේ මෙහෙම නිර්දේශයක් තිබෙනවාය කියලා.

කැබිනට් මණ්ඩලයත් නොමඟ යවලා ගල් අඟුරු ගෙනෙන්න ඕනෑ කිව්වා. Lowest කෙනාට දුන්නා කිව්වා. හැබැයි, quality එක බැලුවේ නැහැ. ඔතැන තමයි ඩීල් එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇත්තවශයෙන්ම පළමුවැනි නැව එන්න ඕනෑ, දෙසැම්බර් මාසයේ 14වැනි දා. හැබැයි, මම දන්නා තරමින් පළමුවැනි නැව ආවේ දෙසැම්බර් මාසයේ 30වැනි දා. පළමුවැනි නැව ආවාම පටවන වරායේ - load port එකේ - ඉඳලා report එකක් එන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙන්න මේ සුපිරිසිදු ආණ්ඩුව, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ගල් අඟුරු පටවන රටෙන් නැතුව දකුණු අප්‍රිකාවෙන් තමයි ගල් අඟුරු පැටෙව්වේ. හැබැයි, report එක එන්නේ ඉන්දුනීසියාවෙන්. එතකොට ඉන්දුනීසියාවට යවපු samples ඒ පටවපු එකේ samples ද කියලා අපේ කමිටුවේදීවත් පිළිගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටෙන්ඩරයෙන් දූෂණය පටන් ගත්තා. Report එකෙන් ඒක ඉදිරියට ගෙන ගියා. Samples පරීක්ෂා කරද්දී ඇමතිතුමා මෙතැනට ඇවිල්ලා වාගේම මාධ්‍යවලත් ලොකුවට කිව්වා, නැහැ නැහැ, ප්‍රශ්න නැහැ කියලා. ගල් අඟුරු ෆේල්! ගල් අඟුරු සමාගමට තග දමලා තමයි real-time test එක නවත්වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුපිරිසිදු නම්, විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ. විනිවිදභාවයක් ඇතුව වැඩ කරන්න ඕනෑ. මාර වැඩේ කියන්නේ, දැන් මේක මෙගා ටෙලි නාට්‍යයක් වාගේයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් ලංකාවේ මුහුදට නැව ඇවිල්ලා බෑවාම බොයිලේරුවට දමනවා, real-time එක බලන්න. ලක්විජය ගල් අඟුරු බලාගාරයේ බොයිලේරුවල තිබෙන real-time report එක අනුව තමයි කොපමණ මෙගාවොට් ප්‍රමාණයක් ජනනය වෙනවාද කියන එක පරීක්ෂා කරන්නේ. මොකද, කොහෙන් check කළත් ලක්විජය ගල් අඟුරු බලාගාරයේ බොයිලේරුවට දමලා නේ විදුලිය උත්පාදනය කරන්න ඕනෑ. පළමුවැනි report එක ෆේල්. තුන්වැනි පාර්ශ්වය විදියට check කරන්න ඉන්දියාවට යැව්වා. පළමුවැනි එකේදී දෙකම සමපාත වෙනවා. හොරාට කලින් කෙහෙල් කැන වැට පනිනවා නේ. ඇත්තවශයෙන්ම මේ ගල් අඟුරු ගෙනෙන්න කලින් මෙහෙම තත්ත්වයක් මතු වෙන්න පුළුවන් කියලා අපි කමිටුවේදී අමාත්‍යාංශ ලේකම්වරයාට අනතුරු ඇඟවීම් කළා. ලේකම්තුමාට ඇමතිතුමා වැඩ කරන්න දෙන්නේ නැති හින්දා ඒවා communicate වුණාද, නැද්ද කියන්න මම දන්නේ නැහැ. හැබැයි, එහෙම වුණා.

හැබැයි, දෙවැනි නැව එද්දී අපි කිව්වා, මේක ෆේල් කියලා. එතකොට පැනලා කිව්වා, එහෙම නැහැ, ඒක ෆේල් නැහැ කියලා. ෆේල් නම් අපි දඩ ගහනවාය කිව්වා. දඩ ගහනවා කියලා කොහේවත් නැහැ. පැනලා තමයි එහෙම කිව්වේ. මේවා ගැන හොඳට වට මේසවල සාකච්ඡා වෙච්ච නිසා තමයි එහෙම පැනලා කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා අපි කියන ඒවා නොවෙයි. අපි එකක්වත් හිතලු කියන්නේ නැහැ. නිල reports තිබෙනවා. අද මම කියන කාරණාවලට අදාළ සියලු ලේඛන සභාගත කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, reports දෙක, තුන සහ හතර ෆේල් වෙනකොට පිළිගත්තේ නැහැ. හැබැයි, "ටක්" ගාලා පළමුවැනි නැවට ඩොලර් මිලියන 2.1ක දඩයක් ගහනවා කියලා මාධ්‍ය සන්දර්ශනයක් පැවැත්වූවා. මේගොල්ලන් හිතා ගෙන ඇති, මේ ගල් අඟුරු සමාගමේ නිලධාරීන්ව තියලා press conference එකක් පවත්වලා පැලවත්තේ ඩෝබි බලකාය දාලා social media එකේ fake profilesවලින් ගැහුවාම මේ ඔක්කොම හරි යයි කියලා. පුළුවන් නම් තියන්නකෝ, පළාත් සභා මැතිවරණය; ලිට්මස් පරීක්ෂාව කර ගන්න.

පසුගිය ආණ්ඩුවල හොරකම් වෙලා තිබෙනවා. හැබැයි, මේ වාගේ මහ දවාලේ හොරකම් කරලා නැහැ. මොකද, මේකෙදි මහ බැංකු බැඳුම්කර මංකොල්ලය වාගේ දෙතුන් ගුණයක් ගහලා තිබෙන්නේ. අනේ පව්, මාලිමාවේ මන්ත්‍රීවරු. මම දන්නේ නැහැ, කීයක් හරි දුන්නාද කියලා. කට වහගෙන ඉන්න වෙලා තිබෙනවා. කඩේ යන්න අද වෙනදා වාගේ මන්ත්‍රීවරු මේ ගරු සභාවේ ඇත්තෙත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න. දන්නේ නැති දේවල් කියලා දෙන්නේ. මේ රැල්ලට ආපු කට්ටිය නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දන්නේ නැත්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි නැව ආවා. දෙවැනි නැවත් ෆේල්. හැබැයි, මට හිතෙනවා දෙවැනි නැව ෆේල් වුණාම කුට ලේඛන වැඩකට ගියා කියලා. අද හිනා වෙන්න, දොඩවන්න,

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කියවන්න. මම දන්නවා, පෙරේදා සාකච්ඡාවක් තියලා මේ ටෙන්ඩර් එක ගැන අද කථා නොකර previous tenders ගැන කථා කරමු කියලා පොඩි practice session එකක් දාලා ඇවිල්ලා තිබෙන්නේ කියන එක. තමන් තමන්ව රවට්ටා ගන්න. හැබැයි, මේ සියලු ලිපිලේඛන අපි සභාගත කරනවා. අද පියවර නොගත්තත්, අද කවුරු කාව රැක්කත්, අනාගතයේ අපි මේවාට පියවර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු ඛනිජ තෙල් විෂය භාර ඇමතිතුමාටයි, සභාපතිටයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම රුපියල් මිලියන 800කට අදාළව නඩු දැම්මේ හොරා කෑවා කියලා නොවෙයි, රජයට පාඩු කළා කියලා. එතකොට මේ ඇමති කොච්චර පාඩු කර තිබෙනවාද? මේ ඇමති පාඩු කර තිබෙන ප්‍රමාණය ගත්තොත්, පළමුවෙනි නැවෙන් මිලියන 595.1යි. ඒකට මිලියන 644ක් අය කරගෙන තිබෙනවා; දෙවැනි නැවෙන් මිලියන 288.5යි; තුන්වැනි නැවෙන් මිලියන 1,047.4යි; හතරවැනි නැවෙන් මිලියන 865යි; පස්වැනි නැවෙන් මිලියන 1,144.2යි; හයවැනි නැවෙන් මිලියන 1,197.7යි; හත්වැනි නැවෙන් මිලියන 974.9යි; අටවැනි නැවෙන් මිලියන 1,559.3ක්. මේ, මම කියන ඒවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදුලිබල අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ අත්සන සහිතව, විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිගේ office එකෙන් එවපු ලේඛනය. මා ඒ ලේඛනය **සභාගත*** කරනවා.

නැව් 8ම පාඩුයි. මේ නැව් 8ම පාඩු වෙද්දී තමයි, මේ ඇමති කියන්නේ ටෙන්ඩර් එක අහෝසි කරන්න ඕනෑ නැහැ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එකතුව කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේ ටික එකතු කළාම මහ බැංකු බැඳුම්කර වංචාවට වඩා වැඩියි. මහ බැංකු බැඳුම්කර වංචාව රුපියල් බිලියන 10 නේ. මේක ගත්තොත්, ඊට වඩා වැඩියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න, අහගෙන ඉන්න කියන්නම්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එහෙම කෙනෙකුට නේ, භාර දීලා තිබෙන්නේ. පොඩ්ඩක් අහගෙන ඉන්න. මම මේ ලේඛන සභාගත කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොඳම වැඩේ කියන්නේ, බොයිලේරුව ක්‍රියාත්මක කරන ලක්විජය බලාගාරයේ report එක අනුව ෆේල්. හැබැයි, ඉන්දියානු සමාගම අනුව pass වෙනවා. ඔන්න, කුට ලේඛන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න ලක් විජය බලාගාරයේ report එක. කිලෝ කැලරි 5,900ට වැඩි අගයක් තිබෙන්න ඕනෑ. කිලෝ කැලරි පළමුවෙනි නැවේ 5,689යි; දෙවැනි නැවේ 5,684යි; තුන්වැනි නැවේ 5,078යි; හතරවැනි නැවේ 5,562යි; පස්වැනි නැවේ 5,670යි; හයවැනි නැවේ 5,415යි. මේ ලේඛනයත් මම **සභාගත*** කරනවා. විදුලිබල අමාත්‍යාංශයේ ඓතිහාසික මහා මංකොල්ලය. මාලිමා ආණ්ඩුවේ ලොකුම මංකොල්ලය මේක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ එකක්වත් සමගි ජන බලවේගයවත්, මරික්කාර්වත් හදපු ලියකියවිලි නොවෙයි. මේවා ලක්විජය බලාගාරය සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් හදපු ඒවා. මේ, ලිඛිත ඒවා. කම්ටුවට එද්දී ඇමති ගෙනැල්ලා meeting එකක් තියලා තගකුත් දාලා එවන්නේ; ඔයගොල්ලන් ඔක්කොමලාගේ ෆේල් මම ළඟ තිබෙනවා කියලා භය කරලා එවන්නේ. ඒ කාලය ඉවරයි ඇමතිතුමා. තේරුම් ගන්න, දැන් යුගය වෙනස්; සමාජය වෙනස් කියලා. ඔයගොල්ලන් මේ රටේ ජනතාවට බොරු කියලා රවට්ටපු කාලය ඉවරයි කියන එකත් මම පැහැදිලිව කියන්න කැමැතියි.

ඊළඟට, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා හොඳ බඩු නම්, අළු ප්‍රතිශතය සාමාන්‍යයෙන් තිබෙන්න ඕනෑ සියයට 11යි. හැබැයි, මේ හැම නැවකම අළු ප්‍රතිශතය සියයට 16ට වැඩියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවැනි නැවේ අළු ප්‍රතිශතය සියයට 20.1යි; දෙවැනි නැවේ අළු ප්‍රතිශතය සියයට 21.38යි; තුන්වැනි නැවේ අළු ප්‍රතිශතය සියයට 25.5යි. මේ ආකාරයට තව ටිකක් දිගට තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ තව වැඩක් තිබෙනවා. මම දන්නේ නැහැ, මාලිමාවේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා, මේ සා විශාල හොරකමක් දෑස් පනා පිට ලිඛිතව ඔප්පු වෙලා තිබෙද්දී කොහොමද රකින්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ වැඩේ තමයි මේ සැපයුම්කරුවා - ගල් අඟුරු සමාගම - රැවටීම. ඒගොල්ලන්ට අනුව Load Port Reports ඔක්කෝම පාස්. ඒ කියන්නේ, ගල් අඟුරු සමාගමට අනුව Load Port Reports ඔක්කෝම පාස්. හැබැයි, ලක්විජය බලාගාරයට අනුව ඒ reports ටික ෆේල්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒකත් පෙන්වන්නම්. මම ඒ තොරතුරු ටිකත් සභාගත කරන්නම්.

දැන් මේ ගල් අඟුරු සැපයුම්කරුවාගේ report එක අනුව පළමුවැනි ලෝඩ් එකේ කිලෝ කැලරි 6,053යි. හැබැයි, ලක්විජය බලාගාරයට අනුව ඒක ෆේල්. සැපයුම්කරුවාට අනුව දෙවැනි report එකේ තිබෙන්නේ කිලෝ කැලරි 6,193යි. හැබැයි, ලක්විජය බලාගාරයට අනුව කිලෝ කැලරි 5,420යි. ඒ කියන්නේ, ඒකත් ෆේල්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන බරපතළම කාරණය මොකක්ද? මෙගාවොට් 300ක් නිෂ්පාදනය කර ගන්න බැරි වෙනවා. ඒ වාගේම, මේ සා විශාල ප්‍රමාණයක් අළු නිෂ්පාදනය වුණාම ඇත්ත වශයෙන්ම එහි තිබෙන බොයිලේරුවලට හානි වෙන්න පුළුවන්. ඒ බොයිලේරුවලට හානි වුණොත් ඒවා repair කරන්න මාස 6ක කාලයක් යනවා. ඒ මාස 6ක කාලය ලක්විජය බලාගාරය ක්‍රියාත්මක නොවන වාතාවරණයක් ආවාම ලංකාව තුළ අඛණ්ඩ විදුලි සැපයුම වෙනුවෙන් ඩීසල් මාෆියාව හරහා විදුලිය ගන්න තවත් ගේමක් ගහන්න සෙට් වෙලාද කොහේද ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරුවල අළු ප්‍රතිශතය සියයට 16ට වඩා වැඩි නම් ඒ ටෙන්ඩර් එක cancel කරන්න ඕනෑ. ඒ වාගේම නැව් 2ක් ප්‍රතික්ෂේපිතයි නම් සම්පූර්ණ ටෙන්ඩර් එක cancel කරන්න

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඕනෑ. ඒ එකක්වත් කරන්නේ නැතුව වටේ යවනවා. අන්න, දැන් උපදෙස් දෙනවා. ඕනෑම උපදෙසක් දෙන්න, මම ඇත්ත කියන්නේ.

ඒ කාලයේ මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ තිබෙන wifeගේ අම්මාගේ account එකට සල්ලි වැටුණාද කියලා හොයලා බලන්න. ඒ ටෙන්ඩර් එක ක්‍රියාත්මක වන කාලයේ මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ තිබෙන wifeගේ අම්මාගේ account එකට සල්ලි වැටුණාද කියලා හොයලා බලන්න. පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා, වටගල මැතිතුමා, මගේ මිත්‍රයා, අද ටයි කෝට් ඇඳලා නැහැ. මම කියන එක එතුමාට ඇහෙන්නේ නැහැ. Telephone එක බොරුවට කනේ තියාගෙන ඉන්නවා. මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ තිබෙන account එක චෙක් කරලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. නිකම් බොරුවට කහින්න එපා. අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* මොකද, ඔබතුමාට රිදෙනවාද? පොඩ්ඩක් අහගෙන ඉන්න. කොහොමත් වැඩේ වරදින්න යන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් වැඩේ මේකයි. කලින් ගෙනාපු ගල් අඟුරුයි, මේ ප්‍රශ්නගත ගල් අඟුරුයි mix කරලා ගහන ගේමකුත් දැන් ක්‍රියාත්මක වෙනවා. කොහොම mix කරලා ගැහුවත්, පෙර ගෙනාපු ගල් අඟුරු පෙබරවාරි මාසය වෙනකොට ඉවර වෙනවා. එම නිසා මේ ටෙන්ඩර් එකෙන් ගෙනාපු බාල ගල් අඟුරු මාර්තු මාසයේ ඉඳලා දිගින් දිගටම පාවිච්චි කළොත්, අවශ්‍ය ප්‍රමාණයට විදුලිය ජනනය කරන්න බැරි වෙනවා. එතකොට අනිවාර්යයෙන්ම කරන්ට් එක කපන්න ඕනෑ, එහෙම නැත්නම් ඩීසල් මාෆියාවෙන් විදුලිය මිලදී ගන්න ඕනෑ.

අපට බලය ගන්න ඕනෑ. ඒක ඇත්ත. හැබැයි, රට කඩාකප්පල් කරලා, කරන්ට් කපලා, ගෑස් පෝලිම් හදලා, මිනිස්සු පෝලිම්වල තියලා ආණ්ඩු ගැනීමේ කාලකණ්ණි ආසාවක් අපට නැහැ. මොකද, ඔබතුමන්ලා තේරුම් ගන්න, මේක පොහොට්ටුව නොවෙයි, සමගි ජන බලවේගයයි කියන එක. අපට දූෂණ චෝදනා නැහැ, අපට නඩු නැහැ. අපි හොරකම් කරලාත් නැහැ, අපි ඔබතුමන්ලා වගේ හිඟා කාලත් නැහැ. හොරා කාලා නැහැ වාගේම හිඟා කාලත් නැහැ. ඒක මතක තියාගන්න. *[බාධා කිරීමක්]* අපි අනුන්ගේ හිල් ජොක්කු ඇඳලා නැහැ, මහත්තයෝ. ඒක හින්දා පොඩ්ඩක් අහගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මහා දවල් කරන මංකොල්ලයක්. මේක සාධාරණීකරණය කරන්න බැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එහෙම නම් permit එකක් ඉල්ලුවේ?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඔව්, permit එකක් ඉල්ලුවා. ඇයි? ඔබතුමාගේ අනුර කුමාර දිසානායක permits 6ක් අරන් තිබෙනවා. නලින්ද ජයතිස්ස ඇමතිතුමා 2015දී permit එක ගත්තාද, නැද්ද? *[බාධා කිරීමක්]* Permit එක ගත්තා නේ? ගත්තා. *[බාධා කිරීමක්]* විජිත හේරත් මහත්මයා permit එක ගත්තාද, නැද්ද? බිමල් රත්නායක මහත්මයා permit එක ගත්තාද, නැද්ද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම ඒ permits ඔක්කෝම ඊළඟ සභාවාරයේදී සභාගත කරනවා. අනුර කුමාර දිසානායක, නලින්ද ජයතිස්ස, බිමල් රත්නායක, විජිත හේරත්, සුනිල් හඳුන්නෙත්ති ගත්තු permits ඔක්කෝම මම සභාගත කරන්නම්. අපි හොරා කාලත් නැහැ, හිඟා කාලත් නැහැ. අනේ පව්! JVP cadre එකේ ඉන්න මිනිස්සු. පසුපෙළ සිටින අය පව්. JVP cadre එක පව්. මේ ගොල්ලෝ ටයි කෝට් ගහගෙන ඇවිල්ලා ඉන්නවා. ගමේ ඉන්න JVP මහත්තුරු පව්. තමන්ගේ ජීවිතය කැප කරලා, දරුවන්ගේ ජීවිත ගැන බලන්නේ නැතුව වැඩ කළේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. අහගෙන ඉන්න, අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා ගහන ගේම් ටික මම කියන්නම්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම කියන්නම්. ලජ්ජයි! පොඩ්ඩක් අහගෙන ඉන්න. දැන් ඒ හොරකම් ගැන කියද්දී ඔබතුමන්ලාට අහගෙන ඉන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිවරයාගේ මේ ක්‍රියා කලාපය නිසා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Marikkar, your time is over.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, the Hon. Gayantha Karunatilleka will give me more time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
How many minutes more?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Give him two more minutes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, you get two more minutes, Hon. Marikkar.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලබන මාසයේ ඉඳලා මේ බාල ගල් අඟුරු පාවිච්චි කළාම මොකද වෙන්නේ? මෙගාවොට් 300ක් නිෂ්පාදනය කරන්න බැරි වෙනවා. එතකොට රුපියල් 24ට ගල් අඟුරුවලින් විදුලිය ඒකකයක් නිපදවනවා වෙනුවට ඒකකයක් රුපියල් 64කට විතර -ඒ කියන්නේ, ඒකකයකට රුපියල් 40ක් විතර වැඩිපුර ගෙවලා- ඩීසල් මාෆියාවෙන් විදුලිය මිල දී ගන්න වෙනවා. මේගොල්ලන් හොරකම් කරන ටික විදුලි පාරිභෝගිකයා ගෙවන්න ඕනෑ. ඒ සඳහා සියයට 13.5කින් කරන්ට් බිල වැඩි කරන්න කියලා යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ඒ නිසා අපි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ - PUCSL එකේ - මහත්වරුන්ට කියන්න කැමැතියි, කවුරුවත් හොරකම් කරන ඒවා මහජනතාව ගෙවන්න ඕනෑ නැහැ කියන එක.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මම ගරු කරන ඇමතිවරයෙක් තමයි අනිල් ජයන්ත මැතිතුමා. මට එතුමා ගැන කනගාටුවක් ඇති වුණා. එතුමා කියන්නේ මොකක්ද? පිරිවැය දරා ගැනීම සඳහා ලු, ගණන වැඩි කරන්නේ. පිරිවැය කොහේද, හොරකම දරා ගැනීම සඳහායි. හොරකම දරා ගැනීම සඳහා තමයි මේ ආණ්ඩුව බිල වැඩි කරන්න සෙට් වෙන්නේ. කිව්වේ කොහොමද? තුනෙන් එකකින් කරන්ට් බිල අඩු කරනවා කිව්වා. ජනාධිපතිතුමාම කිව්වා, රුපියල් 9,000 බිල රුපියල් 6,000ට ගේනවා, රුපියල් 6,000 බිල රුපියල් 4,000ට ගේනවා, රුපියල් 3,000 බිල රුපියල් 2,000ට ගේනවා කියලා. අනේ අර TikTok බල බලා, YouTube බල බලා උයන අම්මලා "අම්මෝ! අනුර කුමාර ආවාම මාර සහනයක් ලැබෙන්නේ" කියලා, ගෙදර මිනිහා කියන දේත් අහන්නේ නැතිව පැනගෙන ගිහිල්ලා ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඔබතුමා දන්නවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාලිගාවත්තේ, ආමර් වීදියේ, වැල්ලම්පිටියේ කොච්චර නම් මිනිස්සු දුවගෙන ගිහින් ඔබතුමන්ලාට ඡන්දය දුන්නාද කියලා. ඔබතුමා ඒක දන්නවා නේ. ස්වාමිපුරුෂයා අපට ඡන්දය දෙද්දි බිරින්දෑ ගිහින් තමුන්නාන්සේලාට ඡන්දය දුන්නා. කරන්ට් බිලයි, වතුර බිලයි අඩු කරනවා, ආහාර, අධ්‍යාපන, සෞඛ්‍ය අංශවල VAT එක බින්දුව කරනවා කිව්වාම, ගෑනි හිතුවා 'මිනිහා හම්බ කරන ගණන කොහොමත් හම්බ කරනවා, මේ අය බලයට ආවොත් මට රුපියල් 10,000ක විතර වාසියක් හම්බ වෙනවා' කියලා. දැන් වාසිය හම්බ වෙලාද තියෙන්නේ? විදුලි බිල තුනෙන් එකක් අඩු කරන එක කෙසේ වෙතත්, තව පාරක් ගහපු ගැහිල්ලට විදුලි බිල සියයට 13.5කින් වැඩි කරන්නයි යන්නේ. මම ඔබතුමාට කියනවා, දැන් වතුවල වැඩිපුර ඇවිදින්න එපා කියලා. මොකද, මේ ගණන වැඩි වුණාම වෙන ප්‍රශ්නයක් මතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හොරකම මහ බැංකු හොරකමට වඩා ලොකුයි. මම පැහැදිලිව කියන්න කැමැතියි, විදුලි බිල වැඩි කළොත්, විදුලි බිල වැඩි කරන්න උත්සාහ කළොත්, අපි මහජනතාව පාරට බස්වනවා කියලා. අපි ඒක අනිවාර්යයෙන් කරන බව කියන්න කැමැතියි. *[බාධා කිරීමක්]* හරි බලමු. ආණ්ඩුවට දැන් මාස 16ක් ගත වෙලා. දැන් honeymoon ගිහිල්ලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Marikkar, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගමේ ගිහිල්ලා ගුටි නොකා ඉන්න. අපි නොවෙයි ගහන්නේ. පෙරටුගාමීන්ගෙන් ගුටි කන්න වෙන්නේ, හොඳේ. අන්න කුමාර් ගුණරත්නම් කිව්වා, ලෑස්ති වෙන්න කියලා. අපි නොවෙයි. අපි ප්‍රජාතන්ත්‍රවාදියි. සමගි ජන බලවේගයේ අපි ප්‍රජාතන්ත්‍රවාදියි. ඔයගොල්ලන්ට ගමේදී කන්න හම්බ වෙන්නේ මහ ජනතාවගෙනුයි, පෙරටුගාමීන්ගෙනුයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Marikkar, please wind up. The Motion is due to be seconded by the Hon. Ajith P. Perera

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම මේ මාලිමාවේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා, ඔබතුමන්ලා මේවාට ආධාර අනුබල දෙන්න එපා කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව අපහසුතාවට ලක් කරන්න එපා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවේ මේකට නොවෙයි. අපටත් මේක වෙන්න දීලා, කරන්ට් කපනකල් ඉඳලා දේශපාලනය කරන්න තිබුණා. නමුත් මෙතැනින් හරි මේක වළක්වා ගන්න ඕනෑ.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමන්ලාට අවුරුදු පහක ජන වරමක් ලැබිලා තිබෙනවා. මේ වාගේ එක ඇමතිවරයෙකුගේ වැඩවලින් තමුන්නාන්සේලාගේ සම්පූර්ණ ආණ්ඩුවම විනාශ කරගෙන මේ රටේ මිලියන 22ක් ජනතාව අනාථ කරන්න එපා කියා අපි ඉල්ලා සිටිනවා. මේ හොරකමට විරුද්ධ වෙන්න කොන්දක් තිබෙන්නේ කාටද කියන එක අපි බලන්න ලෑස්තියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith P. Perera. You have 11 minutes to second the Motion moved by the Hon. S.M. Marikkar.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Chief Government Whip?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කියපු ඒවාට උත්තර ලබා දෙනවා, ආණ්ඩු පක්ෂය හැටියට. ගරු මන්ත්‍රීතුමනි, හෝමාගම මහජන බැංකුවේ, wifeගේ අම්මාගේ නමට තිබෙනවාය කියපු account එකේ නම කියන්න, account number එක කියන්න. අද විවාදය ඇතුළත ඒ account එකට සල්ලි වැටිලා තිබෙනවාද, කාගේද ඥාති සම්බන්ධය කියලා සියල්ල හෙළිදරව් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ නමයි, account number එකයි කියන්න, මේ ගරු සභාවට.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Marikkar, I think that is very clear.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සියයට 99ක් සාක්ෂි සහිතව ඉදිරිපත් කරලා තිබියදීත් ඉතිරි එකට අඬන්න එපා කියන්න. ඒගොල්ලන්ටම හොයලා බලා ගන්න කියන්න. පොලීසිය ඒගොල්ලන්ගේ නේ. *[බාධා කිරීම්]* පොලීසිය ඒගොල්ලන්ගේ නේ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Would the House come to order?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Marikkar?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන බැංකුවේ ඒ account number එකයි, account එකේ නමයි, account එකට ගිය ගණනයි පිළිබඳව ඉදිරියේදී මම ඔබතුමන්ලාව දැනුවත් කරන්නම්. ඉස්සෙල්ලාම මේ දුන්නු ඒවා ගැන හොයන්න. *[බාධා කිරීම්]* ඉස්සෙල්ලා මේ දුන්නු ඒවා ගැන හොයන්න. *[බාධා කිරීම්]* මම ඒ විස්තර ටික සම්පූර්ණයෙන්ම ලබා දෙන්නම්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, Please! Would the House come to order? - *[Interruption.]*

Hon. Ajith P. Perera, you have 11 minutes to second the Motion moved by the Hon. S.M. Marikkar.

[පූ.භා. 11.53]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. ප්‍රථමයෙන්ම, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා, මම මේ යෝජනාවට අදාළව කථාව පටන් ගන්න කලින් ඔබතුමාගෙන් එක දෙයක් දැනගන්න කැමැතියි. ඒ තමයි, බලශක්ති ඇමති ධුරයට පත් වෙනකොට ඔබතුමා කලින් කරපු රස්සාවෙන් ඔබතුමාව අස් කරලා තිබුණා, ටෙන්ඩරයක් සම්බන්ධ දූෂණයක් සිද්ධ කළා කියලා. ඔබතුමාට රස්සාව නැති වුණා, ඔබතුමා නඩු දැම්මා, ඒ නඩුවෙන් ඔබතුමා වැරදිකරු වුණා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පැමිණිල්ලක් තිබුණා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ ඔක්කෝම දැනගෙන තමන්ගේ කල්‍යාණ මිත්‍රයා, කාලයක් තිස්සේ තමන්ගේ cadre එකේ එකට වැඩ කළ මිත්‍රයා කෙරෙහි විශ්වාසය තියලා චෝදනා තිබිච්ච, අල්ලස් කොමිසමේ පරීක්ෂණයක් තිබිච්ච, ඒ වෙනකොට වරදකරු වෙච්ච, ඒ වෙනකොට පොහොර සමාගමේ ටෙන්ඩරයෙන් හොරකම් කරලා වරදකරු වෙලා රස්සාව නැති වෙච්ච මනුස්සයා මේ රටේ ආර්ථිකයේ තුනෙන් එකක වගකීම තිබෙන බලශක්ති ඇමතිකමට පත් කළා. ඔන්න ඕකයි ප්‍රශ්නය. මේ වාගේ බරපතළ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගන්න, අහගන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට කථාවක් තිබෙනවා නේ. ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. [බාධා කිරීම්] හා, එහෙම නම් කියන්න. හැබැයි මට වෙලාව ඕනෑ. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොරු සමාජගත කරන පිකාසෝලා තමයි විපක්ෂයේ ඉන්නේ. *[බාධා කිරීම්]* පුළුවන් නම් ඔප්පු කරන්න. මම සේවය හැර ගිහින් තිබෙන්නේ ආයතනයෙන්. පුළුවන් නම් එහෙම නොවෙයි කියලා ඔප්පු කරන්න. මම සේවය හැර ගිහින් තිබෙන්නේ. මම ඒක අත හැරලා ආවේ. චෝදනා කරන්න පුළුවන් ඕනෑම කෙනෙකුට. නමුත් පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kumara Jayakody, you have 16 minutes to answer.

Hon. Ajith P. Perera, you may please continue.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ඇමතිතුමා - කුමාර ජයකොඩි මැතිතුමා- පොහොර සංස්ථාවේ ටෙන්ඩර් විෂය භාර කළමනාකරු වශයෙන් කටයුතු කළා. ඒ පිළිබඳව දූෂණයක්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

සිද්ධ වුණා; එතුමාට රස්සාව නැති වුණා; රස්සාවට යන්න බැරි වුණා. ගරු ඇමතිතුමනි, ඊට පසුව ඔබතුමා නඩු දැම්මා. නඩු දැම්මාම ඔබතුමා කළ වරද හරි, ඔබතුමාගේ ඒ ක්‍රියාව වරදක්, ඔබතුමා වරදක් කළා කියලා සනාථ වෙලා ඔබතුමා නඩුව පරාද වුණා. ඊට පස්සේ ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළා. අදටත් ඒ පැමිණිල්ල තිබෙනවා. අදටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ඒ පැමිණිල්ල තිබෙනවා. ඒක නැහැ කියනවාද? ඔබතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණයකට ලක් වෙලායි ඉන්නේ. අධි චෝදනා ගොනු කරන්න තීරණය කළාම, දේශපාලන බලපෑම් කරලා මේ ඇමතිට විරුද්ධව තිබෙන ඒ නඩුව නතර කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක මම කියන දෙයක් නොවෙයි; කවුරුත් දන්නා දෙයක්. මේක මේ සභාවේ මීට කලින් කථා කළා. එවැනි දූෂණයක් හා සම්බන්ධ, දූෂණයක් කළ, දූෂණයක් පිළිබඳ බරපතළ අපරාධමය විමර්ශනයකට ලක් වෙලා සිටින කෙනෙකු රටේ ආර්ථිකය පිළිබඳව බරපතළ වගකීමක් තිබෙන මේ වාගේ ඇමතිකමකට පත් කරපු

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ හොරකමට වග කියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගත්තා නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ නිසා කරුණාකරලා පිරිමියෙක් වාගේ කෙළින් උත්තර දෙන්න. හරි, කෙළින් උත්තර දෙන්න. වටේ ගිහින් වැඩක් නැහැ. රස්සාවට යන්න බැරි වුණේ හොරකම් කරලා අහු වුණු නිසා. *[බාධා කිරීම්]* අපට කියන්න දෙයක් නැහැ. මොනවාද කියන්නේ? අපි හරියට හම්බ කරලා තිබෙනවා, බඩු ගෙවලා තිබෙනවා, හරියට ජීවත් වෙලා තිබෙනවා. රස්සාව නැති වුණු මිනිස්සු නොවෙයි, අපි. අවුරුදු 33ක් මම මගේ රස්සාව කරලා තිබෙනවා. මේ පළාතේ හිටපු ප්‍රධාන නීතිඥයෙක් මම, දේශපාලනයට එනකොට. ඒවා ගැන කියන්න දෙයක් නැහැ. අපි මේ දේශපාලනයට ඇවිල්ලා තිබෙන්නේ සෙල්ලම් කරන්න නොවෙයි, මේ රටේ අල්ලස, දූෂණය මැඩලන්න අවශ්‍ය කරන දේවල් කරන්නයි. අපේ නලින්ද ජයතිස්ස මැතිතුමාගේ සහෝදරිය මාත් එක්ක වැඩ කරනවා. *[බාධා කිරීම්]* අහන්න, අජිත් පෙරේරාගේ practice එක කොහොමද කියලා. ඔය

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වගේ නොවෙයි. *[බාධා කිරීම්]* අපි රැල්ලට ආපු මිනිස්සු නොවෙයි. රැල්ලට විරුද්ධවයි පාර්ලිමේන්තුවට ආවේ, එතුමායි මමයි දෙදෙනාම. අහපු ප්‍රශ්නවලට ඔබතුමා උත්තර දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහපු ඒවාට උත්තර දෙන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 පෙබරවාරි මාසයේ 11වන දා විදුලිබල මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා මෙන්න මේ ලිපිය. මේ ලිපිය ඉදිරිපත් කරන දවසට ගණන් හදන්නේ ගල් අඟුරු නැව් 4ක් පිළිබඳවයි. ඒ ගල් අඟුරු නැව් 4න් සිදු වෙලා තිබෙන සමස්ත පාඩුව, ඍජු විදුලි ජනන අලාභය මිලියන 2,796යි. ඇස්තමේන්තුගත නඩත්තු සහ අලුත්වැඩියා සඳහා යන වියදම මිලියන 230.74යි. මුළු ඇස්තමේන්තුගත අලාභය බිලියන 3.02යි, එහෙම නැත්නම් මිලියන 3,000යි. සැපයුම්කරුගෙන් අය කර ගන්න පුළුවන් අලාභය, එහෙම නැත්නම් අලාභ පියවීම බිලියන 1.037යි. පාඩුව බිලියන 2යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇමතිතුමා ටෙන්ඩර් කොන්දේසි වෙනස් කරලා, අලුත් සමාගමකට මේ ටෙන්ඩරය දෙන්න දාපු ඩීල් එක නිසාත්, ප්‍රසම්පාදන කොමිසම නොමඟ යවපු නිසාත්, ප්‍රසම්පාදන කොමිසමේ සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුව දින 42ක් දෙන්න ඕනෑ එකට දින 21ක් දීලා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන් මේ ක්‍රමවේදයට එන එක වළක්වා, ඒ හරහා විවිධ බලපෑම් කරපු නිසාත්, ඊට පසුව බොරු හදිසියක් ඇති කරලා, බොරු ප්‍රමාදයක් ඇති කරපු නිසාත් නැව් 4කට අලාභය බිලියන දෙකයි, විදුලිබල මණ්ඩලය විසින් ගණනය කරපු ආකාරයට. මේක නැව් 20කට නම් කීයක් වෙයිද? එච්චරයි මට කියන්න තිබෙන්නේ. මේ එන හැම නැවේම, මේ නැව් අටේම ගල් අඟුරු බාලයි. මේ නැව් අටේම ගල් අඟුරුවල බලාපොරොත්තු වන බලශක්ති ප්‍රමාණය නැහැ. මේ නැව් අටේම අළු ප්‍රමාණය නියමිත ප්‍රමාණයට වඩා වැඩියි. දිගින් දිගටම මේ අලාභය සිද්ධ වෙනවා.

දැන් අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා කථාවක් කිව්වා. එතුමාට දුන්නු තොරතුරු අනුව නේ එතුමා කථා කරන්නේ. එතුමා මේ විෂයය පිළිබඳව දන්නේ නැහැ නේ. එතුමා කිව්වා, භය වෙන්න එපා, අපි මේ අලාභය පියවා ගන්නවා, රටට ප්‍රශ්නයක් නැහැ කියලා. එහෙම කිව්වේ පළමුවැනි නැවට. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද, විදුලිබල මණ්ඩලය එවා තිබෙන තොරතුරුවලට අනුව මේ බාල ගල් අඟුරු පාවිච්චි කිරීම නිසාත්, ටර්බයින් තල අධික ලෙස රත් වීම නිසාත් අලුත්වැඩියාවට සහ මාරු කිරීමට යන පාඩුව නැව් හතරකට මිලියන 100ක් බව? වායු පූර්ණ තාපක - APH - අවහිරතා පිරිසිදු කිරීමට යන වියදම -පාඩුව - මිලියන 50යි; බලාගාරය දින 21ක් වහන්න ඕනෑ. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය දින 21ක් වැහුවාම සිදු වන පාඩුව ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. ඒ වාගේම මේ බාල ගල් අඟුරු නිසා බොයිලේරු තල බාදනය වීම හේතුවෙන් අලුත්වැඩියාවට මිලියන 10ක් වැය වනවා. ඒ වාගේම එක් යන්ත්‍රයක් දින 14ක් වහන්න ඕනෑ. FGD පද්ධතිය තාපන මූලද්‍රව්‍ය මාරු කිරීමට මිලියන 60ක්, 70ක් වැය වෙනවා. එතකොට මේ බාල ගල් අඟුරු නිසා විදුලිය උත්පාදනය කිරීමේ අඩුවක් සිද්ධ වෙනවා. විදුලිබල මණ්ඩලයේ ගණන් හැදීම අනුව නැව් හතරකට අලාභය බිලියන දෙකයි. තව නැව් 20ක් එන්න තිබෙනවා. ඒ වාගේම ඒ නැව් ප්‍රමාදයි. මේ සියල්ල තිබියදී මේ බලාගාරයට, යන්ත්‍රවලට බිලියන ගණනක හානි වෙමින් තිබෙනවා. ඒ අනුව මේක බිලියන ගණනක අලාභයක් බවට පත් වෙනවා. මේක ඉතා බරපතළ ප්‍රශ්නයක්. මේ බරපතළ ප්‍රශ්නය නිසා රටේ ආර්ථිකයට හානියක් වෙනවා විතරක් නොවෙයි, මේ රටේ බලශක්ති

සුරක්ෂිතතාවට ගැටලුවක් ඇති වෙනවා. මක්නිසාද, අපේ රටේ ආර්ථිකයේ හදවත වාගේයි මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය. මේ ගල් අඟුරු බලාගාරය අකර්මණ්‍ය වුණොත් ආර්ථිකයම කඩා වැටෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, ගෝඨාභය රාජපක්ෂගේ කාලයේ අපිට ඩීසල් ගෙනෙන්න ඩොලර් නැති වුණු බව. ඩීසල් ගෙනෙන්න ඩොලර් නැති වුණු නිසා අපේ තාප බලාගාර, ඩීසල් බලාගාර ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒ නිසා පැය 12ක්, 13ක් විදුලිය විසන්ධි කළා; ආර්ථිකය කඩා වැටුණා; එතුමාට පැනලා යන්නත් වුණා. ඒ වාගේම තමයි, දිගින් දිගටම මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය මේ විධියට අනතුරට පත් වුණොත් සහ මේ තරම් දිගින් දිගට පාඩු සිද්ධ වුණොත් මේ රටේම ආර්ථිකය අඳුරට පත් වෙනවා. මේක තමයි, ප්‍රධාන කාරණය.

ගරු ඇමතිතුමා මීට කලින් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, අපි ටෙන්ඩරය දුන්නා, ඒ ටෙන්ඩරය දීලා බාල ගල් අඟුරු ආවාම මම මොකද කරන්නේ කියලා. හැබැයි, ඔබතුමා දන්නවාද, ඔබතුමාගේ අමාත්‍යාංශයේ Director (Technical), ටී.පී. කොඩිතුවක්කු මහත්මයා වාර්තාවක් දීලා තිබෙන බව? ඒ වාර්තාවේ දිනය 2025.08.05වන දා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සෙල්ලම කරනකොට, මේ ටෙන්ඩර් කොන්දේසි වෙනස් කරලා, ඒ වාගේම ප්‍රසම්පාදන කොමිෂන් සභාවට වැරදි තොරතුරු ලබා දීලා, බොරු හදිසියක් මවා පාලා, මේ කාර්ය පටිපාටිය අයුතු ලෙස පාවිච්චි කරන බව තේරුම් යනකොට එතුමා මේ විධියට ලියනවා. “However, proceedings with such a shortened bidding period may badly affect the quality of the supply and fairness and transparency of the bidding process and having a loss to the end result." කවුද මෙහෙම කියන්නේ? බලශක්ති අමාත්‍යාංශයේ තාක්ෂණික කටයුතු අධ්‍යක්ෂ ටී.පී කොඩිතුවක්කු මහත්මයා. කුමාර ජයකොඩි මැතිතුමනි, ඔබතුමා තමයි ඇමතිතුමා. අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් වෙනමම වාර්තාවක් ලියලා, ඔබතුමා මේ කොන්දේසි ටික වෙනස් කරනකොට, manipulate කරනකොට නැති වෙනවා කියන්නේ මොනවාද?

අවසානයේදී ලැබෙන ගල් අඟුරුවල තත්ත්වය බාල වෙන්න පුළුවන්, රටට පාඩු වෙන්න පුළුවන් කියන එක. නමුත්, ඔබතුමා සවන් දෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ Director (Technical) ට නොවෙයි. ඔබතුමා සවන් දෙන්නේ නැහැ, Director (Technical)ට. ඔබතුමා සවන් දෙන්නේ ජාවාරම්කාරයන්ට, අලුත් bidderට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ බලශක්ති ඇමතිතුමාට තමන්ගේ අමාත්‍යාංශයේ Director (Technical) මේ වැඩේ කරන්න එපා, මේකේ අවුලක් තිබෙනවා, මේ විධියට කාලය අඩු කරනකොට, බොරු හදිසියක් මවනකොට, මේ ක්‍රියාදාමය තුළ ගුණාත්මකභාවය අඩු වෙන්න පුළුවන් කියලා කියනකොට - දැන් මේ වෙලා තිබෙන්නේ ඒක නේ - හරි නම් විෂය භාර ඇමතිතුමා ඒක පිළිගන්න එපා යැ. එතුමාත් පිළිගන්නවා. මම හිතන විධියට, එතුමා කියන එකක් නැහැ, මේක හොඳයි කියලා.

මම ඔබතුමන්ලාට කියන්නේ මෙච්චරයි. මේ 159දෙනාම හොරු කියලා මම කියන්නේ නැහැ. ඒ අය යම් හේතුවක් නිසා, රටේ දේශපාලන ප්‍රවාහය නිසා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. ඒ වාගේම අපේත් පෞද්ගලික මිත්‍රයන් ඇතුළුව ඔබතුමන්ලාගේ cadre එක බොහෝ බලාපොරොත්තු ඇතුව පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. සමහරු කාලයක් අපට වැඩ කරපු අය. රටේ ජනතාව දේශපාලන වෙනසක් ඇති කරලා, අද වනකොට ඔබතුමන්ලා 159දෙනෙකු පාර්ලිමේන්තුවට එවා තිබෙනවා. ඒක පොඩි ගණනක් නොවෙයි නේ. අපේ දිස්ත්‍රික්කයෙන්ම 7දෙනෙකු පාර්ලිමේන්තුවට එවා තිබෙනවා. ඒ, එවපු අය තේරුම් ගන්න ඕනෑ කාරණය මොකක්ද? මේ රටේ ප්‍රධානම, වටිනාම ටෙන්ඩරයේ ගුණාත්මකභාවය පහළ ගිහිල්ලා තිබෙනවා. ආපසු ඒක, "නැහැ" කියන්න එපා. ආපසු ගල් අඟුරු හෝදන්න ලැහැස්ති වෙන්න එපා. හෝදලා ඉවර කරන්න බැහැ, ඇමතිතුමා. ගල් අඟුරු බාලයි; 1, 2, 3, 4, 5, 6, 7 සහ 8 කියන නැව්වල ගල් අඟුරු බාලයි. අද වනකොට නැව් 15ක් විතර එන්න ඕනෑ. නමුත්, මේ වනකොට ඇවිල්ලා තිබෙන්නේ ඒ ප්‍රමාණයෙන් භාගයයි. තව වෙනම ප්‍රශ්නයකුත් තිබෙනවා. වාරකන් කාලය එන්න කලින් නැව් ටික ආවේ නැත්නම් මේ බලාගාරය අවුරුද්ද පුරා අපට පවත්වාගෙන යන්න බැරි වෙනවා. මොකක්ද ඒකට හේතුව? මේ බලාගාරයේ පිහිටීම අනුව අපි අවුරුද්දටම අවශ්‍ය ගල් අඟුරු ටික වාරකන් කාලයට කලින් ගොඩ බා ගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up now.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තමන්ගේ අමාත්‍යාංශයේ තාක්ෂණික අධ්‍යක්ෂවරයා මේ වැඩේ වැරදියි කියද්දි, බැලූ බැල්මටම අද වනකොට බාල ගල් අඟුරු ඇවිල්ලා තිබියදි, ඒ ක්‍රියාදාමය manipulate කරලා, අලුත් bidder කෙනෙකුට ඒකට එන්න අවස්ථාව සලසා දෙනවා. මේ වාගේම ප්‍රශ්නයක් මීට කලින් මතු වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ප්‍රශ්නය මතු වුණු වෙලාවේදී විගණකාධිපතිවරයා 2022 සැප්තැම්බර් මාසයේ 30වැනි දින දරන මෙන්න මේ වාර්තාව ඉදිරිපත් කළා. ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා සභාපති ධුරය දරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒ නිර්දේශ අනුමත කළා. ඊට කලින් සිදු වුණු වැරදි අඩුපාඩු හැදුවා. කරන්න ඕනෑ මොනවාද කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනදී කිව්වා, මෙට්‍රික් ටොන් මිලියනයක අත්දැකීම් තිබෙන්න ඕනෑය කියලා. දැන් මොකක්ද තිබෙන ප්‍රශ්නය? අලුතින් මේ ටෙන්ඩරය දිනපු කෙනාට, undercut කරලා දිනපු කෙනාට, අඩු ගණනට සපයනවාය කියපු කෙනාට ගල් අඟුරු සපයා අත්දැකීමක් නැහැ. හොරකමට දක්ෂ වුණාට ගල් අඟුරු සැපයීමට ඔහුට පළපුරුද්දක්, දක්ෂකමක් නැහැ. මොකක්ද තිබෙන කොන්දේසිය, විගණකාධිපතිවරයාගේ වාර්තාවට අනුව? විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 5.5.1 (ආ) අනුව, පසුගිය මාස 36 තුළ GCV අගය 5,900 Kcal/kg හෝ ඊට වැඩි ධාරිතාවක ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියනයක් සැපයීමේ පළපුරුද්දක් තිබෙන්න ඕනෑ. රටේ තත්ත්වය සාමාන්‍ය වුණා. ඔබතුමාට කියන්න බැහැ, පරණ විධියට අපි කළාය කියලා. කලින් ආණ්ඩුවේ, වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවේ අඩුපාඩුකම් තිබුණා; ගෝඨාභයගේ ආණ්ඩුවේ අඩුපාඩුකම් තිබුණා. ඒවා කරන්නද ඔබතුමන්ලා ආවේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, would you please wind up now?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක් දෙන්න, මේ තර්කය ඉදිරිපත් කරලා ඉවර කරන්න. අපේ පක්ෂයේ කාලයෙන් ඒ වෙලාව අඩු කර ගන්න.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විගණකාධිපතිවරයා කියලා තිබෙන, විගණකාධිපති වාර්තාවේ 5.5.1හි තිබෙන කොන්දේසි සියල්ලම කඩ කරලා තිබෙනවා. ඒ වාගේම මේ කියන සමාගම ඉතාම අවම පළපුරුද්දක් තිබෙන හෝ බොරු ලේඛන ඉදිරිපත් කළ සමාගමක්. ඒවා ගැන හොයා බැලුවේ නැහැ. ඒවා ගැන හොයා බලන්නේ නැතුව අන්ධානුකරණයෙන් භාර ගත්තා. ඔබට අවශ්‍ය විධියට නිලධාරින් දමාගෙන මේ ක්‍රියාදාමය manipulate කළා. මම ඒකයි ඔබතුමාට කියන්නේ, ඇමතිතුමනි. ඔබතුමාගේ ඉතිහාසය හොඳ නැහැ නේ. ඔබතුමා මීට කලින් මේ වාගේ ටෙන්ඩර් මගඩියකට පැටලුණු මනුස්සයෙක්. ඔබතුමාට ඒකට කියන්න හේතු තිබෙන්න පුළුවන්, "මම නොවෙයි, මගේ ගෝලයා තමයි කළේ" කියලා. එහෙම නේ ඔබතුමා කලින් කිව්වේ. හැබැයි, ඔබතුමා කළත්, ගෝලයා කළත් ඔබතුමා ටෙන්ඩර් මගඩියකට පැටලිලා රස්සාව නැති කර ගත්ත මනුස්සයෙක්. ඔබතුමාව මේ රටේ බලගතුම ඇමතිකමට පත් කරලා, මේ රටේ ජාතික ආර්ථිකය සම්පූර්ණ අනාරක්ෂිත තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ නිසා තමයි මේ ආණ්ඩුව දුර්වල වෙන්නේ; ඒ නිසා තමයි මේ ආණ්ඩුව වැරදි වෙන්නේ; ඒ නිසා තමයි මේ ආණ්ඩුව දූෂිත වෙන්නේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා වගකීම භාර අරගෙන, ඉල්ලා අස්වෙලා ගෙදර යන්න. හොඳ මිනිස්සු මේ ආණ්ඩුවේ 159දෙනා අතර ඉන්නවා. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ajith P. Perera, would you please wind up?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මට තව පොඩි වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ පරීක්ෂණයක් තිබෙනවා, ඇමතිතුමා. ඔබතුමාට අධි චෝදනා ගොනු කරන්න ඔන්න මෙන්න තිබුණේ. පුවත් පත්වලත් ඒ ගැන පළ වුණා.

ඔබතුමා pressurize කරලා ඒක නතර කරගෙන ඉන්නවා. අස්වෙන්න, ඇමතිතුමා. අස්වෙලා ගෙදර යන්න. ලජ්ජා නැද්ද? ඔබතුමාට උපාධියක් තිබෙනවා කියනවා නේ. ඒ උපාධියට ගැළපෙන මොකක් හරි රක්ෂාවක් වෙන රටකින් හෝ හොයා ගෙන යන්න, මේ රටේ ආර්ථිකය විනාශ කරන්නේ නැතුව. පිරිසිදු මිනිස්සු වාගේ ඇවිල්ලා ජනතාව රවටා හැම දාම කෝටි-ප්‍රකෝටි ගණන් හානි කරනවා. අදත්, හෙටත් මේක සිද්ධ වෙනවා. ඉදිරියේදී මේ රටට එන "බාල" යැයි කියන හැම නැවකින්ම මේ රටේ ආර්ථිකය විනාශ වෙනවා. ඒ නිසා කරුණාකරලා වගකීම භාර ගෙන ඉල්ලා අස්වෙන්න. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kumara Jayakody. You have 16 minutes.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Thondaman, why are you on your feet? - *[Interruption.]* I will give you time once the Hon. Minister finishes his speech.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. What is your issue, Hon. Member?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களிடம் நான் ஒரு விடயத்தைக் கேட்கவிருக்கிறேன். கடந்த மாதம் சம்பளப் பிரச்சினை சம்பந்தமாக ஓர் ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டது. அது ஒப்பந்தம் கிடையாது, புரிந்துணர்வு உடன்படிக்கை என்ற விடயம் அதன்பிறகு வெளிவந்தது. இப்போது அந்தப் புரிந்துணர்வு உடன்படிக்கை சம்பந்தமாகத் தொழிற்சங்கங்கள், ஊடகப் பிரிவினர், அரசியல்வாதிகள், சிவில் அமைப்புகள் போன்றோர் விபரங்களைக் கோரியிருக்கின்றனர். ஆனால், அரசாங்கம் அதை வெளியிட மறுக்கின்றது. அரசாங்கத்தின் சார்பில் கையெழுத்துப் போடப்பட்ட அந்த ஒப்பந்த ஆவணத்தை இந்தச் சபையில் சமர்ப்பிக்கும்படி நேற்றும் நான் கேட்டிருந்தேன். அதை நீங்கள் பாராளுமன்றத்தில் சமர்ப்பிப்பீர்களா? இது ஒரு விடயம்.

இரண்டாவது, ஹங்குராங்கெத்த பகுதியில் ஹோப், ரொக்வூட், ஹேவாஹெட்ட, லூல்கந்துர ஆகிய இடங்கள் பாதிப்புக்குள்ளாகியுள்ளன. லூல்கந்துரவில் மொத்தமாக 11 பேர் இறந்திருக்கிறார்கள். ஆனால், இந்தப் பகுதிகளுக்கு எந்தவிதமான உதவிகளும் போய்ச் சேரவில்லை. இது சம்பந்தமாகவும் உங்களிடமிருந்து பதிலை எதிர்பார்க்கிறேன்.

நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kumara Jayakody, you can start your speech now.

[අ.භා. 12.09]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව දැක්කාම මට මතක් වුණේ කොට හුඹහයි, කොට මිනිහයි විශ්වාස කරන්න එපා කියන කථාව. මේ යෝජනාවම බොරුවක්. *[බාධා කිරීමක්]*

මොකද, මෙහි අන්තර්ගතය ගැනවත් තේරුමක් නැතුව තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මේකේ මුලින්ම තිබෙනවා, "2025-2026 ගල් අඟුරු වාරය සඳහා ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයට අවශ්‍ය වන ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 12.32ක ප්‍රමාණය..." යනුවෙන්. සාමාන්‍යයෙන් වාර්ෂිකව මෙයින් 1/5කටත් වඩා ඕනෑ වෙනවා. මම දන්නේ නැහැ, මේ බොරු මත පදනම් වෙලා එක එක දේවල් කියන්නේ මොකාද කියලා. එතැනින් තමයි මේක පටන් ගෙන තිබෙන්නේ. මේ වාගේ ප්‍රශ්න මතු කර මේ ගරු සභාව නොමඟ යවන්න උත්සාහ කරන්නේ ඇයි කියලා මම දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

මේක පිළිගන්න බැහැ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඔව්, මේක පිළිගන්න බැහැ. තනිකරම බොරුවක්. මේකේ අන්තර්ගතය ගැනවත් දන්නේ නැතුව තමයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ කියන කාරණය තමයි අපට කියන්න තිබෙන්නේ. මේ යෝජනාව ඉදිරිපත් කළාට, දැන් මෙතැන අහගෙන ඉන්නවත් කවුරුවත් නැහැ. *[බාධා කිරීම්]* ඔව්. කවුරු හරි දෙන මොනවා හෝ කුණු ගොඩක් ගෙනැල්ලා මේ සභාව නොමඟ යවනවා.

ඊළඟට මෙහි සඳහන් කර තිබෙනවා, මෙම කටයුත්තේදී වැරදි විධියට ප්‍රසම්පාදනය කර තිබෙන බවක්. ඒ කියන්නේ මූල්‍ය ශක්‍යතාව, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් කියන කාරණා 2022 සැප්තැම්බර් 30 Audit Report එකට අනුව සිදු කර නැහැ කියන එක තමයි මේකේ මූලික පදනම කරගෙන තිබෙන්නේ. මගේ ළඟ තිබෙනවා, 2022 සැප්තැම්බර් 30 දිනැති Audit Report එක. 2022-2023, 2023-2024 සහ 2024-2025 කියන වර්ෂ 3 සඳහා ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 4.5ක් මිලදී ගැනීමට සිදු කරන ලද ඉතාම දූෂිත සැපයුම් කොන්ත්‍රාත්තුව කිසිම සුදුසුකමක් නැති අයට පිරිනැමීම පිළිබඳව වූ Audit Report එක තමයි මේ තිබෙන්නේ. එහි ඔය කියන වචන ටික එහෙමම තිබෙනවා. මේකේ නිර්දේශ 7.2 යටතේ සඳහන් කර තිබෙනවා, "මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණුවලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුළු මූලික අවශ්‍යතාවන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ මූලික ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරගකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය" යනුවෙන්. ඕක තමයි නිර්දේශය තුළ තිබෙන්නේ. ඒ වචන ටිකම තමයි මෙතුමා copy කර දමා තිබෙන්නේ. මේක, 2022 සැප්තැම්බර් 30 දිනැති විගණන වාර්තාව.

ඒ අනුව, Lanka Coal Company (Pvt.) Limited එක අදාළ ප්‍රසම්පාදනයේදී- 2022 කිව්වාම, 2022/2023 තමයි ඊළඟ ගල් අඟුරු සැපයුම් වර්ෂය වෙන්නේ. ඒකට අදාළ විශේෂ ස්ථාවර Cabinet Appointed Procurement Committee එකේ Report එක තමයි මා ළඟ තිබෙන්නේ. ඒකේ "Background" එකේ 3වන කරුණ යටතේ මෙසේ කියා තිබෙනවා:

> "In line with the directives given by the Committee on Public Enterprises and views expressed by Cabinet of Ministers considering the Cabinet Memorandum No: 23/0609/621/026, dated 27.03.2023, relaxation of eligibly criteria for registration with Lanka Coal Company has been made by SSCAPC to enhance the competitiveness."

එම Procurement Committee එක අන්තිමට එය consider කරලා තමයි එම තීරණය අරගෙන තිබෙන්නේ. එහි SSCAPC Decision යටතේ 12 ii හි මෙසේ සඳහන් වෙනවා:

> "Amend clause 10.2.b to reduce from 1 million MT to 500,000 MT of coal supply experience. Accordingly, the coal supply experience at least 500,000 MT of coal during the previous 36 months. Furthermore, at least 100,000 MT of experience with a Gross Calorific Value (As Received Basis) of 5,900 kcal/kg or above is required."

ඒක තමයි කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, 2022/2023 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදනයේදී - අපේ මන්ත්‍රීවරු කියන - Audit Report එකේ නිර්දේශ ක්‍රියාත්මක කරලා තිබෙනවා. එතකොට ඒක තමයි දිගටම -2025/2026 වර්ෂයේ ප්‍රසම්පාදනයේදීත් - පාවිච්චි කරලා තිබෙන්නේ. ඒ කොහේවත් මේක normalize කරන්න කියා නැහැ. මම දැක්කා, ආංශික අධීක්ෂණ කමිටුවේදී මේක normalize කරන්න කියා තිබෙනවා. මේක පටලවනවා. බොරුව තමයි මේ සමාජගත කරන්නේ. 2023 තමයි ඒක වෙනස් කළේ කිව්වාම, "එතකොට Audit Report එක අනුව normalize කළේ නැද්ද?" කියලා අහනවා. Audit Report එකේ කියලා තිබෙන්නේ ලිහිල් කරන්න කියලා. ලිහිල් කරලා තිබෙන්නේ, 2023දී. එක අතකින් ගත්තාම ඒකේ බලාපොරොත්තුව ඇත්තටම ඉටු වෙලා තිබෙනවා. මොකද, අපි ටෙන්ඩර් සඳහා සැපයුම්කරුවන් register කරලා තිබෙනවා. එහි prequalification system එකක් තිබෙනවා. ඒකෙදි ඉස්සෙල්ලාම සුදුසුකම් ඔක්කෝම බලලා තමයි register කරන්නේ.

අපේ ආණ්ඩුව පත් වෙන්න ඉස්සෙල්ලා, පසුගිය අවුරුදුවල කළා වාගේ නිකම් මේ පාරේ යන කට්ටිය අරගෙන ඇවිලා, තමන්ගේ ඥාතීන් ඇවිලා කැබිනට් මණ්ඩලය හරහා සැපයුම් කොන්ත්‍රාත් ලබා දුන් ටෙන්ඩර් එකක් නොවෙයි, මේක. මේක online ක්‍රමය යටතේ applications call කරලා, අර කියන ඔක්කෝම ක්‍රමවේද අනුව සහ සුදුසුකම් පරීක්ෂා කර බලා තමයි තෝරාගෙන තිබෙන්නේ. 2025/2026 අවුරුද්දේ tenders call කළාම සැපයුම්කරුවෝ 26දෙනෙක් ඉදිරිපත් වෙලා සිටියා. ඒකෙන් අපට ලංසු 10ක් හම්බ වුණා. ඇත්තටම ලංසු 11ක් ඉදිරිපත් වුණා. එක්කෙනෙක් ඒකට සහභාගි වෙන්න බැහැ කියලා ලියුමක් දීලා තිබුණා. අපට වලංගු ලංසු 10ක් ලැබුණා. ඒක තමයි ගල් අඟුරු ප්‍රසම්පාදනයට ඉතිහාසයේ සිට ගත්තාම ලැබුණු වැඩිම ලංසු ප්‍රමාණය. 2022 අරමුණු මෙතැනදී තමයි ඉටු වුණේ. ඒ කියන්නේ, සහභාගිත්වය වැඩි කරන්න, තරගකාරිත්වය වැඩි කරන්න කියන කාරණා මේ අවස්ථාවේ තමයි ඉටු වුණේ. මෙම කාර්ය කිසිකෙනෙක් focus කරලා, කිසිකෙනෙක් විශේෂිත කරලා කළ එකක් නොවෙයි. 2022දී ටෙන්ඩර් ක්‍රියාදාමය කරලා තිබෙන්නෙත් දින 21කින් තමයි. 2021/2022 අවුරුද්දේ pre-bid meeting එකේදී තව කාලය ඉල්ලා තිබෙනවා. හැබැයි, එක දවසක් දීලා නැහැ. අපි දින 21ක් දීලා, සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත තව දවස් 7කුත් දුන්නා. අපට ඕනෑ එහි අස්වැන්න - harvest එක - වැඩි කරගෙන හොඳ මිලකට ගල් අඟුරු ගන්නයි. එහෙම නැතුව, කාවවත් වළක්වලා ගන්න නොවෙයි. අපි සම්පූර්ණයෙන් විවෘත ටෙන්ඩර් කැඳවීමක් කරලා තිබෙනවා. එහි වගකීම අපි ගන්නවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, let the Hon. Minister finish. I will give you time. Maybe, you want to question something more.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිරිපත් කළ අසත්‍ය - ව්‍යාජ - කල් තැබීමේ යෝජනාවේ ඊළඟට තිබෙනවා, ප්‍රමාදයක් ගැන. ඇත්තටම 2024/2025 අවුරුද්දේ අපි එනකොට තිබුණු සැපයුම් කොන්ත්‍රාත්තුව අනුව සැපයුම්කරු අප්‍රේල් වනකොට නියමිත ප්‍රමාණය දීලා ඉවර වෙලා තිබුණේ නැහැ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let him finish, Hon. Member. I will give you time after that.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අප්‍රේල් වනකොට තව නැව් 11ක් එන්න තිබුණා. හරි නේද?

ඔය, දූෂිත තෝරා ගැනීම්වල සැපයුම්කරුවෝ. ඒගොල්ලන් නැව් 11ක් දෙන්න තිබුණා. ඒ නැව් 11 දෙන්න පටන් ගත්තේ සැප්තැම්බර් මාසයේ ඉඳන් දෙසැම්බර් මාසය දක්වා කාලයේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, do you wish to be interrupted? Do you want to take this up?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
No, Sir. Allow him after my speech.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Member, you can raise it after his speech because the Hon. Minister does not want to be interrupted.

Hon. Minister, you may continue.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නොරොච්චෝලේ බලාගාරය හදන්න තෝරා ගැනීමේදී ප්‍රධානම සාධක නොසලකා හැර තිබෙනවා. එතැන භූමිය තෝරා ගැනීමේ ඉඳලා ප්‍රශ්න තිබෙනවා. මාස අටක විතර කාලයක් ඇතුළත තමයි අපට මේ ගොඩබෑම කරන්න පුළුවන් වන්නේ. එක වරකට එක පාරයි. මොකද ස්ථිර ජැටියක් නැති නිසා මුහුද මැද තියලා බාන්නේ. එතකොට එක වරකට එක නැවයි බාන්න පුළුවන්; back-to-back vesselsවලින් තමයි බාන්න වෙන්නේ. පසුගිය දූෂිත මගඩියේ ගල් අඟුරු ඇවිල්ලා තිබෙනවා, සැප්තැම්බර් ඉඳන් දෙසැම්බර් 7වැනි දා වෙනකල්. ඒ වෙනකල් අපට ගල් අඟුරු අලුතින් ගෙනැල්ලා බාන්න තැනක්, එහෙම නැත්නම් බාන්න පහසුකම් නැහැ. දෙසැම්බර් එනවා නම් අපි දෙසැම්බර් අග ඉඳන් තමයි අලුත් එක පටන් ගන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමෙකුත් කිව්වා වාගේ, ඒ සැපයුම්කරුවා පළමුවැනි තොගය ගෙනාවා, දෙසැම්බර් 30 වනකොට. අද වනකොට 9වැනි නැවේ ගල් අඟුරු බානවා. 10වැනි නැවත් ඇවිල්ලා තිබෙනවා. 11වන නැවත් මඟ එනවා. 12, 13 නැව්වලට ගල් අඟුරු පටවනවා. ඒ විධියට දිගටම ඒ chain එක ක්‍රියාත්මක වනවා. මෙතැන ප්‍රමාදයක් වෙලා නැහැ. ප්‍රමාදය වෙලා තිබෙන්නේ කලින් කොන්ත්‍රාත් ගිවිසුම්වල. ඒ ගැන කවුරුවත් දන්නේ නැහැ. මේ ඔක්කෝම ඉන්නේ කිසිම දෙයක් දන්නේ නැහැ වාගේ. බාල ගල් අඟුරු, එහෙම නැත්නම් quality එක අඩුයි කියන ඒවා 2014දීත් ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ඒ විධියට කලිනුත් වෙලා තිබෙනවා. සමහර අවුරුදුවල පාඩුව සම්බන්ධයෙන් ශත පහක්වත් අය කරගෙනත් නැහැ. සමහර අවුරුදුවල අය කර නොගෙන ඉතිරි වෙලා තිබෙනවා, ඩොලර් මිලියන අටකට වැඩිය. ඒවා අය කර ගන්න තිබෙන ඒවා. ඔය කෑ ගහන අයගේ ආණ්ඩු කාලයේ ශත පහක්වත් අය කරගෙන නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී කොහොමටවත් ප්‍රමාදයක් වෙලා නැහැ.

මෙතැනදී තව කිව්වා, damages ගැන. මේ ගැන අපි පරීක්ෂා කරලා බැලුවා. ගල් අඟුරු තත්ත්වයෙන් හොඳයි කියනවා නේ. 2025 අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ ඉඳන් දෙසැම්බර් මාසය අතර කාලයේදී ගල් අඟුරු බලාගාරයේ unit එකක් පැය 72ක් වැඩ කරලා නැහැ. ඒවා තනිකරම boiler tube leak වෙලා තමයි වැඩ කරලා නැත්තේ. එහෙම නැතුව maintenance නිසා නොවෙයි. Boiler tube leak වීම නිසායි එහෙම වෙලා තිබෙන්නේ. ගල් අඟුරුවල තත්ත්වය මේකට බලපානවාද කියලා මේ විධියට කියන්න බැහැ. ඒ බලාගාරය පටන් ගත් 2011 අවුරුද්දේ ඉඳලා අවුරුදු කීයක මාස කීයක්, දවස් කීයක් damage වෙලා තිබෙනවාද? එහි history එක ගත්තොත්, මෙතැන ඉන්න සිහිබුද්ධිය තිබෙන ඕනෑ කෙනෙකුට තේරෙනවා, එදා ඉඳන් ගල් අඟුරු බලාගාරයේ units off කරනවා, කඩා වැටෙනවා කියලා. ඕක තමයි හැම දාම තිබුණු තත්ත්වය. දැන් තමයි units තුනම ක්‍රියාත්මක වෙන්නේ. ඒක නිසා බොරු කතන්දර කියන්නත් බැහැ.

අනෙක් එක තමයි, OEMගේ - Original Equipment Manufacturerගේ - නිර්දේශ අනුව මේක ගෙන යන්න ඕනෑ සාමාන්‍යයෙන් මෙගාවොට් 250 - 300 අතර range එකේ. සාමාන්‍යයෙන් shipmentsවලදී අපි මෙගාවොට් 265ට ගෙන යනවා. එම නිසා ඒකෙන් කොහෙත්ම පාඩුවක් වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් විශේෂයෙන්ම කියන්න ඕනෑ.

No tube failures have been reported by plant engineers. මේ දක්වා එහෙම වෙලා නැහැ, මේවා ආවාට පස්සේ. Although

higher ash content may cause boiler tube erosion in the long run, its extent can be determined through detailed technical studies such as comparative surface microstructure analysis. නිකම් බලාගෙන ඉඳලා මන්ත්‍රීවරුන් ගිහිල්ලා කොළවල ලියලා දුන්නාට ඒක නිර්ණය වෙන්නේ නැහැ, කොහොමත්. Therefore, without a comprehensive reliability assessment and adequate historical data, the long-term impact of low-grade coal cannot be quantitatively evaluated. The minimum recorded capacity due to this coal shipment was 265 megawatts, which was within the safe range as recommended by the OEM and well above the part load maintained during solar plant curtailments. Solar plants curtail කරන වෙලාවේ මීට වඩා අඩුවෙන් තමයි coal පාවිච්චි වුණේ.

Accordingly, there is no evidence of adverse impact on the turbine from these coal shipments. Additional maintenance costs, including air preheater cleaning and blockage removal, can be assessed, if properly recorded. To date, no such issues have been observed and further operational data is being collected for analysis. Emission downstream of FGD - Flue-Gas Desulfurization - unit is continuously monitored by the Ambient Air Quality Monitoring System, and recorded data show no significant increase or any problem associated with FGD during the period of these coal shipments.

මෙතැන කියලා තිබුණා, FGD damage වෙනවා, ඒවා අලුතින් repair කරන්න වෙනවා කියලා. එහෙම කිසිම දෙයක් වෙන්නේ නැහැ. මොකද, coal plant එකේ තිබෙන data අනුව ambient temperature එක හෝ එහි තිබෙන වායු දූෂණය වීමක් සිදු වෙලාම නැහැ. ඒ නිසා අපි නිකම් ash content වාගේ වචන කිව්වාට හරියන්නේ නැහැ. Coal plant එකේ recordsවලට අනුවයි අපි මේවා කියන්නේ. ඒ වාගේම, අපේ රටේ තිබෙන ප්‍රධාන ආයතනයක් විසින් එය check කර තිබෙනවා. වායු දූෂණය ගැන බැලුවාම, Particulate Matter 2.5 ගත්තොත්, 50 microgram per cubic metre තමයි තිබෙන්න ඕනෑ. මේ කාලය ඇතුළත එය 21-27 range එක තුළ තමයි තිබෙන්නේ. අපි Particulate Matter 10 ගත්තොත්, 100 microgram per cubic metre තමයි තිබෙන්න ඕනෑ. නමුත්, ඒකත් තිබෙන්නේ 100ට අඩුවෙන්; දිගටම 38යි, 35යි, 73යි.

කාබන් මොනොක්සයිඩ් ප්‍රධාන දෙයක්. ඒක 24 hours not available. ඒක තිබෙන්න ඕනෑ, 9,000 ppb for eight hours. නමුත්, 24 hours check කළාමත් ඒ ප්‍රමාණය ඇවිල්ලා නැහැ. ඒක maximum ඇවිල්ලා තිබෙන ප්‍රමාණය 886යි.

ඊළඟට, නයිට්‍රජන් ඩයොක්සයිඩ් ගත්තොත්, 50 ppb තමයි තිබෙන්න ඕනෑ. එය 3.3, 5.6 සහ 3.8 කියන range එකේ තමයි දැනට පවතින්නේ. ඒ වාගේම, සල්ෆර් ඩයොක්සයිඩ් ගත්තොත්, එහිත් 30 ppb තමයි තිබෙන්න ඕනෑ. එය 9.1, 5.7 සහ 6 කියන rangesවල තමයි දැනට තිබෙන්නේ. ඒ නිසා තාක්ෂණිකව මේ වචන හෝ බොරුවට මේවායේ ලියා තිබෙන ඉලක්කම් පිළිබඳව නොව මෙහි ඇත්ත දේ සම්බන්ධයෙන් අපි විමර්ශනය කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අපි මේ වනවිට විමර්ශන කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, මෙහිදී කිසිම වංචාවක් කරලා නැහැ. මොකද, වංචාව හෝ දූෂණය ගැන කථා කරන්න එහි නිර්වචනය තේරෙන්නේ නැහැ. මේක intentionally කවුරුවත් කළේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. මොකද, අපි ඒ ගැන පරීක්ෂා කරනවා. කලින් ඉඳලාම මේ ප්‍රසම්පාදන ගැන, මේ සැපයීම් ගැන ප්‍රශ්න තිබිලා තිබෙනවා. 2015 විතර වෙනකල්ම Load Port Report එකට විතරයි සියයට සියයම ගෙවලා තිබෙන්නේ. ඊට පසුව තමයි මෙහෙනුත් check කරන්න අරගෙන තිබෙන්නේ. මේක එහෙම කාලයෙන් කාලයට වෙනස් වෙමින්, දියුණු වෙමින් ආපු ක්‍රමවේදයක්. අපි හිතනවා, තව ඉස්සරහට මේ ගැන හරියට study කරලා, මෙහි තිබෙන ප්‍රශ්න විසඳාගෙන ඉස්සරහට යන්න ඕනෑ කියලා. මොකද, ලංකාවේ තිබෙන situation එකයි, අපේ plantsවල තිබෙන situation එකයි කියන ඔක්කොම හරියට දැනගෙන මේක ඉස්සරහට ගෙනයන්න ඕනෑ කියලා මම හිතනවා. ඇත්තටම අපි ඒකට අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. අමාත්‍යාංශයේ ලේකම්තුමා හරහා අපි ඒ ගැන කියලා තිබෙනවා. මේ විධියට අපි වැඩිපුරත් මෙහි පරීක්ෂණ කරන්න, අවශ්‍ය දේවල් හඳුනා ගන්න ඉස්සරහට කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි, ඉදිරි ප්‍රසම්පාදනයේදී අපි වෙනස් කර ගන්න ඕනෑ දේවල් මොනවාද කියා බලන්න ඕනෑ. ඒ හැරෙන්න, මේ කියන යෝජනාවම පදනම් වෙලා තිබෙන්නේ බොරු විධියටයි. මොකද, පැහැදිලිවම මේ යෝජනාවේ චෝදනාවක් විධියට කියා තිබෙනවා, turbine එකේ blades damage වෙනවාය කියලා. මම දන්නේ නැහැ, මේවා කවුරු හරි ලියා දෙනවා ඇති. ඊට පස්සේ කවුරු හරි ඇවිල්ලා ඒවා කියවනවා. නමුත්, ඒ ගැන කියන මනුස්සයා හරි සිහියෙන් ඒක කියන්න එපා යැ. මොකද, turbine එකට coal ළං වෙන්නේවත් නැහැ. බොයිලේරුවේ වතුර රත් කරන එක, pressure කරන එක තමයි coalවලින් කරන්නේ. ඊට පසුව pressure වෙච්ච steam ටිකෙන් තමයි turbine එක කරකවන්නේ. Steam එක එක්ක coal එන්නේ නැහැ, turbine එකට. එහෙම වෙනවා නම් ඒක වෙනම ප්‍රශ්නයක්. ඒකට අපි වෙනම උත්තර දෙන්න ඕනෑ, ඔය වාගේ දේවල් කියන අයගේ දැනගැනීමට. එහෙනම්, මෙච්චරකල් blades damage වෙලා තිබෙන්නේ ඔහොම වෙන්න ඇති. මේකේ history එක ගත්තොත්, ගෙනාපු දවසේ සිට Unit 1 ලෙඩ දුන්නා. පසුගිය අවුරුද්දේ හතර වතාවකට වඩා damage වෙලා repair කළා. පසුගිය අවුරුද්දේ average එක ගත්තොත්, සාමාන්‍යයෙන් plants තුනෙන් දෙකකට වඩා ක්‍රියාත්මක වෙලා නැහැ. එතකොට ඔය කියන හොඳම coal ගෙනැල්ලා තිබුණේ. Coal ගැන විතරක් නොවෙයි මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ. Coal ගැනත් ප්‍රශ්න තිබෙනවා වෙන්න පුළුවන්. අපි ඒවා ගැනත් හොයනවා. ඒ නිසා අපි මේ කිසිම දෙයක්, කිසිම විධියකින් බැහැර කරන්නේ නැහැ, මේකේ කිසිම දෙයක් නැහැ කියලා.

හැබැයි, අපි කරගෙන ආපු ප්‍රසම්පාදන ක්‍රමවේදය, සැපයුම්කරුවන් තේරීම ආදී ඔක්කෝම දේවල් ක්‍රමවේදයකට අනුව කරනවා. මෙච්චර කල් කිසිම ක්‍රමවේදයක් නැතුව, Cabinet Papers දාලා වැරදි විධියට කරපු ඒවා කාටවත් පෙනුණේ නැහැ. 2022දී ටෙන්ඩර් එක ගත්තා නම් අපි ඊයේ පෙරේදා වෙනකම්ම ඩොලර් 328ට තමයි coal මෙට්‍රික් ටොන් එකක් ගන්නේ. ඒ ටෙන්ඩර් එක ඇනුණු එකම හොඳයි. 2022 අවුරුද්දේදී මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 328කුත්, ශත ගණනකට තමයි ගන්න තීරණය කරලා තිබුණේ. ඒකට විරුද්ධව තමයි ඔය Audit Report එක ගහලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, ඒක තමයි. මම මේ කියන අයවත් බහුතරයක් ගෙදර යවා තිබෙන්නේ ඒක තමයි. අපි ඒක නිවැරදි කරගෙන යනවා. දැනට තිබෙන එක අපි කරගෙන ආවා. අපි දැන් ඒක ඉස්සරහට නිවැරදි කරගෙන යනවා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ. අපි ඒකට අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

ඊළඟට, direct feeding ගැන කථා කරනවා. Direct feeding ගැන කිව්වා වාගේම ඇත්තටම අපි ගොඩක් දවස්වල මෙගාවොට් 2,250ට වැඩිය අරගෙන තිබෙනවා. මොකද, limit කරන්න කියලා තිබෙන්නේ මෙගාවොට් 2,250 - 2,300 අතර. මොකද, විශේෂයෙන් දවල් කාලයේ අපි limit කරන්න ඕනෑ, අපට solar penetration එක වැඩි හින්දා. ඒ හැම දෙයක් ගැනම විස්තර මා ළඟ තිබෙනවා. ඔය කියන තරම් ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]*

[ගරු කුමාර ජයකොඩි මහතා ]

නැහැ, නැහැ, කියන තරම් ප්‍රශ්නයක් නැහැ. ඔයගොල්ලන් කියන එකක් නොවෙයි. මේවායේ ප්‍රශ්න තිබෙනවා. මෙහෙම නේ. මේකේ ක්‍රමවේද හදන්න තිබෙනවා. *[බාධා කිරීමක්]* මෙහෙමයි. මේකේ, දඩ ගහන ක්‍රමවේද තිබෙනවා. මේ ගල් අඟුරුවල තාපජනන අගය 5900 kcal/kg - 6,150 kcal/kg අතර නැත්නම් දඩ අය කර ගන්න පුළුවන් කියලා මේ ගිවිසුමේ condition එකක් තිබෙනවා. අපි කොම්පැනි හෝදන්නේත් නැහැ; footnote ගහලා හෝදන්නේත් නැහැ. අපි ඒවා කරන්නේ නැහැ. අපේ කොම්පැනිත් නැහැ; අපි ඔය කොම්පැනිවලට සම්බන්ධත් නැහැ; අපි ඔය කොම්පැනි එකකටවත් telephone call එකක්වත් අරගෙන නැහැ. ඒක නිසා අපිට මේ සම්බන්ධයෙන් පිරිසිදුව කථා කරන්න පුළුවන්. මේ ගිවිසුම්වල ඔය වාගේ ප්‍රශ්න එනවාට තමයි අදාළ විධියට formula හදා තිබෙන්නේ. තාපජනන අගය 5900 kcal/kg - 6,150 kcal/kg අතර නැත්නම්, තාපජනන අගය 5900 kcal/kgට අඩු වෙනවා නම් ඒකට double ගෙවන්න වෙනවා. ඒ විධියට තමයි තිබෙන්නේ. ඒ හැම දෙයක්ම තිබෙනවා. අපි ඉස්සරහට බලනවා, තව මේවා වෙනස් කරන්න ඕනෑ ද කියලා. මොකද, අපි විශේෂයෙන්ම ඉල්ලන්නේත් ලෝකයේ ටිකක් ගන්න අමාරු quality එකක coal ටිකක්. සාමාන්‍යයෙන් රටවල් ගොඩක් GCV එක 4,000 ගණන්වල ඉඳලා ඉල්ලනවා. අපි ඉල්ලන්නේ ටිකක් high-end එකක්. ඒවා ගන්න පුළුවන් රටවල් සීමිතයි. ඒවා ගන්නකොට මේ වාගේ ප්‍රශ්න එනවා. අපිට ඒවා ගැනත් ඉස්සරහට හිතන්න වෙනවා. එහෙම නැතුව මේ දේවල් අපේ රටේ හදාගෙන අපට කරන්න බැහැ නේ. Coal හදාගෙන මේ දේවල් කරන්න අපට බැහැ. අපට world market එකෙන් තමයි ඒවා ගන්න තිබෙන්නේ. ඒවා ගන්නකොට ඒවායේ වෙනස්කම් වෙන හින්දා තමයි ඔය conditions දාලා තිබෙන්නේ. ඒවා අපි දාපුවා නොවෙයි. ඒවා international conditions. ඒවාට එකඟ වෙලා තමයි අපේ රටට එන්නේ. ඒවාත් එක්ක තමයි අපි ඉස්සරහට යන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, we have to suspend the Sitting for lunch.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මෙහිදී කිසිම විධියකින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේවත්, සැපයුම්කරුවෝ වෙනස් කිරීමේ ක්‍රමවේදයක් හෝ වෙනත් දෙයක් අපි කරලා නැහැ. Contract එක ඕනෑම වෙලාවක default කරන්න පුළුවන් නම් අපි ඒක ඒ වෙලාවට default කරනවා. ඒ හැරෙන්න අනීතිකව කිසිම දෙයක් අපිට කරන්න බැහැ. අපි නීත්‍යානුකූලවයි වැඩ කරන්නේ. එම නිසා අපි ඒ ආකාරයට වැඩ කටයුතු කරනවා. ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Hon. Deputy Speaker,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have to suspend the Sitting for lunch. Could you take it up after lunch?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Yes, Sir, I will take it up after lunch.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Madam, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමා කලින් කිව්වා මට අවස්ථාව දෙනවා කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් කථා කළ ගරු ඇමතිතුමා කිව්වා, "යම් අලාභයක් වෙලා තිබෙනවා. හානියක් වෙලා තිබෙනවා. ඒක පොඩ්ඩයි" කියලා. මේ සම්පූර්ණ කොන්ත්‍රාත්තුව අවසන් වෙනකොට මේ තරම් බාල ගල් අඟුරු දිගින් දිගට ආවොත්, මේ නැව් විසි ගණනම ආවොත් ඒ අලාභය රුපියල් බිලියන 100කට වැඩි වෙනවා. 2026.02.11වැනි දින ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා විසින් සකස් කර තිබෙන මේ ලිපිය, විදුලිබල මණ්ඩලය විසින් අමාත්‍යාංශ ලේකම්තුමාට එවලා තිබෙන මේ ලිපිය තමයි අපට SOC එකේදි ලැබුණේ. ඒ ලිපියේ තිබෙන කාරණා එතුමා ප්‍රතික්ෂේප කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන විදුලිබල මණ්ඩලය, එතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට එවපු ලිපියෙන් තමයි ඉදිරිපත් කළේ, මේ යන්ත්‍රෝපකරණවලට හානි වෙනවා, අලාභ සිද්ධ වෙනවා කියලා. මම උපුටා දක්වපු හැම දත්තයක්ම මේ ලිපියේ තිබෙනවා. 2026.02.11 දිනැති එම ලිපිය මම **සභාගත*** කරනවා.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ලිපිය බොරු නම් ඒ බොරු වෙන්නේ මම නිසා නොවෙයි, විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිතුමා, මේ ලිපිය පාර්ලිමේන්තුවට එවපු අමාත්‍යාංශ ලේකම්තුමා නිසා. ඒ නිසා ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න යුතුකමක් තිබෙනවා, අපි අසත්‍ය කියනවා කියලා චෝදනා කරන්නේ නැතුව. මොකද, අපි සියයට 100ක් සත්‍ය කරුණු මත, තාක්ෂණික කරුණු මත, විද්‍යාත්මක කරුණු මත, සංඛ්‍යාලේඛන මත තමයි කථා කරන්නේ. මේ ලිපිය පාර්ලිමේන්තුවේ කමිටුවට ලබා දුන්නේ අමාත්‍යාංශ ලේකම්තුමා. අමාත්‍යාංශ ලේකම්තුමා දීපු ලිපිය ඇමතිතුමා ප්‍රතික්ෂේප කරනවා නම්, එක්කෝ ලේකම් යන්න ඕනෑ, නැත්නම් ඇමතිතුමා යන්න ඕනෑ. ඇමතිතුමා යන එක තමයි හරි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Point of Order එක ස්ථාවර නියෝග 91 (ඟ) යටතේ ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා සභාගත කළා ලියුමක්. දැන් ඇමතිතුමා කථා කරද්දී ඉතා පැහැදිලිව කිව්වා, මේ turbinesවලට කිසිම ප්‍රශ්නයක් වෙලා නැහැ කියලා. Turbinesවලට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ, turbinesවලට coal ළංවෙන්නේවත් නැහැ කිව්වා. ඒ වාගේම, සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාට අයුතු චෝදනාවක් කළා, කිසිම දෙයක් නොදැන ඇවිල්ලා කවුරු හරි කියලා දීපු එකක් මෙතැන කියෙව්වා කියලා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා සභාගත කළ ලිපිය ආයෙත් මම සභාගත කරන්න අවශ්‍ය නැහැ නේ. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක කියෙව්වාම පෙනී ගියා, මෙහි ඉතා පැහැදිලිව මේ කාරණා තිබෙනවා කියලා. අපි අහන්න කැමැතියි මේ ලිපිය පිළිගන්නේ නැද්ද කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කිව්වේ, ස්ථාවර නියෝග 91 (ඟ) ද?

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඔව්. අයුතු චෝදනාවක් නොකළ යුතු බව සඳහන් වෙන ස්ථාවර නියෝග 91 (ඟ).

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, that letter dated 11th February, 2026 states, I quote:

> "The direct and quantifiable escalation in operational costs resulting from the use of low-grade coal"

ඊළඟට, එහි ඉතා පැහැදිලිව මෙසේ ද සඳහන් වෙනවා:

> "Turbine Last stage blade-Repair/ replace the turbine last stage blade due to overheating problem"

එතකොට මේක පිළිගන්නේ නැද්ද, ගරු ඇමතිතුමා? මොකක්ද එතුමා ඒ වෙලාවේ දීපු උත්තරය?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.03]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කනගාටු වෙනවා, මේ කරුණුවලට උත්තර දෙන්න මේ අවස්ථාවේ අමාත්‍යවරයා මේ සභාවේ නැති එක ගැන.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. විදුලිබල මණ්ඩලයත්, විදුලිබල මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීනුත් ආරක්ෂා කරනවා කියලා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. විදුලිබල මණ්ඩලයත්, විදුලිබල මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීනුත් ආරක්ෂා කරනවා කියපු පුද්ගලයා අද පළාත් පාලන ආයතනයක සභාපතිකම දරනවා. විදුලිබල මණ්ඩලයේ 23,000ම අනාථ වෙලා සිටින මොහොතක්, මේ. දැන් බලන්න, 550කට අධික පිරිසක් අභ්‍යන්තර විභාගවලට මුහුණ දීලා, පරීක්ෂණවලට මුහුණ දීලා ඒ අයට උසස්වීම් ලැබිලා තිබෙනවා. ඒ උසස්වීම් ටිකවත් මේ ආණ්ඩුව ලබා දෙන්නේ නැහැ. අපි අහන්න කැමැතියි, 2025.08.25 දිනැති ලිපියක් උපයෝගී කරගෙන අලුතින් බඳවා ගැනීම් කරන්නේ නැහැ කියලා විභාග සමත් වුණු විදුලිබල මණ්ඩලයේ 550කට අධික ප්‍රමාණයක සේවක ප්‍රජාවට ඒ උසස්වීම් ටික ලබා දෙන්නේ නැත්තේ ඇයි කියලා. විශේෂයෙන්ම කම්කරු දෙපාර්තමේන්තුවත් නිර්දේශ කර තිබෙනවා ඒවා ලබා දෙන්න කියලා. මම ඊට අදාළ තොරතුරු සියල්ලක්ම **සභාගත*** කරනවා.

ඔන්න ඔය ආකාරයට තමයි බලයට පත් වුණාට පස්සේ විදුලිබල මණ්ඩලයටත්, විදුලිබල මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ටත් මේ රජය සලකන්නේ.

එදා විපක්ෂයේ ඉන්නකොට IMF එකට විරුද්ධව, ප්‍රතිසංස්කරණවලට විරුද්ධව, ප්‍රතිව්‍යුහගතකරණවලට විරුද්ධව ජනතාව මහ පාරට බස්සලා, මේ 23,000කගේ ඔළු ගෙඩි පෙන්වලා තමුන්නාන්සේලා දේශපාලන ජයග්‍රහණ ලැබුවා. හැබැයි, ජනාධිපති පුටුවට ගියාට පස්සේ, ආණ්ඩු බලය ලබා ගත්තාට පස්සේ, තුනෙන් දෙකේ බලය ලබා ගත්තාට පස්සේ "විදුලිබල මණ්ඩලයේ ඒ 23,000ට අද හෙණ ගැහුවත් කමක් නැහැ, අපි අපේ වැඩේ කරගත්තා" වාගේයි කටයුතු කරන්නේ. විදුලිබල මණ්ඩලයටත්, එහි සේවක මහත්ම මහත්මීන්ටත් ඇත්ත වශයෙන්ම දෙයියන්ගේම පිහිටයි. නමුත්, අපි පැහැදිලිවම කියන්න කැමැතියි, ප්‍රතිව්‍යුහගතකරණය, ප්‍රතිසංස්කරණය කිරීම, ඒ වෙනස්කම් කිරීම අවශ්‍ය බව. ඒවා ක්‍රියාත්මක වෙනකොට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

විශේෂයෙන්ම ආයතනයේත්, දීර්ඝ කාලයක් ආයතනයේ සේවය කරපු මේ 23,000කගේත් අයිතිවාසිකම් සුරක්ෂා කරගෙනයි අපි කටයුතු කරන්නේ කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. එම නිසා කරුණාකරලා 27වැනි දාට පෙර මේ 550දෙනා විභාගවලින් ලබා ගත් උසස්වීම්වලට අදාළ ස්ථිර ලිපි ටික භාර දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම වර්තමාන රජය පොරොන්දු වුණේ සියයට 33කින් විදුලි බිල අඩු කරනවා කියලායි. ජනාධිපතිවරයාම කිව්වා, රුපියල් 9,000 බිල රුපියල් 6,000 කරනවා, රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා කියලා. හැබැයි, මේ මොහොත වන විට රජය තීන්දුවක් අරගෙන තිබෙනවා, වීදි සහ පොදු ස්ථාන ආලෝක කිරීම සඳහා වූ ආයෝජන හා නඩත්තු වියදම් සඳහා පාරිභෝගික අය ක්‍රමයක් යටතේ අමතර බද්දක් පාරිභෝගිකයාගෙන් අය කරන්න. මේවා කිව්වේ නැහැ නේ, ඡන්දය කාලයේ. ජනාධිපතිවරණයේදී මේවා කිව්වේ නැහැ නේ. මහ මැතිවරණයේදී කිව්වේත් නැහැ නේ, පාරිභෝගිකයාට අලුත් බද්දක් ගහනවා කියලා. ඒ විතරක් නොවෙයි, වීදි සහ පොදු ස්ථාන ආලෝක කිරීම සඳහා වන පිරිවැය සියලු පාරිභෝගික කාණ්ඩ අතරේ බෙදී යන අයුරින් අර බද්දට අමතරව පාරිභෝගිකයින්ගේ බිල් පතට තව සියයට 2.2ක මුදලක් එකතු කර අය කරගන්නට රජය තීන්දු කරලා තිබෙනවා. ජනාධිපතිවරණයේදී මේවා කිව්වේ නැහැ නේ. මහ මැතිවරණයේදී මේවා කිව්වේ නැහැ නේ. ඇයි, ඒවා හංගාගෙන හිටියේ? ඇයි, ඒවා හෙළිදරව් කළේ නැත්තේ?

ඒ විතරක් නොවෙයි. දෙවැනි වතාවටත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මහජන අදහස් දක්වන්නට දීලා තිබෙන්නේ දින 7යි. අඩුම ගණනේ දින 14ක්, දින 21ක් ලබා දුන්නා නම් සාධාරණයි. එම නිසා අමාත්‍යවරයාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා, ඒ විධියට කටයුතු කරන්න කියලා.

විශේෂයෙන්ම ගල් අඟුරු බේදවාචකය -ගල් අඟුරු දූෂණය, ගල් අඟුරු වංචාව- ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී මම කැමැතියි, මේ කරුණු කාරණාත් ඉදිරිපත් කරන්න. ඇත්ත වශයෙන්ම අපේ රටට වාර්ෂිකව ගල් අඟුරු නැව් 36ක්, 38ක් අවශ්‍ය වෙනවා. මම මේ කියන්නේ දළ වශයෙන්. ඒ නැව් 36ත්, 38ත් අතර ප්‍රමාණයෙන් දැනට නැව් 11ක් ඇවිල්ලා අවසන්. ඒවා රුසියානු ගල් අඟුරු. අපි දන්නා විධියට රුසියානු ගල් අඟුරුවල ප්‍රමිතියේ ගැටලුවක් වෙලා නැහැ. මේ අලුත් ටෙන්ඩරය හරහා ගෙනාපු දකුණු අප්‍රිකානු - South African - ගල් අඟුරු පිළිබඳව තමයි ගැටලුව තිබෙන්නේ. අලුත් ටෙන්ඩරය හරහා නැව් 25කට ආසන්න ප්‍රමාණයක් ඇණවුම් කරලා තිබෙනවා කියලා අපට ආරංචියි. ඒ වාගේම මේ හැම දෙනාගේම දැන ගැනීම පිණිස මම කාරණයක් කියන්න කැමැතියි. අපි දන්නා විධියට ගල් අඟුරු බාන්න පුළුවන් සැප්තැම්බර් මාසයේ සිට අප්‍රේල් අග දක්වා වාරකන් නොවෙන කාලය තුළයි. ඒ නිසාම ගල් අඟුරු ටෙන්ඩරය අප්‍රේල් මාසයේ නිකුත් කරලා ඒ වැඩකටයුතු අවසන් කරනවා.

නමුත්, අපට දකින්න තිබෙන දේ මේකයි. මෙදා පාර ගල් අඟුරු ටෙන්ඩරය අප්‍රේල්-සැප්තැම්බර් දක්වා කාල වකවානුව තුළ ක්‍රියාත්මක කරන්න තිබුණු මොහොතක ආංශික අධීක්ෂණ කාරක සභාවට ඇවිල්ලා නිලධාරින් කිව්වා, "කැබිනට් එක ඒ තීන්දුව ගත්තේ ප්‍රමාද වෙලා" කියලා. ඒ කියන්නේ කැබිනට් එක හරි වෙලාවට ඒ ටෙන්ඩර් ක්‍රියාදාමය ක්‍රියාත්මක කරලා නැහැ. ඒ වාගේම ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ පිරිවිතර වෙනස් කරලා තිබෙනවා. වසර තුනක කාලයක මිලියනයක ගල් අඟුරු සැපයීම සුදුසුකම වුවත්, එය ලක්ෂයක් දක්වා අඩු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ අවස්ථාවේ තවත් කරුණක් පෙන්වා දෙන්න කැමැතියි. ආණ්ඩුව විශේෂයෙන්ම තර්ක කරමින් ඉන්නවා, "අපි Load Port Report එක බලමු, Discharge Port Report එක බලමු, නොරොච්චෝලේ report එක බලමු" කියමින්. ඒ වාර්තා අතරින් Load Port Report එක කියන්නේ සැපයුම්කරු ලබා දෙන වාර්තාවයි. Discharge Port Report එක කියන්නේ ඒ සැපයුම භාර ගන්න අපි ප්‍රොටෙක්නා කියන ආයතනයෙන් ලබා ගන්නා වාර්තාව. ඒ වාගේම නොරොච්චෝලේත් වෙනම වාර්තාවක් තිබෙනවා, ඒ operational ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්න. දැන් ඔය මොන report එක ගැන කථා කළත් නිසි ප්‍රමිතියෙන් යුක්ත වූ ගල් අඟුරු ගෙන්වා තිබෙනවාද, නැද්ද කියන එක අකුරට, තිතට දැන ගන්න පුළුවන්, බොයිලේරුවේ දහන වාර්තාව මඟින්. ඒ වාගේම තථ්‍ය කාලීනව විදුලි ජනන ධාරිතාව සපයනවාද නැද්ද කියා සඳහන් වාර්තාව මඟින්. Real-time coal burning consumption rate එකට, බොයිලේරුවේ දහන වාර්තාවට කාටවත් හොර කරන්න බැහැ. ඒක සමාගමක් දෙන වාර්තාවක් නොවෙයි. ඒක විද්‍යාත්මකව ඒ නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වනකොට නිකුත් වන වාර්තාවක්. අනෙක් එක තමයි, තථ්‍ය කාලීනව විදුලි ජනන ධාරිතාව කොපමණද කියන එක පෙන්නුම් කරන වාර්තාව. ඒවා සම්බන්ධයෙන් කාටවත් බොරු කරන්න බැහැ. ඒවායෙන් කවුරුවත් රවට්ටන්න බැහැ.

දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? ඒ බලාගාරයේ ඒකක - units - 3ක් තිබෙනවා. එක unit එකකින් නිපදවන්න ඕනෑ මෙගාවොට් 300ක්. එතකොට ඔක්කෝම මෙගාවොට් 900ක් වනවා. මෙගාවොට් 900ක බලාගාරයක් තමයි නොරොච්චෝලේ බලාගාරය. අපි පසුගිය වසර 10 දිහා බැලුවොත් ඒ බලාගාරය මේ ඒකකවලින් කිසිම දවසක මෙගාවොට් 300 බැගින් ලබා දෙන්න අපොහොසත් වෙලා නැහැ. ඒ කියන්නේ පසුගිය අවුරුදු 10ම ඒ හැම ඒකකයක්ම මෙගාවොට් 300 බැගින් නිපදවා තිබෙනවා. එතකොට ඒ ඒකක තුනෙන් සම්පූර්ණයෙන් නිපදවනවා මෙගාවොට් 900ක්. මම අපේ ගරු අමාත්‍යතුමාට වගකීමෙන් කියනවා, මං අර කියපු බොයිලේරුවේ දහන වාර්තාව - real-time coal burning consumption rate එක - සහ තථ්‍ය කාලීන විදුලි ජනන ධාරිතාව -real-time megawatt values - අනුව ගත්තාම, ඒ නැව් අටේම ඇවිල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරු බව. මෙන්න, ඒ වාර්තාව. ඒ නැව් අටේම ඇවිල්ලා තිබෙන්නේ බාල ගල් අඟුරු.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කමක් නැහැ, මම තව කාලය ගන්නම්.

මට මේ කාරණාව ගැන පැහැදිලිව කියන්න තිබෙනවා. පළමුවෙනි නැව, මෙගාවොට් 285යි; දෙවැනි නැව, මෙගාවොට් 290යි; තුන්වැනි නැව, මෙගාවොට් 260යි; හතරවෙනි නැව, මෙගාවොට් 295යි; පස්වෙනි නැව, මෙගාවොට් 285යි; හයවෙනි නැව, මෙගාවොට් 270යි; හත්වෙනි නැව, මෙගාවොට් 275යි; අටවෙනි නැව, මෙගාවොට් 255යි. ඒ එකක්වත් මෙගාවොට් 300ක් වාර්තා කරලා නැහැ. ඒ වාගේම අපි ගනිමු, මෙගාවොට් 300ක් නිපදවීමට අදාළ විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්නට යන කිලෝග්‍රෑම් ප්‍රමාණය, කිලෝවොට් පැයකට. පිළිගත්තු

ප්‍රමාණය තමයි, 0.37. හැබැයි, එම අගය පළමුවෙනි නැවේ, 0.4යි; දෙවැනි නැවේ, 0.39යි; තුන්වැනි නැවේ, 0.43යි; හතරවැනි නැවේ, 0.38යි; පස්වෙනි නැවේ, 0.4යි; හයවැනි නැවේ, 0.4යි; හත්වැනි නැවේ, 0.4යි; අටවැනි නැවේ, 0.44යි.

මේ එකක්වත් 0.37 ප්‍රමිතියට නැහැ. අපි මේ වෙන වෙන කථා කියනවා නොවෙයි. මේ දත්ත අනුව අපි පැහැදිලිවම පෙන්වා දෙනවා, ප්‍රත්‍යක්ෂ කරනවා, බාපු නැව් අටේම තිබෙන්නේ බාල ගල් අඟුරු බව. මොකක්ද මේකේ ප්‍රතිඵලය? බාල ගල් අඟුරු නිසා බලාපොරොත්තු වුණාට වඩා වැඩි ගල් අඟුරු ප්‍රමාණයක් ඇණවුම් කරන්න සිද්ධ වෙනවා. මොකද, බාල ගල් අඟුරුවලින් නිපදවන මෙගාවොට් ප්‍රමාණය අඩුයි. අර කියපු මෙගාවොට් 300 ප්‍රමාණය එන්නේ නැහැ. එතකොට තවත් පැත්තකින් ඇති වෙනවා හිඟයක්. ගල් අඟුරුවලින් ඒ හිඟය නිර්මාණය වනකොට එක්කෝ වැඩිපුර ගල් අඟුරු ගෙන්වන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් ඩීසල්වලින් විදුලිය උත්පාදනය කරන්න සිද්ධ වෙනවා. ඒකෙන් මොකද වෙන්නේ? ඩීසල් බලාගාර මාෆියාවට යට වෙනවා. ඩීසල්වලින් විදුලිය උත්පාදනය කරන කොට විදුලි බිල වැඩි වෙනවා. අවසානයේ පාරිභෝගිකයාටයි ඒක ගෙවන්න සිද්ධ වෙන්නේ. අප්‍රේල් මාසයේ විදුලි බිල වැඩි කළ යුතුයි කියලා යෝජනාවක් මේ රජය ගෙනැල්ලා තිබෙනවා. අප්‍රේල් මාසයේ විතරක් නොවෙයි, පැහැදිලිවම කියන්න ඕනෑ ඊට පසුවත් තවත් වතාවක් විදුලි බිල වැඩි කරන්න සිද්ධ වෙනවාය කියන එක මේ සංඛ්‍යාලේඛනවලින් අපට කියන්න පුළුවන් බව.

මේ බාල ගල් අඟුරු උපයෝගි කර ගැනීම තුළ අනිවාර්යයෙන්ම උපකරණවලටත් හානියක් සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම මේ කියන මෙගාවොට් 300 නිපදවන්නට Gross Calorific Value එක 5,900 සිට 6,150 දක්වා ක්‍රියාත්මක වුණොත් ප්‍රමාණවත්. හැබැයි ටෙන්ඩර් එකේ දමා තිබෙන්නේ, 6,150යි. ඒක 6,150ට අඩු වුණු අවස්ථා තිබුණා කියලා සමහරු මෙතැනදී ලොකුවට කිව්වා. ඒක මෙතැනත් කිව්වා; SOC එකේදීත් කිව්වා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. 5,900ට වඩා අඩු ගල් අඟුරු ගෙන්වා තිබෙන බව පැහැදිලිවම කියන්න ඕනෑ. ඉතින් බාල ගල් අඟුරු තමයි ගෙන්වා තිබෙන්නේ. ඒ නිසා කවුරු මොන වාර්තාවලින් කිව්වත් මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ නැව් 8න් මෙගාවොට් 300 නිපදවූවාද නැද්ද කියන ප්‍රශ්නයට උත්තර සපයන්න කියලා. ඒ වාගේම, මේ ගෙන්වපු ගල් අඟුරුවලින් විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා යන කිලෝවොට් පැයකට අදාළ කිලෝග්‍රෑම් ප්‍රමාණය 0.37 කියන ප්‍රමිතියට අනුකූල වුණාද නැද්ද කියන එකත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න.

මම අවසාන වශයෙන් පැහැදිලිවම කියනවා, බාල ගල් අඟුරු ගෙන්වා තිබෙන බව. මම වෙන වෙන කාරණා කියලා නොවෙයි ඒක ඔප්පු කළේ. මම ඒක ඔප්පු කළේ, විද්‍යාත්මක දත්ත, රවට්ටන්න බැරි දත්ත, real-time data - තත්කාලීන තොරතුරු - අනුවයි. ඒ නිසා අපි පැහැදිලිවම රජයෙන් ඉල්ලීමක් කරනවා, ගල් අඟුරු කේන්ද්‍රීයව සිදු වුණු මේ දූෂණය පිළිබඳව පැහැදිලි, විවෘත පරීක්ෂණයක් පවත්වන්න කටයුතු කරන්න කියලා. මේ ගල් අඟුරු දූෂණය හරහා සිදු වුණු පාඩුව පාරිභෝගිකයන්ගෙන් අය කර ගන්නට අපි කිසි ලෙසකින්වත් ඉඩ තබන්නේ නැහැ. අප මේ රටේ විදුලි පාරිභෝගිකයන් මහ පාරට ගෙන්වා ගල් අඟුරු දූෂණය හරහා පාරිභෝගිකයාට සිදු වුණු ඒ අවාසිය, ඒ හානිය අමාත්‍යවරයා ප්‍රමුඛ රජයෙන් ලබා ගන්න කටයුතු කරනවාය කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.19]

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද මේ විවාදය වෙලාවේ අදහස් පළ කරපු ගරු මරික්කාර් මන්ත්‍රීතුමාගේත්, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේත් කථා ඇහුවාම මට මතක් වුණේ අපේ ජන සමාජයේ තිබෙන කථාවක්. කිසිම තේරුමක් නැතිව කෑ ගහලා අඬන දරුවන් දැක්කාම ගමේ ගොඩේ ඉන්න ආත්තම්මලා සීයලා කියනවා, "පුතේ, ඔය හිරලෙ පාත් වෙලාද කියලා පොඩ්ඩක් බලන්න" කියලා. ඇත්තටම, ඒ වාගේ එකක් විතරයි මට දැනුණේ ඒ කථා ඇහුළේ.

කිසිම පදනමක් නැතිව ඒ කියන්නේ, ව්‍යාජ ලෙස සකස් කරන ලද යෝජනාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අද දවසේ කාලය විනාශ කරමින් ඉන්නවා. ඒ කණ්ඩායම උදේ පාන්දර පොල්දූව හන්දියට වෙලා උද්ඝෝෂණයක් කරලා කෑ ගැහුවා. විපක්ෂයේ ඉන්නවා, හතළිස් ගණනක්. නමුත් 14දෙනායි එතැන ඉඳලා තිබෙන්නේ. ඕක තමයි තත්ත්වය. අඩුම ගාණේ විපක්ෂයේ ඉන්න ටිකදෙනාවත් ගෙනිහිල්ලා නොවෙයි, එතුමන්ලා ඒ උද්ඝෝෂණය කළේ.

ඇත්තටම රටක සංවර්ධනයට බාධා වන හේතු අතර ප්‍රධානම එකක් තමයි, ඒ රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන පාර්ලිමේන්තුව වාගේ ස්ථානවල මේ වාගේ හැසිරෙන, බොරුව සහ අනවශ්‍ය කලබල ඇති කරන විපක්ෂයක් තිබීම. අපි කලිනුත් කිව්වා වාගේ මොකක් හරි වුණාම කුණුහරුප කියන, බොරු කියන විපක්ෂයක් ඉන්න රටක් මේක. ඒ නිසා "බොරුවක් කියමු, කලබලයක් හදමු" කියන විපක්ෂයේ සංකල්පය උඩ තමයි ඇත්තටම අද මේ යෝජනාව දාලා තිබෙන්නේ. වෙන කිසිවක් ඒකේ නැහැ. "බොරුවක් කියමු, කලබලයක් හදමු" කියන සංකල්පයෙන් තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ.

අද මාතෘකාවට අනුව ගත්තොත්, කලින් පෙන්වා දුන්නා වාගේම මේ යෝජනාවේ අඩංගුවම බොරුවක්. මේකේ තිබෙනවා, "..ටොන් මිලියන 12.32ක ප්‍රමාණයක් සපයා ගැනීම සඳහා" කියලා. එහෙම එකක් නැහැ. ඒ කියන්නේ, අවුරුද්දකට නොවෙයි අවුරුදු 10කට විතර වන ප්‍රමාණයක් තමයි මේකෙන් කියලා තිබෙන්නේ. ඒ නිසා එහෙම එකක් නැහැ. කලින් සමාගම භාර ගත්ත ගල් අඟුරුවලින් ලැබීමට නියමිත ප්‍රමාණයකුත් මෙතැන තිබෙනවා. ඒ සියල්ලමත් එක්ක ගත්තාම අවශ්‍ය වෙලා තිබෙන්නේ, ටොන් මිලියන 1.5ක විතර ප්‍රමාණයක්. එතකොට ඒ ප්‍රමාණයට තමයි මේ ටෙන්ඩර් එක දෙන්නේ.

ඊළඟට, මේ යෝජනාවේ තිබෙන තව එක කාරණයක් අපි ගනිමු. "නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා, ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව විගණකාධිපතිවරයාගේ නිර්දේශ මත පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් වැඩිමනත් ප්‍රතිපත්තිමය උපදෙස් සපයා දී තිබියදී ද," කියලා තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. ඔව්, ඒ අනුව තමයි කටයුතු කර තිබෙන්නේ. ඒකේ කිසිවක් වෙනස් කර නැහැ. 2010දී හෝ 2011දී මේක පටන්

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

ගත්තාට පස්සේ මේකට අවශ්‍ය ගල් අඟුරු ගෙන ඒමේ මුළු ක්‍රියාවලියම අධ්‍යයනය කළාම ඉතාම හොඳින් පෙනෙනවා, විගණකාධිපතිතුමාගේ නිර්දේශවලට අනුව, ඒ වාගේම COPF එකේ නිර්දේශවලට අනුව, ඒ කියපු සියලු දේවල්වලට අනුගතව වැඩ කරපු එකම වාරය මේක කියලා. මේ විපක්ෂයේ මහත්වරුන්ට බඩ පපුව දාලා ගිහිල්ලා තිබෙන්නේ ඒකට. මෙතෙක් කල් එහෙම ප්‍රතිපත්තිමය ආකෘතියකට නැතිව මේවා ගෙනැල්ලා මේ රටට දැවැන්ත පාඩුවක් කරපු කණ්ඩායමක් විපක්ෂයේ ඉඳගෙන කියනවා, තීන්දුවලට අනුව, නිර්දේශවලට අනුව මේ ගෙනාපු ක්‍රියාවලිය වැරදියි කියලා. මේක රටක් තේරුම් ගන්න ඕනෑ කොහොමද? ජන සමාජයක් මේක තේරුම් ගන්න ඕනෑ විධියක් තිබෙනවා. මේ විධිය බලන්න. කවුද මේ චෝදනාව කරන්නේ? මොකක්ද මේ චෝදනාවේ පදනම? මේ සියල්ල අධ්‍යයනය කර ගන්න ඕනෑ.

විගණකාධිපතිවරයාගේ වාර්තාව අප සතුව තිබෙනවා. ඒකේ 7.2 වගන්තිය යටතේ නිර්දේශ ගෙනෙනවා. ඒක මේ යෝජනාවට ඇතුළත් කර තිබෙනවා. ඒ Procurement Guidelines, ඒ නිර්දේශ අනුව වෙනස් කරනවා, 2023දී. ඒ වෙනස් කරපු එකට අනුකූලව තමයි මේ කටයුතු කරලා තිබෙන්නේ. ඒ වාගේම මෙහි ප්‍රකාශ කරනවා, "ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රියාදාමයට පටහැනිව දූෂිතව ක්‍රියා කිරීම මඟින්" කියලා. මුළුමනින්ම මේක බොරුවක්. මම කියන්නේ මෙහෙම යෝජනාවක් පාර්ලිමේන්තුව වාගේ තැනකට මෙවැනි දවසක විවාදයකට යොමු කිරීම -බොරුවක් ඉදිරිපත් කිරීම - පිළිබඳව අපේ විරෝධය පළ කරන්න ඕනෑ බවයි. පට්ට බොරුවක්, පට්ට කලබලයක් හදලා වෙන මොකුත් කර ගන්න දෙයක් නැතිව ඉන්න එකක් මෙතැන තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම රිදිලා තිබෙනවා, මේ කණ්ඩායමට. විපක්ෂයට රිදුණු හේතුව තමයි අපි ඇත්තටම හොයන්න ඕනෑ. ගල් අඟුරු ආනයන ක්‍රියාවලිය ඇතුළේ ඇයි මෙච්චර රිදුණේ, මෙච්චර රිදෙන්න හේතුව මොකක්ද? අද උදේ පොල්දූව හන්දියේ කරපු උද්ඝෝෂණයේ සටන් පාඨ දිහා බැලුවාම රිදුණු හේතුවත් පොඩ්ඩක් අනාවරණය වනවා.

විශේෂයෙන්ම 2010 සහ 2015 කාලයේදී වසර 5ක් සඳහා වාර 5කදී ගල් අඟුරු ආනයනය කරලා තිබෙන ප්‍රමාණය ගත්තාම, ටොන් මිලියන 4.58ක්. ඒ සමාගමට ගෙන්වන්න දීලා තිබුණේ කිසිදු වලංගු ටෙන්ඩර් පටිපාටියකින් තොරවයි. එදා එහෙම තමයි ගෙනාවේ. ඊළඟට, ඒ කාලයේ ප්‍රමාදවීම් සහ මේ මතු කරන ජාතියේ ඔක්කෝම තාක්ෂණික ගැටලුත් එක්ක, ගෙනැල්ලා නොදීපු ඒවාත් එක්ක - ඒ සියල්ලම- ගත්තාම, රුපියල් මිලියන 16,000ක විතර පාඩුවක් තිබෙනවා, ඒ කාලයේ. ඒ ගෙනාපු ප්‍රමාණයට රුපියල් මිලියන 16,000ක විතර පාඩුවක් වෙලා තිබෙනවා. මේ මහත්වරු ඒක අය කරගෙන නැහැ. නීතිමය ක්‍රියාමාර්ග ගන්නත් බැරි වෙලා තිබෙනවා. මොකද, වලංගු ගිවිසුම් තිබිලා නැති නිසා. ඒ නිසා වලංගු ගිවිසුමකින් තොරව අවුරුදු ගණනාවක් තිස්සේ මේවා ආනයනය කරලා රටට පාඩුවකුත් කරලා ඒ පාඩුව විගණනය ඇතුළේ පෙන්වා දීලා තිබෙද්දීත්, ඒ පාඩුව අය කර ගන්නවත් ක්‍රමයක් නැතුවයි මේ මහත්වරු හිටියේ. එහෙම තමයි වැඩ කළේ. එහෙම වෙලා තිබෙද්දී, නැවත 2009දී procurement එකක් ගිහින් ඊට පස්සේ ඒකත් නවත්වලා අර කලින් සමාගමටම ආපසු දෙනවා. නියම procedure එකේ යන එකත් නවත්වලා ඒ අයට සපයන්න දෙනවා. ඒ වාගේම 2011දීත් එහෙමයි. Tender procedure එක යනවා. ඒක අවලංගු කරලා, ටෙන්ඩරය දිනපු සමාගමට දෙන්නේ නැතුව, ආපසු අර කලින් ආනයනය කරපු සමාගමට නිකම්ම සපයන්න කියලා දීලා දානවා. මෙහෙම තමයි වැඩ කරලා තිබෙන්නේ. ඒ නිසා මේ රටේ ජන සමාජය යම් අවබෝධයක් ලබා ගන්න ඕනෑ, මේ මහත්වරු වැඩ කරලා තිබෙන්නේ මෙහෙමයි කියන එක ගැන.

අද මේ මහත්වරු දෙතුන් දෙනක් කථා කරපු ඒවා ගත්තාම, ඒක ඇතුළේ හොරකම් කළේ කොහොමද කියන එක තමයි කිව්වේ. ඇත්තටම ඒක පාපෝච්චාරණයක්. මේ සමාජයට ඔවුන්ම පැහැදිලි කළා, අපේ කාලයේ නම්, අපි මෙහෙම තමයි කළේ කියලා. ඒක ආදේශ කරන්න හදනවා අපේ ආණ්ඩුවට, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේත් එහෙමයි වෙලා තිබෙන්නේ කියලා හිතලා. මේ තනිකරම තාක්ෂණික ගැටලුවක් පදනම් කරගෙන,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

තාක්ෂණික ගැටලු, තාක්ෂණික දත්ත ඕනෑ තරම් කියා ගන්න පුළුවන්. ඒ තාක්ෂණික ගැටලුවත් හරියට ඉදිරිපත් කරන්න තේරෙන්නේ නැතුව බොරු මත පදනම් වෙච්ච යෝජනාවක් දාලා තිබෙනවා. මේ ආණ්ඩුව විසින් ගත්ත තීරණ කිසිවකට අපි කිසිදු ආකාරයක බලපෑමක් කරලා නැති මොහොතක චෝදනාවක් කරනවා. ඒක විස්තර කරද්දී, එතුමන්ලා හිටියා නම්, කරන දේවල් ටික තමයි මේ කියන්නේ සහ එතුමන්ලා මෙතෙක් කල් කරපු දේවල් ටික තමයි මේ කියන්නේ. මේ මහත්වරු පාලන බලයේ හිටපු අය. අපි නොවෙයි නේ හිටියේ. ඒ වාගේම 2012, 2013, 2014දීත් එහෙමයි. ඒ සමාගමටම සැපයුම දෙනවා. කොහොම හරි අන්තිමට ඒ සමාග ගල් අඟුරු ගේන එක නවත්වන්නේ යම් ටෙන්ඩර් එකක් පරාජය වීමෙන් පසුව. ඒ වනතුරුම ඒ සමාගමට දුන්නා.

ඒ වාගේම 2021/2022 වර්ෂය ගත්තොත්, සාමාන්‍යයෙන් දෙන්න ඕනෑ, දින 42ක කාලය අඩු කරලා දුන්නේ. ඒ කාලය දිගු කළේත් නැහැ. දින 21ට අඩු කරලා දුන්නේ. හැබැයි, අපි නිශ්චිතව කියන්න ඕනෑ, ඒ වෙලාවේදීත් tender procedure එකක ගිහිල්ලා, නැවතත් ඒක නවත්වලා Cabinet approval එකකින් වෙන සමාගමකට දෙනවා. මෙහෙම වැඩ කරපු අය තමයි මේ. අපි කොහේද එහෙම කරලා තිබෙන්නේ? අපි එහෙම කිසිවක් කරලා නැහැ.

අපි කලින් මෙතැන සාකච්ඡා කළා, කිරි හරක් ආනයනය සම්බන්ධ ප්‍රශ්නය. ලංකාවට කිරි හරක් 20,000ක් ආනයනය කරන්න බැසිල් රාජපක්ෂ මහත්තයලා කටයුතු කරපු විධිය. ඒ Cabinet Paper එකේම තමයි ලියලා දෙන්නේ, මේ අහවල් සමාගමට මේ ටෙන්ඩර් එක දෙන්න කියලා. මේ, එහෙම කරපු අය. මේ සමාගමට, වේලාර්ඩ් රුරල් එක්ස්පෝර්ට් පුද්ගලික සමාගමට මේ ඩොලර් වටිනාකම සහිත ටෙන්ඩරය ප්‍රදානය කරන්න කියලා කැබිනට් පත්‍රිකාවෙන්ම කියපු මහත්වරු තමයි මේ. ඒ මහත්වරු එක්ක එකට වැඩ කරපු අය තමයි මේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
හොඳයි, මම කථාව අවසන් කරන්නම්.

දැන් කියනවා, නොරොච්චෝලේ බලාගාරය කැඩෙන්න පුළුවන් කියලා. මේකේ ආයු කාලය ගත්තොත්, 2041 වෙනකොට පළමුවෙනි බලාගාරයේත්, 2044 වනකොට දෙවන සහ තුන්වන බලාගාරවලත් ආයු කාලය අවසන් වෙන්න නියමිතයි. ඒක තමයි මේ යන්ත්‍රවල තිබෙන තත්ත්වය. ඒ වාගේම 2017දී හිටපු විදුලිබල ඇමතිවරයාම කියනවා, මේ කාලය ඊටත් වඩා අඩුයි, ඊටත් අඩුවෙන් මේක නතර වෙන්න පුළුවන් කියලා. 2011-2014 කාලය ගත්තාම බිඳ වැටීම් නිසා නිෂ්පාදන අත්හිටවූ කාලය තිබෙනවා, දින 136ක් ලෙස. Total එකක් විධියට ගත්තාම මාස හතරහමාරක විතර කාලයක් නතර කරලා තිබුණේ. ඉතින් දැන් මේක කැඩෙන්න නියමිතයි. කොහොමත් සමාජයේම තිබෙන අදහස තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක වැඩ කරනවාට වඩා කැඩිලායි තිබෙන්නේ කියන එක. ඒ බව සමාජය දන්නවා.

දැන් හදන්නේ, ඊළඟ යම් මොහොතක මේ බලාගාරය කැඩුණොත්, ඒක වුණේ මේකෙන් කියලා bud කරන්න. එවැනි යෝජනා හදන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒ වාගේ තක්කඩි තැන්වලට යන්න ඕනෑ නැහැ. අසාධාරණ යෝජනා නොදා ඇත්ත යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. සත්‍ය යෝජනාවක් මත මේ පාර්ලිමේන්තුවේ කාලය ගතකරමු කියා ඉල්ලමින්, මා නිහඬ වෙනවා. මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට ඉස්සෙල්ලා ගරු මන්ත්‍රීවරයෙක් මගේ නම කියලා මට අභියෝග කළා, පුළුවන් නම් මම කියපු වාහන permits ටික සභාගත කරන්න කියලා. මම දැන් ගෙනාවා, Hon. D.M. Anura Kumara Dissanayake, M.P., 464/20, Pannipitiya Road, Pelawatta, Battaramulla කියලා නිකුත් කරපු permit එකේ copy එක. මේ තිබෙන්නේ ඒක. ඊළඟට, බිමල් නිරෝෂන් රත්නායක මැතිතුමාගේ permit එකේ copy එක. ඊළඟට තිබෙනවා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ permit එකේ copy එක. මේ permits අරගෙන විකුණලා පක්ෂ අරමුදලට දමාගෙන දැන් සුද්දවන්තයෝ වාගේ ඇවිල්ලා කහිනවා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

[பி.ப. 1.31]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையானது முக்கியமான ஒரு - *[இடையீடு]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරු කරුණාකර නිහඬ වෙන්න. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய இந்தப் பிரேரணையினூடாக முக்கியமான சில விடயங்கள் உரையாடப்பட்டிருக்கின்றன. அந்த வகையில், இந்த வலுசக்தித் துறையில் ஏற்படுகின்ற பல பிரச்சினைகள் இங்கே சுட்டிக் காட்டப்பட்டிருக்கின்றன. உண்மையிலே இது மக்களோடு பின்னிப்பிணைந்த, பொருளாதாரத்தோடு தொடர்புடைய முக்கியமான ஒரு துறையாகக் காணப்படு கின்றது. விசேடமாக, இங்கே ஏற்படுகின்ற நிர்வாகச் சீர்கேடுகளோ, ஏனைய விடயங்களோ அடிமட்டத்திலுள்ள ஏழை மக்களைப் பாதிக்கின்றவையாகத்தான் காணப்படு கின்றன. இந்த இரண்டாவது காலாண்டுக்கு மின்சாரக் கட்டணத்தை 13.56 சதவீதத்தால் அதிகரிப்பதற்கான முன்மொழிவை மின்சார சபையானது பொதுப் பயன்பாடுகள் ஆணைக்குழுவுக்குச் சமர்ப்பித்துள்ளது. இந்தச் சுமையானது அடிமட்ட மக்கள்மீது சுமத்தப்படவிருக்கின்றது. இதனால் மின்சாரப் பாவனையாளர்கள் மென்மேலும் சுமைகளைச் சுமக்க வேண்டியவர்களாக இருக்கிறார்கள். வறுமைக் கோட்டுக்குக் கீழுள்ள மக்கள் மிகவும் பாதிப்படையக்கூடிய ஒரு சூழ்நிலை எதிர்காலத்திலே ஏற்படக்கூடிய வாய்ப்பும் இருக்கின்றது.

மேலும், 2021, 2022 காலப்பகுதியிலே மின்சாரம் மற்றும் எரிபொருள் தட்டுப்பாடு காரணமாக மக்கள் பாதிக்கப்பட்டு, நாட்டில் பொருளாதாரக் குழப்பநிலை ஏற்பட்டது. இதனால் நாடு மிகவும் பின்தள்ளப்பட்ட சூழ்நிலை உருவானது. அதேபோன்ற ஒரு சூழ்நிலை எதிர்காலத்திலும் ஏற்பட்டுவிடக் கூடாது. அதை அடிப்படையாகக்கொண்டு இங்கே உரையாற்றியவர்கள் பல விடயங்களைச் சுட்டிக்காட்டி யிருந்தார்கள். குறிப்பாக, தரக்குறைவான நிலக்கரி இறக்குமதி செய்யப்பட்ட விடயம் பற்றி கூறியிருந்தார்கள். கடந்த யூன் மாதம் மின்சார சபைக்கு 15.8 பில்லியன் ரூபாய் நட்டம் ஏற்பட்டிருக்கின்றது. இந்த நட்டம் அனைத்தும் நுகர்வோரின் மத்தியிலேதான் சுமத்தப்படப் போகின்றது. இதனால் ஏழை மக்கள்தான் பாதிக்கப்படப் போகின்றார்கள். அந்த வகையிலே, தரக்குறைவான நிலக்கரியை இறக்குமதி செய்வதனாலோ அல்லது இவ்வாறான ஏனைய விடயங்களைச் செய்வதனாலோ பாதிக்கப்படுபவர்கள் எமது மக்கள்தான். இந்த விடயங்களைக் கருத்திலேகொண்டு, ஒரு சரியான பொறிமுறையை அமைத்து, நிலக்கரியை இறக்குமதி செய்து மின்சார உற்பத்தியைச் சரியான முறையிலே வழிநடத்த வேண்டுமென்று இந்த உயரிய சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

அதுமட்டுமல்ல, மின்சார சபையிலே வேலை செய்கின்ற கிட்டத்தட்ட 23,000 தொழிலாளர்கள் பாதிப்புக்குள்ளாகின்ற சூழ்நிலை காணப்படுகின்றது. ஏனென்றால், மின்சார சபை தனியார்மயப்படுத்தப்பட்ட பின்பு, four departments ஆகப் பிரிக்கப்பட்டதனால், தாங்கள் எந்த நிலைமையிலே தங்களுடைய வேலையைச் செய்வதென்று அங்கலாய்த்துக் கொண்டிருக்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைக்குள் அந்த ஊழியர்கள் தள்ளப்பட்டிருக்கின்றார்கள். ஆகவே, மின்சார சபையில் வேலைசெய்கின்ற ஊழியர்களைப் பாதுகாக்க வேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. இந்த விடயங்களை அடிப்படையாகக் கொண்டு நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும்.

அடுத்து, அம்பாறை, மட்டக்களப்பு மாவட்டங்களிலே தேவையற்ற மின்சாரக் கம்பங்கள் வீதிகளிலே காணப்படுகின்றன. வீதியோரங்களில் அல்லது வீதியின் உட்புறத்தில் அமைக்கப்பட்டிருக்கின்ற அந்த மின்சாரக் கம்பங்களால் விபத்துகள் ஏற்படுவதனால் பல மரணங்கள் சம்பவிக்கின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, வீதிகளுக்கு மிக அண்மையில் அல்லது வீதிகளின் எல்லைக்குள்ளே அமைக்கப்பட்டிருக்கின்ற அந்த மின்சாரக் கம்பங்களை இலங்கை மின்சார சபை அகற்ற வேண்டும். விசேடமாக, ஆலையடிவேம்பு, கல்முனை, திருக்கோவில் போன்ற பிரதேசங்களிலும் அதேபோன்று மட்டக்களப்பின் பல பிரதேசங்களிலும் இவ்வாறு காணப்படுகின்ற மின்சாரக் கம்பங்களை அகற்ற வேண்டும்.

அதுமட்டுமல்ல, மின்னிணைப்புகளை வழங்குவதிலும் காலதாமதம் காணப்படுகின்றது. Customers மின் இணைப்புக்காக apply பண்ணி பல மாதங்களாக காத்திருக்க வேண்டியதொரு சூழ்நிலை காணப்படுவதனால், மின்னிணைப்புகளை மிகவும் துரிதப்படுத்தி வழங்குவதற்கான செயற்பாட்டை இந்த அரசு மேற்கொள்ள வேண்டுமென்று இந்தச் சபையினூடாகக் கேட்டுக் கொள்கின்றேன்.

மழை காரணமாக இன்று அம்பாறை மற்றும் மட்டக்களப்பு மாவட்ட விவசாயிகள் மிகவும் பாரதூரமான ஒரு பொருளாதாரச் சிக்கலை அனுபவித்துக் கொண்டிருக்கின்றார்கள். தாம் விளைவித்த நெல்லைக்கூட விற்பனை செய்ய முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைக்கு அவர்கள் தள்ளப்பட்டு இருக்கின்றார்கள். மூன்று மூடை நெல்லை 10,000 ரூபாய் விலையில் மிகவும் நட்டத்துக்கு விற்பனை செய்கின்றார்கள். ஏனென்றால், அந்த நெல் மழையில் நனைந்து ஈரமாகி விற்பனை செய்ய முடியாத நிலையில் காணப்படுவதனால், இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற விவசாயிகள் பாதிப்புக்குள்ளாகி இருக்கின்றனர். அதனடிப்படையில், இந்தக் காலகட்டத்தில் அவர்களுக்கு ஒரு நெல் உலர்த்தும் machineஐ - burnerஐ - நீங்கள் அந்தந்தப் பிரதேசங்களில் நிறுவும்பொழுது, நெல் ஈரமடைந்தாலும் அவர்கள் அதனை உலர்த்தி உரிய விலைக்கு விற்பனை செய்யக்கூடிய ஒரு சந்தர்ப்பம் ஏற்படும். ஆனால், இன்று அவர்கள் 'தித்வா' புயல் மற்றும் ஏனைய விடயங்களினால் பாதிக்கப்பட்டு நலிவடைந்து போயிருக்கின்றார்கள். இன்று இருக்கின்ற நிலையில் விவசாயிகள் நஞ்சருந்தி இறக்கின்ற மிகவும் பயங்கரமான, அபாயகரமான சூழலுக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். தங்களது முழுச் சொத்துகளையும் விற்று விவசாயத்தைச் செய்திருக்கின்ற விவசாயிகள் இன்று மிகவும் பாதகமானதொரு சூழ்நிலைக்குள் தள்ளப்பட்டு இருக்கின்றார்கள். அவர்களைப் பாதுகாக்க வேண்டிய கடமையும் பொறுப்பும் அரசுக்கு இருக்கின்றது. அந்த வகையில், நெல் உலர்த்தும் machineஐ இனாமாகவும் மின்சாரத்தை மானிய அடிப்படையிலும் வழங்குவதற்கும் உரிய விலையில் நெல்லைக் கொள்முதல் செய்யவதற்கும் ஏதுவான நடவடிக்கைகளை மேற்கொண்டு அவர்களுக்கு உதவவேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 1.39]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ගැනෙන්නේ නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා එම ගල් අඟුරු මඟින් සිදුකරන බලශක්ති උත්පාදන ක්‍රියාවලිය පිළිබඳවයි. වැරදි සහ අපැහැදිලි තොරතුරු මත පදනම්ව සකස් කර ගන්නා ලද උපකල්පන මත ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මෙම යෝජනාව සම්බන්ධ විවාදයට තමයි අපි මේ විධියට එකතු වන්නේ. රටේ ආර්ථික සංවර්ධනය සඳහා ඉතාම වැදගත් කාර්යභාරයක් කරන සාධකයක් විධියට තමයි අපි බලශක්තිය සලකන්නේ. මේ ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අද උදෑසන සිට ඉදිරිපත් කරන ලද තොරතුරු, චෝදනා ගත්තොත්, ඒ අතර තිබෙන ප්‍රධාන කාරණාව තමයි, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැරදියි කියන එක. බලශක්ති අමාත්‍යවරයා විසින් මේ සම්බන්ධව ඉතාම හොඳ පැහැදිලි කිරීමක් කරනු ලැබුවා.

මේ අවස්ථාවේ මම විශේෂයෙන් කියන්න ඕනෑ, වැරදි තොරතුරු ලබා දෙමින් රටේ ජනතාව මුළා කරන්න, රටේ ජනතාව අපේක්ෂා කරන ඉලක්ක වෙත යන ගමන වළක්වන්න

තමයි මේ අවස්ථාව යොදාගෙන තිබෙන්නේ කියන එක. මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගත්තොත්, මෑත ඉතිහාසයේ වැඩිම ලංසුකරුවන් ප්‍රමාණයක් සම්බන්ධ වූ ටෙන්ඩරය බවට මේක පත් වුණා. මේ tender එකට 26දෙනෙක් පමණ register වෙලා තිබුණා. ඒ අය අතරින් 11දෙනෙක් පමණ මෙයට සහභාගි වෙලා තිබුණා. ඒ අයගෙන් 10දෙනෙක් මේකට ලංසුකරුවන් විධියට ඉදිරිපත් වෙලා තිබුණු බවත් මම කියන්න ඕනෑ. මෑත කාලයේ තිබුණු වැඩිම ලංසුකරුවන් සම්බන්ධ වෙච්ච ටෙන්ඩරය විධියට තමයි මේක ගැනෙන්නේ.

ඊත් එක්කම මේ ලංසුකරුවන්ගේ prequalifications පිළිබඳවත් කරුණු ඉදිරිපත් කරනු ලැබුවා. මා කියන්න ඕනෑ, එහිදී මේ tender process එකෙන් තේරුණු, එහෙම නැත්නම් මේ tender එක ලැබුණු international supplierගේ prequalifications සම්බන්ධයෙන් චෝදනාවක් එල්ල කළ බව. විශේෂයෙන්ම කියන්න ඕනෑ, ඒ එල්ල කරපු චෝදනා අසත්‍ය බව. More than three years' experience බලලා තිබුණා. ඒ experience එක ඒ විධියටම ඔවුන්ට තිබුණා. ඒත් එක්කම ඒ කාලය ඇතුළත - ඒ අවුරුදු තුන ඇතුළත - ලක්ෂ පහක supply එකක් දෙන්න ඕනෑ කියන කාරණාව තිබුණා. ඒකත් ඒ විධියටම register වෙලා තිබුණු අය සතුව තිබුණා. ඒත් එක්කම financial experience එක ගත්තොත්, US Dollars 150 million financial experience එකක් තිබෙන්න ඕනෑ. මේ ලංසුකරුවන් සියලුදෙනාටම ඒකත් ඒ ආකාරයෙන්ම තිබුණා. ඒ වාගේම, within that time period, legal background එක ගත්තත්, without any argument - there should be an acceptable situation - it was there. මේ සැපයුම්කරු ලියාපදිංචි නැහැ කිව්වා, විවිධ ප්‍රශ්න තිබෙනවා කිව්වා. නමුත් මේ සැපයුම්කරු සම්බන්ධව එහෙම කිසිම කාරණාවක් තිබුණේ නැහැ. මෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉතාම පැහැදිලිව, ඉතාම හොඳින් කරලා තිබුණා.

ඒත් එක්කම දින 21ක් සම්බන්ධ කථාවකුත් කිව්වා. දින 21 ගත්තත් එහෙමයි. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව තිබෙනවා. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙන් ඒ සඳහා අනුමැතිය අරගෙන තමයි දින 21 ප්‍රසම්පාදනයට මේක යොමු කරලා තිබුණේ. ඒත් එක්කම මේ දින 21 කාල සීමාව මදි කියලා, suppliersලා විසින් තව දින ගණනක් ඉල්ලා තිබුණා. Then, additional seven days were given for all the suppliers; තවත් දින 7ක් ලබා දීලා මුළු කාල සීමාව දින 28ක් බවට පත් කරලා තිබුණා. ඊට පසුව appeal period එක විධියට තවත් දින 14ක් ලබා දීලා තිබුණා. එහෙම නම් ඒ දින 14 ඇතුළත tender process එක ගැන appeal එකක් ඉදිරිපත් වන්න ඕනෑ. If there was any misinformation or misconduct, there would have been an appeal. හැබැයි, එහෙම appeal එකක් ඉදිරිපත් වෙලා තිබුණේ නැහැ. එහෙම තිබුණා නම් appeal එකක් එන්න ඕනෑ. Appeal period එක විධියට දින 14ක් දීලා තිබුණා. නමුත්, මේකට එකම එක්කෙනෙක්වත් appeal එකක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ.

ඒ වාගේම මෙහි මූල්‍ය ශක්‍යතාව ගැනත් බලන්න තිබුණා. ඒ වාගේම පළපුරුද්ද, සැපයුමේ තිබෙන ගුණාත්මකභාවය පිළිබඳ කාරණා ගැනත් බලන්න තිබුණා. ඒ සියල්ලම consider කරලායි තිබුණේ. මේ හැම කාරණාවක් පිළිබඳවම අවධානය යොමු කරලා තමයි මේ tender process එක වෙලා තිබුණේ.

ඒ වාගේම මේ tender process එක ගත්තොත්, Bid Opening Committee, Bid Evaluation Committee, ඊට පස්සේ Procurement Committee කියන මේ හැම committee එකකින්ම අදාළ නීත්‍යානුකූල පසුබිම යටතේ, අදාළ නීත්‍යානුකූල වටපිටාව ඇතුළේ තමයි මේ කටයුත්ත කරලා තිබුණේ. එහෙම නැහැයි කියන්න කිසිම සාක්ෂියක් මේකේ නැහැ.

ඊළඟට, Auditor-General's Report එක මත පදනම් වෙලා තවත් කාරණාවක් කිව්වා. Auditor-General's Report එක පදනම් කරගෙන කටයුතු කළේ නැහැ කිව්වා. ඒක සම්පූර්ණ මිථ්‍යාවක්; සම්පූර්ණ වැරදි කථාවක්. 2022 වසරේ අන්තිමට තමයි ඒ Auditor-General's Report එක ඉදිරිපත් කරලා තිබුණේ. ඒ Report එකෙන් ඉල්ලා තිබූ පරිදි - කියන ලද පරිදි - කටයුතු කරලා තිබුණා. ඒකේ මොකක්ද කියලා තිබුණේ? ඒකෙන් කියලා තිබුණා, ලක්ෂ 10ක් - one million - තිබුණු supply එක ලක්ෂ 5 දක්වා අඩු කළා කියලා. ඒක Auditor-General's Report එකේ තිබෙන කාරණාවක්. මේ tender process එකේ තිබෙන යම් යම් conditions ලිහිල් කරන්න කියලා තිබුණා. ඒ අනුව තමයි 2023දී ඒක කරලා තිබුණේ. ඒ කරන ලද එකම එක ලිහිල් කිරීමක්වත් අපි මේ tender එක ඇතුළත වෙනස් කරලා නැහැ. GCV එක 5,900ට වඩා තිබෙන්න ඕනෑය කියන condition එක ඒ විධියටම apply කරලා තිබුණා. ඒක නිසා ඔය ඉදිරිපත් කරනු ලැබුවේ සම්පූර්ණ අසත්‍යයක්. ඒ කාරණා ටික ගත්තාම ඒ තත්ත්වය තමයි තිබෙන්නේ.

අපි දන්නවා, coal කියන්නේ natural resource එකක්, ස්වාභාවික සම්පතක් කියලා. ස්වාභාවික සම්පතක් වුණාම, it was not made in a factory; මේක කර්මාන්තශාලාවක් ඇතුළත සකස් කරන එකක් නොවෙයි. ඒක නිසා තමයි මේකේ ranges දාලා තිබෙන්නේ. මේකේ quality එකට අනුව, ඒකේ තත්ත්වයට අනුව, ඒකේ ස්වභාවය අනුව ranges දාලා තිබෙනවා. ඒ ranges තුළ කටයුතු කරන්නේ කොහොමද කියන කාරණාවත් මෙහි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේකේ range එක විධියට GCV එක 5,900ත්, 6,150ත් අතර තිබෙන්නට ඕනෑ. එහෙම නැත්නම්, GCV එක 6,150ට වඩා වැඩි වුණොත් කිසිදු ගැටලුවක් නැහැ. GCV එක 5,900ත්, 6,150ත් අතර තිබෙනවා නම්, ඒකත් accepted. හැබැයි, GCV එක 5,900ට අඩුයි නම් තමයි ඒකට ගහන ලද දඩය දෙගුණයකින් වැඩි කරලා අය කරන්නේ. ඒ අනුව මේ ගෙනෙන ලද පළමුවැනි shipment එක ගත්තොත්, එහි ගැටලුවක් තිබුණා. ඒ නිසා තමයි, US Dollars 2.1 million had been fined.

මේකේ තවත් තාක්ෂණික කාරණා ගණනාවක් තිබෙනවා. මෙහිදී Load Port Report එක වැදගත් වනවා, ඒ වාගේම Discharge Port Report එකත් වැදගත් වනවා. ඊළඟට, අපි Load Port Report එක ගත්තොත්, මේ ආපු හැම නැවකම - ඇවිල්ලා තිබෙන හැම shipment එකකම - Load Port Report එකේ කිසිදු issue එකක් නැහැ. ඒක තමයි, internationally accepted rule එක. එතැනින් එහාට අපට වෙන කරන්න දෙයක් නැහැ. ඒක අනුව එවලා තිබෙනවා. ලක්විජය බලාගාරයේ report එක පිළිගන්නේ නැහැ, ඒක accredited lab එකක් නොවන නිසා. විශ්වසනීය තොරතුරු මත ඒක accredited lab එකක් කියලා පිළිගන්න එකක් නොවන නිසා අපි ඒක ඉන්දියාවේ accredited lab එකකට යවනවා. ඒ අනුව ඉන්දියාවෙන් එන report එක තමයි අපි පිළිගන්නේ. ඒ අනුව පළමුවෙනි නැව ෆේල් කියලා පිළිගත්තා. ඒ අනුව තමයි ඒකට US Dollars 2.1 million දඩ ගහලා තිබුණේ.

මම කියපු accredited lab කථාව ගත්තොත්, accredited lab එකක් විධියට Indian lab එක පිළිගන්නවා, ලක්විජය එක පිළිගන්නේ නැහැ. මේ අය මේ සමහර කාරණා - points - ඉදිරිපත් කරන්නේ මොනවා මත පදනම් වෙලාද? ලක්විජය බලාගාරයේ තිබෙන රසායනාගාරයේ වාර්තාව පිළිගන්න කියලාද? ඒක පිළිගන්න බැරි නිසා තමයි report එක ඉන්දියාවට යවලා ඉන්දියාවෙන් report එකක් ගන්නේ. ඒ කාරණාවත් වැරදියි. ඒ අනුව මේ අය ඉදිරිපත් කරන ලද බොහෝ කාරණා වැරදියි.

[ගරු රුවන් විජේවීර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙකේ තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. අපි රටක් විධියට ගත්තොත් දූෂණයට විරුද්ධව බරපතළ සටනක් කරගෙන යනවා. අපි Corruption Perceptions Index එකේ 2024 අවුරුද්දේ හිටියේ 121ට, අපි දැන් 107 දක්වා ඇවිල්ලා තිබෙනවා. දූෂණයට එරෙහිව සටන් කරන රටක් ලෙස, දූෂණයට එරෙහිව සටන් කරන ආණ්ඩුවක් විධියට, දූෂණයට එරෙහිව සටන් කරන මන්ත්‍රීවරුන්, ජනාධිපතිවරයෙක් සහ මහජනතාවක් ඉන්න රටක් විධියට අපව පිළිගෙන තිබෙනවා. ඒක දරාගන්න බැරිව තමයි විපක්ෂය මේ දේවල් එකතු කරන්නේ. ඒක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. එහෙම නැතිව වෙන issue එකක් නැහැ, ඒක තමයි මෙතැන තිබෙන main issue එක.

ඒ විතරක් නොවෙයි. Verité Research එකෙන් රට ඇතුළේ කළ "Mood of the Nation" poll එකෙන් මොකක්ද වුණේ? ඒකෙන් වුණේත් රට ඇතුළේ ජනතාව පිළිගෙන තිබීම, ආණ්ඩුවක් විධියට අපි against corruption කියලා. The Government is acting and working hard against corruption. That has been accepted. ඒක තමයි තිබෙන issue එක. ඒ නිසා තමයි මෙකේ මොකක් හරි issue එකක් හදලා Government එක යන පාර පෙරළන්න ඕනෑය කියන අදහසේ ඉන්නේ.

ළඟදී අපේ රටට ආවා, Ms. Kristalina Georgieva, Managing Director of the IMF. එතුමිය මොකක්ද කියන්නේ? එතුමිය කියන කාරණා ඉතා වැදගත්. එතුමිය කියනවා, "I think for the first time there is a Government that is trusted by the people and is doing their part to gain that trust." යනුවෙන්. ඉතිහාසයේ පළමුවෙනි වතාවට ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න රජයක් - Government එකක් - ඉන්නවා කියනවා. ඒ වාගේම එතුමිය කියනවා, "And very important, the view of the Government is that there has to be trust in civil service, and that means corruption has to be eliminated" යනුවෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
Sir, give me one more minute, please.

එතුමිය කියන ඉතා වැදගත්ම කාරණාව මොකක්ද? "Sri Lanka is the first country in Asia, of which the Government asked us to do a governance assessment so we can help in this fight to eliminate corruption". මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, corruption පිළිබඳව පරීක්ෂණයක් - governance assessment එකක් - කරන්න කියලා ඉල්ලපු ආසියාවේ පළමුවෙනි රට ශ්‍රී ලංකාව බව එතුමිය කියනවා. අවසාන වශයෙන් එතුමිය කියනවා, "I also saw in the President and in the members of the Government genuine interest in the well-being of the people. And I know that success comes when the country is united. This Government is working so hard to achieve that" යනුවෙන්. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.50]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පළමුවෙනි වතාවට රටක් IMF එකෙන් ඉල්ලුවා කිව්වා නේ, දූෂණය පිළිබඳව governance assessment එකක් කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමා, ඒක ඉල්ලුවේ මේ ජනාධිපතිතුමා නොවෙයි, හිටපු ජනාධිපතිතුමා. මම ඒක ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ සභාවේ මහා ලොකුවට කථා කළා, වංචාවක්, දූෂණයක් සිද්ධ වෙලා නැහැ කියලා. මට විනාඩි 5ක කාලයක් පමණයි වෙන් වෙලා තිබෙන්නේ. ඒක නිසා කෙටියෙන් කියන්නම්. එක පාරක් මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට හිටියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට මට සිද්ධ වුණා, නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය සම්බන්ධයෙන් 2022-2025 කාල පරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීම් පිළිබඳව විශේෂ විගණන වාර්තාවක් කැඳවන්න. එවකට සිටි ආණ්ඩුව ඒ සභාපති ධුරයෙන් මාව අයින් කරලා ආලා වෙන කෙනෙක් පත් කර ගත්තා. ඒකට හේතුව වුණේ, ඒ ගල් අඟුරු ටෙන්ඩර් එක සම්පූර්ණයෙන්ම නීති විරෝධියි කියලා අපි දැකපු එක. ඒ නිසා අපි දීපු recommendationsවලට අනුව, විගණකාධිපතිවරයාගේ recommendationsවලට අනුව ඒ ගනුදෙනුව නැවැත්වූවා. ඒ ආණ්ඩුවට වැඩිපුරම තරහා ගියේ වෙන මොකක්වත් නිසා නොවෙයි, මගේ සභාපතිත්වයෙන් දීපු නිර්දේශවල එක තැනක අපි කිව්වා, මීට පස්සේ අවම වශයෙන් අවුරුද්දක්වත් මේ Tender Board එකේ වාඩිවෙලා හිටපු අයට ඒ වැඩේ කරන්න ඉඩ දෙන්න එපා කියලා. "මෙම ප්‍රසම්පාදන කමිටුවේ සාමාජික නිලධාරින්හට නැවත ප්‍රසම්පාදන කටයුතු සඳහා සහභාගි වීම අවම වශයෙන් වසරක කාලයකට හෝ අත්හිටුවිය යුතුය" කියලා අපි ඒ නිර්දේශය දුන්නේ, එවැනි දූෂණ ඉදිරියේදී සිදු වීම නැවැත්වීමට තිබෙන අවශ්‍යතාව නිසායි. මේ අවස්ථාවේදී මම 2022 සැප්තැම්බර් 30 දිනැති නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාල පරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව සහ 2022 ඔක්තෝබර් 04 දිනැති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව **සභාගත*** කරනවා.

මෙන්න මෙකයි අවම සුදුසුකම හැටියට තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳට අහගන්න. මොකද, සමහරු මේක වෙනස් කරලා කියන්න හදනවා, "පසුගිය මාස 36 තුළ GCV අගය 5900 kcal/kg හෝ ඊට වැඩි ධාරිතාවක ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1ක් අවම වශයෙන් සැපයීමේ පළපුරුද්දක් සහිත වීම" කියලා. ඒක තේරුම් ගන්න අමාරු නැහැ නේ. මිලියනයක් කියන්නේ, ලක්ෂය වාගේ දහගුණයක් නේ. ඕනෑම කෙනෙකුට ඒක තේරෙනවා නේ. මම අහන්නේ මෙකයි. එක් වතාවක් මාව පැන්නුවේ මෙන්න මේ වාර්තාව නිසායි. පුළුවන් නම් ආපසු මාව කමිටුවෙන් පන්නන්න. මේක තමයි, විශේෂ විගණන වාර්තාව. දැන් මම අහනවා, මේ වාර්තාව දැක්කේ නැද්ද කියලා. මේ වාර්තාව අනුව කටයුතු කළ යුතුයි. එහෙනම්, අපි පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවක් පත් කරලා, ඒකට සභාපතිවරයෙක් සහ සාමාජික මන්ත්‍රී කණ්ඩායමක් පත් කරන්නේ ඇයි? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149 හා 150 ව්‍යවස්ථා අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ බලය තිබෙන්නේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පාර්ලිමේන්තුවට. ඒ බලය ක්‍රියාත්මක කරන්න තිබෙන කමිටුව තමයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව. ඒ කාරක සභාවේ වාර්තාවේ ඉතා පැහැදිලිව මේ පිළිබඳව සඳහන් වෙනවා. මේක නැහැ කියන්නේ කවුද? කවුරු හරි කියන්න පුළුවන්ද, අපි මේක ignore කරනවා, අපි මේක නොසකා හරිනවා කියලා. එහෙම කියන්න බැහැ. පාර්ලිමේන්තුව තමයි නීති හදන්නේ; Cabinet එකට නීති හදන්න බැහැ. පාර්ලිමේන්තුවෙන් හදන නීතිය Cabinet එකෙන් වෙනස් කරන්නත් බැහැ. පාර්ලිමේන්තුවෙන් හදන නීතිය වෙනස් කරන්න පුළුවන්, පාර්ලිමේන්තුවට පමණයි. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ විශේෂ විගණන වාර්තාවෙන් නිර්දේශ කරලා තිබෙන දේ කවුද වෙනස් කළේ? කොහොමද ඒක වෙනස් කළේ? ඒ නිසා මම හිතන විධියට, මේ පිළිබඳව මීට වඩා අවධානය යොමු කරන්න වෙනවා. මම ඒ කාරණාව ගැන විතරයි කථා කරන්න ගත්තේ. මොකද, මම විෂයානුබද්ධව ඒ දේ කරලා, ගෙදර යන්න වුණු කෙනෙක්. ඒකයි මම මේවා කියන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, ගරු ඇමතිතුමා කියන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔය වාර්තාවේ දිනය කවදාද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මේ වාර්තාවේ දිනය කවදාද කියලා ගරු ඇමතිතුමා මගෙන් අහනවා. ගරු ඇමතිතුමනි, මේ වාර්තාවේ දිනය 2022 සැප්තැම්බර් 30වන දා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
වාර්තාවේ ඒ ගැන නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒ වාර්තාවේ ඒ ගැන නැති වෙන්නේ කොහොමද? ඇමතිතුමා කියනවා, ඒ වාර්තාවේ ඒ ගැන නැහැ කියලා. විශේෂ විගණන වාර්තාවේ 22වන පිටුව බලන්න. එහි 5.5 යටතේ තිබෙනවා, "ගල් අඟුරු සැපයුම්කරුවෙකු ලියාපදිංචිය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්" කියලා. ඒ වාගේම එම පිටුවේ, 5.5.1 (ආ) යටතේ තිබෙනවා, "පසුගිය මාස 36 තුළ 5900 kcal/kg...." යනුවෙන්. ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1ක් අවම වශයෙන් සැපයීම කියලා තිබෙනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවන්නේ නිරීක්ෂණ. නිර්දේශ විශේෂ විගණන වාර්තාවේ 7.2 යටතේ තිබෙන්නේ. ඔබතුමා 7.2 කියවන්නකෝ. මම ඕනෑ නම් ඔබතුමාට ඒක කියවන්නම්. 7.2හි තිබෙන්නේ තිබෙන ඒවා ලිහිල් කරන්න කියලා. මම ඒ ගැන මගේ කථාවේදී කිව්වා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්න. මේ නිරීක්ෂණවල තිබෙන්නේ සමස්තය. මේක තමයි, specific එක. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, ගරු ඇමතිතුමා. කෑකෝ ගහන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. විගණකාධිපතිවරයා වාර්තාවක් දීපු පලියට ඒක නීතිය වෙන්නේ නැහැ. නමුත්, ඒ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරලා සම්මත වුණාම තමයි, මේ annexure එක නීතිය වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ දිනය තමයි, 2022 ඔක්තෝබර් 04වැනි දා. නිර්දේශවල තිබෙන්නේ මෙහෙමයි. මට විපක්ෂයෙන් තවත් විනාඩියක කාලයක් ලබා දෙයි.

විශේෂ විගණන වාර්තාවේ 7 යටතේ තමයි නිර්දේශ තිබෙන්නේ. "මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණුවලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය" කියලා එහි සඳහන් වනවා. "පළපුරුද්ද සහ සැපයුම් ගුණාත්මකභාවය" කියලා තිබෙනවා. නමුත්, "පළපුරුද්ද" පිළිබඳව සඳහන්ව තිබෙන්නේ, 5.5.1 (ආ) යටතේයි. 7.2 යටතේ නිර්දේශවල තිබෙනවා, "පළපුරුද්ද" කියලා. නමුත්, පළපුරුද්ද ගැන තිබෙන්නේ, 5.5.1 (ආ) යටතේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියක කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
සමාවෙන්න, මට ලැබී ඇති කාලය අවසන් බව මම දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අමතර විනාඩියත් අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි.

මට මේ ගැන තර්ක කරන්න අවශ්‍යතාවක් නැහැ. මම මේ කාරණය ඉදිරිපත් කළේ සද්භාවයෙන්, ගරු ඇමතිතුමනි. මොකද, මේක මගේ මූලිකත්වයෙන් කළ විගණනයක්. ඒ නිසා මම හොඳටම මේ ගැන දන්නවා. මේ විගණනය ඉදිරිපත් කරලා ගෙදර යන්න සිදු වුණු කෙනෙක්, මම.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.57]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද දින මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙනාපු එක ගැන මෙතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. මුලින්ම අපි බැලුවා, මේ යෝජනාව මොකක්ද කියලා. මොකද, මේ කාරණයට සම්බන්ධව එදා හිටපු අමාත්‍යවරුනුත් අද මේ යෝජනාව ඉදිරිපත් කළ විපක්ෂයේ ඉන්නවා. මේ යෝජනාවේ මුලින්ම තිබෙනවා, " '2025-2026 ගල් අඟුරු වාරය' සඳහා, ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයට අවශ්‍ය වන ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 12.32ක..." යනුවෙන්. මොනවාද අප්පා මේ කියන්නේ? කවුද, ඔබතුමන්ලාට මේවා ලියා දෙන්නේ? මෙට්‍රික් ටොන් මිලියන 12.32ක්! උපරිම ධාරිතාව මෙට්‍රික් ටොන් මිලියන 2.25යි. නමුත්, ගෙනෙන්නේ මෙට්‍රික් ටොන් මිලියන 1.5යි. පළමුවැනි කාරණයම වැරදියි නේ. මොනවාද මේ? කවුද මේවා ලියා දෙන්නේ? ඔය ඔක්කෝම එක එක අය ලියා දීපු ඒවා. ඒවා කියන්න ගිහිල්ලා තමයි ඇන ගන්නේ. මේක හොඳින් අහගන්න.

ඊට පස්සේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මෙච්චර කල් තිබුණු ඒවා ගැන විස්තරේ කිව්වා. ඊට පස්සේ සද්භාවයක් ගැන කිව්වා. පට්ටපල් බොරු. 2022 සැප්තැම්බර් 30 දිනැති විශේෂ විගණන වාර්තාවේ 7.2 යටතේ තිබෙනවා, තිබුණු ඒවා ලිහිල් කරන්න කියලා. ශක්‍යතාව, පළපුරුද්ද කියන ඒ ඔක්කෝම බලලා තමයි දෙන්නේ. දැන්, උද්සෝෂණත් කළාය කියනවා. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම කිව්වේ මේකේ තිබෙන කථාව. මමයි ඒ කමිටුවේ සභාපතිව හිටියේ. මම දන්නවා, මේකේ ලියා තිබෙන්නේ මොකක්ද කියලා. අවම වශයෙන් - minimum - මෙට්‍රික් ටොන් මිලියනයක් ගෙනෙන්න ඕනෑය කියලා තමයි තිබෙන්නේ. ඒක තමයි, අවම සුදුසුකම සහ experience එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු මන්ත්‍රීතුමා කිව්ව කාරණය ඉතාම පැහැදිලියි. මේ විශේෂ විගණන වාර්තාවේ 7.2 යටතේ ඉතාම පැහැදිලිව කියා තිබෙනවා නේ, "...පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරගකාරීත්වය උපරිම කර ගැනීම..." කියලා. එම නිසා ඒ ගැන අපි කථා නොකර ඉඳිමු. *[බාධා කිරීමක්]* දැන් කියන්නකෝ, අර,- *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මොකක්ද?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
අයියෝ, අහගන්නකෝ. *[බාධා කිරීමක්]* එහෙම නම් කියන්නකෝ, අවුරුද්දකට ඕනෑ මෙට්‍රික් ටොන් මිලියන ගණන කීයද කියලා. ඒක දන්නේ නැද්ද? එතැනම වැරදියි නේ. මේ වාර්තාවේත් කියා තිබෙනවා, "ලිහිල් කර" කියලා. ඒවා පැත්තකින් තියලා මගේ කථාව කරගෙන යන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒවාට උත්තර නැහැ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මෙහෙමයි. එතුමන්ලා කවුරු හරි ලියා දෙන එකක් කියවනවා. දැන් ආපසු කියනවා, ලක්විජය ගල් අඟුරු බලාගාරයේ තිබෙන ඒවා ගැන. අපේ ප්‍රසම්පාදනයට කලින් ප්‍රසම්පාදනයේ කිලෝ කැලරි 5,900ට අඩු ඒවා 5ක් තිබෙනවා. කිලෝ කැලරි 5,900ට අඩු, 5,400 ගණන්වල ඒවා 5ක් තිබෙනවා. ඒවාට දඩ අය කළාද? දැන් කියනවා, ඒ ඔක්කෝම rejected කියලා. කොහේ හරි යන කවුරු හරි ලියා දෙන කොළ කෑල්ලක් උස්සාගෙන ඇවිල්ලා මෙතැන කියවනවා. මේ විවාදය පටන් ගන්නකොටම මොනවාද මේ කියන්නේ? ඔබතුමන්ලා එක්ක විවාද කරන්න පුළුවන්ද? හිටපු රාජ්‍ය ඇමතිවරු ඉන්නවා, හිටපු ඇමතිවරු ඉන්නවා, ඒ වාගේම SOC එකේ සභාපතිතුමා ඉන්නවා. මම හිතුවා, වැරදීමක් වුණාය කියලා පටන් ගන්නකොටම සමාව ගනියි කියලා. නමුත්, ඒකම කියවනවා. ඉතින්, ඔබතුමන්ලාත් එක්ක ගල් අඟුරු ගැන විවාද කරන්නේ කොහොමද?

ඊළඟට, දැන් තවත් කතන්දර කියනවා නේ. මේකෙදි තමයි හරියට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිද්ධ වුණේ නැත්තේ කියලා කියනවා. මෙවර තමයි වැඩිපුරම ප්‍රමාණයක් ටෙන්ඩර් එකට ඉදිරිපත් වුණේ; 11ක් හෝ 10ක්. 11දෙනෙක් දීලා, 10දෙනෙක් තමයි ඉදිරිපත් වුණේ ඒ අවස්ථාවට. අපි මේ ගැන කියන්න ඕනෑ. ඒ, මොකද දන්නවාද? දැන් මේකේ ඇත්ත කාරණය දැන ගත්තොත්, අද උද්සෝෂණයට මහජනතාව කවුරු හරි ගියා නම් එහෙම ගියපු අයත් කෝටුවක් අරගෙන තමන්ගේම පස්ස පැත්තට ගහ ගන්න ඕනෑ. මොකද, මේගොල්ලන්ගේ මේ මෝඩ තීන්දු තීරණත් එක්ක අතීතයේ වෙච්ච දේවල් මේ සභාවේදී ඉදිරිපත් කරන්න හොඳ අවස්ථාවක් තමයි අපට මේ එළඹිලා තිබෙන්නේ. ඒ අවස්ථාව තමයි අපි මේ උපයෝගී කර ගන්නේ. ඒ නිසා මේවා හොඳින් අහගෙන ඉන්න කියලා අපි කියනවා. ජනතාවටත් අපි කියනවා, මේවා ගැන සැලකිලිමත් වෙන්න කියලා. දැන් මේ ටෙන්ඩරය ගැන කථා කරන අය මීට කලින් ටෙන්ඩරයේදී මොකද කළේ? 2022-2023 ටෙන්ඩරය ගියා, එක්තරා සමාගමකට; සිංගප්පූරුවේ තිබෙන ප්‍රසිද්ධම, ලෝකයම පිළිගන්නා සමාගමකට තමයි ඒ ටෙන්ඩරය ගියේ. ටෙන්ඩරය දෙන දවසේම ඊට වඩා අඩුවෙන් සමාගමක් ඉදිරිපත් වුණාය කියලා ඒකට අවස්ථාව දෙනවා. එතකොට TEC එක ඒකට විරුද්ධ වෙනවා; Tender Board එක ඒකට විරුද්ධ වෙනවා. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා ඒ සමාගමටම දෙනවා. ඒකට subcommittees දමලා යටින් ගේම ගහනවා. අන්න ඒවා තමයි වංචා. දැන් මේ සභාවේදී කියනවා, වංචා ගැන. ඔන්න වංචා! ටෙන්ඩරය පැත්තක. ටෙන්ඩර්

නැහැ, දෙනවා අත යටින්. *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න, අහගෙන ඉන්න. තවත් ගොඩක් දේවල් කියන්න තිබෙනවා. තව කියනවා, පාඩු වෙච්ච ඒවා ගැන. *[බාධා කිරීමක්]* පාඩු වෙච්ච ඒවා ගැන කියනවා. දැන් කිව්වා නේද, 2014-2015 සඳහා රුපියල් මිලියන 12,500ක් අය විය යුතුයි කියලා?

ඒවා අය කර ගත්තාද? ඒ පාඩුව කවුද ගෙවන්නේ? ඔයගොල්ලන් ගෙවනවාද? ඊට පසුව 2011දී රුපියල් මිලියන 3,500ක්. මේවා හොඳට අහගෙන ඉන්න. ඊට පසුව 2014 දක්වා දින 136ක් නොරොච්චෝලේ වැඩ කර නැහැ. දින ගණන ගත්තොත්, දින 136ක්. දැන් blade එක ගැනයි, වෙන පාඩුව ගැනයි, දවස් ගණනයි අහනවා. අපි දන්නවා නේ, මොකක් හරි වෙච්ච ගමන් ඒ කාලයේ නොරොච්චෝලේ කැඩෙනවා.

දැන් ඔය testing ගැන කියනවා නේ. 2019 වෙනකම් load port testing විතරයි කර තිබෙන්නේ. ඒකට සම්පූර්ණ මුදල ගෙවා තිබෙනවා. හොයා බලන්න, 2019 ගැන. ඒ කියන්නේ, පටවන තැනින් test කරලා ඒකට තමයි සියයට 100ක් ගෙවන්නේ. දැන් හරි ක්‍රමයට, නිවැරදි විධියට මේවා වෙනකොට මොකක්ද කියන්නේ? අර අපේ මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ දැන් මේවා දූෂණයෙන් තොරව සිදු වෙනවා කියලා රටේ ලෝකයේ ඔක්කෝම පිළිගන්නකොට, මේගොල්ලන්ට හරිම අමාරුවක් හැදිලා තිබෙනවා. ඒ නිසා "මේවායෙන් දූෂණ සිදු වෙනවා" යනුවෙන් කියනවා. අර බිරිඳගේ අම්මාගේ account එකක් ගැන කියනවා. ඒක ඒගොල්ලන්ගේ practice එක. දැන් ඒ ගැන කරුණු ඉදිරිපත් කරන්න කිව්වාම, වෙන මොනවාද කොළ කෑලි වගයක් ගෙනැල්ලා ඉදිරිපත් කරනවා. ඇත්තටම අපිට මේ ගැන ආයෙත් කථා කරන්න කිසිම දෙයක් නැහැ.

නමුත් මම තව දෙයක් කියන්නම්. ඔන්න අහගන්න ගහපු ගැහිලි ගැන. 2016 යහපාලන ආණ්ඩුව පැවැති කාලයේදී නැව් 7ක් reject වෙනවා. ඒවාට දඩ ගැහුවා. දඩ ගැහුවේ බොහොම අමුතු ක්‍රමවලට. දැන් දඩ ගැන අරගොල්ලන්, මේගොල්ලන් එක එක ඒවා කියනවා. නමුත් ඒ කාලයේ ගහපු දඩ ප්‍රමාණ ගැනත් ඕනෑ නම් අපි කියන්නම්. අර ලක්විජය බලාගාරයේ bomb calorimeter - 2022-2023 ආපු readings ඔක්කෝමත් කියන්නම්. දැන් විපක්ෂ නායකතුමාට මේ සැරේ ඒවා දීලා නේ. නමුත් කලින් ඒවා දීලා නැහැ නේ. ඉතා පැහැදිලිවම පෙනෙනවා නේ, එතැන යම් වරදක් තිබෙනවා කියලා. එහෙම නම් 2022-2023 කාලයේ list එක අරගෙන එන්නකෝ, කථා කරන්න.

2016 යහපාලන ආණ්ඩුව පැවැති කාලයේ නැව් 7ක් reject වුණා. ඒකට දඩ ගහපු විධිය බලන්න. ඒකට equation එකක් හදලා තිබුණා. එම equation එකේ එක තැනක දශම 1න් බෙදන්න තිබෙනවා. ගණිතය දන්නා අය මේ ගැන දන්නවා. දශම 1න් බෙදනවා කියන්නේ 10න් වැඩි කරනවා. 5 කියලා තිබුණොත් දශම 1න් බෙදුවොත්, 50 වෙනවා. එහෙම තමයි දඩය අය කරන්න ඕනෑ. මේගොල්ලන් ගහපු ගැහිල්ල කොහොමද දන්නවාද? දශම 1න් බෙදනවා වෙනුවට බෙදුවා, 1න්. ගණන් දන්නා අය දන්නවා. 1න් බෙදුවාම මොකක්ද වෙන්නේ කියලා පොඩි කෙනෙක්ගෙන් ඇහුවත් කියයි, 5 එකෙන් බෙදුවාම, 5යි නේ. ඇයි, ඒක 1න් බෙදන්නේ කියලා දන්නා අය දන්නවා. ඔන්න ඔය වාගේ ලජ්ජා නැති වැඩ කළේ. නමුත් අපේ ඇමතිතුමාට හොරා කියනවා, footnotes ගහපු අය. ඒ වාගේම ගිහිල්ලා පර්මිට් ඉල්ලා අඬපු අය තමයි මේ බොරු චෝදනා කරන්නේ. මතක තබා ගන්න, අපි දූෂණ සංජානන දර්ශකයේ ඒ විධියට ඉස්සරහට එන්නේ කොහොමද, අපිට දූෂණ චෝදනා තිබෙනවා නම්? දූෂිත කිසිවෙක් අපි ඇමතිකම්වලට පත් කරන්නේ නැහැ. එහෙම තැනකට අපි ඇවිල්ලා ඉන්නේ නැහැ. *[බාධා කිරීමක්]* "හක් හක්" ගාලා හිනා වුණාට වැඩක් නැහැ. දශම 1න් බෙදන්න ඕනෑ එක, 1න් බෙදුවාම ඒ දඩය 10ගුණයකින් අඩු වෙනකොට, ඒක ඔබතුමන්ලා ගෙවනවාද? අතීතයේ සිදු වුණු මේ සියල්ල ගැන පරීක්ෂා කරලා මේවා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කරන්න ඕනෑ.

අපි ඉතා පැහැදිලිව කියන්නේ මේකයි. ඔවුන් දන්නවා, මේකේ ගහපු යටි ගේම් ගැන, යටි මඟඩි වැඩ ගැන. දැන් ටෙන්ඩර් ගැන කථා කරනවා. නමුත් නිසි ක්‍රමවේදයට අනුව ටෙන්ඩර් දෙන්නේ නැතුව ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ගිහිල්ලා ඒගොල්ලන්ට ඕනෑ අයට දුන් ඒවා ගැනත් කියන්න පුළුවන්. ඊළඟට, ලක්විජය බලාගාරයේ පාඨාංක ගැන කථා කරනවා. ඒ කාලයේ පාඨාංක ගැන කියන්නේ නැහැ. ඒ පාඨාංක ගැන දැන් ඕනෑ නම් කියන්නම්. දැන් සහාගත කරන්න වුණත් පුළුවන්. අර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ කාරණයේදී ඒක අනික් පැත්තට හැරුණා වාගේ මෙතැන දූෂණ වෙලා කිව්වාම, මේ වැඩේත් හරි කියලා ඔයගොල්ලන් හිතුවා. ඇත්තටම අපිට පැහැදිලිව පෙනෙනවා, දූෂණ වුණේ කොතැනද කියලා, හොරකම් වුණේ කොතැනද කියලා. මෙතැන දූෂණයක් වුණා කියනවා නම් වෙච්ච දූෂණය මොකක්ද කියලා කියන්න. එහෙම නම් ගිහිල්ලා නඩු දමන්න. අර period එකේ විරෝධතා දක්වන්න තිබුණා. කවුද විරෝධතා දැක්වූයේ? කවුද නඩු දැම්මේ? ඔන්න ඔය වාගේ තත්ත්වයක් තමයි ඔයගොල්ලන්ගේ ක්‍රියාකාරිත්වය තුළ දක්නට තිබෙන්නේ. තව විස්තර ගොඩක් තිබෙනවා. ඕනෑ නම් මම ඒවාත් කියන්නම්.

ඊළඟට, අලාභය ගැනත් කියනවා නේ. මම පළමු නැවේ විස්තර විතරක් කියන්නම්, කාලය සීමාසහිත නිසා. මෙවර දඩය වෙන්නේ රුපියල් මිලියන 644ක්. Worst-case scenario ගත්තොත්, ඒ කියන්නේ තෙල්වලින් දහනය වෙනවා කියා ගණනය කළොත් රුපියල් මිලියන 595ක් එන්නේ. ඊට වඩා වැඩි ප්‍රමාණයක් දඩය අරගෙන තිබෙනවා. හැබැයි, ඒගොල්ලන්ගේ කාලයේ දශම 1න් බෙදනවා වෙනුවට 1න් බෙදා තමයි ගේම ගැහුවේ.

මම මේ වෙලාවේ තව දෙයක් කියන්න ඕනෑ. දැන් සමහර පක්ෂවලට ඕනෑ වෙලා තිබෙනවා, ආයෙත් ජාතිවාදය අවුස්සන්න. අපි දන්නවා, මේ ජනාධිපතිවරයාට යාපනයේ විතරක් නොවෙයි, මේ රටේ හැම පැත්තකම - උතුරේ, නැඟෙනහිර, දකුණේ, කඳුකරයේ - ඉන්නා අයගේ විශ්වාසය තිබෙන බව. අපිට උතුරේ ජනතාව කෙරෙහි, විශේෂයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන දමිළ මන්ත්‍රීවරුන් කෙරෙහි විශාල ගරුත්වයක් තිබෙනවා. හැබැයි, එම ගරුත්වය නැති වන විධියට කටයුතු කරන්න හොඳ නැහැ. අපි දන්නවා පසුගිය කාලයේ හිටියා සභා ගර්භය තුළ මිරිස් කුඩුවලින් ගහපු අය, mike කඩපු අය. එම සංස්කෘතිය නැවත ගෙනෙන අය ඉන්නවා. ඇත්තෙන්ම කිව්වොත්, අපට මුහුණ දිහා බලන්න පිළිකුලක් දැනෙන අය ඉන්නවා. අපේ ජනාධිපතිතුමා ඉලක්ක කරලා ඉතා අසික්කිත ලෙස මඩ ගැසීම් සහ අවලාද කිව්වා. පසුගිය දිනක මම දැක්කා අපේ ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියට නොයෙක් අවලාද කියනවා. දැන් ඒගොල්ලන්ට පුරුදු ක්‍රමයක් තිබෙනවා නේ. තාත්තා පාර්ලිමේන්තුවට ආවාට පසුව පුතා එනවා. ඊට පසුව බාප්පා එනවා. ඒ වාගේ පවුලේ හැමෝම එනවා නේ. ඒගොල්ලෝ එකපාරම කැබිනට් මණ්ඩලයට එනවා. ඊළඟට, අපේක්ෂකයා වනවා. ඒගොල්ලන්ට තිබෙන්නේ ඒ practice එක නේ.

ඇත්තටම අපේ බිමල් රත්නායක සහෝදරයා හම්බ වෙන්න ඉස්සෙල්ලා තමයි මට සමන්මලී සහෝදරිය විශ්වවිද්‍යාලයේදී හම්බ වුණේ. එතුමියව විශ්වවිද්‍යාලයේදී මම හඳුනා ගත්තේ ශිෂ්‍ය අරගළවලදී දක්ෂ සටන්කාරිනියක් විධියට. ඊටත් පසුව තමයි මම ඇත්තටම බිමල් සහෝදරයා හඳුනා ගත්තේ. එම සහෝදරිය අවුරුදු 27ක් නගර සභාවල කටයුතු කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

1994 අවුරුද්දේ වාගේ තමයි අපි විශ්වවිද්‍යාලයේදී හමු වුණේ. ඒ කාලයේ තමයි අපි හඳුනා ගත්තේ. මෙතුමන්ලා ගොඩක් දුරට හිතන්නේ වෙනස් විධියකට. දැන් අව්වාහක කාන්තාවක් දැක්කාම මෙතුමන්ලාට මතක් වෙන්නේ වෙනත් දෙයක්. හිතේ තිබෙන කැතකම මතු වෙන්නේ. පිරිමි අය දෙදෙනෙක් එකට කථා කළොත් මෙතුමන්ලාට හිතෙන්නේ එක දෙයක්. කාන්තාවෝ දෙදෙනෙක් කථා කළොත් හිතෙන්නේ එක දෙයක්. එහෙම හිතෙන්නේ හිතේ තිබෙන කැතකම නිසා. අපේ අගමැතිතුමියට, ගරු කථානායකතුමාට, ගරු බිමල් රත්නායක මැතිතුමාට තමන්ගේ හිතේ තිබෙන කැත අදහස් මත අසික්කිත, අවලාද කථා කියනවා. එම නිසා මම ආදරණීය ලෙස ඉල්ලීමක් කරනවා. අපි බලාපොරොත්තු වුණේ සහ අපෙන් මිනිසුන් බලාපොරොත්තු වුණේ, ලස්සන පාර්ලිමේන්තුවක්. ඒකට තමයි system change එක කියන්නේ. අන්න ඒ බලාපොරොත්තුව ඉටු කරන්න ඉතා හොඳින් හැසිරෙන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වාගේම තව කාරණයක් කියන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරු ඉන්නවා හැම දාම ස්ථාවර නියෝග පොත අතට ගන්නවා, point of Order එකක් ඉල්ලනවා. Point of Order එක දන්නෙත් නැහැ. ලජ්ජයි. සමහර අය අපේ දිස්ත්‍රික්කයේ. දිස්ත්‍රික්කයේ කියන්නත් ලජ්ජයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියනවා, මෙතුමන්ලාට අද ඉඳන් මෙය පාරා වළල්ලක් වන බව. දූෂණ චෝදනා සියල්ල, වැරදි වැඩ ඔක්කෝම කරලා තිබෙන්නේ මෙතුමන්ලා. මෙතුමන්ලා එක්ක තමයි ඒ ගනුදෙනුව මිනිසුන්ට බේරා ගන්න වෙන්නේ. අන්න ඒ අය වෙන්න තිබෙන ඩොලර් මිලියන ගණන්, රුපියල් මිලියන ගණන් කොහොමද අය කරගන්නේ කියන එක තමයි ඉදිරි කථාවලදී මෙතුමන්ලා පැහැදිලි කරන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.09]

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කලින් කථා කළ මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන ඉන්නකොට මට තේරුණේ මොකක්ද දන්නවාද? "2016දී මෙන්න මෙහෙම දේවල් වෙලා තිබෙනවා, ඒක නිසා මේක කමක් නැහැ. එදාත් හොරකම් කරලා තිබෙනවා, එදාත් ප්‍රශ්න තිබිලා තිබෙනවා. එහෙම නම් දැනුත් කමක් නැහැ" වාගේ තමයි මට තේරුණේ.

ඊළඟට, Transparency Internationalහි 2025 ගෝලීය දූෂණ සංජානන දර්ශකයේ දැන් අපි ඉන්න ස්ථානය 107 කියලා උජාරුවෙන් දහලනවා. ඔබතුමන්ලා එදා කිව්වේ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව දූෂිතයි කියලා; ඒක දූෂිතම ආණ්ඩුව කියලා කිව්වා. ඒ කාලයේ එම දර්ශකය අනුව අපි 82වන ස්ථානයේ හිටියේ. ඔබතුමන්ලා දූෂිතයි කියපු ආණ්ඩුව කාලයේ අපේ රට හිටියේ 82වන ස්ථානයේ. දැන් ඔබතුමන්ලාගේ කාලයේ 107වන ස්ථානයේ ඉන්නේ. ඊට වැඩිය ස්ථාන 25ක් පිටුපසට ගිහින්. දැන් ඔබතුමන්ලා Transparency Internationalහි ගෝලීය දූෂණ සංජානන දර්ශකය පිළිගන්නවා නම්, ඔබතුමන්ලාට පිළිගන්න වෙනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව තිබුණු කාලයට වැඩිය ස්ථාන 25ක් පිටුපසින් තමයි ඉන්නේ කියලා. හොරකම් කරනවා නේද? ඔබතුමන්ලා ඒක පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බලශක්ති ඇමතිතුමාට දිගින් දිගටම ආරාධනා කළා ප්‍රසිද්ධ විවාදයකට. හැබැයි, ආවේ නම් නැහැ. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ඇතුළේ මෙතැන සෙල්ලම් කරන්න ඕනෑ නැහැ. එම නිසා එළියේ මාධ්‍යයක විවාදයකට ආරාධනා කළා. නමුත්, ආවේ නැහැ. අපේ හිටපු විදුලිබල ඇමති ගරු කංචන විජේසේකර මැතිතුමා දැන් පාර්ලිමේන්තුවේ නැහැ. එවකට හිටපු රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මැතිතුමාත් දැන් පාර්ලිමේන්තුවේ නැහැ. ගරු කංචන විජේසේකර මැතිතුමා දැන් දේශපාලනයේ යෙදෙන්නෙත් නැහැ. හැබැයි, එතුමා ආරාධනයක් කළා. ඇමතිතුමනි, ඔබතුමායි, නියෝජ්‍ය ඇමතිතුමායි හෝ ඔබතුමා හෝ එතුමා දේශපාලනයේ නැති වුණත් ඒ කාලයේ දීපු ටෙන්ඩර්වල ප්‍රශ්නයක් තිබෙනවා නම් ප්‍රසිද්ධ විවාදයකට එන්න කියලා එතුමා ආරාධනා කළා. එතුමා සූදානම්, ඔබතුමාත් එක්ක විවාද කරන්න. හැංගෙන්න එපා. පාර්ලිමේන්තු වරප්‍රසාද ඇතුළේ හැංගෙන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ටෙන්ඩරය දූෂිතයි කියලා මම කිව්වේ අද නොවෙයි. මෙම ටෙන්ඩරය දූෂිතයි කියලා මම කිව්වේ ජූලි මාසයේ. ඔබතුමන්ලා ටෙන්ඩරය කල් දමපු වෙලාවේ, ජූලි මාසයේ තමයි මම කිව්වේ, එම ටෙන්ඩරයෙන් හොරකමක් කරන්න ලැහැස්ති වෙන්නේ කියලා. ඊට පසුව මම අගෝස්තු මාසයේත් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "මේ ඇමතිතුමා හොරකමක් කරන්න, මේ ආණ්ඩුව මේක මෙහෙයවනවා" කියලා. අපි සැප්තැම්බර් මාසයේත් කිව්වා. ඊට පසුව තමයි මේ දූෂණයට අවශ්‍ය පරිසරය මේ ආණ්ඩුව හදා ගත්තේ. මෙම ටෙන්ඩරය දූෂිතයි කියලා මම කියන්න ඕනෑ නැහැ. එම කමිටුවේ හිටියා Lanka Coal Company එකේ සභාපතිතුමා. එතුමා ඉල්ලා අස්වීමේ ලිපිය දීලා තිබෙනවා. එම ලිපිය මා ළඟ තිබෙනවා. එම ඉල්ලා අස්වීමේ ලිපියේ මොනවාද තිබෙන්නේ? ඉංග්‍රීසි භාෂාවෙන් ලියපු ඒ ලියුමේ translation එකයි මම මේ කියන්නේ. එතුමා කියනවා, "මම කවදාවත් දේශපාලනය කරපු කෙනෙක් නෙවෙයි. පළමුවැනි වතාවට මම NPP එකත් එක්ක දේශපාලනය කළා. ඒක නිසා මට පත්වීම හම්බ වුණා" කියලා. ඒ කියන්නේ, ඒක දේශපාලන පත්වීමක්. එතුමා වැඩිදුරටත් කියනවා, "ඒ වාගේම මම Lanka Coal Company එකේ සභාපතිකම භාර ගත්තේ දූෂණයෙන් මේ රට බේරා ගන්න, Lanka Coal Company එක බේරා ගන්න. හැබැයි, මම බලාපොරොත්තු වෙච්ච දේ වුණේ නැහැ. මම Lanka Coal Company එකේ සභාපතිවරයා වශයෙන් හිටියාට Mr. Udayanga Hemapala සහ එයාගේ team එක තමයි ඔක්කෝම තීන්දු ගන්නේ. ඒක හින්දා සභාපතිවරයා වශයෙන් මම, ඒ වාගේම Board එක මේ ටෙන්ඩරය නිසා ඇති වන දූෂණයට, වගකීමට කිසිම වගකීමකින් බැඳී නැහැ" කියලා. එතුමා මේ ඉල්ලා අස්වීමේ ලිපිය දෙනවා, අගෝස්තු මාසයේ 17වන දා. ඒ කියන්නේ, 18වැනි දායි ටෙන්ඩරය; 17වැනි දා එතුමා ඉල්ලා අස් වෙනවා, "මේ ටෙන්ඩරය දූෂිතයි. මම ඉල්ලා අස් වෙනවා" කියලා. ඊට පස්සේ ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? එතුමා ඒ සභාපතිවරයා පෞද්ගලිකව ගෙන්වා කියනවා, "මේක කරන්න එපා. මේ ටෙන්ඩරය අත්සන් කරන්න. ටෙන්ඩරය අත්සන් කරලා ඔබතුමා

ඉල්ලා අස් වෙන්න" කියලා. ඊට පස්සේ දෙවැනි ඉල්ලා අස් වීම එන්නේ අගෝස්තු 25වන දා. 25වන දා අර කියපු දූෂණ කථා ඔක්කෝම අයින් කරලා, "මම ලෙඩ වෙලා ඉන්නේ. ඒක හින්දා අයින් වෙනවා" කියලා සඳහන් කරනවා. ජනාධිපතිතුමා කථා කරලා කිව්වාම දූෂණ කථා ඔක්කෝම අයින් වුණා; වගකීම් ගන්නේ නැති එක අයින් වුණා; ලෙඩ වුණා. මම මේ ලියුම් දෙකම **සභාගත*** කරනවා.

මෙහෙම තමයි ඒ ටෙන්ඩරයේ දූෂණය පටන් ගත්තේ.

ගරු ඇමතිතුමනි, උදේ පාන්දර අසත්‍ය කියන්න එපා. ඔබතුමා මට උත්තරයක් දෙන්න. ඔබතුමා කිව්වා, ගිය ආණ්ඩුවෙන් ආපු ගල් අඟුරු දෙසැම්බර් 07වන දා වන කල් ආපු හින්දා තමයි මේක පරක්කු වුණේ කියලා. නැව් ආපු laycan විස්තර ටික මෙන්න මා ගාව තිබෙනවා. අන්තිම නැව ඇවිල්ලා තිබෙන්නේ, නොවැම්බර් 13වන දා. ඇයි ඇමතිතුමා අසත්‍ය කියන්නේ? ඔබතුමා උත්තර දෙන්න. ඔබතුමා උදේ කිව්වා, "දෙසැම්බර් 07වැනි දා වන කල් නැව් ආවා. ඒක හින්දා තමයි ටෙන්ඩර් කල් ගියේ" කියලා. දැන් උත්තර දෙන්න කෝ. ඇයි මේ බොරු කියන්නේ? අන්තිම නැව ආවේ නොවැම්බර් 13වන දා. මම මේ ලේඛනයත් **සභාගත*** කරනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අන්තිම නැව ආවේ නොවැම්බර් 13වැනි දා. මොකක්ද දන්නවාද වුණේ? ඇමතිතුමා රුසියාවේ ගිහිල්ලා ඒ සමාගම හමු වුණා, 2025.10.15වැනි දා. ටෙන්ඩරයක් ක්‍රියාත්මක වන අතරතුර අමාත්‍යවරයෙකුට ඒ අදාළ සමාගම් හමු වෙන්න බැහැ. ඒක තමයි රටේ ප්‍රසම්පාදන නීතිය. ඔබතුමා අමාත්‍යවරයා වශයෙන් රුසියාවට ගිහිල්ලා ඒ සමාගම හම්බ වෙනවා, එහේ වෙලාවෙන් දවල් 1.00ට. ඒ සමාගම හමු වෙලා ඇවිල්ලා නැව් 5ක් වැඩි කරලාත් දෙනවා. පසුගිය ආණ්ඩුව දූෂිතයි කිව්වා. එහෙම කියපු ඔබතුමන්ලා නැව් 10ක්ව තිබුණු එක 11ක් කළා. නැව්11, නැව් 16 කළා. ඔබතුමායි එහෙම කළේ. වෙන කවුරුවත් නොවෙයි. ඔබතුමා තමයි ඒක register කළේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

රුසියාවේ ගිහිල්ලා ඒ සමාගම හම්බ වෙලා ඩීල් දාගන්න බැරි වුණාම ආපහු ඇවිල්ලා ඒ නැව් 5 cancel කළා; දීපු award එක cancel කළා. මාස එකහමාරක් නැව් නැහැ. නොවැම්බර් 07වන දා ඉඳන් දෙසැම්බර් 30වන කල් එක ගල් අඟුරු නැවක්වත් ලංකාවට ආවේ නැහැ. නැව් 6ක් නැති වෙලා තිබෙනවා. ඒකේ පාඩුව විතරක් බිලියන 25ක්; කෝටි 2,500ක්. මෙහෙම තමයි දූෂණ, වංචා කරන්නේ. මේ ටෙන්ඩරය දාන්න තිබුණේ අප්‍රේල් මාසයේ. අප්‍රේල් මාසයේ දාන්න තිබුණු ටෙන්ඩරය ඇයි සැප්තැම්බර් මාසය දක්වා කල් දැම්මේ? මොකක්ද හේතුව? ඊට පස්සේ ඒක emergency tender එකක් වුණේ කොහොමද? ඒ ටෙන්ඩරයේ දානවා, "මේක හදිස්සියි" කියලා. ඒක හදිසි වුණේ කොහොමද? ඒ ටෙන්ඩරය කල් යාම නිසා නිලධාරින්ට හිරේ යන්න වෙයි කියන හින්දා නිලධාරින් අපට කියා එවා තිබෙනවා, "අපි ටෙන්ඩරය දාන්න නම්,

ඇමතිතුමා කැබිනට් අනුකමිටුව දාන්න ඕනෑ කියලා; ඇමතිවරයා ඒක අගෝස්තු වනකල් කල් දාපු හින්දා තමයි ටෙන්ඩර් එක දාන්න බැරි වුණේ" කියලා. ඔන්න වැඩේ! කොහොමද වැඩේ? සභාපතිවරයා කියනවා අමාත්‍යාංශයේ ලේකම් සහ අමාත්‍යවරුන් තමයි මේකට වග කියන්න ඕනෑ කියලා.

ඊට පස්සේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් කියනවා, මෙච්චර පාඩුවක් වෙලා තිබෙනවා කියලා. හැබැයි, අද මෙතැන ඉන්න අය ගිය ආණ්ඩුවට චෝදනා කරනවා. ගිය ආණ්ඩුව Cabinet Paper එකෙන් අනුමැතිය දුන්නා කියලා කිව්වා. ගරු ඇමතිතුමා, Cabinet Papersවලින් තමයි කොහොමත් ටෙන්ඩර් පිරිනමන්නේ. ඔක්කෝම ටෙන්ඩර් පිරිනමන්නේ Cabinet Paper එකෙන්. 2023 -2024 එකේත්; 2024 - 2025 එකේත් මොකක්ද වුණේ? සාමාන්‍යයෙන් රුසියාවේ සමාගම් ලංකාවට, ඉන්දියාවට වාගේම චීනයට තමයි ගල් අඟුරු සහ ඉන්ධන supply කරන්නේ. ඒවා supply කරගෙන එන කොට geopolitics එක්ක මේ සමාගම්වලට සම්බාධක ඇති වෙනවා. සම්බාධක ඇති වුණාම අලුතින් registration process එකට ඇතුළු වෙන්න ඔවුන්ට අමාරුයි. ඊට පස්සේ අපි 2024-2025 ටෙන්ඩරය call කරනවා. ටෙන්ඩරය call කළාම ඒ ටෙන්ඩරයටම proposal එකක් එනවා, කෝටි 1,000ක් අඩුවෙන්. ඒක සිංගප්පූරුවේ සමාගමක් නොවෙයි. "Swiss Singapore" කියන්නේ ඒකේ නම. South Africaවලින් තමයි ගල් අඟුරු ගෙනෙන්නේ. ඒ ගොල්ලන්ගේ මිල ගණන් lowest, ඒක හරි; ටෙන්ඩරය lowest, ඒගොල්ලන්ගේ. හැබැයි, ඒ ටෙන්ඩරයටම තව සමාගමක් proposal එකක් දෙනවා, "සම්බාධක නිසා අපි කෝටි 1,000ක් අඩුවෙන් දෙන්නම්, quality product එකක්" කියලා. අන්තිමට මොකද වුණේ? ඒකට නීතිපතිවරයාගෙන් උපදෙස් ගන්නවා. නීතිපතිවරයාගේ උපදෙස් අනුව කෝටි 1,000ක් අඩුවෙන් තමයි කලින් ටෙන්ඩරය ක්‍රියාත්මක වුණේ.

හැබැයි, දැන් මේ ටෙන්ඩරයට මොකද වුණේ? පාඩුව විතරක් බිලියන 100යි. ඇමතිතුමාට ඕනෑ තරම් අවස්ථාව තිබුණා මේ ටෙන්ඩරය cancel කරන්න. මම දැක්කා, ආණ්ඩුවේ පසුපෙළ මන්ත්‍රීවරයෙක් කියනවා, මේක cancel කරන්න බැහැ කියලා. කියවන්න, මේ ටෙන්ඩර් ලේඛනය; කියවන්න මේ Agreement එක. මේ Agreement එකේ පළමුවෙන්ම තිබෙන කොන්දේසිය තමයි නැව් දෙකක් වෙලාවට ආවේ නැත්නම් එය cancel කරන්න පුළුවන් කියන එක. මේ Agreement එක අනුව දෙසැම්බර් මාසයේ නැව් 3ක් එන්න ඕනෑ. නමුත්, එන්නේ එක නැවයි. මේ Agreement එක අනුව ජනවාරි මාසයේ නැව් 6ක් එන්න ඕනෑ. නමුත්, එන්නේ නැව් 4යි. මේ Agreement එකේ තිබෙන විධියට පෙබරවාරි මාසයේ -මේ මාසයේ- නැව් 6ක් එන්න ඕනෑ. නමුත්, මේ තිබෙන විධියට එන්නේ නැව් 4යි. මේකම ඇති එය cancel කරන්න. ඇමතිතුමනි, ඔබතුමාට වුවමනාවක් තිබුණා නම් ඒකට ඕනෑ තරම් ප්‍රතිපාදන තිබෙනවා. ඊළඟට, පළමු නැව සම්බන්ධයෙන් ඔබතුමාට report එක එවනවා. ඒක ෆේල්. ඒක නිකුත් කළේ ඉන්දියාවේ lab එකද, එහෙම නැත්නම් වියට්නාමයේ lab එකද, ඉන්දුනීසියාවේ lab එකද කියන එක නොවෙයි වැදගත්. මේකේ ප්‍රතිඵලය, මේ ගල් අඟුරු දහනය කළාම කොච්චර විදුලිය උත්පාදනය වෙනවාද කියන එකයි. ඇමතිතුමාත්, මමත් දෙන්නාම දන්නවා, මේ report එක ගැන. එක report එකක් එනවා නොරොච්චෝලෙන්; අනෙක් report එක එනවා National System Control Centre එකෙන්. National System Control Centre එකේ අන්තිම reports දෙකටම අනුව ඒ ගල් අඟුරු සියල්ල ෆේල්. ඊට අදාළ ලේඛන මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩී. වී. චානක මහතා]

ඒ ගල් අඟුරුවලින් මෙගාවොට් 900 හැදෙන්නේ නැහැ; මෙගාවොට් 810 හැදෙන්නේ නැහැ. මෙගාවොට් 600යි හැදෙන්නේ සමහර ඒවායේ. සමහර ඒවායේ මෙගාවොට් 650යි; සමහර ඒවායේ මෙගාවොට් 750යි. ඒක ඩීසල්වලින් හෝ furnace oilවලින් හෝ හදන්න ගියොත් වැය වෙනවා, බිලියන 21ක් හෙවත් කෝටි 2,100ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට අමතරව, එය හදන්න මාසයක් විතර යනවා. මාසයක් වහලා තිබුණොත්, ඒ ප්‍රමාණය ඩීසල්වලින් හදන්න ගියොත් බිලියන 23ක් - කෝටි 2,300ක් - වැය වෙනවා. ඊට අමතරව, මාස එකහමාරකට ගල් අඟුරු නැති වෙනවා. මොකද, මේ වනකොට එන්න ඕනෑ නැව් 15ක්. ඒ නැව් 15න් ඇවිල්ලා තිබෙන්නේ නැව් 8යි. නැව් 5ක් පරක්කුයි. ඒ නැව් පහේ ගල් අඟුරුවලින් හදන විදුලිය ඩීසල්වලින් හදන්න ගියාම වැය වෙනවා බිලියන 31ක්. මේ වෙද්දී විතරක් බිලියන 75ක් - කෝටි 7,500ක් - මේ ටෙන්ඩරයෙන් පාඩු වෙලා තිබෙනවා. ආණ්ඩුවේ ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට කියනවා වගේ කිව්වොත්, හැම ගොවි මහත්මයෙකුටම, හැම වී කිලෝවකටම රුපියල් 40 ගණනේ දෙන්න පුළුවන් මුදල් ප්‍රමාණයක් මේ වෙද්දි පාඩු වෙලා තිබෙනවා. මුළු ලංකාවේම ඉස්කෝලවලට සුහුරු පන්ති කාමර 4 ගණනේ හදලා දෙන්න පුළුවන් මුදලක් මේ වෙද්දී පාඩු වෙලා තිබෙනවා. එහෙම නැත්නම්, ලංකාවේ කිලෝමීටර 7,500ක් කාපට් කරන්න පුළුවන් මුදලක් මේ වෙද්දී පාඩු වෙලා තිබෙනවා. මේ පාඩුව ගැන අපි නොවෙයි කියන්නේ, මේවා කියන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා දීපු වාර්තා. මේවා අපි නොවෙයි කියන්නේ, මේවා කියන්නේ ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන්ම ලබා දීපු වාර්තායි. හැබැයි, මේ ටෙන්ඩරය ඇතුළේ, කොන්දේසි 3ක් violate කර තිබෙන මේ සමාගමට මේ ආණ්ඩුව තවදුරටත් කඩේ යනවා. ඇමතිතුමා කියනවා, "මම නම් කූල් එකේ ඉන්නේ. මට ප්‍රශ්නයක් නැහැ. මම නම් කූල් එකේ ඉන්නේ" කියලා. ඇමතිතුමා, ඔබතුමා කූල් එකේ ඉන්න බව අපි දන්නවා. ඔබතුමා රට රටවලට යනවා, ඔබතුමා කූල් එකේ ඉන්නවා. හැබැයි, රටේ ජනතාවට සියයට 10කින් විදුලි බිල වැඩි කරන්න යනවා. ඒක සමානයි බිලියන 100. මේ වංචාවෙන් වූ පාඩුවත් බිලියන 100යි. ඇමතිතුමා, විදුලි බිල සියයට 10කින් වැඩි කළාම ලැබෙන්නේ ගල් අඟුරු වංචාවේ කොමිස් මුදල, හොරකමට අදාළ මුදල. ඒ මුදල සොයා ගන්න තමයි විදුලි බිල වැඩි කරන්න යන්නේ. අපි සාක්ෂි සහිතව පාර්ලිමේන්තුවට, ඉන් පිටතට, Commission to Investigate Allegations of Bribery or Corruption වෙත කියන සියල්ලටම තොරතුරු ලබා දී තිබෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ඉඳන්ම විපක්ෂයේ මෙතුමන්ලා මිථ්‍යාවක ඉඳිමින්, කිසිම පදනමක් නැති උපකල්පන මත පිහිටා යෝජනාවක් ගෙනැල්ලා, ඒ යෝජනාව පිළිබඳව මෙතුමන්ලාම දෙපැත්තට බෙදිලා බෙරිහන් දෙනවා. ජනතාව උදේ ඉඳන් මේ විවාදය අහගෙන ඉන්නවා. ජනතාවට වැටහෙනවා ඇති, විපක්ෂයේ අය පසුගිය කාලවල කරපු ඒවා ඒගොල්ලන්ම වමාරන බව. මේ දෙගොල්ලෝ අවුරුදු ගණනක් ප්‍රධාන පක්ෂවල ඉඳගෙන ආණ්ඩු කළා. අද මේ දෙගොල්ලන්ම විපක්ෂය පැත්තේ ඉඳන් ජනතාවට කරුණු කියනවා, එදා ආණ්ඩු කරද්දී තමන් විසින්ම කරපු කාර්යයන් පිළිබඳව. බොහොම සන්තෝෂයි, මේ දෙගොල්ලන් තමතමන් ගැනම එසේ කරුණු කියා ගැනීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්පූර්ණයෙන්ම පදනම් විරහිත යෝජනාවක් බව අද උදෑසන ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරපු අපේ ගරු අමාත්‍යතුමාත්, ආණ්ඩු පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීවරුත් ඉතා පැහැදිලිව පෙන්වා දුන්නා. මේ විපක්ෂයට මොකක්ද වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දැන් මේගොල්ලෝ මොකක්හරි එකක එල්ලෙන්න හදනවා. මොකද, මේ සමාජයේ ජනතාව තමන්ව ප්‍රතික්ෂේප කළේ ඇයි කියලා මේගොල්ලෝ දන්නවා. ඒ නිසා මේගොල්ලෝ මොකක්හරි එකක එල්ලිලා උත්සාහ කරනවා, මේ ජාතික ජන බලවේගය ආණ්ඩුවත් තමන්ගේ ආණ්ඩු වාගෙයි කියලා කියන්න. මේගොල්ලන්ට අපේ ගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම මේ ල්ලන්ගේම සමහර අයත් වරින් වර කිව්වා, නැවත බලය ගන්න අවශ්‍ය නම් මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් ජනතාවට ඉදිරිපත් කරන්න කියලා. නමුත්, මේ අය එවැන්නක් ඉදිරිපත් කර ගන්න බැරි නිසා ඉදිරියට යා ගන්න බැරිව, මේ ආණ්ඩුවත් තමන්ගේ ආණ්ඩු වාගෙයි කියා කල්පනා කරමින්, ඒ මත පිහිටා තර්ක ඉදිරිපත් කරමින්, ජනතාව වෙත ව්‍යාජ ප්‍රකාශ කරමින් පාර්ලිමේන්තුවේ හයියෙන් කෑ ගසමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න ඕනෑ කාරණය මේකයි. මොවුන් කරන මේ විවේචන මේ රටේ ජනතාව පිළිගන්නේ නැහැ. මේ අය මේ රට පාලනය කළේ කොහොමද, ජනතාවගේ බදු මුදල් වංචා කළේ මොන විධියටද, ඒවා සම්බන්ධයෙන් දූෂණ ක්‍රියා සිදු කළේ මොන විධියටද කියන එක පිළිබඳව මේ රටේ ජනතාවට තවම අමතක වෙලා නැහැ. ජනතාව දන්නවා, මේ අය මේ රට පාලනය කළේ කොහොමද කියලා; ජනතා බදු මුදල් භාවිත කළේ කොහොමද කියලා. ඒ පිළිබඳව අපේ රටේ ජනතාවට ඉතා හොඳ අවබෝධයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම කියන්නම් මේ උදවිය ව්‍යාජ උපකල්පන මත පදනම් වෙලා අද උදේ ඉඳන් ගල් අඟුරු ටෙන්ඩරයක් අල්ලාගෙන කෑ ගහන එකේ සත්‍ය කථාව. මේගොල්ලන් මොනවාද මේ කියන්නේ? එකක් තමයි, මේ කියන ගල් අඟුරු ටෙන්ඩරයට අදාළ පිරිවිතර අපේ ආණ්ඩුව වෙනස් කළා කියන එක. මම කනගාටු වෙනවා, විපක්ෂයේ එක උගත් මන්ත්‍රීතුමෙකු නිරීක්ෂණ සහ නිර්දේශ පටලගෙන කථා කිරීම ගැන. මොකද, කලබල වුණාම එහෙමයි. Observations and recommendations පවා පැටලෙනවා. උගත් මන්ත්‍රීවරුන් වෙලාත් ඒවා පැටලෙනවා. නිරීක්ෂණ මත පදනම් වෙලා යමක් නිර්දේශ කරන්න එපායැ. නිර්දේශ නේ ක්‍රියාත්මක කරන්නේ.

මොකක්ද මෙතුමන්ලා කියන මේ වාර්තාව? අපේ ආණ්ඩුව කාලයට අදාළ වාර්තාවක් නොවෙයි මෙතුමන්ලා මේ පදනම් කරගෙන තිබෙන්නේ. 2022 සැප්තැම්බර් 30වන දින වාර්තාවක් පදනම් කරගෙන කියනවා, අප මේ පිරිවිතර වෙනස් කළා කියලා. අපි පිරිවිතර වෙනස් කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. මේ පිරිවිතර 2023 වර්ෂයේදී තමයි වෙනස් කළේ. 2022 වාර්තාව පදනම් කරගෙන එහි නිර්දේශ සලකා බලා, 2023දී වෙනස් කරපු පිරිවිතර

මත තමයි මේ ටෙන්ඩරය දීලා තිබෙන්නේ. එහෙම නැතිව 2024 සැප්තැම්බර් මාසයේ ජනාධිපතිවරණයෙන් හෝ 2024 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් හෝ පසුව බලය පිහිටවපු ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පාලන කාලය තුළ මේ කිසිම පිරිවිතරයක් වෙනස් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නම් ඇත්ත. 2023 බලයේ හිටියේ කවුද කියලා අපි කවුරුත් දන්නවා. හැබැයි, එදා බලයේ හිටපු අය ඒ පිරිවිතර වෙනස් කරපු එකේ යම් යම් සාධනීය ප්‍රතිඵලත් තිබෙනවා. කලින් සමාගම් 10යි තිබුණේ. දැන් සමාගම් 26ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. එහි සාධනීය ප්‍රතිඵලයක් විධියට තමයි එය සිදු වුණේ. ඒ නිසා තරගකාරිත්වය වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍ය දැනුම තිබෙන ඕනෑම කෙනෙක් දන්නවා, තරගකාරී සමාගම් ප්‍රමාණය වැඩි වනකොට, තරගකාරිත්වය වැඩි වනකොට ඒකේ ප්‍රතිලාභ පෙරළා ජනතාවට ලබා ගන්න පුළුවන් කියලා. ඇත්ත එය වුණත් අපි පිරිවිතර වෙනස් කළා කියලා පට්ටපල් බොරුවක් සමාජගත කරන්න විපක්ෂය උත්සාහ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම කිව්වා, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය තමයි තීරණය කරන්නේ කියලා. එතුමන්ලාගේ ආණ්ඩු කාලවලදී කැබිනට් මණ්ඩලය ඒවා තීරණය කරපු හැටි අපි දන්නවා. අද ජනතාවත් අපෙන් අහනවා, තුනෙන් දෙකක බලයක් තියාගෙනත් ඒ බලය පාවිච්චි කරන්නේ නැද්ද කියලා. අපේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක්. අපේ කැබිනට් මණ්ඩලයට බලය තිබුණු පලියට ප්‍රසම්පාදන ක්‍රියාවලියට අපි අත ගහන්නේ නැහැ. ප්‍රසම්පාදන කොමිසමක් තිබෙනවා. ඒ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තමයි ටෙන්ඩර් පටිපාටිය සිදු වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට කලින් ටෙන්ඩර් ක්‍රියාවලිය ආදි කිසි දෙයක් අනුගමනය කරන්නේ නැතුව දින 10කින් ගල් අඟුරු ප්‍රසම්පාදනය කර ගත්තු ක්‍රියාවලියක් තිබුණු බව අපි දන්නවා. එහෙම නොවෙයි කළ යුත්තේ. මේ ටෙන්ඩරයට දින 28ක කාලයක් ලබා දී තිබෙනවා. සම්පූර්ණයෙන්ම මූල්‍ය විනය උල්ලංඝනය කරලා, මූල්‍ය ක්‍රියා පටිපාටි උල්ලංඝනය කරලා කිසිම ටෙන්ඩරයක් නැතුව දින 10කින් ගල් අඟුරු ගෙනාපු යුගයක් තිබුණා, 2023ට කලින්. ඒවා සම්පූර්ණයෙන්ම පරාද කරලා, මෙවර මුලින් දින 21ක්, පසුව අමතර දින 7ක් වශයෙන් දින 28ක් මේ ටෙන්ඩරයට දීලා තිබෙනවා. එහෙම නම්, අපි ටෙන්ඩර් ක්‍රියාවලියේ පටිපාටි නිවැරැදිව අනුගමනය කරලා තමයි මේ ප්‍රසම්පාදන සිදු කරලා තිබෙන්නේ.

විපක්ෂය කියන්න උත්සාහ කරනවා, ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව අපි කවුරුත් දන්නවා. ගල් අඟුරු කියන්නේ ස්වාභාවික සම්පතක්. ඒ නිසා සපයන ගල් අඟුරුවල ප්‍රමිතිය තීරණය කරන පිළිගත්, සම්මත පිළිවෙතක් තිබෙනවා. ඒක අපට ඕනෑ ඕනෑ විධියට තීරණය කරන්න බැහැ. ඒක තීරණය කරන ජාත්‍යන්තර මට්ටමින් පිළිගත්තු, දේශීය විශේෂඥයන් අනුමත කරපු කිසියම් පිළිවෙතක් තිබෙනවා. අන්න ඒ අනුව තමයි ගල් අඟුරුවල ප්‍රමිතිය තීරණය කරන්නේ. සාමාන්‍යයෙන් දළ කිලෝ කැලරි ප්‍රමාණය අනුව තමයි මූලික වශයෙන් ගල් අඟුරුවල ප්‍රමිතිය තීරණය කරන්නේ. අපි දන්නවා, සාමාන්‍යයෙන් ගල් අඟුරුවල දළ CALORIFIC අගය ගත්තොත්, එය කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5,900-6150 අතර තිබෙන්න ඕනෑ කියන එක මූලිකව පිළිගත්තු සම්මතය බව. මේ ටෙන්ඩර් ක්‍රියාවලියත් ඒ අනුව තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ.

අපි මෙතැන දිගින් දිගටම කථා කළා, පරාසයේ යම් අපගමනයක් සිද්ධ වුණොත්, දඩ මුදල් අය කර ගැනීම ගැන. මේක මේ අද ඊයේ ඇති වෙච්ච ක්‍රියාවලියක් නොවෙයි. මම කියන්න කැමැතියි, 2020-2021 කාලයේ මේ වාගේම ප්‍රමිතියේ අපගමනය නිසා ඩොලර් මිලියන 4.54ක් දඩ මුදල් ලෙස අය කළ බව. ඒ වාගේම 2021-2022 දී ඩොලර් මිලියන 6.1ක දඩ මුදල් නියම කළා. 2022-2023 දී ඩොලර් මිලියන 7.8ක දඩ මුදල් නියම කළා. එහෙම ප්‍රමිතියට තිබුණා නම්, එහෙම ප්‍රමිතිය පිළිබඳ පරාසයක් නැත්නම් මේ ටෙන්ඩර් පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්, ක්‍රමවේදයක් නැත්නම් මෙවැනි දඩ මුදල් අය කර ගැනීමට ගියේ ඇයි? අන්න ඒ විධියට තමයි මෙවරත් ඩොලර් මිලියන 2.1කට ආසන්න මුදලක් දඩ විධියට නියම කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වාභාවික සම්පතක් වන ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී තිබිය යුතු ප්‍රමිතිය පිළිබඳව යම් පරාසයක් තිබෙන බවට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මතයන් තිබෙනවා. ඒ අනුව තමයි ඒවා තීරණය කරලා තිබෙන්නේ. එම තීරණයන්ට අනුව සුළු වශයෙන් වෙන ඒ අපගමනයන් වළක්වා ගැනීම සඳහා, එයින් යම් පාඩුවක් වෙනවා නම් ඒක පියවා ගැනීම සඳහා තමයි මේ දඩ මුදල් අය කරන්නේ. ඉතින් ඒක මේ අද ඊයේ ඇති වෙච්ච එකක් නොවෙයි. ඉතිහාසය පුරාම සිදු වන දෙයක්. මෙවරත් ඒ විධියට සිදු වෙලා තිබෙනවා. ඒ දඩ මුදල් අය කර ගැනීම තුළින් ජනතාවට වෙන, රටට වෙන පාඩුව පියවා ගැනීම සඳහා තමයි එම කටයුතු කරන්නේ.

ඊළඟට, මේගොල්ලන් තවත් කථාවක් මවලා, මෙන්න මේක මතම ඉඳගෙන ලොකුවට කෑ ගහනවා. මේ ටෙන්ඩර් ක්‍රියාවලියේ සිදුවන පාඩුව විදුලි බිලට එකතු කරනවා ලු. දැන් මේ එළියෙත් පොඩි කණ්ඩායමක් ගෙනැල්ලා, ජනතාව පොඩ්ඩක් අවුස්සන්න බලනවා. මොකද, වෙන මොකුත් නැහැ. පසුගිය කාලයේ කිව්වා, ආර්ථිකය කඩාගෙන වැටෙනවා; සංස්කෘතිය කඩාගෙන වැටෙනවා, ජාත්‍යන්තර පිළිගැනීම් නැහැ කියලා. මේ ඔක්කෝම ඉවර වුණා. මේ ඔක්කෝමත් ඉවර වෙලා ආර්ථිකය දැන් හොඳට යනවා. සංස්කෘතික වශයෙන් ප්‍රශ්නයකුත් නැහැ. ඒ වාගේම ජනතාවගේ ආර්ථිකය ස්ථාවර වෙලා ඒවායේ ප්‍රතිඵල ජනතාව භුක්ති විඳිනකොට මේගොල්ලන්ට මොකුත් කර ගන්න දෙයක් නැහැ. වෙනත් මොකක් හරි අර්බුදයක් හදන්න හදනවා. අප්‍රේල් මාසයේ අර්බුදයක් එනවා ලු. ඉතින් මේගොල්ලන් දැන් බලාගෙන ඉන්නවා, වැටෙනකම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගල් අඟුරු බලාගාරයට 2011 වසරේ ඉඳලාම මේ විධියට ගෙන්වපු ගල් අඟුරුවල ප්‍රමිතිය ගැන මම කලින් කිව්වා. එහෙම නම්, ඒ දඩ මුදල් අය කිරීමත් එක්ක ඒකෙන් ගම්‍ය වෙනවා, ඒවායේ ප්‍රමිතිය පිළිබඳව. එහෙම නම් අනිවාර්යයෙන්ම ඒ කාලයේ විදුලි බිලට ඒගොල්ලන් එකතු කරපු ඒ ක්‍රියාවලිය ගැන තමයි ඒගොල්ලන් මේ කියනවා ඇත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ටෙන්ඩර් ක්‍රියාවලිය තවම අවසන් වෙලාත් නැහැ. දැනටමත් එහෙම අඩු ප්‍රමිතියෙන් තිබුණු ගල් අඟුරු නැව්වලට නියමිත දඩ මුදල් අය කරලා තිබෙනවා. ඉතිහාසයෙත් එහෙම කරලා තිබෙනවා. මේ වේලාවේත් කරලා තිබෙනවා. එහෙම නම් ඒ මුදල් පෙරළා රටට ලැබීම හරහා, ලංකා විදුලිබල මණ්ඩලයට ලැබීම හරහා "පාඩුව" කියලා ඒගොල්ලන් විසින්ම හදන මිථ්‍යාව ජනතාව මත පැටවෙන්නේ කොහොමද? එහෙම දෙයක් කිසිම විටක කිසිසේත්ම වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවෙන් පසුව ඔබතුමාට ප්‍රශ්නය අහන්න පුළුවන්. මම ඊට පස්සේ උත්තර දෙන්නම්.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒත් එක්කම තිබෙන තව ලොකුම ප්‍රශ්නයක් ගැන මම කියන්නම්. මේ සැපයුම්කරු පිළිබඳව විවේචනයක් ගේනවා. අපිට තේරුම් ගන්න පුළුවන්, මේ සැපයුම්කරුවා පිළිබඳව මේ විවේචනය ගේන්නේ මොකද කියලා. මොකද, මේගොල්ලන්ට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, -ඒ කියන්නේ සමහර අයට. මම මේ ඔක්කෝටම කියලා කියන්නේ නැහැ.- මේගොල්ලන් කාලාන්තරයක් තිස්සේ එක සැපයුම්කරුවෙකුට මේ ගල් අඟුරු ටෙන්ඩර් දිගින් දිගටම ලබා දුන් නිසා. කාලයක් තිස්සේ මේගොල්ලන් ඒ සමාගම තෝරා ගත්තත්, මෙවර එම සමාගමට ඒ ටෙන්ඩරය ලැබිලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2022දී ලියාපදිංචි නොවූ සමාගමකට කැබිනට් එකේ බලය භාවිත කරලා, කැබිනට් අනුමැතියෙන් ටෙන්ඩර් ප්‍රදානය කරලා තිබෙනවා. අපි එහෙම කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ සමස්ත ටෙන්ඩර් ක්‍රියාවලියම ගත්තාම, ප්‍රසම්පාදන කොමිසමේ ක්‍රියාපටිපාටි අනුගමනය කරලා තමයි මේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනික් කාරණය මේකයි. මේගොල්ලන් පදනම් විරහිත උපකල්පන ඉදිරිපත් කරනවා. මොකක්ද දැන් වෙලා තිබෙන්නේ? අපි දන්නවා, මේ සීමාසහිත ගල් අඟුරු පුද්ගලික සමාගම පිහිටුවන්නේ, -

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මේ සීමාසහිත ගල් අඟුරු පුද්ගලික සමාගම පිහිටුවන්නේ, 2008 ජනවාරි 23වැනි දා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ සඳහා පදනම් වෙන්නේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ගත් අමාත්‍ය මණ්ඩල තීරණයක්. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව් කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
86 (අ) ස්ථාවර නියෝගය යටතේ මම මතු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 86 (අ) කියවා ගන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියවා ගන්න පුළුවන්. ඔබතුමා කියන්නකෝ, මොකක්ද කියලා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
වරදවා තේරුම් ගෙන තිබෙන මගේ කථාවේ යම් කොටසක් නිවැරදි කිරීමට ස්ථාවර නියෝග 86 (අ) යටතේ අවස්ථාව තිබෙනවා. මෙතුමා කිව්වා, දඩ අය කරගන්නවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් දඩ අය කරගන්නේ, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ කරුණට අදාළව ඔබතුමාගේ නම කියලා නිශ්චිතව සඳහන් කළේ නැහැ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඒක තමයි. නිශ්චිතව, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක අදාළ වෙන්නේ නැහැ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ඒක නිශ්චිතව සඳහන් කළා. ඒ කියන්නේ, මම කථාවක් කළා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මෙතුමා කියන විධියට සාමාන්‍යයෙන් දඩ අය කරගන්නේ, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා එකම පැත්තේ ඉඳගෙන දෙපැත්තට බෙදිලා කරන විවාදය මට අදාළ නැහැ. මම කියමින් සිටියේ මේකයි. සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම පිහිටුවන්නේ 2008 ජනවාරි 23වැනි දා. ඒ සඳහා පදනම් වෙන්නේ 2007 අංක 7 දරන සමාගම් පනත. අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් තමයි මේ සමාගම පිහිටුවන්නේ. මේ සමාගම පිළිබඳව ජනතාව දැන ගන්න ඕනෑ. මේ සමාගමේ කොටස්වලින් සියයට 60ක් ලංකා විදුලිබල මණ්ඩලයට අයිතියි. සියයට 20ක් භාණ්ඩාගාරයට අයිතියි. ඒ වාගේම සියයට 10ක් වරාය අධිකාරියටත්, සියයට 10ක් සීමාසහිත ලංකා නැව් සංස්ථාවටත් අයිතියි.

දැන් මෙතැන මතක් කළා, 2009 වසරේ සිට 2016 වසරේ ජූනි දක්වා ලක් විජය විදුලි බලාගාරයේ සිදු කළ ගල් අඟුරු ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් 2020 වසරේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කළා කියලා. 2010 - 2015 දක්වා කාලය තුළ Noble Resources Limited කියන සමාගම ගල් අඟුරු මෙට්‍රික් ටොන් 4,583,670ක් සපයා තිබුණා. මෙන්න මේ සම්බන්ධයෙන් තමයි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරලා, ඒ පිළිබඳව නිරීක්ෂණ කරලා, ඒ මත නිර්දේශ ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී අනාවරණය වුණේ මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මම අවසන් කරන්නම්.

එතැනදී අනාවරණය වුණේ ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා කිසිදු වලංගු ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකළ බවයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව අනුව මම ඒක වගකීමෙන් කියනවා. මේ රටේ ජනතාවට එහෙම පාඩු කරපු, කිසිම ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්නේ නැතිව හිතුමතේ කටයුතු කරපු ඒ අය තමයි අද මේවා කියන්නේ. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නිවැරදි, නිත්‍ය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලා, සමාගම් 10කට වැඩි ප්‍රමාණයකින් තරගකාරී මිල ගණන් යටතේ තමයි අපි මේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරලා තිබෙන්නේ. ඒ වාගේම නිසි කලට ගල් අඟුරු සැපයීමට අපොහොසත් වීම නිසා 2011 සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා දින 24ක් මේ විදුලි බලාගාරය වසා දමා තිබුණා. ඒ වෙනකොට රුපියල් මිලියන 3,500ක් පාඩු සිද්ධ වුණා කියලා ගණන් බලා තිබෙනවා. 2015 අගෝස්තු සිට 2015 සැප්තැම්බර් දක්වා කාලය තුළ බලාගාරයේ ජනන යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වුණා. ඒ වාගේම 2014 - 2015 කාල පරිච්ඡේදය තුළ නිසි පරිදි ගල් අඟුරු නොසැපයීම නිසා ඒ කාලයේ රජයට වෙච්ච පාඩුව රුපියල් මිලියන 12,500ක් කියලා ගණන් බලා තිබෙනවා. එහෙම නම්, ඔය කියන විධියට ඒවා එකතු කළේ කොහේටද කියලා මම අහන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බලශක්ති ක්ෂේත්‍රය තුළ අපේ දැක්ම මීට වඩා පුළුල්. අපි බලශක්ති ස්වෛරීත්වයක් සඳහා තමයි කටයුතු කරගෙන යන්නේ. පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සියයට 70ක ජනන අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා අපි කටයුතු කරගෙන යනවා. අපි ගල් අඟුරු මත පමණක් රැඳී ඉන්නේ නැහැ. අපි සූර්ය බලයෙන්, සුළං බලයෙන්, බලශක්තිය උපයා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. අපි දන්නවා, අපේ ජල විදුලිය අවසන් වී ගෙන යනවා කියලා. බලශක්ති ස්වෛරීත්වයක් වෙනුවෙන් හැකිතාක් දුරට සුළං බලයෙන් බලශක්තිය උපයා ගැනීම සඳහා අපි මේ වෙනකොටත් කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම සූර්ය බලයෙන් බලශක්තිය උපයා ගැනීම සම්බන්ධයෙන් අපි යෝධ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අන්න, ඒ වැඩ පිළිවෙළ තුළ මේ රටේ බලශක්ති ක්ෂේත්‍රයේ කිසිම ගැටලුවක් ඇති වෙන්නේ නැතිව ජනතාවට අවශ්‍ය ප්‍රතිඵල ලබා දීම සඳහා අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමාගේ කථාවෙන් පස්සේ මට අවසර දෙනවා කිව්වා. ඔබතුමා පොරොන්දුව ඉෂ්ට කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ කාලය තුළ නොවෙයි කිව්වේ. ගරු මන්ත්‍රීතුමනි, එතැනින් පස්සේ අපට යන්න කාලයක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
තත්පර 30ක් දෙන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක කියන්න, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ඡන්ද විමසීම පිළිබඳව සලකා බැලීම සඳහා වන Parliamentary Select Committee එකට මගේ නමත් ඇතුළත් වෙලා තිබෙන නිසා ස්ථාවර නියෝග 102, 103, 104 යටතේ තමයි මම මේ ප්‍රකාශය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ඡන්ද විමසීම් ක්‍රමය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම පිළිබඳ යෝජනාව පසුගිය ජනවාරි මාසයේ 6වෙනි දා ඉදිරිපත් කළා. තව සති දෙකකින් මාස දෙකක් පිරෙනවා, එම යෝජනාව ඉදිරිපත් කරලා. මම සතුටු වනවා, අද වනකොට හෝ ආණ්ඩු පක්ෂයෙන් තමන්ගේ නම් යෝජනා කරලා විජිත හේරත් ඇමතිතුමාගේ මූලිකත්වයෙන් ඒ කමිටුව පත් කර තිබෙන එක ගැන. ඒ වාගේම මම මේ අවස්ථාවේ දී රජයට ස්තුතිවන්ත වනවා, එම විශේෂ කාරක සභාව පත් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඉල්ලීමක් තිබෙනවා, මේ විශේෂ කාරක සභාවේ පළමු රැස්වීම් දිනය ලබන පාර්ලිමේන්තු සතියේ නියම කරන්න කියලා. මොකද, මේ විශේෂ කාරක සභාවේ වාර්තාව මාස තුනක් ඇතුළත දෙනවා කිව්වා. ඒ කමිටුවට දැනට පත් කරලා තිබෙන්නේ 11දෙනායි. එහි 12වන සාමාජිකයා හැටියට විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන අපේ හිටපු අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමාව එකතු කරන්න කියලාත් මම මේ අවස්ථාවේ දී ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පර 30ක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තත්පර 30ක කාලයක් පමණයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේ දී ඔබතුමා දක්වපු ස්ථාවරයට වඩා සම්පූර්ණ වෙනස් ස්ථාවරයක් ලංකා ගල් අඟුරු සමාගමෙන් ඉල්ලා අස්වෙච්ච සභාපතිතුමා දක්වා තිබෙනවා. එතුමා කියනවා, එතුමාට මේ දූෂිත ගල් අඟුරු ක්‍රියාදාමයට සම්බන්ධ වෙන්න බැහැ, ඒ පිළිබඳව වග කියන්න ඕනෑ අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය උදයංග හේමපාල මහතා කියලා. එහෙම කියලා එතුමා අස් වෙලා තිබෙනවා. ඔබතුමා ඒකට උත්තරයක් දෙන්නේ නැද්ද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ඒක අදාළ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම හොඳයි. එච්චර බරපතළ දෙයක් අදාළ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මහතා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගල් අඟුරු වංචාවක් සම්බන්ධයෙන් විපක්ෂය විසින් වැරදි තොරතුරු මත දැවැන්ත බේගල් ප්‍රමාණයක් සමාජගත කරමින් ඉන්න වෙලාවක තමයි අපි අද කථා කරන්නේ. මේ පිළිබඳව මනා ලෙස විද්‍යාත්මකවත්, තාක්ෂණික වශයෙනුත් නිවැරැදි පැහැදිලි කිරීමක් අපේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කරමින් ඉන්නවා. මේ විපක්ෂය කොහොමත් බොරු කියන්න, මඩ ගහන්න දක්ෂයි කියලා අපි දන්නවා. ජනාධිපතිවරණ සමයේත් ජනතාවට බිල්ලෝ මැව්වා, බොරු කිව්වා, මඩ ගැහුවා. හැබැයි, අත් වුණු ඉරණම පරාජය. මහ මැතිවරණය ආවා. බිල්ලෝ මැව්වා, මඩ ගැහුවා, බොරු කිව්වා, කුමන්ත්‍රණ කළා. මොකද වුණේ? කුජීත වෙලා ගියා. අපට තුනෙන් දෙකක බලයක් හිමි වුණා. ඒක තමයි ඇත්ත. අපි ආණ්ඩුව පිහිටෙව්වාට පස්සේ පාර්ලිමේන්තුව ඇතුළේ දවස ගණනේ මේ විපක්ෂය මොකද කරන්නේ? අඩුම තරමේ සතියක්වත් අල්ලන් යන්න බැරි බොරු සමාජගත කරනවා, ප්‍රබන්ධ හදනවා, විකෘති කිරීම් කරනවා, ජනතාවට ගතු කියනවා වාගේ නොයෙක් දේ ප්‍රකාශ කරමින් ඉන්නවා. ඔබතුමන්ලා මොනවා ප්‍රකාශ කළත්, ජනතාව තුළ ජනාධිපතිතුමා සම්බන්ධයෙන්, මේ ආණ්ඩුව සම්බන්ධයෙන් තිබෙන ගෞරවය, විශ්වාසය එන්න එන්නම වැඩි වෙමින් තිබෙන බව අපි දන්නවා. ඒ පිළිබඳව මනා ලෙස මේ වන විට ඔප්පු වෙමින් තිබෙනවා.

ඔබට පුළුවන් තරම් මේ පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරගෙන බොරු කියන්න පුළුවන්, මඩ ගහන්න පුළුවන්. ඒ පිළිබඳව අපට කිසිම තර්කයක් නැහැ, ඔබට ඒවා කරන්න පුළුවන්. හැබැයි අපි එකක් කියනවා. මේ ආණ්ඩුව දූෂණයට, වංචාවට, හොරකමට, නාස්තියට එරෙහිව කටයුතු කරන බවට වූ ජන වරමක් තමයි මේ ගොඩනැඟිලා තිබෙන්නේ. ඒ අනුව අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා තමයි ලෝකයේ රටවල් අතර ජනාධිපතිතුමාට එන්න එන්නම පිළිගැනීමක් ලැබෙමින් පවතින්නේ. ඒ වාගේම ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අතර හොරකම, වංචාව හා දූෂණය නවත්වපු රාජ්‍යයන් අතර අපි ඉදිරියට යමින් තිබෙනවා.

අපි දන්නවා, නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරය අවුරුදු 30ක කාල සීමාවක් සඳහා තමයි ඉදිවෙලා තිබෙන්නේ කියලා. ලංකාවේ පවතින විදුලිබල අර්බුදයට පිළියමක් වශයෙන් විදුලිය නිෂ්පාදනයට දායක කර ගන්න තමයි අවුරුදු 30කට මේ බලාගාරය ඉදිකරලා තිබෙන්නේ. 2011දී මෙය ආරම්භ කළා. මේ වනකොට අවුරුදු 15කට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. අන්න, ඒ කාලය පුරාම මේ නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරය ඇතුළේ සිදු වෙච්ච දේවල් ටික මේ වනකොට අපි හොඳටම දන්නවා. මේ සම්බන්ධව විගණන වාර්තා තිබෙනවා, FCID එකේ වාර්තා තිබෙනවා. මට මතක විධියට, 2016දී වාගේ ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධව නඩු තීන්දුවකුත් දීලා තිබෙනවා. වේදනාවෙන් කෑ ගහන, හොඳට රිදිලා අඬන සමහර අය සමාගම් එක්ක ගනුදෙනු කරපු විධිය, ඒවාට දේශපාලන බලය පාවිච්චි කරපු විධිය, අයුතු ගනුදෙනු කරපු විධිය ඒ වාර්තා කියවද්දි මනා ලෙස පැහැදිලි වනවා. තමන් විසින් කරපු කුමන්ත්‍රණ, තමන් විසින් කරපු අපරාධ, තමන් විසින් කරපු වංචා තවදුරටත් කරන්න බැරි වනකොට, තමන්ගේ බලාපොරොත්තු සුන් වෙලා යනකොට වේදනාවක් ඇති වීම ගැන අපට කරන්න දෙයක් නැහැ. ඒක ඔබ විසින්ම දරාගන්න ඕනෑ. මෙතැන ඒ විලාපය - ලතෝනිය - දීම ගැන එක අතකින් අපි සතුටු වනවා. අපි ගල් අඟුරු ආනයනය සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග තුළ තමයි කටයුතු කරමින් සිටින්නේ. මෙහිදී අපි නිවැරදි ටෙන්ඩර් ක්‍රමවේද අනුගමනය කර තිබෙනවා, විනිවිදභාවය සහිතව කටයුතු කර තිබෙනවා. පසුගිය කාලයේ මෙම කටයුතුවලදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමු අමුවේ උල්ලංඝනය කළා. නමුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය රකිමින් තමයි අපි මේ කටයුතු කරමින් සිටින්නේ. ඒ විධියට විධිමත් ක්‍රමවේද යටතේයි මේ කටයුතු සිද්ධ වෙමින් තිබෙන්නේ. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අනුමැතියට අනුවයි ඉදිරි කටයුතු සියල්ල සිද්ධ වෙලා තිබෙන්නේ. විපක්ෂයට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. නමුත් ආණ්ඩුවක් විධියට අපි කටයුතු කරමින් සිටින්නේ, විනිවිදභාවයක් සහිතවයි. අපේ රටේ සියලු කටයුතු සූදානම් වෙන්නේ දූෂණයෙන් තොර ක්‍රියාමාර්ග තුළයි. සියලු අමාත්‍යාංශ කටයුතු කරමින් සිටින්නේත් ඊට අනුරූපීවයි. ඒ නිසා බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරින්ට, ඇමතිතුමාට හෝ කිසිම කෙනෙකුට පෞද්ගලිකව හෝ චේතනාන්විතව හෝ කිසිදු අරමුණක් නැහැ, දූෂණයට, වංචාවට, හොරකමට සම්බන්ධ වන්න.

පාර්ලිමේන්තු වරප්‍රසාද තුළ අද ඔබ කරපු ප්‍රකාශ එළියේ කරන්න පුළුවන් වුණොත්, ඔබට අත්වන ඉරණම පිළිබඳව දැනගන්න පුළුවන්. මෙතැනදී සමහර අය ගිණුම් අංක ගැන කිව්වා, ගිණුම් තිබෙනවා කිව්වා. එහෙම නම්, මේ වනකොට ඒවා සභාගත කරන්න ඕනෑ; ගිණුම් අංක කියන්න ඕනෑ; ඔවුන්ගේ නම් කියන්න ඕනෑ. නමුත් ඒවා කියාගන්න බැහැ. මෙතැන වගකීම්

විරහිත ප්‍රකාශ ඉදිරිපත් කරලා, එළියට ගිහිල්ලා මාධ්‍යයට voice-cuts දෙනවා. ඒ දේවල්වලින් සමාජය කලබල කරන්න, සමාජය උසිගන්වන්න පුළුවන්කමක් නැහැ. මේ විපක්ෂය එන්න එන්න වඳ වී ගෙන යන විපක්ෂයක් බවට පත් වනවා. මේ වාගේ බෙගල්, අවලාද හරහා සමාජගත කරන මත ඇතුළේ විපක්ෂයට එල්ලෙන්න වැලේ වැල් නැති වන එක විතරයි තවදුරටත් සිදුවෙමින් තිබෙන්නේ. අපි දන්නවා, Black Sand Commodities එකත් එක්ක එදා හිටපු අය කටයුතු කළේ කොහොමද කියලා. ජාත්‍යන්තර රටවල නම් කියන්න හොඳ නැති නිසා මම ඒ සමහර සමාගම් ගැන කියන්න යන්නේ නැහැ. මොකද, ඒ රටවල් එක්ක අපි තවදුරටත් විනිවිදභාවයෙන් කටයුතු කරන්න ඕනෑ. කුමන්ත්‍රණකාරී පිරිස් එකතු වෙලා ගහපු ගේම්වලට ඒ රටවල නම් කියන එක ගැළපෙන්නේ නැහැ.

2030 වර්ෂය වනකොට පුනර්ජනනීය බලශක්තිය පැත්තට තමයි මේ ආණ්ඩුව යමින් තිබෙන්නේ. මේ වනකොට ඩීසල් බලාගාර අපට දරාගන්න බැරි ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ලෝකයේ හිඟ වෙමින් යන දෙයක් බවට ගල් අඟුරු පත් වෙලා තිබෙනවා. ඒවාට අදාළව මේ කියපු තාක්ෂණික කාරණා තුළ සිදු විය හැකි දේවල් ගොඩක් තිබෙනවා. ඒ වාගේම පරිසර දූෂණය තුළත් සිදු විය හැකි දේවල් ගොඩක් තිබෙනවා. ඒවා පාලනය කරගෙන අපි රටක් විධියට පුනර්ජනනීය බලශක්තිය පැත්තට යන්න ඕනෑ. ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය සියලු සැලසුම් අපි සූදානම් කරමින් තිබෙනවා. දැනටත් අපේ ජල විදුලිය සියයට 35ක මට්ටමකයි තිබෙන්නේ. ඒ වාගේම සූර්ය බලයෙන් සහ සුළං බලයෙන් සියයට 15ත්, 20ත් අතර අපි කටයුතු කරමින් තිබෙනවා. මේ ක්‍රියාවලිය තමයි දැන් සාමාන්‍ය මට්ටමේ තිබෙන්නේ. මෙක සියයට 70 ඉක්ම වූ මට්ටමකට යන්න පුළුවන් තත්ත්වයක් උදා කර ගැනීමට තමයි මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටින්නේ. ඒ සඳහා දුර දැක්මක් සහිත දිගු වැඩ පිළිවෙළක් ඇතුළේයි ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ. ඒ නිසා ඔබ නඟන චෝදනාවලට අපි භාවිතාවෙන් උත්තර දෙන්න සූදානම්. දූෂණ විරෝධී ශ්‍රී ලංකාවක් හදන්න, මහජනතාවත් එක්ක කටයුතු කරන්න මේ ආණ්ඩුව අනිවාර්යයෙන්ම සූදානම් වනවා. න්‍යායට වඩා භාවිතාවෙන්, ක්‍රියාමාර්ගවලින් ඒ දේවල් ඔප්පු කරන්න තමයි අපි සූදානම් වන්නේ. ඔබට පුළුවන්, ඔබ ඉතිහාසයේ කරපු වැරැදි, අඩුපාඩු පිළිබඳව පසුතැවීමක් සහිතව කටයුතු කරන්න. ඒ මත සිටිමින් වැරැදි උපකල්පන අපේ ඇඟේ තවරන්න, එහෙම නැත්නම් අපට ඒවා පටවන්න හිතාගෙන ඔබ කටයුතු කරනවා වෙන්න පුළුවන්. නමුත්, ඒවා මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වන්නේ නැහැ. මේ ආණ්ඩුවේ තිබෙන ගුණාත්මකභාවය දවස ගාණේ වැඩි කරගනිමින් අපි ජනතාවත් එක්ක ඉදිරියට යන්න සූදානම්.

මේ වනකොට මේ ආණ්ඩුව විසින් පාඩු ලබන රාජ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පත් කරමින් තිබෙනවා. පසුගිය කාලයේ වසා දමන්න හදපු, ජාත්‍යන්තර සමාගම්වලට විකුණන්න හදපු මිල්කෝ ආයතනය ලාභාංශ බෙදන තැනට දැන් පත් වෙලා තිබෙනවා. ඒ අනුව අපි රට නිවැරදි මාවතකට ගනිමින් තිබෙනවා. මේ වන විට රටේ උද්ධමනය යම් මට්ටමකට අඩුවෙමින් තිබෙනවා. හැබැයි, හොරකමට සම්බන්ධ වෙච්ච අය දැන් කලබල වෙලා ඉන්නවා; දූෂණයට සම්බන්ධ වෙච්ච අය දැන් කලබල වෙලා ඉන්නවා.

විපක්ෂයට තවදුරටත් ඉදිරියේදී කියන්න දෙයක් නැහැ. පසුගිය කාල සීමාවේදී අපි දැක්කා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල එල්ලිලා ඉන්නවා. ඒ ගැන හඬක් නැඟුවා, පාර්ලිමේන්තුවේ. ඒක දැන් ලත් තැනම ලොප් වෙලා කථාවක් නැතුව ඉන්නවා. දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ඉන්නවා. තමන් කියපු මතය වෙනුවෙන් සතියක්, දෙකක්වත් අල්ලාගෙන යන්න බැරි තරමට බංකොලොත් වෙලා, බෙලහීන තත්ත්වයට පත් වෙමින් තිබෙනවා. ඒ වාගේමයි අද නඟන හඬ. මේ බොරු අවලාදය ඉදිරි සති දෙක වෙනකොට තමන්ටම පාරා වළල්ලක් බවට පත් වෙමින්, තමන්ටම ඒකට උත්තර දී ගන්න බැරි සමාජ විරෝධයක් හැදෙන එකක් බවට පත් වෙනවා. අපි අනිවාර්යයෙන්ම මෙහි තිබෙන නිවැරදිභාවය, සද්භාවය, අවංකභාවය සහ මේ පිළිබඳ මතය සමාජගත කරනවා. මේ ආණ්ඩුව ඔබ මතු කරන ආකාරයේ දූෂිත ආණ්ඩුවක් නොව දූෂණයට විරුද්ධ, දූෂණය පරාද කරන, ජනතාවාදී ආණ්ඩුවක් කියන එක තවදුරටත් ප්‍රකාශ කරමින්, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබුණු වෙලාවෙන් විනාඩි ගණනක් කපලා.

අද විවාදය ගැන කථා කරද්දී ඇමතිතුමා හොඳ කථාවක් කිව්වා. ඒ තමයි, "කොට හුඹහයි, කොට මිනිහායි" විශ්වාස කරන්න එපා කියන එක. දැන් මේ "කොටා", "කොටා" කිව්වේ කාටද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට, අමාත්‍යතුමා නිවැරදි කර දෙන්න ඕනෑ මේ "කොටා" කවුද කියලා. ඒ කියන්නේ, කොටෙක් තමයි අපට ඔත්තුව දීලා තිබෙන්නේ කියලා කිව්වේ. ඒක නිසා තමයි ඇමතිතුමා කොටාගේ කථාවකින් පටන් ගත්තේ. මේ ආණ්ඩුව, මේ යෝජනාව ඉදිරිපත් කරපු විපක්ෂයට ඒ සම්බන්ධයෙන් සාධාරණ පිළිතුරු ටිකක් ලබා දෙන්න ඕනෑ. හැබැයි, ඒක නොවෙයි කරන්නේ. පරණ, කොහේවත් නැති කෙහෙල් මල් ටිකක් අරගෙන ඇවිල්ලා කථා පවත්වනවා. ඒවා වැරදියි කියලා තමයි තමුන්නාන්සේලාට ඡන්දය දීලා මේ සභාවට 159දෙනෙක් පත් කරලා එව්වේ. හැබැයි, මතක තබා ගන්න, ඒ 159දෙනා එව්වේ තමුන්නාන්සේලාගේ පැලවත්තේ account එකට පඩි හැටියට සල්ලි ටික එකතු කර ගන්න නොවෙයි, මේ රටට වැඩ කරන්නයි කියන එක. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීතුමන්ලාව පාවිච්චි කරන්නේ පැලවත්තේ account එකට සල්ලි දමා ගන්න විතරයි කියන එක තමයි අද අපට පෙනෙන්නේ. මොකද, ඒ අයට වැඩදායී වැඩක් පෙන්වන්න නම් දෙන්නේ නැහැ කියන එක මේ ප්‍රශ්නවලින් පෙනෙනවා.

ගල් අඟුරු වංචාව ගැන කථා කරද්දී විශේෂයෙන්ම මතක තබා ගන්න, පුත්තලම ආසනයේ, කල්පිටිය බලප්‍රදේශයේ තමයි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය තිබෙන්නේ කියන එක. කල්පිටිය ප්‍රදේශයේ මිනිස්සු මේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදන්න දුන්නේ ඔවුන්ගේ ජීවිත පරිත්‍යාග කරලා. ඒ විතරක් නොවෙයි, මේ ප්‍රදේශයේ තිබෙන පරිසර ප්‍රශ්න ගොඩකට ධීවරයා, ගොවියා කියන මේ සියලුදෙනාම මුහුණ දෙමින් තමයි මේ බලාගාරය හදන්න අවස්ථාව ලබා දුන්නේ. සමස්ත රටටම වැඩදායී වැඩක් කරන්න ඕනෑ නිසා තමයි ඒ අය විශේෂයෙන්ම ඒ පරිත්‍යාග ටික කළේ.

මතක තබා ගන්න, ගල් අඟුරු ටෙන්ඩර් කරද්දී වයඹ පළාත් පරිසර අධිකාරියත් එක්ක මේ ටෙන්ඩරය බැඳී පවතිනවාය කියන

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

එක. මේ ටෙන්ඩරය කරන්න ඕනෑ විධිය සම්බන්ධයෙන් දෙගොල්ලන්ටම වෙනම නීති පද්ධතියක් සකස් කර තිබෙනවා. විශේෂයෙන්ම reject කරන calorific value එක සම්බන්ධව සහ අළු සම්බන්ධව මේකට ප්‍රමිතීන් දීලා තිබෙනවා. විශේෂයෙන්ම calorific ප්‍රමාණය 5,900 සිට 6,150 දක්වාත්, අළු ප්‍රතිශතය 16ට වඩා වැඩි නම් එතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ටෙන්ඩර් කරන්න බැහැ, පළමුවෙන්ම. ඒ ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ මේ පදනම මත. මේ පදනම මත ටෙන්ඩරය ඉදිරිපත් කළාට පසුව පළමුවැනි නැව ඇවිල්ලා check කරනකොට මොකක්ද වුණේ? පළමුවැනි නැව reject වුණා. මතක තබා ගන්න, පළමුවැනි නැව reject වුණාම වයඹ පළාත් පරිසර අධිකාරිය පරිසර ආරක්ෂණ බලපත්‍රයක් දීලා තිබෙනවා කියන එක. එහෙනම්, ඒ බලපත්‍රය අවලංගු කරන්න වෙනවා. මොකද, ඒ බලපත්‍රයට අදාළ කොන්දේසි මත නොවෙයි පළමුවැනි නැවේ තිබෙන බඩු ටික ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා පළමුවෙන්ම එතැනින් reject වෙනවා. එතැනින් reject වෙනකොට මේ වයඹ පළාත් පරිසර අධිකාරිය බැරි වෙලාවත් මේ ආරක්ෂණ බලපත්‍රය cancel කළොත් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වසා දමන්න සිද්ධ වන බව මතක තබා ගන්න. ඒක තමයි, පරිසර නීතිය. පරිසර අමාත්‍යවරයාට අද විශාල වගකීමක් පැවරී තිබෙනවා, මේ ගැන කථා කරන්න. හැබැයි, එතුමා මේ ගැන කථා කළේ නැහැ.

මේ පරිසර ආරක්ෂණ බලපත්‍රය හදන්න හේතුව වුණේ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ plant එක බේරා ගැනීම විතරක් නොවෙයි. ප්‍රදේශයේ පරිසරය ආරක්ෂා කර ගැනීමත් ඒකට හේතුවක් වුණා. තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ, පරිසරය ආරක්ෂා කර ගන්න වැඩසටහනේදී ගල් අඟුරු දහනය කිරීම සම්බන්ධව වෙනම වැඩසටහනක් සකස් කර තිබෙන බව. මධ්‍යම පරිසර අධිකාරිය, මේ අමාත්‍යාංශය සහ අදාළ ආයතන සම්බන්ධීකරණය කරගෙන Continuous Emission Monitoring System එකක් හදලා තිබෙනවා. ගල් අඟුරු දහනය වෙනකොට ඉතුරු වන අළු ප්‍රමාණය පිළිබඳව කෙටි කාලයක් ඇතුළත චිමිනියේ සවි කර තිබෙන sensors හරහා සම්පූර්ණ report එකක් ලබා ගන්නවා. ඒ විධියට තමයි මිනුම කරන්නේ. ඒ මිනුම online හරහා වයඹ පළාත් පරිසර අධිකාරියටත් බලා ගන්න පුළුවන් ආකාරයට තමයි සකස් කරලා තිබෙන්නේ. හැබැයි, මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, මේ වසරේ ජනවාරි මාසයේ, පෙබරවාරි මාසයේ ඒක වැඩ කළාද නැත්නම් ක්‍රියා විරහිත වෙලා තිබුණාද කියලා. එහෙම නැත්නම් ඒක නිකම් නැකතකට නැවැත්තුවා වාගේ නතර වෙලා තිබුණාද? ඒ විධියට නතර වෙලා තිබුණු එක මේ ජාවාරමේ කොටසක්ද කියලා මම ඔබතුමාගෙන් අහනවා. මේ අවස්ථාවේදී ඒක නතර වෙලා තිබෙනවා. ජනවාරි මාසයේ නැව ඇවිල්ලා test එක කරපු වෙලාවේ ඉඳලා පෙබරවාරි මාසය වනකල් ඒක නතර වෙලා තිබෙනවා. ඒකත් මේ ජාවාරමට සම්බන්ධයක් තිබෙනවා. එම නිසා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කියලා මම විශේෂයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඒ වාගේම, වයඹ පළාත් පරිසර අධිකාරියත් එක්ක බැඳිලා තිබෙන වැඩසටහනේ ඊළඟ කාරණා ගැනත් මම කියන්න ඕනෑ. නොරොච්චෝලේ බලාගාරයේ plants තුනක් තිබෙනවා. එකකින් මෙගාවොට් 300 ගණනේ මෙගාවොට් 900ක් නිෂ්පාදනය වෙනවා. 1 ඉඳලා 9 වෙනකල් testings ටික කරනකොට, විශේෂයෙන්ම loading port එකේ හැම report එකකින්ම කියලා තිබෙනවා, 1 සහ 6 pass කියලා. හැබැයි, ඉන්දියාවේ "කොටෙක්නා" ආයතනයෙන් මොකක්ද කියලා තිබෙන්නේ? 1 සහ 6 reject කියලා තිබෙනවා. ඒ report දෙක පරස්පර වුණේ කොහොමද? හැබැයි, ඒ විධියට පරස්පර වාර්තා එනකොට ඇමතිවරයා ඇතුළු මේ කණ්ඩායම කොහේද බලාගෙන හිටියේ? උඩ බලාගෙන හිටියාද? "කොටෙක්නා" ආයතනයද මේ බොරුව කරන්නේ, නැත්නම් loading port එකේ ඉන්දුනීසියානු සමාගමද මේ වැරැද්ද කරන්නේ? එම නිසා ඉස්සෙල්ලාම ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න ඕනෑ කියන එක මතක තබා ගන්න.

දැන් අපට ආරංචියි, රුවන් කියලා කෙන්යාවට සම්බන්ධ කෙනෙක් තමයි ආණ්ඩුවත් එක්ක සම්බන්ධ වෙලා මේක පිටුපස ඉන්නේ කියලා. අමාත්‍යවරයාට වඩා ඉහළින් ඔහුට මේ සම්බන්ධයෙන් සම්බන්ධතාවක් ගොඩනැඟිලා තිබෙනවා කියලා තමයි අපට ආරංචි. දැන් අමාත්‍යවරයාගේ බෙල්ල තමයි මුලින්ම යන්නේ. මේ සඳහා ඉහළින් සම්බන්ධතාවක් තිබෙනවාය කියන එක තමයි අපට දැනගන්න ලැබිලා තිබෙන්නේ. මේ හැම report එකක්ම අරගෙන බැලුවොත් පෙනෙනවා, විශේෂයෙන්ම ගල් අඟුරු ටික හරියට තිබුණා නම් මෙගාවොට් 300 ගණනේ විදුලිය නිපදවෙන්න ඕනෑ කියලා. හැබැයි, මම කලින් කියපු විධියට පසුගිය දවස්වල ඒ plants තුනේ ඒ විධියට විදුලිය නිපදවුණේ නැහැ. නිෂ්පාදනය වුණේ ඉතාම අඩු මෙගාවොට් ප්‍රමාණයක්; මෙගාවොට් 500, 600, 700 වාගේ ප්‍රමාණයන් තමයි නිෂ්පාදනය වෙලා තිබුණේ. එසේ නිෂ්පාදනය වුණු ප්‍රමාණය බලපු ගමන් කියන්න පුළුවන්, ගල් අඟුරු ටික බාලයි කියලා. එම නිසා වයඹ පළාත් පරිසර අධිකාරියෙන් අපි අහනවා, ගල් අඟුරු ටික බාල නම් ඒ වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය තවදුරටත් දෙන්න පුළුවන්ද කියලා. දෙන්න බැහැ. ඒකට හේතුව තමයි, ඒක පරිසරයට අහිතකරයි කියන එක. එම නිසා ඒක සිද්ධ වුණේ කොහොමද කියන කාරණය මම මේ වෙලාවේදී විශේෂයෙන් අහනවා.

ඒ වාගේම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මෙතැනදී අපට පෙනෙනවා, ජනතාවවත්, විදුලියවත්, ඒ බලාගාරයවත් නොවෙයි මේගොල්ලන් රකින්නේ කියලා. මේ පෙබරවාරි මාසය අවසන් වෙනකොට ඊට කලින් ගෙනාපු ගල් අඟුරු ටික අවසාන වෙනවා. එතකොට, අලුත් ගල් අඟුරු තමයි මාර්තු මාසයේ මුල ඉඳලා පාවිච්චි කරන්න පටන් ගන්න වෙන්නේ. ඒ විධියට පාවිච්චි කරන්න පටන් ගත්තාම ඒ ගල් අඟුරු බාල නම් ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා. ඒ බලාගාරය පැය 24 පුරාම ක්‍රියාත්මක වනවා නම්, ඒ වාගේම මෙගාවොට් 300 ගණනේ මෙගාවොට් 900ක් නිපදවෙනවා නම්, බාල ගල් අඟුරු නිසා ඒ බොයිලේරු ටිකයි, මැෂින් ටිකයි සම්පූර්ණයෙන්ම නාස්ති වෙලා විනාශ වෙනවා විතරක් නොවෙයි, බොයිලේරුවක යම් කිසි ප්‍රශ්නයක් පැන නැඟුණොත් ඒ බොයිලේරුව අලුත්වැඩියා කර නැවත පාවිච්චියට ගන්න හය මාසයක් ගත වෙනවා. හැබැයි, ඒ අලුත්වැඩියා කිරීම සඳහා ගත වන කාලය තුළ විශේෂයෙන්ම මේ රටේ සමස්ත ජනතාවට විදුලිය ලබා දෙන්න නිපදවා තිබෙන මෙගාවොට් ප්‍රමාණය මදි. එම නිසා විදුලිය ලබා දෙන්න අනිවාර්යයෙන්ම ජෙනරේටර් ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්ධන පාවිච්චි කරන්න වෙනවා. මේ ජාවාරමේ අනෙක් කොටස තමයි, ඉන්ධන පාවිච්චි කරලා විදුලිය නිපදවීම. එම නිසා මතක තබා ගන්න ඕනෑ, මේ කාරණාවේදී රට ගැන හිතන්නේ නැතුව, ජනතාව ගැන හිතන්නේ නැතුව, තමන්ගේ සාක්කුව ගැන, එහෙම නැත්නම් මඩිය තර කර ගන්න හිතපු නිසා තමයි අද මේ රටේ ජනතාවට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, අලුතින් ගෙනැල්ලා තිබෙන ගල් අඟුරුවල වැඩිපුර තිබෙන්නේ කුඩු කියන එක. ගල් අඟුරු කුඩු නිසා ඒ ප්‍රදේශයේ ජනතාවට බරපතළ හානියක් සිද්ධ වෙනවා. අප්‍රේල් මාසය වෙනකොට වාරකන් කාලය එනවා. වාරකන් කාලයේදී ඒ ගල් අඟුරු කුඩු සියල්ලම ඒ ප්‍රදේශයේ ජනතාවගේ ගෙවල්වලට සහ වගාවන්වලට යනවා. ඒ කුඩු ගහකට වැටුණාම ගහ පිච්චිලා යනවා. ඔබතුමන්ලා මතක

තබා ගන්න, එක පැත්තකින් මේක නිසා රටටම බරපතළ හානියක් සිද්ධ වෙනවාය කියන එක. විදුලිය සම්බන්ධයෙනුත් ප්‍රශ්න ඇති වෙනවා; විදුලි බිල වැඩි වෙනවා.

ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරයේ මැෂින් ටික සම්පූර්ණයෙන් අක්‍රිය වන වැඩසටහනක් ඒ පැත්තෙන් ක්‍රියාත්මක වෙනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ එක ප්‍රදේශයක පරිසරය සම්පූර්ණයෙන් විනාශ වෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාව කාටවත් අත පාන්නේ නැති ජනතාවක්. ඒ ජනතාවගේ රැකියා ටික සම්පූර්ණයෙන් විනාශ වෙනවා. ඒ සම්බන්ධව ආණ්ඩුව වගකීම භාර ගත යුතුයි. ආණ්ඩුව එක පැත්තකින් ඒ සම්බන්ධව වගකීම භාර ගත යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අවසාන වශයෙන් කියන්න පුංචි කාරණාවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ plant එකේ මම අර කියපු කොටස් දෙකම තිබෙනවා. එක පැත්තකින් මේක පැය 24 පුරා දිව්වොත්, plant එක ඉවරයි. හැබැයි plant එක බේරා ගන්න කියලා සියයට 50ක ප්‍රමාණයකින් දිව්වොත්, මේ රටේ විදුලි බිල තුන් හතර ගුණයකින් වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි, අප්‍රේල් මාසය වෙනකොට අනිවාර්යයෙන් මේ රට blackout කරලා නතර කරන්නේ. මේ ජාවාරමෙන් මුදල් ටික එකතු කරගෙන තමන්ගේ සාක්කුව, නැත්නම් මඩිය තර කර ගන්න ඇමතිතුමා ගන්නා උත්සාහය නිසා රටේ සමස්ත ජනතාවට අප්‍රේල් මාසය වෙනකොට, විශේෂයෙන්ම සිංහල අවුරුද්දට කළුවරේ ඉන්න වෙනවාය කියලා අවසාන වශයෙන් මම මතක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ගල් අඟුරු ටෙන්ඩර් වංචාවක් ගැන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා අද උදෑසන සිට කරගෙන යන මේ විවාදයේදී ටෙන්ඩර් පටිපාටිය ගැන සහ මොකක්ද මේ වෙද්දී වෙලා තිබෙන්නේ කියන එක ගැන ඇමතිතුමා ඇතුළු ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් අදහස් දැක්වූවා. මේ වෙද්දී මේ සාකච්ඡාවත් යම් තැනකට එමින් තිබෙනවාය කියලා අපට තේරෙනවා, බලාගෙන ඉද්දී.

මේක පැහැදිලිවම අවුරුදු දෙකහමාරකට, තුනකට පස්සේ ටෙන්ඩර් පටිපාටියකට අනුව සමාගම් ගණනාවකින් ටෙන්ඩර් කැඳවලා award කරපු ටෙන්ඩර් එකක්. එතකොට ඒක සාමාන්‍ය විධියට යනවා. ඒකේදී තත්ත්වයෙන් බාල ගල් අඟුරු ආවාය, ඒවාට මොකක්ද කරන්නේ කියන එක ගැන තමයි සාකච්ඡාව යන්නේ. මේ ආකාරයෙන් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම ගැන හෝ ඒකෙන් එන්න පුළුවන් ගැටලු ගැන කථා කරන එක තවත් එකක්. දැන් මෙතැන දිගටම කථා වුණා සහ අපි හැමෝම දන්නවා, පසුගිය අවුරුදු තුනේ, -2023, 2024, 2025- මේ ආකාරයෙන් සමාගම්වලට විවෘතව ටෙන්ඩර් කැඳවන්නේ නැතුව, කැබිනට් මණ්ඩල අනුමැතියකින් පමණක් එක සමාගමකට ටෙන්ඩර් එක award කරමින් තමයි ඉස්සරහට ගියේ කියලා. ඒක අපි දන්නා කරුණක්. ටෙන්ඩර් කැඳවන්නේ නැතුව විතරක් නොවෙයි, පළමුවැනි වතාවට ටෙන්ඩරය කැඳවලා, ටෙන්ඩරය කැඳෙව්වාට පස්සේ අඩුවෙන් දෙනවාය කියලා තමයි දුන්නේ. අර මන්ත්‍රීතුමාත් කිව්වා මම දැක්කා, කෝටි 1,000ක් අඩුවෙන් ආවා, ඒ නිසා දුන්නා, ඒක හොඳ වැඩක් වාගේ කථාවක්. එහෙම නම් ටෙන්ඩර් පටිපාටියක් ඕනෑ නැහැ නේ. මම දන්නා කෙනෙක් ඉන්නවා, එයාට මේ ගණනට දෙනවාය කියලා එහෙම යන්න බැහැ. මේක රටක් නේ. එහෙම නැතුව මේක කාගේ හරි කඩයක් කරනවා නොවෙයි නේ. එතකොට යන්න ඕනෑ විධියක් තිබෙනවා. එතකොට අපි හැමෝම පිළිගන්නවා, ඒවා නිසි ක්‍රමවේදවලට ගෙන ඒම තමයි කළ යුත්තේ, ඒක තමයි මේ කරමින් තිබෙන්නේ කියලා. ඒවායේ ගැටලු තිබෙනවා නම්, අපට කථා කරන්න පුළුවන්.

හැබැයි තවත් කථාවක් කියනවා, මේ නිසා සියයට 10ක් විදුලි බිල වැඩි වෙනවාය කියලා. දැන් මේ කරන්නේ, එක කථාවකින් තවත් කථාවක් හදාගෙන, කථා ගොඩක් හදාගෙන එන එක. එතකොට දැන් සියයට 10ක් විදුලි බිල වැඩි කරන්න, අවුරුද්දට දෙපාරක් හෝ කිහිප වරක් ඉල්ලීම් කරන විධියට විදුලිබල මණ්ඩලය ඉල්ලීමක් කර තිබෙනවා, PUCSL එකෙන්. ඒ සම්බන්ධ report එකේ හේතු දක්වලා තිබෙනවා, මේ විදුලි බිල වැඩි කිරීම සඳහා ඉල්ලුම් කරන්නේ මොකටද කියලා. ඒ නිසා බොරු කියන්න එපා. කලින් වතාවලත් ඉල්ලුම් කළාට වැඩි වුණේ නැහැ නේ. නමුත් මේකේ නිශ්චිතව හේතු දක්වා තිබෙනවා, ඉල්ලුම් කරන්නේ මොන හේතු නිසාද කියලා. ඒකේ ගල් අඟුරු කථාවක් නැහැ. නමුත් දැන් මේ ඔක්කෝම ටික එකතු කරලා එක කථාවක් හදන්න හදනවා. හදලා මාර වංචාවක්, මාර වැඩක් වුණාය කියලා කට්ටියම එක්ක කියන්න හදනවා. මොකක් හරි කියන්න ඕනෑ නිසා එහෙම කියන එකේ වරදක් අපි දකින්නේ නැහැ. නමුත් බොරු කියන්න එපා. ඒකේ නිශ්චිතව හේතු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ හේතුවල මේ කාරණය නැහැ. මොකද, මේක මෙතුමන්ලා උපකල්පනය කරන ප්‍රශ්නයක් නේ, මෙහෙම වෙයි අරහෙම වෙයි කියලා. හැබැයි මේක කියන්නේ කවුද? මේ රටේ විදුලි බිල සියයට 400කින් වැඩි කරපු මිනිස්සු. සියයට 10කින් විදුලි බිල වැඩි වෙන්න මේක හේතු වෙනවාය කියලා එහෙම නැති හේතුවක් කියනවා. එදා සියයට 400කින් විදුලි බිල වැඩි කළා.

මේ රටේ විදුලි බලය සහ බලශක්තිය සම්බන්ධව මොනවාද තිබුණු ඉලක්කම්, අපි මේ ආණ්ඩුව භාර ගන්න කලින්? අපි කිව්වා වාගේම ඉදිරි කාලය තුළ, ඉදිරි වසර තුන තුළ විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන දිශාවක් ඔස්සේ අපි වැඩ කරගෙන යන්නේ. සරල උදාහරණ කිහිපයක් ගත්තොත්, සෝලා විදුලිය ඒකකයක් ගන්න ගණන රුපියල් 36 ඉඳලා රුපියල් 17 වෙනකම් අඩු කරලා තිබෙනවා; අදානි සමාගමට රුපියල් 24ට දෙන්න තිබුණු එක වෙනත් සමාගමකට රුපියල් 12ට දෙන්න පුළුවන් විධියට අඩු කරලා, රුපියල්වලින් ගෙවන්න පුළුවන් විධියට ටෙන්ඩරය කැඳවලා තිබෙනවා. Battery storage තිබුණේ නැහැ. ඒක රුපියල් 12ට අඩු කරලා තිබෙනවා. මේ රටේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ cost එක අඩු කරමින්, පුනර්ජනනීය බලශක්තියට යන්න අදාළව වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරනවා. එහෙම කරමින් ඉද්දී තමයි අනෙක් පැත්තෙන් දිගින් දිගටම මෙහෙම කියන්නේ. එක බොරුවක් තව කථාවක්, තව බොරුවක් තව කථාවක්, තවත් ලියුමක් ආදී වශයෙන් එකතු කරලා, වෙනම කථාවක් ගොඩනහලා මෙතැන කියනවා.

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

ඒ වෙනුවෙන් උදේ ඉඳන් බොරු කියනවා, බොරු එකතු කරනවා. සමහර වෙලාවට බොරුවේ සීමාව තමන්ට දරා ගන්නත් බැරි වෙනවා. මරික්කාර් මන්ත්‍රීතුමා සභාවේ නැද්ද? මම හිතන විධියට account details ගේන්න ගිහින් වෙන්න ඇති. ඇමතිතුමාගේ බිරිඳගේ අම්මාගේ බැංකු පොතේ photocopy එකක් ගන්න ගිහින් වෙන්න ඇති කියලා අපි හිතනවා. හවස් වෙන්න කලින් එයි කියලාත් හිතනවා. *[බාධා කිරීමක්]* ඔව්, හවස් වෙද්දී photocopy එක අරගෙන එයි නේ. එතකොට බලමු, පොතේ photocopy එක අරගෙන එයිද කියලා. ඒ මට්ටමේ බොරු නේ කියන්නේ. උදේ ඔක්කෝම කියනකොට හැමෝම අහගෙන ඉන්නවා වාගේ තේරුණාම බොරුව overdose ගිහිල්ලා ඊට වඩා ඒවා කියනවා. අන්තිමට කියනවා, සල්ලිත් ආවා, ඇමතිතුමාගේ නෝනාගේ අම්මාගේ හෝමාගම මහජන බැංකුවේ account එකට සල්ලි ආවා කියලා. මම හිතන්නේ කියපු ගමන් තේරුණා පොඩ්ඩක් වැඩිපුර කියැවුණා කියලා. ඊට පස්සේ වැඩිය හිටියෙත් නැහැ මේ පැත්තේ. මෙහෙමයි, ඒක තමයි ක්‍රමය. "බිරිඳගේ අම්මාගේ" වාගේ වචන එන්නේ තමන් දන්න practice එක අනුව, තමන් ගනු දෙනු කළ විධිය අනුව, තමන් සල්ලි ගනු දෙනු කළ විධිය. ඒක නේ එච්චර ඉක්මනට ඒ වචන එන්නේ. මමත් කල්පනා කළා, මට ඔහොම එකක් එක පාරට ඔළුවට එන්නේ නැහැ නේ, "බිරිඳගේ අම්මාගේ" වාගේ එකක් කියන්න. ඒ, තමන් දන්න එක. ඔහොම තමයි ඒගොල්ලන් ගනු දෙනු කරලා තිබෙන්නේ. ඒ පුරුද්දට අපිත් එහෙමයි කියලා හිතාගෙන කියනවා. බැංකු පොතේ photocopy එක හවස එයි.

පොහොට්ටුවේ මන්ත්‍රීතුමා සැහෙන උද්වේගයෙන් කථා කළා; සාධාරණයි. මොකද, ඔබතුමා කථා කරන එක සාධාරණයි නේ. අවුරුදු 3ක් තුළ ටෙන්ඩර් නොදා කැබිනට් අනුමැතියෙන් දුන්නේ කාටද? මම සමාගම්වල විස්තර කියන්න යන්නේ නැහැ. බිලියන ගානක ගනු දෙනුවක් නේ. නමුත් අවුරුදු 3ක් තිස්සේ ඒක දුන්නේ කාටද, ඒ සමාගම කාගේද? මම දන්නා විධියට ඒ සමාගම යෝෂිත රාජපක්ෂගේ classmate කෙනෙකුගේ. මේ සමාගම ගැන පසුගිය කාලයේත් කථා වුණා. ඒ කථා වුණේ Ondansetron ඖෂධ සම්බන්ධ ප්‍රශ්නය ගැන. *[බාධා කිරීම්]* ඩී.වී. චානක මන්ත්‍රීතුමා, ඉතින් ඔබතුමාගේ නම නොවෙයි නේ කිව්වේ, ඔබතුමා යෝෂිත රාජපක්ෂ නොවෙයි නේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
"පොහොට්ටුවේ මන්ත්‍රීතුමා" කිව්වා. මම හැර පොහොට්ටුවේ වෙන මන්ත්‍රීවරු නැහැ නේ, මම නේ ඉන්නේ. ගරු නජිත් මන්ත්‍රීතුමනි, කලින් දීපු එක යෝෂිත රාජපක්ෂගේ නොවෙයි, ව්‍රායි බල්තසාර්ගේ මස්සිනාගේ. ඒ කොම්පැනියේ අයිතිකාරයා ව්‍රායි බල්තසාර්ගේ මස්සිනා, වෙන කවුරුවත් නොවෙයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
හරි, හරි. කාගේද කියලා බලා ගන්න පුළුවන්. මම දන්න දේ මම කිව්වේ. මම එතුමාගේ නම කිව්වේ නැහැ, මම රාජපක්ෂ කෙනෙකුගේ නමක් කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට විනාඩියක් දෙන්න, බාධා කළ නිසා.

අවසාන වශයෙන් මට කියන්න ඕනෑ මේකයි. රාජපක්ෂලාගේ සමාගමක බිස්නස් එක අඩු වුණා කියලා එතුමන්ලා කථා කරන එක අවුලක් නැහැ. හැබැයි දැන් මේ සමගි ජන බලවේගය ඇයි ඒකට එච්චර කලබල වෙන්නේ? මම කලින් දවසකත් කිව්වා, උදේ රාජපක්ෂලාට නඩු දාන්නේ නැහැ කියලා මේ සභාවේ කෑ ගහනවා, හවසට රාජපක්ෂලාගේ බඩු ගේන්න දුන්නේ නැහැ වාගේ ප්‍රශ්නයක් එක්ක මෙතැන හැප්පෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්. මම කලින් දවසක් කිව්වා මේ ගැන. කථාවක් ගියා නේ නාමල් රාජපක්ෂ මහත්තයා ඉන්දියාවේ යද්දී මේගොල්ලන් බෑග් එක උස්සාගෙන ගියා කියලා. මම කියන්නේ මේ කරන්නෙත් ඒ වැඩේ. සංකේතීයව කරන්නේ ඒ වැඩේ. අතැන ගනු දෙනුව, බිස්නස් එක යනකොට මේගොල්ලන් බෑග් උස්සාගෙන යනවා. මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, අර පැත්තෙන් කථා කරන එක සාධාරණයි; බිස්නස් එක නැති වුණාම කථා කරන එක වෙනම දෙයක්. නමුත්, සමගි ජන බලවේගයේ හැසිරීම දැක්කාම මට මතක් වෙන්නේ, අපේ අර පරණ කියමනක්. එනම්, "තල නම් තෙලට වේලේ, මී බෙටි කුමට වේලේද" කියලා තමයි අහන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 3.07]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල්තබන අවස්ථාවේ විවාදය සඳහා විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

මෙම යෝජනාව ඉදිරිපත් කළ ඒ මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කළේ බොහෝ අසත්‍ය කරුණු රැසක් එක්ක. ඒ වාගේම එතුමා විසින් ඉදිරිපත් කරන ලද අසත්‍ය කරුණු මෙතැන ප්‍රත්‍යක්ෂ කරලා පෙන්වන්න බැරි නිසාම මේ මොහොතේත් එතුමා සභා ගර්භයේ නැහැ. යෝජනාව ඉදිරිපත් කළ මොහොතේ ඉඳලා තවමත් නැහැ. එතුමා කිව්වා ජනතාව මේ නිසාම පාරට බස්සනවා කියලා. ජනතාව පාරට බස්සන්න ගිහිල්ලාද දන්නෙත් නැහැ, අර බැංකු ගිණුම් අංකය සොයා ගන්න ගිහිල්ලාද දන්නෙත් නැහැ.

හැබැයි, මේ විවාදය ආරම්භ වූ මොහොතේ මේ විවාදයට සම්බන්ධ වුණු විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් - 10ක්, 15ක් විතර - එකතු වෙලා, පොල්දූවට මෙහා -පාර්ලිමේන්තුව ඉස්සරහා - බෝඩ් ටිකක් එල්ලාගෙන පොඩි උද්ඝෝෂණයක් කරනවා අපි දැක්කා. ඔවුන්ගේ මේ ක්‍රියාවලියෙනුත් අපට තේරුම් යන්නේ, මේ බොරුව ඔවුන්ට තවදුරටත් මෙතැන ස්ථාපිත කරන්න බැරි වන නිසා, මේ සභා ගර්භයෙනුත් ඉවත් වෙලා ගිහින් එසේ කරන බවකුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන්ගේ මේ ක්‍රියාකාරිත්වය, ඔවුන්ගේ මේ හැසිරීම සම්බන්ධයෙන් අපි පුදුමයට පත් වන්නේ නැහැ. ඔවුන් එසේ කරන්න හේතුවක් තිබෙනවා. මොකද, විපක්ෂය තමන්ගේ පැවැත්ම වෙනුවෙන් එසේ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි තාක්ෂණික කරුණු ගැන අපේ ආණ්ඩුවේ ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු -බොහෝ අය- අදහස් දැක්වූවා. හැබැයි, මේකේ දේශපාලනික කරුණක් තිබෙනවා. ඒක තමයි, විපක්ෂය පසුගිය කාලය පුරාම තම පැවැත්ම වෙනුවෙන් ඉදිරිපත් කරපු යෝජනාත්, ඔවුන්ගේ ක්‍රියාමාර්ග සියල්ලත් අසාර්ථක වීම. ඒ අසාර්ථක වීම වළක්වා ගන්න ඔවුන් අලුත් යෝජනා, අලුත් චෝදනා ඉදිරිපත් කරමින් යනවා. ඒවාත් පාරා වළල්ලක් බවට පත් වෙමින්, ඒගොල්ලන්ටම බලපෑම් එල්ල කරමින් තිබෙනවා. මම ඒවායෙන් එකක්, දෙකක් කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන කොට ඒක අසභ්‍යකරණ ක්‍රියාවලියක් කියපු විපක්ෂය ඒකෙන් සම්පූර්ණයෙන්ම නෑවා. ඊට පස්සේ මොකක්ද වුණේ? මොකක් හරි ජනතා විරෝධයක් පාරේ හෝ එළියේ හෝ තිබෙනවා නම්, ජනතාව පොඩි විරෝධතාවක් හරි දක්වනවා නම්, ඒ විරෝධතාව පැවැත්වෙන තැනට, ඒ ඉස්සරහට ගිහිල්ලා, විරෝධතාකරුවන් ළඟට ගිහිල්ලා, සමහර දේවල් ලේවලින් අත්සන් කරලා දෙන්න ගිහිල්ලා ඒකෙනුත් විපක්ෂය නාගෙන තිබෙනවා. එවැනි තවත් අවස්ථා කිහිපයක්ම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙහිදී අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් දිහා බැලුවාම වැටහෙන දෙයක් තිබෙනවා. ජනතාව ඔවුන් දිහා බලාගෙන ඉන්නවා නම්, ජනතාවත් තේරුම් ගන්නවා විපක්ෂය මේ කරන්නේ බොරුවක් කියලා. ජනතාව මේක බොරුවක් ලෙස තේරුම් ගන්න එක් හේතුවක් තමයි, පසුගිය මැතිවරණවලට කලින් විශාල මුසාවාදයක් ඉදිරිපත් කරපු, කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකුත් මේක ඇත්ත කියලා ඔප්පු කරන්න බොහොම සද්දෙට හඬ නඟපු එක. ඒ අය තමයි, අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ පන්සල්වලට ගහයි, හාමුදුරුවන් වහන්සේලා මරා දමයි කියලා විශාල බොරු චෝදනා එල්ල කළේ. හැබැයි, ජනතාව ඒවා ප්‍රතික්ෂේප කළා. ඒ හා සමාන බොරු ඉදිරිපත් කරමින් තමයි, මේ විවාදයට ඔවුන් සම්බන්ධ වුණේ. ඒ වාගේම, මලෙයහම් ජනතාවගේ දෛනික වැටුප රුපියල් 400කින් වැඩි කරන්න ආණ්ඩුව කටයුතු කළා. විපක්ෂයේ සමහරු ඒකට විරුද්ධ වුණා. ඉහත කී කරුණු අනුව බැලුවාම පෙනෙනවා, විපක්ෂය ගත්තු සෑම ක්‍රියාමාර්ගයක්ම ඔවුන්ටම විරුද්ධව ආපිට ඇවිත් තිබෙන බව.

අපේ ගරු අගමැතිතුමියට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරනවා කියලා විපක්ෂයේ පිරිසක් කලබලෙන් ඒකට අත්සන් ලබා ගන්නවා අපි දැක්කා. නමුත්, ඒකෙනුත් පලක් නැති වෙලා තිබෙනවා. ඒ නිසා අප දේශපාලනිකව තේරුම් ගන්න ඕනෑ දෙය තමයි, විපක්ෂයට තම කාර්යභාරය ඉටු කරන්න තරම් සාධක මතු වෙලා නැහැ කියන එක. ඒ නිසා පුංචි පුංචි දේවල් අල්ලා ගෙන ඒ මත යැපෙමින් තමයි ඔවුන් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු මිල දී ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව ඔවුන් දිගින් දිගටම අසත්‍ය චෝදනායි ඉදිරිපත් කරමින් යන්නේ. විශේෂයෙන්ම එහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව ඔවුන් චෝදනා ඉදිරිපත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කිසිදු ගැටලුවක් සහිතව කෙරුණු එකක් නොවෙයි. එහි ටෙන්ඩර් සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය වෙලා තිබුණේ සැප්තැම්බර් 08වන දායි. සාමාන්‍යයෙන් දින 21ක් ඒ සඳහා ලබා දීලා තිබුණා. ටෙන්ඩර්කරුවන්ගේ ඉල්ලීම මත එය නැවත දින 28ක් දක්වා දීර්ඝ කරලා දෙන්න කටයුතු කර තිබුණා. ඒ විතරක් නොවෙයි. අප මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරැදි ලෙස ඉටු කරගෙන යද්දී අතීතයේ සිදුවීම් රැසක් වෙලා තිබෙනවා. මේ ටෙන්ඩර් ක්‍රියාවලියට පරිබාහිරව තමයි ගල් අඟුරු ප්‍රසම්පාදන කටයුතු සියල්ල සිදු කරලා තිබුණේ. මම 2009 වසරේ සිද්ධියක් ඉදිරිපත් කරන්නම්. 2009 වසරේ පළමු ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කළ නමුත් එය අවසාන කළේ නැහැ. එය අවලංගු කරනු ලැබුවා. 2009 වසරේ නැවත දෙවන ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කෙරුණත් අවසාන තීරණයක් ලැබුණේ නැහැ. අවසානයේදී ටෙන්ඩර් කාර්ය පටිපාටියෙන් පරිබාහිරව ගල් අඟුරු මිල දී ගැනීම සඳහා ඒ සමාගමට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම 2011දීත් ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව ගල් අඟුරු ප්‍රසම්පාදනයට - ගල් අඟුරු මිල දී ගැනීමට - කටයුතු කර තිබෙනවා. 2013, 2014, 2015 කියන කාල සීමාවල පවතින ටෙන්ඩර් පටිපාටියට අනුවවත් කටයුතු කරන්න පැවැති ආණ්ඩු කටයුතු කරලා නැහැ. හැබැයි අපේ ආණ්ඩුව මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කරලා තිබෙනවා. මා හිතන විදියට, ඉතිහාසයේ වැඩිම ටෙන්ඩර්කරුවන් ප්‍රමාණයක් -10දෙනෙක්- ඉදිරිපත් වෙලා, ඉන් එක් අයෙක් තමයි ඒ ටෙන්ඩරය අරගෙන තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ඉතින් මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් ඇති වෙලා නැහැ. නමුත්, එතැනිනුත් එහාට ගිහින් විපක්ෂය දැන් කියනවා, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් අනතුරුව ගෙන්වන ගල් අඟුරුවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටලුවක්

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

තිබෙනවා කියලා; එම ගල් අඟුරුවල ප්‍රමිතිය නිසි ආකාරයෙන් නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගල් අඟුරුවල ප්‍රමිතිය නිසි පරිදි නැත්නම්, ඒ සම්බන්ධවත් ගන්න ඕනෑ ක්‍රියාමාර්ග ද සඳහන් කර තිබෙනවා. උදාහරණයක් විධියට කියනවා නම්, ගල් අඟුරුවල ප්‍රමිතිය නිසි පරිදි නැත්නම්, ඒ කියන්නේ GCV අගය කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5,900ට අඩු නම්, දෙගුණයක දඩයක් අය කර ගන්නවා; කිලෝ කැලරි 5,900-6,150 අතර නම්, එක ගුණයක දඩයක් අය කර ගන්නවා. එහෙම ක්‍රියාවලියක් තිබෙනවා. එහෙම ක්‍රියාවලියක් තිබෙන්න හේතුව තමයි, ස්වාභාවික අමුද්‍රව්‍යයක් විධියට එන ගල් අඟුරුවල එහෙම ගැටලු තිබෙන්න පුළුවන් වීම. ඒ නිසා ඒකට ගත යුතු ක්‍රියාමාර්ගත් තිබෙනවා. එහෙම ගැටලුවක් ඇති වෙලා තිබෙනවා නම්, ඒකට අදාළ ක්‍රියාමාර්ග සිදු කරමින් තමයි ඉන්නේ. ඒක තමයි ඇත්ත. ඒ හරහා වංචාවක් සිදු වෙලා තිබෙනවා කියන කාරණය මතු කරන්න විපක්ෂය උත්සාහ කරනවා. නමුත් ඒ හරහා වංචාවක් සිදු වෙලා නැහැ. හැබැයි විපක්ෂයේ වුවමනාව වෙලා තිබෙන්නේ, දැනුත් වංචාවක් සිදු වෙලා තිබෙනවා කියමින් ඒගොල්ලන්ගේ අතීත ක්‍රියාවලියත් අපේ ක්‍රියාවලියත් සාමාන්‍යකරණයට ලක් කරන්නයි. අප ඒගොල්ලන්ට කියන්නේ, "සොරි තමයි!" කියලායි. මොකද, අපි මේ ආණ්ඩුව හදාගෙන තිබෙන්නේ හොරකම, දූෂණය, වංචාව, නාස්තිය නතර කරන්නයි. ඒක තමයි අපට ජනතාව දීපු වරම. අන්න ඒ ජන වරමට අනුව තමයි අප කටයුතු කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
විපක්ෂයට ලබන පාර්ලිමේන්තු සැසි වාරය සඳහාත් අලුත් මාතෘකාවක් සොයා ගන්න වෙයි, ඒ පාර්ලිමේන්තු සතිය ඇදගෙන යන්න. විපක්ෂයේ මේ යෝජනාව නැවත අවස්ථාවක ඔවුන්ටම පාරා වළල්ලක් බවට පත් වෙයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.17]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நிலக்கரி கொள்வனவுக்கான விலைமனுக் கோரலிலே மோசடிகள் இடம்பெற்றிருப்பது சம்பந்தமாக எதிர்க்கட்சியினர் அரசுக்கு எதிரான முறையீடாக ஓர் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்திருக்கிறார்கள். தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றத்திலே நடக்கின்ற விவாதங்களைப் பார்க்கின்றபோது, இங்கு அதிகூடியதாக இடம்பெறுகின்ற ஒரு வார்த்தைப் பிரயோகம் என்றால், அது 'பொய்' என்பதாகும். இது எல்லோராலும் பேசப்படுகின்ற விடயமாக இருக்கின்றது. நாங்கள் இந்த நாட்டினுடைய வளர்ச்சிக்காக, இந்த நாட்டிலுள்ள மக்களின் தேவைகளை, அவர்களுடைய குறைபாடுகளைப் பற்றி பேசுகின்றபொழுது, இந்த இடத்திலே இருக்கின்ற அமைச்சர்களாக இருந்தாலும் சரி அல்லது ஜனாதிபதியினுடைய பணிகளைச் செவ்வனே நிறைவேற்று வதற்காக இருக்கின்ற அவருடைய ஆளணியாக இருந்தாலும் சரி அல்லது அதற்கு எதிராக இருக்கின்ற எங்களுடைய எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தாலும் சரி, யாரும் இங்கே பேசுகின்ற விடயங்களுக்குச் செவி சாய்ப்பதாகவோ அல்லது அந்த விடயங்களுக்குப் பதில் கொடுப்பதாகவோ இல்லை. தாம் கொண்டுவந்த விடயத்தில் கவனமாக இருந்து, எதிரணியை அல்லது ஆளும் அணியைத் தோற்கடித்து மக்களிடத்தில் நல்ல அபிப்பிராயத்தைப் பெறுகின்ற ஒரு முயற்சிதான் இடம்பெறுகின்றதே தவிர, ஆளும் தரப்பு கொண்டுவருகின்ற நல்ல விடயங்களுக்கு எதிர்க்கட்சியினர் ஆதரவாக இருப்பதாகவோ அல்லது எதிர்க்கட்சியினர் கடந்தகால அனுபவத்தின் அடிப்படையில் கூறும் விடயங்கள் மக்களுக்கு வழிகாட்டியாக இருந்தால் அதை ஆளுந்தரப்பு ஏற்று நடப்பதாகவோ தெரியவில்லை. இருதரப்பினரும் ஒருவரையொருவர் குறைகூறுகின்ற விடயமே இங்கு நடைபெறுகின்றது.

நாங்கள் சிறுபான்மையினச் சமூகத்தின் ஊடாக இங்கே வருகை தந்திருப்பது, எங்களுடைய மக்களின் பிரச்சினைகளை இந்த அவையிலே கூறி, அதற்கான தீர்வை அந்த மக்களுக்குப் பெற்றுக் கொடுக்க வேண்டும் என்பதற்காகவே என்பதை இந்தப் பாராளுமன்றத்திலே பலமுறை கூறியிருக்கின்றோம். நாங்கள் எதிர்க்கட்சி வரிசையிலே இருப்பதனால் எங்களையும் சேர்த்து நீங்கள் பழிதீர்த்துவிடக் கூடாது. நாங்கள் புதிய பாராளுமன்ற உறுப்பினராக, இந்த அரசாங்கத்தின் மூலமாக மக்களுக்குப் பல பணிகளைக் கொண்டுசேர்க்க முடியும் என்ற நம்பிக்கையோடு வந்திருக்கின்றோம். அப்படியிருக்கும்போது, கடந்த அரசாங்கங்களின் பிழைகளைச் சுட்டிக்காட்டி, "இதுபோன்ற தவறுகளை நாங்கள் எதிர்காலத்திலே செய்ய மாட்டோம்; மக்களின் நன்மையின்பால் எங்களுடைய வேலைத்திட்டங்களைக் கொண்டுசெல்வோம்" என்று கூறி ஆட்சிக்கு வந்திருக்கும் உங்கள்மீது, "ஒரு மோசடியான விலைமனு கோரப்பட்டிருக்கின்றது" என்ற குற்றச்சாட்டை இன்று எதிர்க்கட்சியில் இருப்பவர்கள் இந்த நாட்டு மக்களுக்குச் சொல்கின்ற அளவுக்கு நீங்கள் நடந்திருக்கக் கூடாது என்பதையே நாங்கள் எதிர்பார்த்தோம். இவ்வாறான ஒரு வார்த்தையை எதிர்த்தரப்பில் இருப்பவர்களும் இந்நாட்டிலே இருக்கும் ஏனையவர்களும் பேச இடமளிக்காத வகையில் நாட்டைக் கொண்டு செல்லக்கூடியவர்களாக நீங்கள் இருப்பீர்கள் என்ற நம்பிக்கையோடுதான் நாங்கள் வந்தோம்.

ஆனால், நீங்கள் எல்லோரும் "இந்த நாட்டினுடைய ஜனாதிபதிக்கு இன்று 80 சதவீதமான நன்மதிப்பு மக்களிடத்தில் ஏற்பட்டிருக்கின்றது" என்ற விடயத்தை 'பட்டர்' பூசுகின்ற வகையில் கூறுகின்றீர்களே தவிர, "நான் சார்ந்த அமைச்சு சார்பாக அல்லது நான் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருந்து இந்த நாட்டுக்கு, மக்களுக்குப் பணி செய்திருக்கின்றேன்" என்று கூறுவதற்கு ஒருவரும் இல்லாமல் இருக்கின்ற அவல நிலையை இங்கே பார்க்கின்றோம். எதையெடுத்தாலும் "எங்களுடைய ஜனாதிபதி செய்திருக்கின்றார்" என்று அவரைப்பற்றி கூறுவதையே பார்க்கின்றோம். இன்று மாகாண சபை தேவையில்லை என்ற ஒரு நிலைப்பாட்டுடன் இருக்கின்ற நீங்கள், எதிர்காலத்திலே பாராளுமன்றம் என்று ஒன்று தேவையில்லையென்று தனி ஒரு

ஜனாதிபதியிடத்திலே இந்த ஆட்சியைக் கொடுத்துவிட்டுச் செல்கின்ற நிலைமையில் இருக்கின்றீர்களா என்றுகூட எங்களுக்கு நினைக்கத் தோன்றுகின்றது.

இவ்வாறான ஒரு சூழலிலே நாங்கள் சார்ந்திருக்கின்ற எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற பிரச்சினைகளை நாங்கள் முன்வைக்கின்றோம். அவ்வாறு எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற பிரச்சினைகளைப் பல தடவை எடுத்துக்கூறினாலும் அதற்குரிய தீர்வுகள் நடைமுறைப் படுத்தப்படவில்லை. கப்பல்கள் ஊடாக நிலக்கரி துறைமுகத்திற்கு வந்து திரும்பிச் சென்றது அல்லது வரவில்லை என்று நீங்கள் சாட்டுகளைச் சொல்லுகின்ற இந்தச் சந்தர்ப்பத்திலே நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்பு கின்றேன். அதாவது, ஒலுவிலிலே அந்தப் பிரதேசத்திலே யிருக்கின்ற மக்களுக்காக ஒரு பாரிய மீன்பிடித் துறைமுகமும் வர்த்தகம் சார்ந்த துறைமுகமும் ஆரம்பிக்கப்பட்டது. அந்த மீன்பிடித் துறைமுகம் சிறிது காலம் நடைமுறையில் இருந்தது; வர்த்தகம் சார்ந்த துறைமுகம் ஆரம்பிக்கப்பட்ட காலத்தி லிருந்து நடைமுறைப் படுத்தப்படவில்லை.

அந்தப் பிரதேசத்திலே ஏற்பட்டிருக்கின்ற கடலரிப்பின் காரணமாகவும் அந்தத் துறைமுகத்தினுடைய கட்டுமானப் பணிகள் முறையாக மேற்கொள்ளப்படாமையினாலும் இன்று கடல் மண்ணால் அந்தத் துறைமுகம் மூடப்பட்டு யாருக்கும் பிரயோசனம் இல்லாத வகையில் காணப்படுகின்றது. ஒன்றில், நீங்கள் அந்தத் துறைமுகத்தைப் பயன்பாட்டுக்குக் கொண்டு வரவேண்டும் அல்லது அதை முற்றுமுழுதாக மூடிவிட்டு, அந்தத் துறைமுகத்தைப் பாதுகாப்பதற்காகக் கற்களால் போடப் பட்டிருக்கின்ற அரண்களை அகற்ற வேண்டும். அவ்வாறு செய்கின்றபோது, பொதுமக்களுடைய காணிகள் பாதுகாக் கப்படும். அங்கு மருதமுனை தொடக்கம் திருக்கோவில் வரையில் இருக்கின்ற பிரதேசங்கள் கடலரிப்பினால் பாதிக்கப்பட்டிருக்கின்றன; பல ஊர்கள் முற்றுமுழுதாகச் சேதமுற்றிருக்கின்றன. அந்தப் பிரதேசத்திலே இருக்கின்ற தனியாருக்குச் சொந்தமான தென்னந் தோட்டங்கள், வயற் காணிகள் முற்றுமுழுதாகப் பாதிக்கப்பட்டிருக்கின்றன; அவர்கள் கிட்டத்தட்ட 250 ஏக்கருக்கும் மேற்பட்ட காணிகளை இழந்திருக்கின்றார்கள். அதற்கான நட்ட ஈடுகளைத் தருவதாக கடந்த காலங்களில் இலங்கை துறைமுக அதிகாரசபை மற்றும் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் மூலமாக மதிப்பீடுகள் பெறப்பட்டிருந்தும் இதுவரை காலமும் எந்தவிதமான நட்ட ஈடும் கொடுக்கப்படவில்லை. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தேர்தல் காலங்களில் அங்கு வந்தபோது அந்தத் துறைமுகத்தின் பணிகளைச் செய்வோமென வாக்குறுதி வழங்கியிருந்தார். ஒன்றில், அந்தத் துறைமுகத்தைப் பயன் பாட்டுக்குக் கொண்டுவாருங்கள் அல்லது மக்களுடைய காணிகளுக்கான இழப்பீட்டைக் கொடுங்கள்!

அண்மையிலே ஏற்பட்ட கடலரிப்பின் காரணமாக நிந்தவூரில் இருந்த பல தோட்டங்கள் முற்றுமுழுதாகச் சேதமாக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, அட்டப்பள்ளப் பிரதேசம் மிகக் கடுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அந்தப் பிரதேசத்திலே பெயர்போன இஸ்மாயில் மாஸ்டருடைய 4 ஏக்கர் தோட்டம் முற்றுமுழுதாக இரண்டு வார காலத்துக்குள் கடலுக்குள் மூழ்கடிக்கப்பட்டுள்ள கண்ணாற் காண முடியாத ஒரு காட்சியை நாங்கள் கண்டிருக்கின்றோம். இது தொடர்பாக நாங்கள் பலமுறை கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரிடமும் துறைமுகத்துக்குப் பொறுப்பான அமைச்சரிடமும் கூறியிருக்கின்றோம். அதற்கு அவர்கள், “வெளிநாட்டு நிறுவனங்கள் வந்திருக்கின்றன; அவற்றின்மூலம் நாங்கள் இதைச் செய்வதற்கு முயற்சிக்கிறோம்” என்று கூறியிருக்கிறார்களே தவிர, இதுவரை எதுவும் நடந்தேற வில்லை.

இவ்வாறான ஒரு சூழ்நிலையிலே அம்பாறை மாவட்டத்திலே தொடர்ச்சியாக ஒரு வார காலமாகக் கனத்த மழை பெய்து வருகின்றது; விவசாயிகள் அறுவடைக்குக் கஷ்டப்படுகின்றார்கள். அந்தப் பிரதேசம் கடலினாலும் மேலேயிருந்து வருகின்ற மழை நீரினாலும் மேற்குப்புறங்களில் இருந்து வருகின்ற நீரோட்டத்தினாலும் முற்றுமுழுதாகச் சேதமாக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. எனவே, இவ்வாறான எங்களுடைய பிரச்சினைகளையும் தீர்த்து வைப்பதற்கான நடவடிக்கைகளை எடுக்குமாறு அரசாங் கத்திடம் விநயமாகக் கேட்டுக்கொள்வதோடு, எதிர்க்கட்சியும் ஆளும் கட்சியும் குடுமிச் சண்டை போடுவதை விடுத்து, அந்த மக்களுக்கு எதையாவது செய்ய வேண்டும் என்ற நல்லெண்ணத்தோடு இந்தப் பாராளுமன்றத்தைப் பயன்படுத்த வேண்டுமென்றும் கேட்டு, விடை பெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.25]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම ඔබතුමා වාගේ කෙනෙක් මූලාසනයේ සිටියදී මට අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා. විශේෂයෙන්ම පොදුවේ මේ විපක්ෂය විසින් අප වෙත ගෙනෙන චෝදනා පිළිබඳව බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විෂයානුගත කාරණාව දකිනකොට මට මතක් වෙන්නේ ඊයේ මෙතැනදී ගෑස් ටෙන්ඩරය සම්බන්ධව කියපු කාරණා. ඒ ගෑස් ටෙන්ඩරය දීපු එක හොඳ නැහැ කිව්වා. හැබැයි, පොදු ගුණාකාරය තමයි ගෑස් ටෙන්ඩරය අඩුම ටෙන්ඩරය කියන එක. අද මේ කියන ගල් අඟුරු සම්බන්ධ ටෙන්ඩරයත් ගණනින් අඩුම ටෙන්ඩරය.

අපි හොඳ දේශපාලන සංස්කෘතියක් වර්ධනය කර තිබෙනවා. අවුරුදු 3කට පසුව තමයි මේ ටෙන්ඩරය - මොකද, අතීතයේ මේවාත් කැබිනට් පත්‍රිකාවලින් ගියේ. හැබැයි, 2/3ක බහුතර බලයක් සහිත ආණ්ඩුවක් වුණත්, ශක්තිමත් කැබිනට් මණ්ඩලයක් සහිත ආණ්ඩුවක් වුණත් අපි මෙතැනදී හොඳ සුසංයෝගයක් තුළ ටෙන්ඩර් ක්‍රියාවලියකට ගිහින් තිබෙනවා. හැබැයි, ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය තුළ යම් යම් තාක්ෂණික කාරණා කිහිපයක් මතු වුණා. ගෑස් ටෙන්ඩරයේදීත් මතු වුණා, මේකෙදීත් මතු වුණා. එම තාක්ෂණික කාරණාවලට අපි මුහුණ දෙනවා. මේක, "ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන් මෙහෙම වුණා, මාරයි! මෙන්න මේ ටෙන්ඩර් ක්‍රියාවලිය ඇතුළේ මෙහෙම සිද්ධියක් වුණා" නොවෙයි. ඉතිහාසයේ තමුන්නාන්සේලා බලයේ හිටපු කාලයේ; නියෝජ්‍ය ඇමතිවරු වශයෙන් සිටි කාලයේ මෙවැනි සිදුවීම් වෙලා තිබෙනවා. ඒ නිසා මේක මෙහෙම වුණු ප්‍රථම කාරණාව නොවෙයි.

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගත්තාම, මෙය පොදුවේ විපක්ෂය විසින් අද දවසේ ගෙනෙන ලද යෝජනාවක්. අද විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගොඩක් සභා ගර්භය තුළ ගැවසෙනවා. ඒක හොඳයි. විපක්ෂයෙන් නේ, මේ යෝජනාව ගෙනාවේත්. ඒ නිසා මන්ත්‍රීවරුන් ගොඩක් ගැවසෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභා ගර්භයේදී බෙදීමක් - Division එකක් - ඉල්ලන අවස්ථා අපි දැක තිබෙනවා. හැබැයි, එහෙම බෙදීමක් ඉල්ලුවාට ඒ ඉල්ලන මන්ත්‍රීවරයා විතරයි ඉන්නේ. එහෙම කරලා මේ සභාවේ කාලය කා දමනවා. කමක් නැහැ. එහෙම ඉල්ලන එක, ඒක ඒගොල්ලන්ට තිබෙන අයිතියක්. නමුත් අපි දැක තිබෙනවා, සමහර වෙලාවට, - ඊයේ වුණත් විපක්ෂයේ කවුරුවත් විවාදය අවසාන වෙනකම් හිටියේ නැහැ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දොරේ සද්දෙයි, බෙරේ සද්දෙයි අපට පොඩ්ඩක් බේරා ගන්න පුළුවන්. අපි ඒක හඳුනනවා. නජිත් මන්ත්‍රීතුමා සමාගමක නමක් කියපු ගමන්, භූමිතෙල් වැදුණු ගැරඬියා වාගේ "ටක්" ගාලා නැඟිටලා කෑ ගහන්න පටන් ගත්තා. මේ වෙන මොකක්වත් නිසා නොවෙයි. මේ සමාගම් පිටුපස සිටින්නේ, මේ සමාගම් පිළිබඳව ලොකු දැහලිල්ලක් තිබෙන්නේ කාටද? ඒ දැහලිල්ලෙන් අපට එය තේරුම් ගන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ Motion එකේ බැලූ බැල්මට වැරැද්දක් තිබෙනවා. ඒ වැරැද්ද සම්බන්ධව අඩුම ගණනේ විපක්ෂයේ වෙනත් කථික මහත්මයෙක් හෝ කියන්න ඕනෑ. වැරදි Motion එකක් සම්බන්ධව අපි මේ සභාව තුළ තර්ක කරනවා. ඒ මොකක්ද? මේ යෝජනාවේ තිබෙනවා, "...2025-2026 ගල් අඟුරු වාරය සඳහා ලක්විජය ගල් අඟුරු විදුලි බලාගාරයට අවශ්‍ය වන ගල් අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 12.32ක ප්‍රමාණය සපයා ගැනීම..." යනුවෙන්. හිටපු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම යම් කාරණයක් අහනවා. මේ මිලියන 12.32 කියන අයිතමය වැරදියි. මේකේ සාමාන්‍ය අගය 1.5යි, වැඩිම වුණොත් 2.25යි.

හැබැයි, මේ වැරදි Motion එක ගැන අපි තවම තර්ක කරනවා. එය එකක්. අනෙක් කාරණය මේකයි. යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමා කිව්වා, ඇමතිතුමාගේ අම්මාගේ ගිණුමකට සල්ලි ආවා කියලා. කොහේද? හෝමාගම බැංකුවේ. එතුමා ඒක කිව්වා, දිව්වා. කිව්වා, දිව්වා. ඊට පසුව අභියෝගයක් කරනවාය කියලා මෙන්න ලියවිල්ලක් උස්සගෙන ආවා. හිටපු අපේ මන්ත්‍රීවරු වාහන පර්මිට් අරගෙන තිබෙනවා කියලා කිව්වා. අපි වාහන පර්මිට් ගත්තේ නැති බවක් කියලා නැහැ නේ. අපි අරගෙන තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලා වාගේ අපි ඒ පර්මිට් එකක්වත් විකුණලා නැහැ. හරිද? අපි ඒ පර්මිට් එකක්වත් විකුණලා නැහැ. අපට - *[බාධා කිරීම්]* ඔව්, වාහනය ගත්තා. ඇත්ත. ඒක අභියෝගයක් ලෙස ආවේ නැහැ. එතුමා අභියෝග කළේ, පුළුවන් නම් ඇමතිතුමාගේ අම්මාගේ ගිණුම් අංකය ඇතුළු තොරතුරු ටික දෙන්න කියලා. හැබැයි, ඒක කිව්වා විතරයි ඊට පසුව දැක්කේවත් නැහැ. ඒ විස්තර සභාගත කරන්න ආවා. හැබැයි, යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා අතුරුදහන් වී ඇත. හරි ද?

ඊට පසුව කිව්වා, අපේ ගරු ඇමතිතුමාව උසාවියෙන් වරදකාරයෙක් කරලා තිබෙනවාය කියලා. මම කියනවා, අන්න ඒ නඩු අංකය මට ගෙනැල්ලා දෙන්න කියලා. උසාවියකින් වරදකාරයා කළා නම් වරදකාරයා කළ නඩුවේ නඩු අංකය මට ගෙනැල්ලා දෙන්න. එය සරල කාරණයක්. දැන් නැත්නම් පසුව හෝ දෙන්න. ඊට පසුව කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට චෝදනාවක් ඉදිරිපත් කර තිබෙනවාය කියලා. ඔව් තිබෙනවා. ඒ එක්කම කිව්වා, "බලපෑමක් කරලා දැන් විභාග නොකර තියාගෙන ඉන්නවා"යි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තුනෙන් දෙකේ බලයක් සහිත ආණ්ඩුවක් තිබෙනවා. අපි තමයි ඉතිහාසයේ ප්‍රථම වතාවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) අනුව්‍යවස්ථාවට පණ දුන් මිනිස්සු. තේරුණාද? අපි මේ කිසිවකට බලපෑමක් කරන්නේ නැහැ. අපි බලපෑමක් කරනවාය කියලා, පුළුවන් නම් පාර්ලිමේන්තුවෙන් එළියේදී කියන්න. අපි, අපේ එකා කියලා බේරලා නැහැ. යම් යම් අවස්ථාවල අපට යම් යම් තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වුණා. හැබැයි, "අපේ" කියලා අපි කවුරුවත් බේරලා නැහැ. අපි දන්නවා පදනම් විරහිත අල්ලස් චෝදනාවක් තිබෙන බව. ඒකේ පදනමක් නැහැ. පදනම් විරහිත අල්ලස් චෝදනාවට අපි මුහුණ දෙනවා. එදාට බලමු. කිසි ප්‍රශ්නයක් නැහැ, අපි එදාට බලමු. පදනම් විරහිත අල්ලස් චෝදනාවට අපි මුහුණ දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා දැන් මේ මොකක්ද කරන්න හදන්නේ? දැන් මේ කරන්න හදන්නේ, "අපි කළුයි; ඔයගොල්ලෝත් පොඩ්ඩක් මේක ගාගන්නකෝ" කියන එකයි. අර ගීතයක් තිබෙන්නේ, "බිංකුණ්ඩෝ බොල බිංකුණ්ඩෝ, තෝත් නටාපිය මාත් නටන්නම්" කියලා. ඒගොල්ලන්ගේ නැටිලි ටික අපිත් නටන්න ඕනෑ. ඒකද කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විපක්ෂයේ තිබෙන සමහර හිරිකිත හැසිරීම් එක්ක අපට යම් යම් ගැටලු තිබෙනවා. අපි දැන් නීතිය සහ විධානයට අදාළ කරුණු කාරණා ප්‍රමාණයක් ඉටු කරමින් යනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හරහා වෙන්න පුළුවන්, නීතිපති දෙපාර්තමේන්තුව හරහා වෙන්න පුළුවන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හරහා වෙන්න පුළුවන්, ඒ සියල්ල සිදු වෙමින් යනවා. ආණ්ඩු බලය ගන්න කලින් අපි කිව්වා, අපි හරියටම මේ දිහා බලලා ඊට අදාළ නීතිමය කටයුතු ක්‍රියාත්මක කරනවා; හැබැයි, කෙඳිරි ගාන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් තමන් ළඟට ගෙන්වා ගත් යුගයක් තිබුණා. හැබැයි, දැන් නීතිය කාටත් එකයි. ඒ කැඳවා තිබෙන අය ඒ ඒ ස්ථානවලට යන්න ඕනෑ. මම දන්න විධියට අද මෛත්‍රී වික්‍රමසිංහ මහත්මියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එන්න කියලා තිබුණා. මොකද, මම දන්න විධියට ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව 2026.04.19 වනකොට ඒ ගොනුව හදලා නීතිපතිවරයාට යවන්න ඕනෑ. නමුත් අද එතුමිය එහි පැමිණ නැහැ. අසනීප තත්ත්වයක් වෙන්න ඇති. මීට කලින් "සිරිලිය" ගිණුමට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එන්න කියලා ශිරන්ති වික්‍රමසිංහ මහත්මියට දැනුම් දුන්නාම එතුමිය කල් අරගෙන, කල් අරගෙන පසුව ගිහිල්ලා තිබුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා තිබුණා. කලින් තිබුණු තත්ත්වය මොකක්ද? තමන් ළඟට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, තමන් ළඟට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, තමන් ළඟට පොලීසිය එන්න ඕනෑ. දැන් ඒ වෙනුවට අපි දේශපාලන පරිවර්තනයක් කරලා තිබෙනවා. අපි කාටත් එකයි. අපේ කෙනාටත් එකයි, අනෙක් අයටත් එකයි. නීතිය හැමෝටම සමානයි කියන කාරණාව අපි මහ පොළොවේ තහවුරු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයක් ඇතුළේ මේ කථාවල් මොනවාද? මේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට අදාළව ඇත්තටම තාක්ෂණික කාරණාවක් විතරයි ඉතුරු වෙලා තිබෙන්නේ. යම් ගැටලුවක් ඇති වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමා පැහැදිලි කළා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
OD එකක් තිබුණා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒකත් දෙකයි දශම දෙකක වාගේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මිලියන 100ක්?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හරි, ඒකට වන්දි අරගෙන තිබෙනවා. ඊට අදාළ මැදිහත්වීම් කරමින් යනවා. නමුත් අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රශ්නයකට තියාගෙන නැහැ. අපි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළ කටයුතු කරනවා. මෙච්චර ශක්තිමත් ආණ්ඩුවක් තියාගෙන, කැබිනට් මණ්ඩලයේ බලය ඒකට පාවිච්චි කරලා නැහැ. ඔබතුමන්ලා ඒක මතක තියා ගන්න. මෙච්චර ශක්තිමත් ආණ්ඩුවක් තියාගෙන, ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුව තමයි ඒ දේවල් කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මෙතැන කෑ ගැහුවා නේ, මෙතුමාව වරදකාරයෙක් කරලා කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම උත්තර දෙන්නම්?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කොයි උසාවියෙන්ද වරදකාරයෙක් කරලා තිබෙන්නේ? පලු පැළෙන බොරුවක් නේ කිව්වේ. මට විස්තර ඕනෑ නැහැ. මට නඩු අංකය කියන්නකෝ. නඩු අංකය කියන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
උත්තර දෙන්නද?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔහොම කෑ ගහලා කියන්න. මට ඇහෙනවා, ඔබතුමාගේ කටහඬ. ඔය හදන්නේ වෙන විස්තරයක් කියන්න. මම අහන්නේ සරල ප්‍රශ්නයක්. අජිත් පී. පෙරේරා මහත්මයා, මම කියන්නේ මෙතුමා වරදකාරයා කරපු නඩු අංකය කියන්න කියන එකයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාදයකට යන්නේ නැතුව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සියලු කරුණු කාරණා කරන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යටත්ව.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අපේ බලශක්ති ඇමතිතුමා කම්කරු විනිශ්චය සභාවේ එතුමා විසින්ම දාපු නඩුවේදී, එතුමා වරදක් කළා කියන පදනම මත එතුමාව ධුරයෙන් පහ කිරීම තහවුරු කළා. ඒක තමයි වෙච්ච දේ. කම්කරු උසාවියත් අධිකරණයක් තමයි. දූෂණය පිළිබඳ පරීක්ෂණය තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් කරන්නේ. ඒකේ අංකය බලාපොරොත්තුවෙන් ඉන්න. ඒකට කොච්චර බලපෑම් කළත් නතර කරන්න බැහැ. ඒ වාගේම ඔබතුමා කිව්වා නේ, අලාභ ගත්තා කියලා. තවම අලාභ දීලා නැහැ. අදාළ සමාගම අලාභ දීම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වාදයකට ගියොත් ලොකු වෙලාවක් ගත වෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලාභ අය කරලා තිබෙන්නේ අපේ ගරු ඇමතිතුමාගෙන් නොවෙයි. අලාභ ගෙවන්න කියලා නිර්දේශ කරලා තිබෙන්නේ, ඒ අදාළ සමාගමට. ඒක නිසා අපේ ඇමතිතුමාට විරුද්ධව අධිකරණ තීන්දුවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දිගින් දිගටම පිළිතුරු දෙන්න ගියොත් වාදයකට යන්න වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මෙතැන පට්ටපල් බොරු කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වාදයකට යන්න එපා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
විපක්ෂයේ පොදු ස්වභාවය ඕක තමයි. පට්ටපල් බොරුවක් මෙතැන අතහරිනවා, දුවනවා. අතහරිනවා, දුවනවා. මම ඉතා සරල ප්‍රශ්නයක් නේ ඇහුවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දිගින් දිගටම වාදයකට යන්නේ නැතුව කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අපි LT එකේ දාපු නඩුව සාර්ථක වුණේ නැහැ, ඇත්ත.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පරාදයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි, නඩුව පරාද වෙලා මොකක්ද වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මාතෘකාවෙන් බාහිරව කථා කරන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නඩුව පරාදයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
නඩුව පරාද වුණා නම් ගෙවන්න එපා යැ. මොනවාද ගෙවලා තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කථාව අවසන් කරන්න. ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
කොහේද නඩුව පරාද වෙලා තිබෙන්නේ? නඩුවක් පරාද වෙලා නැහැ. ඔබතුමාට කියන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අනවශ්‍ය කාරණාවලට දිගින් දිගටම කාලය වැය වෙනවා.

මීළඟට, ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.39]

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ විපක්ෂය විසින් නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරයේ ගල්අඟුරු මිලදී ගැනීම පිළිබඳව ඉදිරිපත් කර තිබෙන ගැටලුවට අදාළව සභාව කල් තබන අවස්ථාවේ විවාදයට සහභාගී වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර් හිතවත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු මේ යෝජනාවේ සඳහන් වෙනවා, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව, සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාව, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය හා ප්‍රමාණවත් නෛතික බැඳීම් පිළිබඳ ප්‍රශ්න කරන බව. මම උදේ 11.30 සිට දැන් හෝරා හතරක්, පහක් වෙනකල් මෙතැන සියලු කථා අහගෙන හිටියා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කිසිම කථාවකදී මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට සප්‍රමාණව කරුණු ඉදිරිපත් කළේ නැහැ. *[බාධා කිරීම්]* ඔය හිනාවෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාත් ඇතුළුව සියලුදෙනා ඉදිරිපත් කළේ හිතලු විතරයි. ඒ ඉදිරිපත් කරපු සියලු තර්කවලට සංඛ්‍යා දත්ත එක්ක අපේ ඇමතිතුමාත් පිළිතුරු ලබා දුන්නා. ඉදිරියේදී නියෝජ්‍ය ඇමතිතුමාත් පිළිතුරු ලබා දේවි. විපක්ෂය මේ මොකක්ද කරන්න හදන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තර්ක ක්‍රමයක් තිබෙනවා, තර්කයට අදාළව කරුණු ඉදිරිපත් කරන්නේ නැතිව අදාළ පුද්ගලයා විවේචනය කරලා, පුද්ගලයාගේ ක්‍රියාකලාපය විවේචනය කරලා, තමන් ගොඩනහන තර්කය ඔප්පු කරන. ඒකට කියන්නේ, "පුද්ගලාලම්භන තර්කාභාෂය" කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුනි නමුත් කියන්න කනගාටුයි, අද දවසේ ඔබතුමන්ලාගේ උත්සාහය නිෂ්ප්‍රමාණ වුණා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපට පැහැදිලියි, අද කථා කරපු මේ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ වේදනාව. ඒ දුක අපට තේරෙනවා. ඇයි, ඒ දුක? පසුගිය වසර ගණනාවක් තිස්සේ ටෙන්ඩර් එකක් නොදී, කැබිනට් මණ්ඩලයෙන් approve කරලා තමයි ගල්අඟුරු ගෙන්නුවේ. දැන් ඒකට ටෙන්ඩර් එකක් දෙනකොට දැනෙන වේදනාව අපට තේරෙනවා. කෝ, පොඩි හනුමා? අද ඇවිල්ලා නැහැ. තමන්ගේ හාම්පුතාව අනාගතයේදී අයිස්ලන්තයේ ජනාධිපති කරන්නයි හිතාගෙන ඉන්නේ. ඔහුට, ඔහුගේ මල්ලිට, මල්ලිගේ හිතවත් සමාගම්වලට ටෙන්ඩර් නැතිව ගල් අඟුරු ගෙන්වන්න ඉඩ දීපු එක වෙනුවට නව රජය බලයට පත් වෙලා ටෙන්ඩර් පටිපාටියෙන් ගල් අඟුරු ගෙන්වනකොට මේ කැගහපු අයට දැනෙන වේදනාව පැහැදිලියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, හයියෙන් කෑගැහුවාට සත්‍යය වෙනස් වෙන්නේ නැහැ. ඔය කෑගහපු අයගේ පැටිකිරිය, එහෙම නැත්නම් අතීතය මේ රටේ ජනතාව දන්නවා.

අනෙක් අතට මොකක්ද මේ තිබෙන්නේ? මේ තිබෙන්නේ වේදනාව. මේ විපක්ෂයේ හැමදෙනාම දෙපැත්තට බෙදිලා හිටියාට එක මල්ලේ බඩු. ජාතික ජන බලවේග රජය බලය ගන්නකොට වේදිකා දෙකක ඉඳගෙන මේ අය මොනවාද කිව්වේ? මාස 3ක් යනකොට තෙල් පෝලිම් එනවා කිව්වා; ආයෙත් ලයිට් කපනවා කිව්වා. ඒක නොවීමේ දුක තමයි මේ ඉදිරිපත් කරන්නේ.

මම අහගෙන අද මේ යෝජනාව ඉදිරිපත් කරමින් මරික්කාර් මන්ත්‍රීතුමා උදේම කිව්වා, "නැවත රට අඳුරේ තබා දේශපාලනය කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ" කියලා. ඔය පිටවුණේ කටින්. මේ විවාදය අහන, මේ විවාදය බලන මිලියන 22ක ලාංකිකයෝ තේරුම් ගන්න ඕනෑ, මේ වේදනාව මොකක්ද කියලා. විපක්ෂය හිතුවා, විදුලි බලය, ඉන්ධන ඇතුළු බලශක්තිය සම්බන්ධව මේ රජය නිසි ක්‍රියාමාර්ග ගන්න එකක් නැහැ කියලා. මොකද, ඒ ඒගොල්ලන්ගේ සමාගම්; හිතවතුන්ගේ සමාගම්. නම් කිහිපයක් කියවෙනකොට අපේ වටගල සහෝදරයා කිව්වා වාගේ හැමෝම දැක්කා, භූමිතෙල් ගැවුණු ගැරඬි කවුද කියලා. අපේ රට බලශක්තියෙන් අනාරක්ෂිත වෙලා නැවත පෝලිම් යුගයකට, නැවත රට අඳුරේ තබන යුගයකට යෑම තමයි මේ සුන්බුන් කුහක විපක්ෂයේ බලාපොරොත්තුව වුණේ. කුමාර ජයකොඩි සහෝදරයා ඇතුළු මේ ඇමති මණ්ඩලය, විෂය භාර අමාත්‍යාංශය මොකද කළේ? විපක්ෂයේ ඒ බලාපොරොත්තුව සුන් කළා. විපක්ෂ මන්ත්‍රීතුමන්ලා කියපු විධියට ඔවුන් බලාපොරොත්තු වුණා, නැවත විදුලි කප්පාදුවක් කරලා රට අඳුරේ තබන්න. ඒවාට ඉඩ දෙන රජයක් නොවෙයි දැන් තිබෙන්නේ. ඒ නිසා එතුමන්ලාගේ වේදනාව අපට පැහැදිලියි, ඒ දුක අපට තේරෙනවා. හැබැයි, සොරි තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. නව රජය බලයට පත් වනකොට ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල තිබුණේ රුපියල් 332ට. දැන් රුපියල් 292යි. රුපියල් 40ක් අඩුවෙලා තිබෙනවා. මේවා හිතපු නැති දේවල්. කිව්වේ කොහොමද? ඩොලරයේ අගය රුපියල් 500ට, 600ට, 700ට යයි කියලා. එම නිසා දැන් වන දේවල් මේ අයට හිතාගන්න බැහැ. දැන් පෙට්‍රල් මිල අඩුයි. ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක මිල තිබුණේ රුපියල් 377ට. දැන් රුපියල් 340යි. අද වනකොට රුපියල් 37ක් අඩුවෙලා තිබෙනවා. ඩීසල් ලීටරයක මිල තිබුණේ රුපියල් 307ට. දැන් රුපියල් 277යි. රුපියල් 30ක් අඩුවෙලා තිබෙනවා. භූමිතෙල් ලීටරයක මිල තිබුණේ රුපියල් 202ට. අද රුපියල් 182යි. රුපියල් 20ක් අඩුවෙලා තිබෙනවා. ඉතින්, ඕක තමයි රිදෙන්න හේතුව. ඉවසාගෙන ඉන්න. අපට බලය ලැබුණේ අවුරුදු 5කට. ඒ අවුරුදු 5 තුළ ගන්නා ක්‍රියාමාර්ග දෙස බලාගෙන ඉන්න. කලබල වෙන්න එපා; හදිසි වෙන්න එපා. හදිසි වෙලා නාගන්න එපා, සභාව කල් තබන අවස්ථාවේ මෙහෙම යෝජනා ගෙනැල්ලා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරපු එස්.එම්. මරික්කාර් හිතවත් මන්ත්‍රීතුමා ඉතාම අපහාසාත්මක ප්‍රකාශයක් කළ බව. මොකද, තමන් ගැන හිතලා නේ, අනුන් ගැන හිතන්නේ; තමාට උපමා කර තමයි අනුන් ගැන හිතන්නේ. එතුමා චෝදනාවක් කළා, කුමාර ජයකොඩි ඇමතිතුමාගේ බිරිඳගේ මවගේ නමින් හෝමාගම බැංකුවක ගිණුමක් තිබෙනවා කියලා. ඒක කියපු වෙලාවේ සිට එතුමා මේ සභාවේ නැහැ. අපි බලාපොරොත්තු වනවා, ඒ මන්ත්‍රීතුමා ඒ ගැන විස්තර ඉදිරිපත් කරයි කියලා. නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් මේ සම්බන්ධයෙන් විපක්ෂයට අභියෝග කළා. ආණ්ඩු පක්ෂයේ තවත් කිහිපදෙනෙකුත් මේ සම්බන්ධයෙන් අභියෝග කළා. කෝ, මරික්කාර්? මරික්කාර් කෝ දෙන්න, ගිණුම් අංකය. නැත්නම් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලන්න. කුමාර ජයකොඩි ඇමති සහෝදරයාගෙන් විතරක් නොවෙයි, එතුමාගේ බිරිඳගෙනුත් සමාව ඉල්ලන්න, බිරිඳගේ මෑණියන්ගෙනුත් සමාව ඉල්ලන්න. ඔයගොල්ලන් කරන දේශපාලනය නොවෙයි අපේ දේශපාලනය. අමූලික බොරු කියලා පැත්ත පළාතක දැන් නැහැ.

ඒ වාගේම අද උදේ යෝජනාව ඉදිරිපත් කරමින් කළ කථාවේදී මරික්කාර් මන්ත්‍රීතුමාගේ කටින්ම පිට වුණා, බොරු කියලා රවටපු දේශපාලන යුගය දැන් අවසන් කියලා. ඒක තමයි මරික්කාර් මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයට අපටත් කියන්න තිබෙන්නේ. බොරු කියලා ජනතාව රවටපු යුගය දැන් අවසානයි. දැන් තිබෙන්නේ අලුත් දේශපාලන යුගයක්; අලුත් දේශපාලන සංස්කෘතියක්. ඒක බිහි කළේ තමුන්නාන්සේලා නොවෙයි. තමුන්නාන්සේලා පසුගාමී චරිත. තමුන්නාන්සේලා මේ සමාජ ක්‍රමය නැවත වැඩවසම් ක්‍රමයකට අදින චරිත. ජාතික ජන බලවේගය වටා එකතු වෙච්ච ඒ මහා ජන ගඟ තමයි මේ සමාජය ඉදිරියට අරගෙන ගියේ. තමුන්නාන්සේලා තවමත් විශ්වාස කරනවා නම් බොරු කියමින්, මඩ ගසමින්, අවලාද නඟමින් ලංකාවේ ජනතාව රවටන්න පුළුවන් කියලා. ඒකටත් සොරි තමයි. කිහිපදෙනෙකුට පොඩි වින්දනයක් ගන්න පුළුවන්. හැබැයි, ලංකාවේ පොදු ජනතාව නම් මේවාට සැලෙන්නේ නැහැ.

ඒ වාගේම මරික්කාර් මන්ත්‍රීතුමා එතුමාගේ යෝජනාවේදී කිව්වා, මිනිස්සු පාරට බස්සනවා කියලා. අද උදේ අපි දැක්කා, සජබයේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තු පිවිසුමේ විරෝධයක් කරනවා. ඒක සම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ලංකාවේ මිනිස්සු ටික පාරට බස්සන්න කලින් අඩු ගණනේ සජබයේ මන්ත්‍රීවරු ටිකවත් එතැනට ඇවිල්ලා නැහැ. කෝ! සජබයේ මන්ත්‍රීවරු? එතැන ඔක්කෝම හිටියාද? නැහැ. ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමනි, මිනිස්සු පාරට බස්සන්න කලින් තමන්ගේ මන්ත්‍රීවරුන් ටික පාරට ගේන්න. ඔවුනුත් නැහැ. මොකද, මේ සමහරුන්ගේ එක කකුලක් සජිත් ළඟ, අනික් කකුල රනිල් ළඟ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පෙනෙනවා, මේ දවස්වල විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම පිළිබඳව. ඔවුන් මුලින් උත්සාහ කළා, අනුර දිසානායක සහෝදරයා ඉලක්ක කරලා චෝදනා නඟන්න. ඒක වැඩක් වුණේ නැහැ. ඊළඟට ඔවුන් මේ දවස්වල උත්සාහ කරමින් ඉන්නවා, ජාතික ජන බලවේග රජයේ කැබිනට් ඇමතිවරු, ඇමති සහෝදරයන්, ඇමති සහෝදරියන් වෙන් කරලා පහර දෙන්න. එතුමන්ලා මේකත් මතක තියාගන්න ඕනෑ. ඒ සියලු උපක්‍රම අපිත් දන්නවා. අපිත් මේ දේශපාලනයට අහසින් පහත් වෙච්ච මිනිස්සු නොවෙයි. මේ පාර්ලිමේන්තුවට අපි ආවේ හොඳට තෙම්පරාදු වෙලා. අපි පාර්ලිමේන්තුවේ හිටියේ නැති වුණාට, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් 159දෙනාම ප්‍රාදේශීය සභාවල ජාතික ජන බලවේගය නියෝජනය කරපු සභිකයින්. අපේ සභිකයින් 4,000කට වැඩි පිරිසක් බිමේ දේශපාලනයේ හොඳට තෙම්පරාදු වෙලා ඉන්නේ. ඒ හින්දා වටගල සහෝදරයා කිව්වා වාගේ අපි දොරේ සද්දෙයි, බෙරේ සද්දෙයි දෙකම හඳුනනවා. අපේ ඇමතිවරුන්ව වෙන් කරලා, කොන් කරලා අරගෙන පහර දෙන්න එන අරමුණ මොකක්ද කියලා අපට තේරෙනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ කාලයේදී අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය සහෝදරිය වෙන් කරලා පහර දෙන්න උත්සාහ කළ ආකාරයත් අපට මතකයි. අපි ආණ්ඩුවක් විධියට එතුමියව රැක්කා. දැන් ටික කාලයකට කලින් අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර සහෝදරයාව වෙන් කරලා පහර දෙන්න උත්සාහ කළා. අද මේ උත්සාහ කරන්නේ මොකටද? අද උත්සාහ කරන්නේ කුමාර ජයකොඩි සහෝදරයාව වෙන් කරලා පහර දෙන්න. කුමාර ජයකොඩි සහෝදරයා මේ දේශපාලනයට ඇවිල්ලා ගල්අඟුරු වංචාවක් කරලා මුදල් හම්බ කර ගන්න ඕනෑ

[ගරු රුවන් මාපලගම මහතා]

කෙනෙක්ද? එතුමා ඉංජිනේරුවෙක්. එතුමා රුපියල් ලක්ෂ ගණනක වැටුපක් දාලා ඇවිත් ඉන්නේ ස්වේච්ඡාවෙන් මේ වැඩේ කරන්න. රට ගොඩ ගන්න වැඩේ කරන්නයි එතුමා එකතු වෙලා තිබෙන්නේ. එහෙම ඉන්න ලක්ෂ ගණනක පිරිස අතර කුමාර ජයකොඩි සහෝදරයා එක්කෙනෙක්. අපි අපේ අයට වෙන් කරලා ගහන්න දෙන්නේ නැහැ. එතුමන්ලාගේ ඒ අරමුණ දැන් ඉවරයි. ආයෙත් එහෙම ගහන්න කාටවත් එන්න දෙන්නේ නැහැ. මේ සභාවේ ඉන්න ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනාම එක හඬින් මේ ආණ්ඩුව රකිනවා. ඇමතිවරුන්ට තනි කරලා, වෙන් කරලා ගහන්න ඉන්නවා නම් ඒවා සුම්මා තමයි. ආයෙත් එහෙම කරන්න දෙන්නේ නැහැ. ඒ වාගේම ගල් අඟුරු ගැන විවාදයක් ගෙනාපු විපක්ෂයට අද ගලුත් නැහැ, අඟුරුත් නැහැ; සොරි තමයි!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ තිබුණේ "හිඟමන් ලයිෆ්", දැන් තිබෙන්නේ "සිනමන් ලයිෆ්". මෙතුමන්ලා අපට කිව්වා, බලපෑම් තිබෙනවා නම් කියන්න කියලා. මගේ කථාව ආරම්භ කරන්න කලින් එහෙම කියපු නියෝජ්‍ය ඇමතිතුමාගේ දැනගැනීම සඳහා මම ලිපියක් සභාගත කරන්න ඕනෑ. මේ ලියුම යවලා තිබෙන්නේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය. කාටද මේක යවන්නේ? කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාට තමයි මේක යවන්නේ. මොකක්ද මේකෙන් කියන්නේ? "ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කරමින් සිටින, -මම නම කියන්නේ නැහැ, හොඳ නැහැ නේ- යන අය විසින් අවස්ථා කිහිපයකදීම ඉඩම් රාජකාරිවලදී ප්‍රාදේශීය ලේකම්වරු වෙත විවිධ බලපෑම් එල්ල කරමින් ලිපි ඉදිරිපත් කරන බව අප සංගමය වෙත වාර්තා වී ඇත." ඒ අනුව මේ දේශපාලන බලපෑම් කරන්න එපා කියලා තමයි කියන්නේ. ඔන්න, නියෝජ්‍ය ඇමතිතුමා ශ්‍රී ලංකා ප්‍රාදේශීය ලේකම්වරුගේ හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය විසින් යවන ලද එම ලිපිය මම **සභාගත*** කරනවා.

ඔබතුමාට පුළුවන්, මේ සම්බන්ධයෙන් හෙට දිනයේදී එළියේ කියන්න. මේ අය කියන ඒවා මේ අයගේ කථාව කරන්න කලින් අපට ඔප්පු කරලා පෙන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව එන්න කලින් තේමාවක් තිබුණා, "උනුත් එකයි, මුනුත් එකයි" කියලා. දැන් මේ ආණ්ඩු පක්ෂයේ කථා ටික ඇහුවාට පස්සේ ඒ කථාවලින් මට නම් දැනුණේ, 2022ත්, 2023ත් මෙහෙම වුණා, ඒ විධියට කළා, ඒ කාලයේත් කළා, ඒ කාලයේත් මෙහෙම වුණා, මේ කාලයේත් මෙහෙම වුණත් කමක් නැහැ කියනවා වාගේ දෙයක්. ඒ නිසා "උනුත් එකයි, මුනුත් එකයි, අපිත් එකයි" කියලා කියන්න. හය වෙන්න එපා, "අපිත් එකයි" කියලා කියන්න. නේද? එහෙම නැත්නම් ලජ්ජා නැතිව කියන්න, "උනුත් හොරා කෑවා, මුනුත් හොරා කෑවා, අපිත් හොරා කෑවා" කියලා. ලජ්ජා වන්නේ නැතිව එහෙම කියන්න.

ජාතික ජන බලවේගය යැයි කියන මේ උගතුන්, වියතුන් කඩේ යන විධිය දැක්කාම දුක හිතෙනවා. ඉස්සර තිබුණා, මෙවැනි දෙයක්. "බුදු සරණයි" කියලා බෝඩ් එක ගහගෙන ගියපු ලොරියේ පිටුපස තිබුණේ හොර බඩු. දැන් ජාතික ජන බලවේගය යැයි කියන මේ උගතුන්, වියතුන් ඉදිරියට දමා ගෙන හොරු අල්ලනවා කියන බෝඩ් එකත් ගහගෙන පිටුපස පටවලා තිබෙන්නේ හොර බඩු. ඒ හොරකම අහු වුණාම හිරේ යන්නේ, අද ඒවා අපුල්ලන්න වෙලා තිබෙන්නේ, ඒවා හෝදන්න වෙලා තිබෙන්නේ මේ ජාතික ජන බලවේගයේ උගතුන්ට, වියතුන්ට සහ බුද්ධිමතුන්ට. ඒ නිසා උගතා, වියතා, බුද්ධිමතා මතක තියා ගන්න, 2019දී වියතුන් කියලා ආපු අයට මොකද වුණේ කියන එක. මේක නිවැරදි කරන්න පුළුවන්, හොරකම, වංචාව සහ දූෂණය වැරදියි කියන්න පුළුවන් තැන හිට ගන්න අද ජාතික ජන බලවේගයේ කවුරුවත් නැති වීම පිළිබඳව අපි කනගාටු වෙනවා. මේක හොරකමක් නොවෙයි, මේක අපේ බොරුවක්, අපි බොරු ගොතනවා, මේක අපේ සංස්කෘතිය කියලා කියන දේ එහෙම වෙන්න තිබුණා, මෙතැන නීත්‍යානුකූල ක්‍රියා කලාපයෙන් බැහැර වුණු ප්‍රායෝගික ක්‍රියා කලාපයක් තිබුණේ නැත්නම්, අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි.

නමුත්, මෙතුමන්ලා මොකක්ද කළේ? මෙතුමන්ලා, ඒ ගල් අඟුරු සියල්ල පරීක්ෂා කරලා ඒවායේ ඉන්දියානු වාර්තාව හොඳයි, ඊට වඩා දෙයක් නැහැ, ඊට වඩා අපි මොනවා කියන්නද කියන කාරණය මතු කළා. හැබැයි, මේ ගෙනාපු සියලු ගල් අඟුරු දහනය කළා, ඒ දහනය කිරීම වැරදියි කියලා තමයි මෙතුමන්ලා මුලින් කිව්වේ. මෙතුමන්ලාට වැරදුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රායෝගික ක්‍රියා කලාපය මොකක්ද? මේ ගල් අඟුරු දහනය තුළ අද හැමෝටම ඔප්පු වෙලා තිබෙනවා, නිෂ්පාදනය බාලයි කියලා. හොරකමක් වෙලා නැහැ, දූෂණයක් වෙලා නැහැ, මේවා බාල බඩු නොවෙයි කියලා අද කාටවත් ලිපි ලේඛන ගෙනැල්ලා පෙන්වන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, මේ නැව් අටේම ගල් අඟුරු දහනයේදී නිෂ්පාදනය බාලයි කියන එක අද වනකොට ඔප්පු වෙලා ඉවරයි නේ. මේක තේරෙන්නේ නැද්ද, ජාතික ජන බලවේගයේ මේ මහාචාර්ය, ආචාර්යවරුන්ට? එහෙනම් ඉතින් මම කලින් කිව්ව දේ තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. හැබැයි, දැන් බාල ගල් අඟුරු අහු වෙනකොට මොකද වෙන්නේ? ඒවා අහු වෙනකොට හිරේ යන්නේ ඔබතුමන්ලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට කියනවා නේ, මේවාට දඩ අය කරනවා කියලා. දැන් දඩ අය කරගෙනද? දඩ අය කරන්න එකඟ වෙලාද කියන එකයි අපි අහන ප්‍රශ්නය. මේ ආයතනය දඩය ගෙවන්න එකඟ වෙලා නැහැ. ඒගොල්ලන් කියනවා, අපි ළඟ තිබෙන සාම්පලය ඔබ පරීක්ෂා කර බලන්න, එතකොට අපි දඩ ගෙවන්නම් කියලා. ඒ නිසා ඔබතුමන්ලාට දඩයක් අය කර ගන්න තැනක් නැහැ. ඔබතුමන්ලා මේ ආයතනය හිර කරලා ඉවරයි.

ඊළඟට කියනවා, පසුගිය කාලයේ ටෙන්ඩර්වලින් ගල් අඟුරු ගෙන්වන්න අවස්ථාව දුන්නා, ටෙන්ඩර් නැතුව මුදල්වලින් ගෙන්වන්නත් අවස්ථාව දුන්නා, කැබිනට් මණ්ඩලයෙනුත් අවස්ථාව දුන්නා කියලා. තමුන්නාන්සේලා මේ අවස්ථාව දීලා තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි, එදා මහින්ද රාජපක්ෂලාත් එක්ක ඩීල් දාගෙන හිටපු වර්තමානයේ කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිතුමියගේ ඥාතීන්ට. ඒ කියන්නේ ඔබතුමන්ලා නේ ඩීල් දාලා තිබෙන්නේ. අපිද? මේවා බොරුයි කියන කාරණය ඔබතුමන්ලා කියනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඔබතුමන්ලා තව කාරණයක් කියනවා. ඔබතුමන්ලා අපේ මරික්කාර් මන්ත්‍රීතුමාට කියනවා, account එක පෙන්වන්න කියලා. එතුමා ඒ account එක ගැන, එය තිබෙන බැංකු ශාඛාව වාගේම එය කාගේද කියාත් කිව්වා. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, මේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව නේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරයාට කොන්දක් තිබෙනවා නම් ඒ බැංකු ශාඛාවට ගිහිල්ලා මගේ අම්මාගේ, නැන්දම්මාගේ ඒවා නොවෙයි මෙන්න මගේ account එක කියලා පෙන්වන්න පුළුවන් නේ. ඇයි, අපිට ගිහිල්ලා පෙන්වන්න කියන්නේ? අපි කිව්වා නේ, අහවලාගේ නැන්දම්මාගේ account එකේ සල්ලි දාලා තිබෙනවා කියලා. ඒ ශාඛාව තිබෙන්නේ කොහේද කියාත් අපි කිව්වා. දැන් මරික්කාර් මන්ත්‍රීතුමාට කියනවා, ඒ account එක පෙන්වන්න කියලා. ආණ්ඩුව හැටියට ඔබතුමන්ලා ගිහිල්ලා අදාළ බැංකු ශාඛාව හොයලා ඒ නැන්දම්මාගේ account එක පෙන්නුවා නම් මරික්කාර් මන්ත්‍රීතුමා පෙන්වනකම් ඉන්න ඕනෑ නැහැ නේ. එහෙම පෙන්වූවාම තව තවත් දේවල් අහු වෙයි කියන භය තමයි තිබෙන්නේ. මාර තර්ක තමයි මෙතුමන්ලා ගෙනෙන්නේ; මෙතුන්ලාගේ මාර logic තිබෙන්නේ. එහෙම කියලා තිබුණා නම්, ඔබතුමන්ලා දන්නවා නම් ගිහිල්ලා අරගෙන එන්නකෝ. ඔබතුමන්ලාට පුළුවන් නේ ඒක කරන්න, අපි කියනකම් ඉන්නේ නැතුව. ඔබතුමන්ලා පිරිසිදු වෙන්නකෝ ගෙනැල්ලා. 159දෙනෙක් ඉන්නවා, මේ වැඩේ කරනවාය කියා තමයි කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ආපු විධියට නොවෙයි, දැන් වැඩ කටයුතු කරන්නේ. "බුදු සරණයි" කියලා බෝඩ් එක ගැහුවාම, හොරු අල්ලනවා කියලා බෝඩ් එක ගැහුවාම, ඒ හොරු අල්ලන මුවාවෙන් වැඩේ කරයි කියලා මේ රටේ ජනතාව හිතයි කියා මෙතුමන්ලා හිතුවා.

අනික් කාරණය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුජිබුර් මන්ත්‍රීතුමනි, අද ඊයේ, එහෙම නැත්නම් මේ අවුරුද්දයි මාස හයක කාලය තුළ මෙතුමන්ලා හොරා කන්න පටන් ගත්තා කියලා ඔය පසු පෙළ මන්ත්‍රීවරු කවුරු හරි හිතනවා නම් ඒක වැරදියි. එතුමන්ලා එදාත් ඒක කළා; ඉතිහාසයේත් ඒක කළා. අපිත් හිතුවා, පාර්ලිමේන්තුවට නවකයෝ හැටියට එනකොට ඔය කෑ ගහන විධියට මේ පැත්ත හරි පිරිසිදුයි කියලා. ඔය කෑ ගහපු හැම හොරකමක් සම්බන්ධවම, හදපු හැම ෆයිල් එකක් සම්බන්ධවම ඒ ඇමතිවරයාත් එක්ක මේ Lobby එකේ කථා කරලා කටයුතු කළා කියන එක හැම දාම කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඔබතුමන්ලා හොඳට අහලා බලන්න වාගේම මේ ජාතික ජන බලවේගයේ කියන උගතුන්, වියතුන් හොයා බලන්න, අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ජනාධිපතිවරයා උපදෙස් ගන්නේ එදා පාර්ලිමේන්තුවේ කැන්ටින් එකේදී එකට කාපු මලික් සමරවික්‍රමගෙන් කියන කාරණය. ඒ නිසා ඔබතුමන්ලාට මේ හොරකම අලුත් දෙයක් නොවෙයි. ජාතික ජන බලවේගය කියා ගත්ත උදවිය හොඳට තේරුම් ගන්න, ජනතා විමුක්ති පෙරමුණ කියන ඒ කඳවුර එදා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා ඒ හොරකම, වංචාව, දූෂණය ගැන කථා කළාද, ඒ සියල්ල එතුමන්ලාගේ ගත මිට සාක්කුව පුරවා ගන්න පාවිච්චි කළ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා හරි දක්ෂයි මඩ ගහන්න. ඒ, මඩ ගහන සංස්කෘතිය. අද ඔබතුමන්ලාට මොකක්ද වෙලා තිබෙන්නේ කියන කාරණය හොඳට මතක තියා ගන්න. ඒ නිසා මඩ ගහන්න හදන්න එපා. දැන් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඒ නිසා හොරකම ගැන කිය-කියා ඉන්න එපා; වංචාව ගැන කිය-කියා ඉන්න එපා; අරක කළා, මේක කළා කියලා කිය-කියා ඉන්න එපා. ඔබතුමන්ලා ඒ හොරකම් අල්ලලා ඔප්පු කරලා පෙන්වන්න. ඒක තමයි රටේ ජනතාව ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නේ. රටේ ජනතාව දන්නවා, ඔබතුමන්ලා හොරා කන බව. හැබැයි, රටේ ජනතාව ඊට වඩා විශ්වාස කළා, ඔබතුමන්ලාගේ ඔය පිරිසිදුකම, උගත්කම පාවිච්චි කරලා මේ රටේ සිදු වුණු මේ හොරකම්, වංචා නොකෙරෙයි කියන කාරණය වාගේම ඒ හොරුන්ට අවශ්‍ය ඒ දඬුවම ලබා දෙයි කියන එක. හැබැයි, එහෙම දඬුවම් ලබා දෙන්න අවශ්‍ය කශේරුකාව නැති බව අද වනකොට ඔප්පු වෙලා තිබෙනවා. හොරකම දැන-දැන, හොරා කෑවා කියන එක දැන-දැන ඒ හොරු රකින්න පුළුවන්, ඒ හොරු රකිනවා කියන ඒ සපථ කිරීම අද ජාතික ජන බලවේගයේ තමුන්නාන්සේලාත් ඉටු කරලා තිබෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විසින් ගෙනාපු සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය විධියට මම අදහස් දක්වන්න බලාපොරොත්තු වනවා. මට කලින් මන්ත්‍රීවරු ගණනාවක් කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විකුණන්න සහ විකිණෙන බොහෝ දේවල් අපේ රටේ තිබෙනවා. හැබැයි, අපි සාමාන්‍යයෙන් පෙර පාසල් යන දරුවෝ විකුණන්නේ නැහැ. දරුවා එක්කගෙන යන්න බැහැ, වඩා ගන්න බැහැ, මුහුණ දෙන්න බැහැ, පාරේ යන්න බැහැ, බත් ඉදෙන්නේ නැහැ, නින්ද යන්නේ නැහැ කියලා අපි රුපියල් කෝටි 9ක් අරගෙන බණ්ඩාරවෙල මහජන බැංකුවේ account එකේ දමා ගන්නේ නැහැ. අන්න එහෙම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට, පෙර වරු 11.30ට තමයි මරික්කාර් මන්ත්‍රීවරයා මේ සභාව කල් තැබීමේ යෝජනාව මෙම සභාවට ඉදිරිපත් කළේ. ඒ යෝජනාව ඉදිරිපත් කරලා එතුමා කිව්වා, හෝමාගම මහජන බැංකුවේ account එකක් ගැන. Google Map එක බැලුවාම හෝමාගමට තිබෙන්නේ කිලෝමීටර 10යි. විනාඩි 36යි ගත වෙන්නේ හෝමාගමට යන්න සහ එන්න. එතුමාට දැන් දහ වතාවක් විතර හෝමාගමට ගිහිල්ලා එන්න කාලය තිබෙනවා. නමුත්, මම හිතන විධියට, මරික්කාර් මන්ත්‍රීතුමා හෝමාගමට යන්න නම් නොවෙයි හැදුවේ. එතුමා තමන්ට බොරු තොරතුරු දුන් කෙනාගේ ගේ හොයාගෙන යනවා ඇති. ඒ නිසා මේ සභාවේ කටයුතු ඉවර වෙන්න කලින් ඉක්මනට මරික්කාර් මන්ත්‍රීතුමා account number එකයි, ගාණයි හොයාගෙන එයි කියා අපි විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොටෙන්ෂියා සමාගම එක්ක කාලයක් තිස්සේ බිස්නස් කරලා මාසික දීමනා ලබපු හිටපු සමහර නියෝජ්‍ය ඇමතිවරු, මන්ත්‍රීවරු ඒ වේදනාවට,- ඔබ දන්නවා, සාමාන්‍යයෙන් ඩෙසිබල් 70ට වඩා ශබ්දය මිනිස්සුන්ට දරා ගන්න බැරි බව. දරා ගන්න පුළුවන් උපරිම ශබ්දය ඩෙසිබල් 70යි. කාලයක් තිස්සේ ඩෙසිබල් 70ට වැඩි

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ශබ්දයට නිරාවරණය වුණොත් එහෙම විවිධාකාරයේ ශ්‍රවණ ආබාධ හැදෙනවා. මානසික පීඩා ඇති වෙනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිරන්තරයෙන් මේ සභා ගර්භය තුළ රැඳී ඉන්න පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ශ්‍රවණ තත්ත්වයන් පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා ගරු කථානායකතුමාට යෝජනා කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒ මන්ත්‍රීවරයා හිතනවා, ශබ්දය සමානයි සත්‍යය කියලා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තමන් වාගේ කියලා හිතනවා, අනික් අයත්.

මම වැඩි කාලයක් ගන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ සම්බන්ධයෙන් කථා කරන්න.

දැන් මේ චෝදනා ඉදිරිපත් කරන්නේ කාටද? මේ චෝදනා ඉදිරිපත් කරන්නේ දවස් 500ක ආණ්ඩුවකට. ආණ්ඩුව හදලා දවස් 500ක් තුළ ජාත්‍යන්තර දූෂණ සංජානන දර්ශකයේ රටවල් 182න්, 121වැනි තැන ඉඳලා 107 දක්වා රටවල් 14ක් පසුපසට ඇද දමමින් මේ රට උඩට ගෙනා ආණ්ඩුවටයි මේ චෝදනා එල්ල කරන්නේ. අවුරුදු 76ක් විවිධ නායකයෝ පාලනය කරපු රටක් මේක. විවිධ නායකයෝ හිටපු රටක්. හැබැයි, දවස් 500ක් ඇතුළත අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ ආණ්ඩුව දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරලා, රටවල් 14ක් දූෂණ සංජානන දර්ශකයේ පහළට ඇද දමා මේ රට උඩට ගෙනැල්ලා තිබෙනවා. ඒ නිසා තමයි ලෝකයේ නොදන්න නායකයෝ, දැවැන්ත රාජ්‍ය තාන්ත්‍රිකයෝ අද ලංකාවට උදව් කරන්නේ, කථා කරන්නේ, වැළඳ ගන්නේ. දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරන, ඊට නායකත්වය දෙන ඍජු නායකත්වයක් ලංකා ඉතිහාසයේ පළමු වතාවට ලංකාවට ලැබී තිබෙනවා කියන විශ්වාසය, බලාපොරොත්තුව සහ ආදරණීයභාවය නිසායි එහෙම කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. පාඩු කරපු රාජ්‍ය ආයතන පසුගිය දවස් 500 ඇතුළත අපි වේගයෙන් ලාභ කරලා තිබෙනවා. මා ළඟ ඒ ලැයිස්තුව තිබෙනවා. මෙන්න, ලැයිස්තුව. මා මේ ලැයිස්තුව **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රාජ්‍ය ආයතන 52කට අදාළ තොරතුරු මෙහි තිබෙනවා. පසුගිය දවස් 500 ඇතුළත දූෂණය අවම කරලා ඒවා ලාභ ලබන තත්ත්වයට පත් කළේ කොහොමද? Milco (Pvt.) Limited එක ලාභ ලබන තත්ත්වයට පත් කළේ කොහොමද? තැපැල් දෙපාර්තමේන්තුව, ලක්සල ලාභ ලබන තත්ත්වයට පත් කළේ කොහොමද? එම නිසා තමයි මහා භාණ්ඩාගාරය පිරුණේ; ඒක පිරිලා ඉතිරිලා ගියා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න සිද්ධ වුණේ. ඒ විතරක් නොවෙයි. ඉතිහාසයේ වැඩිම රේගු ආදායම, දේශීය ආදායම, සුරාබදු ආදායම කියන මේ සියල්ල ලැබුණේ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය නිසායි. එහෙම ආණ්ඩුවකට තමයි ගල් අඟුරු වංචාවක් ගැන කියන්නේ. කනගාටුයි. බැංකු අයිරාවක් වෙලා තිබුණු භාණ්ඩාගාරය ට්‍රිලියනයකින් පිරෙව්වේ ඒ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය නිසායි. එම නිසා තමයි අපට කිසිසේත්ම අදාළ නැති, සම්බන්ධ නැති Verite Research කියන ආයතනය සිදු කළ සමීක්ෂණයට අනුව ආණ්ඩුවට තිබෙන ජනතා කැමැත්ත සියයට 65 දක්වා වැඩි වෙලා තිබෙන්නේ. විපක්ෂය මර ළතෝනි දුන්නත්, ගිරිය කඩාගෙන කෑ ගැහුවත්, උදේ පාන්දර මොන දහං ගැට දැම්මත්, පෙරළුවත් ජනතා කැමැත්ත සියයට 65 දක්වා ඉහළට ඇවිත් තිබෙන්නේ ඒ නිසායි. ඒ විතරක් නොවෙයි, ආර්ථිකයේ ගමන් මඟෙහි සුබදායකභාවය පිළිබඳව අදහස් දැක්වූ පිරිස සියයට 55 සිට සියයට 64 දක්වා ඉහළ ගොස් තිබෙන්නේ ඒ නිසායි. එහෙම ආණ්ඩුවකට තමයි දූෂණ චෝදනා එල්ල කරන්නේ. කනගාටුයි, තමුන්නාන්සේලා ආණ්ඩුව පෙරළීමට වෙන උපක්‍රමයක් හොයා ගන්න. මහත්වරුනි, ඔය කාරණය නම් මේ ආණ්ඩුව පෙරළන්න කිසිසේත්ම අදාළ එකක් නොවෙයි. කරුණාකරලා වෙනත් මාර්ගයක් තෝරා ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන කාලය සීමිතයි. නමුත් මම 2009 සිට 2016 දක්වා කාල වකවානුවේ ගල් අඟුරු ටෙන්ඩර් ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන්නම්. අවුරුදු පහයි, ටෙන්ඩර් පහයි. මෙන්න තිබෙනවා, 2009 සිට 2016 දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන විමසුම, පිටු 100යි. අවුරුදු පහයි, ටෙන්ඩර් පහයි, පිටු 100ක විගණන වාර්තාවක්. විපක්ෂයේ ඉන්න මහත්වරු රට පාලනය කරපු කාලයේ, 2009 වසරේ සිට අවුරුදු 5 ඇතුළත විදුලි බලාගාරයට ගල් අඟුරු ගෙන්වීම සඳහා ටෙන්ඩර් 5ක් දාලා තිබෙනවා. එකම සමාගම අරන් තිබෙන්නේ. 2014දී එක වතාවක් වෙනත් සමාගමක් තෝරා ගත්තාට පස්සේ නැවත ඇමති අනුකමිටුවක් නම් කරලා, ඒකෙන් යම් උත්තරයක් අරගෙන හිටපු මුදල් ඇමති මහින්ද රාජපක්ෂ මහත්තයා නැවත පරණ සමාගමට ටෙන්ඩර් එක දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011දී සිදු වූ තව සිදුවීමක් තිබෙනවා. නැව් දෙකක් ගොඩ බෑමට නොහැකි වීම නිසා සිදු වූ පාඩුව මිලියන 400යි; කෝටි 40යි. 2011දී Noble Resources International (Pvt.) Limited කියන සමාගමෙන් ගල් අඟුරු මිලදී ගන්නවා. ඔවුන් ටොන් එක ඩොලර් 68ට එකඟ වෙලා තිබෙද්දී, ක්ෂණික මිලදී ගැනීමක් විධියට ඒ සමාගමෙන්ම ඩොලර් 74කට ගල් අඟුරු මිලදී ගන්නවා. ඒ තුළින් දැවැන්ත පාඩුවක් කරනවා. ඊට අමතරව ගල් අඟුරු නැති වීම නිසා 2011 සැප්තැම්බර් 28 සිට ඔක්තෝබර් 23 දක්වා දින 25ක් බලාගාරය වහලා තිබෙනවා. පාඩුව රුපියල් මිලියන 3,500යි - කෝටි 350යි. ඔය මන්ත්‍රීතුමන්ලා නායකත්වය දුන්නු ආණ්ඩු රුපියල් කෝටි 350ක් පාඩු කරලා දවස් 25ක් මේ බලාගාරය වහලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. 2015 සැප්තැම්බර් මාසයේ ඉඳලා 2016 අගෝස්තු මාසය දක්වා කාලය තුළ බරපතළ වංචාවක් සිද්ධ වෙනවා. ලිබර්ටි කොමොඩිටීස් කියන සමාගමට ඔවුන් ගෙවිය යුතු වන්දි මුදල ඉතා බරපතළ ප්‍රමාණයකින් අඩු කර තිබෙනවා ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා නියෝජ්‍ය ඇමතිවරයා ලෙස හිටපු කාලයේ; බලශක්ති නියෝජ්‍ය ඇමතිතුමා හැටියට හිටපු කාලයේ. ඔහු ඒ සැපයුමේ තිබෙන ගැටලු නිසා දඩයක් පනවලා තිබුණා. ඒ දඩය 0.1න් තමයි බෙදන්න තිබුණේ. හැබැයි, බෙදුවේ ධන එකෙන්. රුපියල් 100 එකෙන් බෙදුවාම, 100යි. හැබැයි, රුපියල් 100 බෙදන්න තිබුණේ, දශම එකෙන්. ඒ කියන්නේ 1,000යි. 1,000ක් ලැබෙන්න ඕනෑ තැන 100යි දඩය ගැහුවේ. තවමත් නඩු යනවා, ගරු මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ සිදු කරපු පාඩුව, තමුන්නාන්සේලාගේ "යහ පාලනය" නමින් ආපු ආණ්ඩුව සිදු කරපු පාඩුව ඩොලර් මිලියන 1.5යි; කෝටි 50යි. විදුලිබල මණ්ඩලය ඇතුළු Lanka Coal Company එක තවමත් නඩු කියනවා. ඔන්න! "යහ පාලනය" නමින් කරපු දේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔය කියන සැපයුම 2015ට කලින් එකක්. ඒකට අපේ පාලන කාලය සම්බන්ධ නැහැ. ප්‍රශ්නය මතු වුණේ අපේ කාලයේදී. හැබැයි, ඒ සැපයුම වුණේ 2015ට කලින්. ඒ, කලින් පැවැති ආණ්ඩුව යටතේ වෙච්ච අඩුපාඩුවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කෙටියෙන් කියලා අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.*[බාධා කිරීමක්]* ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාගේ කාලය.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මේ, 2015-2016 කාලය තුළ වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මේගොල්ලෝ 2009 ඉඳලා 2019 දක්වා ගල් අඟුරු සමාගම්වලට මුදල් නිකුත් කරලා තිබුණේ Load Port Report එකෙන්. සියයට සියයක්ම මුදල් නිදහස් කරන ප්‍රතිපත්ති අනුගමනය කළේ Load Port Report එක පදනම් කරගෙන. ගල් අඟුරු ටික ලංකාවට ඇවිල්ලත් නැහැ. සියයට සියයක් මුදල් නිදහස් කරලා තිබෙන්නේ. එහෙම හොරා කාපු, එහෙම මේ රටේ මහජන ධනය කොල්ල කාපු නායකයෝ අද මුළු මහත් ටෙන්ඩර් ක්‍රියාවලියම නීත්‍යනුකූල කරලා, ඉතාම හොඳ තරගකාරීත්වයකින් අඩුම මිල තෝරා ගෙන ප්‍රසම්පාදනය ඉතාම හොඳින් අනුගමනය කරපු මේ විනිවිදභාවයෙන් යුතු ටෙන්ඩරයට දූෂණ චෝදනා නැඟීම තුළ පෙනෙන්නේ එතුමන්ලාට බලය අහිමි වීමේ දුක මිසක් වෙන දෙයක් නොවෙයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிங்ஸ் நெல்சன் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. KINS NELSON took the Chair.*

[අ.භා. 4.08]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොරොච්චෝලේ බලාගාරය අපේ රටේ කාලයක් තිස්සේ ප්‍රවෘත්ති මවනවා. එක්කෝ, ගල් අඟුරු වංචා, දූෂණ සම්බන්ධයෙන්; එහෙම නැත්නම්, එහි යන්ත්‍ර අකර්මණ්‍ය වීම සම්බන්ධයෙන්; නැත්නම් විදුලිය ඇනහිටීම සම්බන්ධයෙන්. ආණ්ඩු ගණනාවක් යටතේ එහෙම කළු චිත්‍රයක් තමයි එම බලාගාරය සම්බන්ධයෙන් හා එහි ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් තිබුණේ.

2011 පෙබරවාරි මාසයේදී මේකේ නිෂ්පාදන කටයුතු ආරම්භ වෙලා 2011 ජූලි මාසයේ එහි විදුලිය නිෂ්පාදනය ආරම්භ වෙලා තිබෙනවා. අපේ රටේ ගල් අඟුරු තිබුණත්, නැතත් අපිට මේ ගල් අඟුරු සපයා ගන්න වෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන්. හැබැයි, මේ ඉතිහාසය දිහා බැලුවාම 2009 ඉඳලා වසර ගණනාවක් මේ ගල් අඟුරු සපයා ගෙන තිබුණේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් නොවෙයි. පළමු සැරේ ගල් අඟුරු සපයා ගන්න ටෙන්ඩර් එකක් call කර තිබෙනවා. හැබැයි, ඒකේ අවසානයට යන්නේ නැහැ අතරමඟ අවලංගු කරනවා. අවලංගු කරලා කැබිනට් තීන්දුවක් හරහා ගල් අඟුරු මිලදී ගන්නවා. අපි හිතමු, මේක එක සැරයක් වුණා කියලා. 2009දී වුණේ පළමු සැරේට නොවෙයි. පළමු සැරෙත් එහෙමයි, දෙවැනි සැරේත් ටෙන්ඩර් call කරනවා, ආයෙත් අවලංගු කරනවා, කැබිනට් තීන්දුවකින් ගන්නවා. තුන්වෙනි සැරේ ටෙන්ඩර් call කරනවා, මැද්දෙදී අවලංගු කරනවා, කැබිනට් තීන්දුවකින් ගන්නවා. හතරවෙනි වතාවෙත් එහෙමයි. පස් වෙනි වතාවෙත් එහෙමයි. මේ එකම ක්‍රියාවලියක්. ඒ කියන්නේ, මේ වැඩේ ආරම්භ කරපු තැන සිට නාමිකව ටෙන්ඩර් එකක් call කරලා, අතරමඟ නතර කරලා තමන් කැමැති සමාගමකට කැබිනට් තීන්දුවක් මඟින් ලබා දෙන එකක් තමයි මේ මුල් අවස්ථාවේ සිදු කරලා තිබුණේ, මේ සභාවේ දී විටින් විට මතු වුණා වාගේ, මේ Noble Resources International (Pvt.) Limited එකට. මේ අයට ඉස්සෙල්ලාම 2015දී ටෙන්ඩර් එකකට ඉදිරිපත් වෙන්න අවස්ථාව ලැබුණාම,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකක්ද point of Order එක, ගරු මන්ත්‍රීතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
සාමාන්‍යයෙන් සභාවේ රීති අනුව සභානායකතුමාගේ පුටුවේ අනෙක් අයට වාඩි වෙන්න බැහැ. ඒ පුටුවේ වාඩි වෙලා ඉන්නවා. ඒක හරි නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථාව කරගෙන යන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
2015දී ඉස්සෙල්ලාම ටෙන්ඩර් එකකට යන්න සිදු වුණාම අවුරුදු ගණනාවක් තිස්සේ -අවුරුදු 6ක් විතර තිස්සේ- කැබිනට් තීන්දුවක් මඟින් ටෙන්ඩර් නොසලකා අවස්ථාව ලබා දීපු සමාගමට ඒ ටෙන්ඩර් එක අහිමි වෙනවා. ටෙන්ඩර් එක අහිමි වුණාට පසුව ඒ සමාගම යනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙනුත් ඒගොල්ලන් පරාජයට පත් වෙනවා. රාජපක්ෂ පාලන සමය තුළ ඒ ගල් අඟුරු සැපයීමේ ක්‍රියාවලිය සිදු වෙලා තිබුණේ එකම ආකාරයකට. ඒක නිකම් සූත්‍රයක් වාගෙයි. ටෙන්ඩර් එකක් call කළාට, එය අතරමඟ නතර කරනවා, එක සමාගමකට කැබිනට් පත්‍රිකා හරහා දිගින් දිගටම එම සැපයුම් අවස්ථාව ලබා දෙනවා. එතැනින් පස්සේ -2016 ඉඳලා- ටෙන්ඩර් call කර තිබෙනවා; සමහර ඒවා අවලංගු කර තිබෙනවා. Spot tendersවලටත් ගිහින් තිබෙනවා. මේ ආදි ක්‍රියාවලියක් කරලා 2022/2023 වර්ෂය සඳහා ගල්අඟුරු සැපයීමට ලංසු කැඳවීමේ කාල සීමාව දින 42 ඉඳන් දින 21 දක්වා අඩු කරනවා. එතැනින් පසුව ලංසු කැඳෙව්වා නම් කැඳවා තිබෙන්නේ මේ දින 21ට අදාළවයි. එහිදීත් එය විටින් විට මා අර කියපු ක්‍රියාවලිය සිදු වෙලා තිබෙනවා; ටෙන්ඩර්වලිනුත් සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලෝකයේ මොකක් හරි පිළිගත්තු සම්මතයන්ට අනුකූලව, විනිවිදභාවයක් සහිතව මේ කටයුත්ත කරන්න පුළුවන් ක්‍රමය තමයි නිසි ක්‍රමවේද අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම. වසර ගණනාවක් නිවැරදිව ඒ දේ නොකරපු ආයතනයක් සම්බන්ධයෙන්, සැපයුමක් සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව සිදු කරපු දේ තමයි මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි සිදු කිරීමට කටයුතු කිරීම. ඒ අනුව 2025 අගෝස්තු මාසය වන විට අපි ජාත්‍යන්තර සැපයුම්කරුවන් ලියාපදිංචිය ආරම්භ කළා. එහිදී සැපයුම්කරුවන් 26ක් ලියාපදිංචි වුණා. ඒක සැලකිය යුතු සංඛ්‍යාවක්. මීට කලින් එකම සමාගමකට හෝ තෝරා ගත්තු සමාගමකට දෙකකට ලබා දී තිබුණු ක්‍රියාවලිය වෙනුවට සැපයුම්කරුවන් 26දෙනෙක් ලියාපදිංචි වුණා. ඒ සැපයුම්කරුවන් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරන්න 2025 අගෝස්තු මාසයේ 18වන දා ආරම්භ කරලා සැප්තැම්බර් 08වන දා දක්වා දින 21ක කාලයක් ලබා දී තිබෙනවා. සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත එය සැප්තැම්බර් 15වන දා දක්වා දීර්ඝ කළා. ඒ අනුව 2022/2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන්ට ලබා දීපු දින 21ක කාලය - අවුරුදු කිහිපයක්ම තිබුණු එක - වෙනුවට අපි දින 28කුත් ලබා දුන්නා. ඒ දින 28 ලබා දුන්නාට පසුව ගරු මන්ත්‍රීතුමා,-

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කැමැත්ත තිබෙනවා නම්, එතුමාට අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මා හිතන විධියට ඔබතුමාට වැරදි තොරතුරු දීලා. 2023/2024 ටෙන්ඩර් එකේ දින 42ක් ලබා දෙනවා. 2024/2025 එකේත් දින 42 කාලයක් ලබා දෙමින් තමයි ටෙන්ඩරය කැඳවීම කළේ. මම දන්නේ නැහැ 2022/2023 කාලයේ දින 21ට කැඳවා තිබුණාද කියලා. ඊට පසුව දින 42ක් තමයි ලබා දී තිබෙන්නේ. ඕනෑ නම් මම ඒ tender document එකත් සභාගත කරන්නම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ ඔක්කොම සභාගත කරන්න. ලිපි ලේඛන සහිතව තමයි මේවා ඔක්කොම කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, වැඩේ කියන්නේ, මේ ගල් අඟුරු කථාවේ අළු සහ අඟුරු ගොඩක් තැන්වල ගෑවිලා තිබෙන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප දින 28ක් ලබා දුන්නාම ලංසුකරුවන් 10දෙනෙක් ඉදිරිපත් වෙනවා. මට කියන්න, ඔබතුමන්ලා නියෝජනය කරන කාටද ඒ දින 28 තුළ එන්න බැරි වුණේ කියලා? අන්න දැන් ඒක කියන්නකෝ. "අපි මෙහෙම සමාගමක් නියෝජනය කරනවා. අපේ සමාගමට එන්න බැරි වුණේ දින 28ක් දීපු නිසා, අපේ සමාගමට එන්න පුළුවන් වෙන්නේ දින 42ක් දුන්නොත් විතරයි" කියලා කියන්නකෝ. ලංසුකරුවන් 10දෙනෙක් ඉදිරිපත් වෙලාත් ඔබ නියෝජනය කරන සමාගම ඒ සමාගම් 10 අතර නැද්ද? තිබෙනවා නේ. ඒ සමාගම තිබෙනවා. ඕනෑ නම් මම නම කියන්නම්. දින 28 ඉඳන් දින 42 දක්වා දුන්නා නම් ඔබ හිතන්නේ ඔබේ කවර සමාගම් එයි කියලාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගල් අඟුරු ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉතිහාසයේ වැඩිම ලංසුකරුවන් ඇවිල්ලා තිබෙනවා; 10දෙනෙක් ඇවිල්ලා තිබෙනවා. හොඳයි නේ. එතැනින් නතර වුණාද? නැහැ. ඒ අයට අභියාචනා කාලයකුත් ලබා දුන්නා; අභියාචනා කාලයක් ලබා දුන්නා, සැප්තැම්බර් 19වැනි දා ඉඳලා 29වැනි දා වනකල්. එතකොට කිසිම appeal එකක් ඉදිරිපත් වුණේ නැහැ නේ. මොකක් හරි දූෂණයක් වුණා වුණා කියනවා නේ. මේ ටෙන්ඩරය ලබාගත් සමාගම හරි නැහැ කියන එක නේ ඔය කියනවා ඇත්තේ. එතකොට ඔබතුමන්ලා නියෝජනය කරන සමාගම්වලට අවස්ථාව තිබුණා නේ, appeal කරන්න. ඉතිරි 9දෙනාගෙන් කවුරුවත් appeal කළේ නැහැ නේ. එහෙම කළේත් නැහැ නේ. ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන ප්‍රශ්නය, ඒ සමාගම්වලට නැති රුදාවක් විපක්ෂයට තිබෙන්නේ ඇයි කියලායි. ඒ සමාගම්වත් ඒකට මෙච්චර නහින්නේත් නැහැ. හැබැයි, මේ ටෙන්ඩර් එකේ දිනය අඩු වුණා, මේකේ අර විධියට වුණා, මෙහෙම වුණා කියලා විපක්ෂයේ කණ්ඩායම් මහා ඝෝෂාවක් කරනවා, දවස් කිහිපයක ඉඳලා. ලංසුකරුවන් 10දෙනෙකු ඉදිරිපත් වෙලා appeal එකටත් කවුරුත් ඉදිරිපත් වුණේ නැත්නම්, ඒ කියන්නේ ඒ ලංසුකරුවන් - ඒ ඉදිරිපත් වෙච්ච අය - තමන්ට සාධාරණ කාලයක් ලැබුණා කියා පිළිගන්නවා කියන එකයි.

මට කියන්න, මෙවැනි ගල් අඟුරු ප්‍රසම්පාදනයකදී Load Port Report එක පදනම් කරගෙන ගල් අඟුරු තොගය භාර ගන්නේ නැතිව ඉන්න ක්‍රමයක් තිබෙනවාද, තිබෙනවා නම් මොකක්ද ඒ ක්‍රමය කියලා? Load Port Report එකක් දුන්නාම, අදාළ පිරිවිතරයන්ට ගැළපෙන හැටියට කිලෝ කැලරි 5,900ට වඩා වැඩි නම් ඒක භාර ගන්නවා. ඒ Load Port Report එක හරි නම්, ඒ හැර ඒ ගල් අඟුරු සම්බන්ධයෙන් බලන්න තිබෙන ක්‍රමය මොකක්ද කියන්නකෝ. ඊට පසුව ඒ නැව ලංකාවට ආවාම, ගල් අඟුරු ගොඩ බෑවාට පස්සේ අපේ ලක්විජය බලාගාරයත්, ලංකා ගල් අඟුරු සමාගමත් ඒවා පරීක්ෂා කරනවා; අදාළ පරීක්ෂණ

කරනවා. ඒ පරීක්ෂණ කරන කොට එතැනදී කිලෝ කැලරි 5,900ත් 6,150ත් අතර,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. කිලෝ කැලරි 5,900ත් 6,150ත් අතර නැත්නම් හෝ කිලෝ කැලරි 5,900ට අඩු නම් මොකක්ද අනුගමනය කළ යුතු ක්‍රමය? ඒක තමයි, දඩ ගහන එක. කරන්න තිබෙන්නේ එච්චරයි නේ. දඩ ගහන එක හැරුණාම කළ හැකි දේ මොකක්ද? මේ ආණ්ඩුව ඇවිල්ලා අලුත් ක්‍රමයක් හැදුවා නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* මේ ආණ්ඩුව ඇවිල්ලා අලුත් ක්‍රමයක් හැදුවේ නැහැ. තිබුණු ක්‍රමයට අනුව තමයි කටයුතු කළේ. ආණ්ඩුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට කළා; පරීක්ෂණ ක්‍රියාවලියත් ඒ තිබුණු ක්‍රමයට කළා; Load Port Report එක බැලුවා; ඒ report එක හරි නම් ගල් අඟුරු ටික ගෙනාවා; ගෙනැල්ලා ගොඩ බෑවාට පසුව ඒ අදාළ කරන පරීක්ෂණ සිදු කළා. ඒ පරීක්ෂණ සිදු කරන කොට ඒ අදාළ සීමාවේ නැත්නම්, ඒ කියන්නේ කිලෝ කැලරි 5,900-6,150 අතර නැත්නම් දඩයක් නියම කරන්න තිබෙනවා. කිලෝ කැලරි 5,900ට අඩු නම් දඩය දෙගුණයක් කර අය කරනවා. මේක නේද, 2020-2021දී- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඔබතුමා දැන් ගොඩක් කථා කළා නේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
පොඩි අවස්ථාවක් දෙන්න, ගරු ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
2020/2021 සඳහා මිලියන 4.54ක් දඩ ගහලා තිබෙනවා; 2021/2022 සඳහා මිලියන 6.1ක් දඩ ගහලා තිබෙනවා; 2022/2023 සඳහා මිලියන 7.8ක් දඩ ගහලා තිබෙනවා. මෙහෙම දඩ ගහලා තිබෙන්නේ කොහොමද? මෙහෙම දඩ ගහලා තිබෙන්නේත්, පටවන වරායේ report එකටත් වඩා ගොඩබාන වරායේ report එක අනුවයි. මේක තමයි ක්‍රමය. ඉතින් මේ අනුව කටයුතු කර තිබෙනවා. මේ වනකොට නැව් 10ක් ඇවිල්ලා තිබෙනවා. ලංකා ගල් අඟුරු සමාගම,-

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ස්ථාවර නියෝග 86 (අ) අනුවයි මම කථා කරන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු නලින්ද ජයතිස්ස මැතිතුමනි, මේකයි ප්‍රශ්නය. ඔය Agreement එකේ තිබෙනවා, Load Port Report එකයි, ලංකාවේ report එකයි අතර gap එකක් තිබුණොත් ඒකේ lab එක පවා cancel කරන්න පුළුවන් බව. ඒකයි නීතිය. දෙකකට වැඩිය-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මේ කතන්දරය ගැන ගොඩක් හාර හාර යන්න ඕනෑ නැහැ. පළමුවෙනි සැපයුම්කරු සහ දෙවෙනි සැපයුම්කරු අතර පරතරය ඩොලර් මිලියන 3.375යි. විපක්ෂය මේ ගොඩක් කථා කියන්නේ මොකක් නිසාද, මේ ගොඩක් දේවල් කියන්නේ කවුරු නිසාද කියලා සොයා බලන්න පුළුවන්, කවුද දෙවැනියට ඉන්නේ කියලා බැලුවාම. ඕක හරි සරලයි; හරිම සරලයි. මම දැක්කා අපේ මන්ත්‍රීවරයෙක් ඒ සම්බන්ධකම් අරවා, මේවා ගැන කියනවා. ඔය නැඟිටින්නේ වෙන මුකුත් නිසා නොවෙයි. ඊළඟට කවුද ඉන්නේ කියලා බලන්න ඕනෑ. කවුද ඉන්නේ? එතකොට තමයි ගොඩක් දේවල් මතක් වෙන්නේ. තමන්ගේ ආණ්ඩුව කාලයේ ටෙන්ඩර් එකවත් කරලා නැහැ; කැබිනට් තීන්දුවලින් දීලා තිබෙන්නේ. එහෙම දීපු අය දැන් අපට අභියෝග කරනවා, අපි ටෙන්ඩර් ක්‍රියාවලිය හරියට ක්‍රියාත්මක කරලා නියමිත පරිදි ලබා දුන්නාමත්. යම් වරදක් සිදුවෙලා තිබෙනවා නම්, ඒ කියන්නේ අදාළ කිලෝ කැලරි ප්‍රමාණය නැතිකොට දඩ ගහලාත් තිබෙනවා නම්, දැන් ඒකටත් අභියෝග කරන්න යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය පටන් ගන්නකොට මම දැක්කා, මේ යෝජනාවේ පළමුවැනි වාක්‍ය ඇතුළේම වරදක් තිබුණා. අඩු ගණනේ කොතරම් ගල් අඟුරු ප්‍රමාණයක් ගෙනෙනවාද කියලාවත් නොදැන කලබලේ තමයි මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. අනික් එක, මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා. පසුගිය කාලයේ නිලධාරීන් ගෙන්වා ඒ සභාපතිතුමා මොනවා ඇහුවාද දන්නේ නැහැ.

ඊළඟට, මෙතැන මහා සද්දයක් දාලා යම් කාරණයක් ගැන කියන්න පටන් ගත්තානේ. දැන් ගොඩක් මන්ත්‍රීවරුන් ඒ ගැන කිව්වා. දැන් බැංකුව මොකක්ද කියලාත් දන්නවා, ශාඛාව මොකක්ද කියලාත් දන්නවා, account එකක් තිබෙනවා කියලාත් දන්නවා, ඇමතිතුමාගේ නැන්දම්මා කියලාත් දන්නවා. දෙයියනේ! එහෙම නම් කියන්නකෝ, ඒ account එකයි, නමයි මොකක්ද කියලා. දැන් කියනවා, ඒක අපට ඔප්පු කරන්න ලු. මේගොල්ලන්ගේ පුරුද්දක් තිබෙනවා, මොකක් හෝ බොරුවක් ඇද බාලා, ඒක බොරුවක් නොවෙයි කියන එක අපට ඔප්පු කරන්න කියන. එහෙම කියලා දුවනවා. හොයාගන්න බැරිව කියලා දුවනවා. ඕක තමයි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී මම දැකපු දෙයක් තිබෙනවා. වෙනදා නම් ආණ්ඩු පක්ෂයට තමයි නැඟිට, නැඟිට උත්තර දෙන්න වෙන්නේ. හැබැයි මේ විවාදය තමයි, විපක්ෂයට නැඟිට, නැඟිට උත්තර දෙන්න වුණු විවාදය. ඇයි, ඒ? මේක හරිම පුදුමසහගත වැඩක්. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ම නැඟිට, නැඟිට උත්තර දෙනවා. 2015-2020 කාලයේ හිටපු අය උත්තර දෙනවා, 2015ට කලින් හිටපු අය උත්තර දෙනවා, 2020න් පස්සේ හිටපු අය උත්තර දෙනවා. ඇයි, ඒ? පැරණි ගල් අඟුරු ගනුදෙනු ඒ තරමම දූෂිතයි. මම ඒකයි කිව්වේ, අළුත් ගෑවිලා, ගල් අඟුරුවල කළුත් ගෑවිලා කියලා. එහෙම තිබෙනකොට, තමන් පිරිසිදුයි කියලා නැඟිට, නැඟිට උත්තර දෙන්න ඕනෑ. අපට කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියට කරලා තිබෙනවා. සැපයුම්කරු විසින් සපයපු එක නැවක හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒවාට දඩ ගහනවා. වෙන මොකක්ද කරන්නේ? ඕක තමයි කරන්න තිබෙන්නේ. හෙට කරන්න තිබෙන්නේත් ඕකම තමයි. මේක තමයි තත්ත්වය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ආණ්ඩු පාර්ශ්වයේ ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනික් කාරණය මෙයයි. අපට දූෂණ චෝදනා එල්ල කරන්න බැහැ. මේ ආණ්ඩුවට දූෂණ චෝදනා එල්ලා කරලා තේරුමක් නැහැ. කරුණාකරලා ඔබගේ හිතවත්කම් තිබෙන, ඔබගේ දේශපාලනයට සම්බන්ධකම් තිබෙන අයට කියන්න, නැත්නම් පණිවුඩයක් දෙන්න, CID එකේ, FCID එකේ සහ පොලිසියේ මේ සම්බන්ධව පරීක්ෂණ සිදු වනකොට කරුණාකරලා ඒ තැන්වලට ඇවිල්ලා අවශ්‍ය කටඋත්තර ලබා දෙන්න කියලා. *[බාධා කිරීමක්]* ගාල්ලේ නේද ඒක හැමදාම යන්නේ? අද නීරෝගීව ඉන්නවා, හෙට CID එකට එන්න කිව්වොත් ලෙඩ වෙනවා, රුධිර ගමනාගමනයත් අඩු වනවා. ඒ නිසා කරුණාකරලා නීරෝගීව ඉන්න කියන්න. මොකද, ගොඩක් අයට ඉදිරි මාස කිහිපය ඇතුළතදී අදාළ ආයතනවලින් කැඳවීම් ලැබෙයි. පරීක්ෂණ සිදු වෙනවා, භය වෙන්න එපා. මහාධිකරණ වැඩිපුර හදලා තිබෙනවා, නඩු ගොනු වෙනවා. කිසිම දූෂිතයෙක් ආරක්ෂා කරන්න මේ ආණ්ඩුවට වුවමනාවක් නැහැ. ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාව දැන් අපට ලැබිලා තිබෙන්නේ. අපි සම්බන්ධ චෝදනා යට ගහන්න කියලා අතීතයේදීවත් අපට කාගෙන්වත් උදව් ඉල්ලන්න වුවමනාවක් තිබුණේ නැහැ. හොරු අල්ලන්නම්, නීතිය ක්‍රියාත්මක කරන්නම් කියලා ආපු බොහෝ ආණ්ඩුවලට ඒවා කර ගන්න බැරි වුණේ, ඊට කලින් ආණ්ඩුවල හිටපු ඒගොල්ලන්ගේ යාළුවන්ට කියලා තමන්ගේ ෆයිල් වහගෙන හිටපු නිසායි. අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා පොලීසිය සහ අධිකරණය ඒ කටයුතු සිදු කරනවා. ඒ සඳහා ආණ්ඩුව යටිතල පහසුකම් සපයනවා. ඒ නිසා කරුණාකරලා ඔබේ යහළුවන්ට කියන්න, ඇවිල්ලා කටඋත්තර දෙන්න කියලා. එතකොට නීතිය නිවැරදිව සහ වේගයෙන් ක්‍රියාත්මක වෙයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.24]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩි 12ක කාලයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කිරීම තිබෙන්නේ ඔබේ අතේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල හා බලශක්ති විෂය භාරව හිටපු ඇමතිවරයෙකු වශයෙන් මේ අවස්ථාවේ අදහස් යොමු කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වනවා. මේ අවස්ථාවේ කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන් මම එක කාරණයක් අහන්න ඕනෑ. මම කථාව පටන් ගන්නේ ඔබේම නායක අනුර දිසානායක ජනාධිපති කිව්ව කතන්දරයකින්. "වෘත්තීය සමිති ව්‍යාපාරවලට පැරණි ඇඳුම් ගලවා අලුත් ඇඳුම් ඇඳ ගැනීමට කාලය ඇවිත්" කියලා එතුමා කිව්වේ, 2005 වසරේ මැයි දිනය දවසේ. ඒ වාගේම ඉස්සර මෙහෙම වුණා, දැන් මෙහෙම වෙනවා, ඉදිරියටත් වෙනවා කියලා තමුන්නාන්සේලා කියනවාට වැඩිය, අපි කොහොමද අලුතින් හිතන්න ඕනෑ කියන එක ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි කියලා මම මේ අවස්ථාවේදීත් හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ගල් අඟුරු ගැනම අහන්නේ නැතුව ඒ විෂය සම්බන්ධයෙන් කාරණයක් අහනවා. මේ වනකොට National Electricity Policy එකක් සම්බන්ධයෙන් මහජන අදහස් විමසීමේ අවස්ථාවක් ඇති කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් ගත්තාම අපි හැමදෙනාම පුදුම වෙලා තිබෙන දෙයක් තමයි, මේක පෙබරවාරි මාසයේ 12වැනි දා website එකේ පළවෙලා, ඊට පස්සේ 17වැනි දා පත්තරේ පළවෙලා, 19වැනි දා වනකොට අදහස් යොමු කරන්න කියලා කාලය අවසන් කර තිබෙන එක. සාමාන්‍යයෙන් ඕනෑම තැනක මෙවැනි දේකට දවස් 21ක් දෙනවා. අන්තිමට National Electricity Policy එකක් ඇති කළේ 2019 අගෝස්තු මාසයේ මම විෂය භාර ඇමතිවරයා වශයෙන් සිටි අවස්ථාවේ. ඒ අවස්ථාවේ මාස හයක් දීලා තිබුණා. මේ අවස්ථාව දෙන්නේ මහජනතාවගෙන් අදහස් විමසන්න මිසක් මහජනතාවට හොරෙන් කටයුතු කරන්න නොවෙයි. ඒ සඳහා මහජන උපයෝගිතා කොමිසම දවස් 21ක කාලයක් දෙන්න ඕනෑ. මේක නීතිමය කටයුත්තක්. මේක අභිමතය පරිදි කරන දෙයක් නොවෙයි. මේ සඳහා අනිවාර්යයෙන්ම දවස් 21ක් දිය යුතුයි කියන සත්‍ය තත්ත්වය තමයි තිබෙන්නේ. ඇයි දැන් මෙහෙම වෙලා තිබෙන්නේ කියන එක අපට ප්‍රශ්නයක්.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවස්ථාව දෙන්න පුළුවන්. මගේ මිනිත්තු 12 ආණ්ඩු පාර්ශ්වයේ කාලයෙන් ලබා දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා පස්සේ මට උත්තර දෙන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි දින 21ක් දුන්නා. දෙවැනි වතාවට තමයි 12වැනි දා website එකට දැම්මේ. ඊට කලින් දින 21ක් දීලා ඔක්කෝම කළා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. අපි පත්තරයෙයි, website එකෙයි දෙකේම දාලා දින 21ක් දුන්නා. Second stage එකේ තමයි 12වැනි දායින් පසුව කළේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ සඳහා නියමිත කාලපරිච්ඡේදය දෙන්න.

ගල් අඟුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් උත්තර දෙනකොට හැම වෙලාවේ load port එක ගැනයි, discharge port එක ගැනයි, Norochcholai Power Plant එකයි ගැන කථා කළා. මම හිතන විධියට, මේකේ වැදගත්ම දේ මේකයි. මේ විෂය භාර ඇමති වශයෙන් කටයුතු කළ අවස්ථාවේ ඊට පෙර වෙලා තිබුණු දේවල් මම දැක්කා. ඉතින්, අපි මේක වෙනස් කළා. මීට පෙර Load Port Report එක තමයි යම් යම් දේවල්වලට ගෙවීම් කරන්න ගත්තේ. අපි ඒක වෙනස් කළා, Discharge Port Report එක ඕනෑය කියලා. ඊට පසුව ඒකේත් ප්‍රශ්නයක් තිබෙනවා නම්, Norochcholai Power Plant එකේ report එකත් ගන්නවා. ඒ අතරත් ප්‍රශ්නයක් තිබෙනවා නම්, අන්තිමට independent report එකකට යනවා. ඉතින්, 2019 February මාසයේ තමයි මේක ඉස්සෙල්ලාම වුණේ. ඊට පසුව ඒකේ first bidding document එකට මේක ඇතුළත් වුණා. ඒ එකතු කිරීම තුළ ඒකේ තිබෙන විෂමතා අපි දැනගත්තා.

මීට පෙර තිබුණේ sulfur content එක, calorific content එක, ash content එක, moisture content එක ආදී මේ ඔක්කෝම සම්බන්ධව ටෙන්ඩර් එකට අනුකූලව කටයුතු කරන්න ඕනෑය කියලායි. අපි ඒක වෙනස් කළා, CEB එක දාලා තිබෙන එකත් එක්ක සමගාමීව යා යුතුයි කියලා. මම හිතනවා, ඇමතිතුමා ඒක පිළිගනීවි කියලා. අපේ කාලයේ ඒක වෙනස් කළා. ඔබතුමා කථා කළේ මීට පෙර වුණු ඒවා සහ ඊට පසුව වුණු ඒවා ගැනයි. නමුත් load port, discharge port සහ Norochcholai Power Plant එක තුළ වෙන්න ඕනෑ එක අපි නිවැරදි කළා. මොකද අපට පෙනුණා, ඒක තුළ අනවශ්‍ය ලෙස බාල ගල් අඟුරු ගේන්න පටන් ගත්තා කියලා. ඒ දේ නැවතුණා, අපි කළ වෙනසත් එක්ක. ඒකත් එක්ක තමයි දෙගුණයක් fine කරන්න පටන් ගැනීමේ අවස්ථාව ඇමතිතුමාට ලබා දුන්නේ. ඉතින්, මම හිතන විධියට දැන් ඒක උපරිම මට්ටමට පාවිච්චි කරනවා. හැබැයි, ඒකෙන් මේ වෙලා තිබෙන වැරැද්ද නිවැරදි වෙන්නේ නැහැ.

මේකේ වෙන්න අවශ්‍යතාව තිබෙන්නේ energy content එකට අනුව මිල දර්ශකය ඇති කිරීමයි. මේකේ 5,900ක calorific content එකක් තිබුණාට, ඒක 5,000ට අඩු වුණා කියලා ඒකට ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකක දඩයක් ගහලා හරියන්නේ නැහැ. මොකද, ගල්අඟුරුවල තත්ත්වය බාල නිසා අපට ඒ තාප බලාගාරය වැඩ කරන්න වැඩිපුර ගල්අඟුරු අවශ්‍ය වනවා. ඒ නිසා මම ඉතාම ඕනෑකමින් ඇමතිතුමාට කියනවා, මේ අවස්ථාවේ තාප විදුලි බලාගාරයෙන් නිපදවන උපරිම විදුලිය ප්‍රමාණය අපේ විදුලිබල පද්ධතියට උපයෝගී කරගන්න කියලා.

දැනට ගල්අඟුරු නැව් නවයක් ඇවිත් තිබෙනවා. ඒ නවයෙන් අටකට අදාළව reports ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම ගල්අඟුරු දකුණු අප්‍රිකාවෙන් ආවාට Load Port Report එක එන්නේ ඉන්දුනීසියාවෙන්. ඒක නීත්‍යනුකූලව හරිද කියන ප්‍රශ්නය තමයි මතු වෙලා තිබෙන්නේ. Load Port certification එකේ ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි අනිවාර්යයෙන් Discharge Port Report එක අවශ්‍ය වන්නේ. Discharge Port Report එක ඉන්දියාවට ගිහින් තිබෙනවා. ඉන්දියාවෙන් පළමුවැනි නැවේ ගෙනා ගල්අඟුරු තොගය reject වෙලා තිබෙනවා. ඊට පස්සේ ඉතිරි අටේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. නමුත් ඒකේ calorific content එක පිළිගෙන තිබෙනවා, ash content එක reject කරලා තිබෙනවා. ඒ වාගේම අපට වැදගත්ම Norochcholai Power Plant එකේ තිබෙන reports අටම ෆේල් වෙලා තිබෙනවා කියන එක තමයි මම මේ අවස්ථාවේ මතක් කරන්නේ. මම හිතන විධියට, නොරොච්චෝලේ තමයි දන්නේ නොරොච්චෝලේ බලාගාරයට අවශ්‍ය හොඳම දේ.

ඒ නිසා තමයි Norochcholai Power Plant එක අපි මේකට අන්තර්ගත කළේ. වැදගත්ම දේ මේකයි. ඒකේ energy content එක විතරක් නොවෙයි, ඒකේ quality එක, boiler එකට impact වෙන එකත් අපි මේ අවස්ථාවේදී බලන්නට ඕනෑ. මොකද එහි tube leak එකක් ඇති වෙලා මාස 6කට විතර ප්‍රශ්නයක් ඇති වුණොත්, අන්න ඒක තමයි විදුලිබල මණ්ඩලයට සිදු වෙන ලොකුම පාඩුව. මේ discharge report එක, ඒ කියන්නේ ඉන්දියාවෙන් ආපු පළමුවෙනි Certificate of Sampling and Analysis මම කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වාගේම, ප්‍රතික්ෂේප වෙලා තිබෙන කාරණා 8ම ඇතුළත් නොරොච්චෝලේ Lakvijaya Power Station එකේ Laboratory Test Report එකත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා බලපාන්නේ ඇයි? සාමාන්‍යයෙන් ගල් අඟුරු ඉන්දියාවෙන් එන්න පුළුවන්; ඕස්ට්‍රේලියාවෙන් එන්න පුළුවන්; රුසියාවෙන් එන්න පුළුවන්; දකුණු අප්‍රිකාවෙන් එන්න පුළුවන්. ඒ ඔක්කෝම බැලුවාම ඒකේ තිබෙනවා ignite වෙන energy content එකක්. දළ වශයෙන් ඒක 5,900ක තිබිය යුතු අවස්ථාවේදී මේ shipments අටම 5,300-5,700 අතර ප්‍රමාණයක තමයි තිබෙන්නේ. ඒකෙන්, කිලෝවොට් එකක් නිෂ්පාදනය කරන්න ග්‍රෑම් 7.73ක් යනවා. දවසකට ඒ වාගේ ටොන් 105ක් අවශ්‍යයි unit එකකට. අපට units තුනක් තිබෙනවා. ඒ units තුනට සාමාන්‍යයෙන් දවසකට ගල් අඟුරු ටොන් 7,500ක් අවශ්‍යයි. මේ 7,500 දවස් 365න් වැඩි කළාම අපට වසරකට අවශ්‍ය සම්පූර්ණ ගල් අඟුරු ප්‍රමාණය එනවා. ඒ එක්කම අපේ දේශගුණ තත්ත්වයත් මීට බලපානවා. තව මාස දෙකක් යන්න ඉස්සෙල්ලා ඒ ඔක්කෝම ගල් අඟුරු නැව්ගත කිරීම අවශ්‍ය වෙනවා. ඒ ප්‍රශ්නය තමයි අපි මේ කථා කරන්නේ.

මම එනකොට යම් යම් අය අහනවා මට ඇහුණා, මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය කියලා. අපි තවම මොකුත් කරලා නැහැ, තාම ගෙන්වන්න පටන් ගෙන නැහැ කියනවා. නැහැ, emergency tenders පටන් ගෙන තිබෙනවා, ඒක කළ යුතුයි. ප්‍රශ්නයක් තිබෙනවා නම් නිෂ්පාදනය කරන්න ඒක අත්‍යවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා අරගෙන තිබෙන ස්ථාවරය හරි. නමුත් එහෙම ගන්න අවශ්‍ය වුණේ ඇයි කියන එක තමයි ප්‍රශ්නය. අවශ්‍ය වෙන්නේ ඇයි? ඒ calorific value එක අඩු වුණාට පසුව ඒකේ දහන හැකියාව අඩු වෙලා ටොන් 100න් කරන්න තිබෙන දේට දැන් ටොන් 115ක් යනවා. ඒ ප්‍රශ්නය නිසා අපට මෙගාවොට් 810ක් නිෂ්පාදනය කරන්න පුළුවන් හැකියාව 720ට අඩු වෙනවා. එතකොට ඒ 720 ගල් අඟුරුවලින් ජනනය කරන්න බැහැ. ඒක කරන්න වෙන්නේ අනෙක් තාප බලාගාරවලින්. මම දන්නා විධියට ඒ තාප බලාගාරවල එක ඒකකයක නිෂ්පාදන ගාස්තුව අද රුපියල් 72.50යි; 60-95 අතර. එහෙම බැලුවාම බිලියන 7,500ක් යනවා. ඒ නිසා තමයි අපි ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නේ.

මම දන්නවා, ඇමතිතුමා bad brief එකක් ඇදගෙන යන බව රජයේ නිලධාරින්ගේ තිබෙන ප්‍රශ්නයට. හැබැයි, ඒකට ඔබතුමා වග කියන්න අවශ්‍යයි. මම මේ සම්බන්ධයෙන් දැනගෙන ඉන්න නිසා මම කියන්නේ. මේකට සටන් කරන්න අවශ්‍යයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමන්ලාගේ සගයන් යම් විධියකට ඒක සාධාරණීකරණය කරන්න හදනවා, "ඉස්සරත් තිබුණා, ඒ නිසා දැන් එහෙම වුණාට කමක් නැහැ" කියලා. වැඩි කල් යන්න ඉස්සෙල්ලා ඔබතුමන්ලා පිළිගනීවි, "මේ ඇමතිවරුන්ට තමයි වැඩිම ප්‍රශ්න ඇති වෙන්නේ, රජයේ නිලධාරින් ප්‍රශ්න නැතිව ඒ ආකාරයෙන්ම වැඩ කරගෙන යනවා" කියන එක. මේකම තමයි ඔබතුමන්ලා අවුරුදු 76ක ශාපයක් ගැන කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු 5ක් තිබෙනවා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ඒ කැපිලා. අතැනිනුත් එකතු වුණා නේ. මම දන්නවා, එහෙම දාලා තිබෙන්නේ අපටත් උදව්වක් ගන්න පුළුවන් විධියට නේ.

මේ සම්බන්ධයෙන් direct feeding ගත්තාම, ඒ ප්‍රශ්නය නැති වෙලා තිබෙනවා. රුසියාවෙන් ගෙනාව එකයි, දැන් දකුණු අප්‍රිකාවෙන් ගෙනාපු දෙකයි අතර වෙනස අඩු කරන්න තමයි direct feeding එකක් ගෙනැල්ලා තිබෙන්නේ. Direct feeding එකක් නැති වුණා නම් මේ ප්‍රශ්නය සොයා ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් කොහොමද කියලා අපි සොයා ගන්න අවශ්‍යයි. අපි නිකරුණේ ඔය පැත්තට ඇඟිලි දික් කරන්නේ නැහැ. මොකද, ඒ පැත්තේ ඉන්නකොට අවුරුදු 76ම හැම දවසේම කියලා තිබුණේ ඔය ප්‍රශ්නයම තමයි. ඉස්සෙල්ලා කළා වාගේ හැම දේටම ආණ්ඩුව විපක්ෂයට බණින එකයි, විපක්ෂය ආණ්ඩුවට බණින එකයි නොවෙයි අපි කරන්න ඕනෑ. ඔබතුමන්ලා කරපු විධියටම හැම දවසකම යම් විධියක අභියෝගතා තිබෙනවා, protest කරනවා, බෝඩ් ලෑලි අල්ලාගෙන ඉන්නවා. අපි කාලයක් දීලා තිබෙනවා, අපට තිබුණු ප්‍රශ්න ඔබතුමන්ලාටත් දැනගන්න. දැන් අපි පෙන්වන්න ඕනෑ නැහැ, ඔබතුමන්ලා දවසින් දවස ඒවා ඔප්පු කරගෙන යනවා. ඔබතුමන්ලාට කල් යන්න යන්න පෙනෙනවා. ඔබතුමන්ලාගේ ලාල් කාන්ත, විජිත හේරත්, බිමල් රත්නායක, වසන්ත සමරසිංහ වාගේ ඇමතිවරුන්ට තේරිලා තිබෙනවා, දැන් මොනවාද වෙන්නේ කියලා. එදා බැන්නාට දැන් ඒ ලේබල් එක, ඒ තොප්පිය ඒගොල්ලන්ගේම ඔළුවට වැටිලා තිබෙනවා. අපි මේ අවස්ථාවේදී සාධාරණීකරණය කරනවා නොවෙයි. ඔබතුමන්ලා යථාර්ථය පිළිගෙන තිබෙනවා කියන එක තමයි මේ අවස්ථාවේදී මතක් කරන්න හදන්නේ.

අද විදුලිබල මණ්ඩලයට තිබෙන්නේ මේ ගල් අඟුරු ප්‍රශ්නය විතරක්ම නොවෙයි. අද ඒ අයට වෘත්තීයමය ප්‍රශ්න තිබෙනවා. ඔබතුමා ඒකට උත්තරයක් දීලා නැහැ. කොම්පැනි හතක් තිබෙන්න ඕනෑ තැනක කොම්පැනි හතරක් තිබෙනවා. ඒ හත පිළිගෙනත් නැහැ, ඒ හතර පිළිගෙනත් නැහැ. ඒ නිසා කාලපරිච්ඡේදයක් දෙන්න. යම් විධියකින් VRS එකක් ක්‍රියාත්මක කරලා, යන්න පුළුවන් අයට යන්න අවස්ථාව ඇති කරලා දෙන්න. ඒකට උත්තරයක් නැහැ. ගරු ඇමතිතුමනි, ඒගොල්ලෝ ඔබතුමාත් එක්ක සාකච්ඡා කරලා මට කිව්වා, එම සාකච්ඡා නිල නොවන මට්ටමින් අසාර්ථක වුණා කියලා. ඔබතුමා, ඔබතුමාගේ ස්ථාවරයේ ඉඳලා තිබුණා. ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ ස්ථාවරයේ ඉඳලා තිබුණා. ඒකට උත්තරයක් ලබා දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරන්න. ඔබතුමන්ලාගේ කඩුවෙල නගරාධිපතිතුමා එදා වෘත්තීය සමිතිවල ඉන්න කොට කිව්වා, මේකේ පොඩි nut එකක් ගැලෙව්වොත් මුළු එකම ඉවරයි කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු දෙකක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳව ගැටලුවක් තිබෙනවා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ නිසා, මේ මොහොතේ අනිවාර්යයෙන්ම කථා කරලා කටයුතු කරන්න. එහෙම නැත්නම් ඔබේ ආණ්ඩුවේ ස්වරූපය වන්නේ අඩි දෙකක් ඉදිරියට ගිහින්, ඊට පස්සේ අඩි තුනක් පස්සට එන එකයි. මේ අවස්ථාවේදී කථා කරලා, ඒ ප්‍රශ්නය නිරාකරණය කරන්න.

CEB එකට "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වුණු හානිය බිලියන 20.2ක් වෙනවා. ඒ ගැන මම ප්‍රශ්නයක් ඇහුවා. තවම පිළිතුරු ලැබිලා නැහැ. ඒ කියන්නේ ඔබේ cash flow එක යන්නේ, මේ විදුලිබල මණ්ඩලය ඉදිරියට යන්නේ පාරිභෝගිකයා ගෙවන මුදලින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම පොඩි වෙලාවයි ගන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ cash flow එකේ opportunity cost එකක් තිබෙනවා. ඒක ගෙවන්නේ පාරිභෝගිකයා මිසක් විදුලිබල මණ්ඩලය නොවෙයි. ඒ වාගේම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. අද ජනනය කළාට සම්ප්‍රේෂණය කරන්න බැහැ. ඒ සඳහා මිලියන 2,000ක් යනවා. එතකොට LNG එක දැන් අරගෙන වැඩක් නැහැ, දැන් කාලය ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. Solar power සඳහා best rate

එකක් අවශ්‍යයි. ඒ කියන්නේ, Battery Energy Storage System එක අනිවාර්යයෙන්ම ඇති කරන්න ඕනෑ. මේ විදුලි බිල අඩු කරන්න නම් ජනනය කිරීමේ පිරිවැය රුපියල් 40ත්, 32ත් අතර ප්‍රමාණයකින් *[බාධා කිරීමක්]* අඩු කරන්න අවශ්‍යයි.

කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසා මම මේ කාරණයත් කියලා අවසන් කරන්නම්. කරුණාකරලා අපේ විදුලි බිල අඩු කරන්න අවශ්‍යයි. විදුලි බිල අඩු කරන්න නම්, ජනනය කිරීමේ පිරිවැය අඩු කරන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ විශාල ගැටලුවක් තිබෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකරලා මේ අවස්ථාවේදී අතීතයට බැණ බැණ ඉන්නේ නැතුව, අනාගතයේදී මේ තිබෙන දේවල් නිවැරදි කරන්නේ කොහොමද කියන ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.38]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் நுரைச்சோலை அனல்மின் நிலையத்துக்கான நிலக்கரி கொள்முதல் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்திலே கலந்துகொண்டு இருக்கின்றோம்.

உண்மையிலேயே இந்த அரசாங்கம் இச்செயற்பாட்டை வெளிப்படைத் தன்மையுடனேயே செய்திருக்கிறது. ஏனெனில், இந்த நிலக்கரி கொள்முதலில் 10 விலைமனுதாரர்கள் கலந்து கொண்டு இருக்கிறார்கள். இச்செயற்பாடு வெளிப்படைத் தன்மையுடன் நடைபெற்றிருக்கிறது என்பதை கௌரவ அமைச்சர் அவர்கள் தெளிவாகக் கூறினார். அவ்வாறு இருந்தும், எதிர்க்கட்சியினர் இந்தப் பிரேரணையைக் கொண்டுவந்து இருக்கிறார்கள். மக்கள் மத்தியில் பிழையான பிம்பத்தை உருவாக்குவதற்கான ஒரு செயற்பாடாகத்தான் நாங்கள் இதனைப் பார்க்கின்றோம். இவர்கள் ஆளுங்கட்சியில் இருந்தபோது மக்களுக்குப் பல பொய்களைக் கூறியே ஆட்சி செய்தார்கள். அதன் நிமித்தமாகத்தான் இன்று எதிர்க்கட்சியில் உட்கார்ந்து இருக்கிறார்கள். எதிர்க்கட்சியில் இருந்து கொண்டும்கூட, பொய்யான தகவல்களைக் கூறி, மக்களிடத்தில் பிழையான பிம்பங்களை ஏற்படுத்த முனைகின்றார்கள். அதன்மூலம் ஏதோ சாதித்துவிடலாம், ஆட்சியைக் கைப்பற்றிவிடலாம் என்று நினைக்கின்றார்கள். மக்கள் மடையர்கள் என்று நினைத்துக்கொண்டே இவர்கள் இவ்வாறான செயற்பாடுகளைச் செய்கின்றார்கள். ஆனால், மக்கள் பூரணமாக தெளிவடைந்து இருக்கிறார்கள். அதனால் இவர்களின் பொய்களைக் கேட்டு அவர்கள் குழம்பப் போவதில்லை.

நுரைச்சோலை அனல்மின் நிலையமானது 900 மெகாவோட் மின்சாரத்தை உற்பத்தி செய்கின்றது. மொத்த மின் உற்பத்தியில் 30-40 சதவீதத்தை இது மேற்கொள்கின்றது. எமது அரசாங்கமானது வெளிப்படைத் தன்மையுடன் செயற்பட்டு, இது தொடர்பான tenders call பண்ணி, குறைந்த விலைமனுதாரருக்கே இதனை வழங்கியுள்ளது. இவர்களுடைய உறவுமுறைக்காரருக்கு விலைமனு கிடைக்கவில்லை என்று நான் நினைக்கின்றேன். அதனால்தான் இவர்கள் பாராளுமன்றத்தில் இவ்வாறான பிரேரணைகளைக் கொண்டுவந்து நேரத்தை வீணடிக்கின்றார்கள். இவர்கள் கொண்டுவருகின்ற பிரேரணைகள் இவர்களுக்கே எதிர்வினையாற்றுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது.

புதுப்பிக்கத்தக்க சக்தி மூலமான மின் உற்பத்தி நோக்கி நாங்கள் நகர வேண்டிய கடப்பாடு இருக்கின்றது. வட மாகாணத்தில் சூரிய மின்கலங்கள் ஊடாக அதிக மின் உற்பத்தியை மேற்கொள்ள முடியும். அதேபோல், காற்றாலை மூலமாகவும் மின் உற்பத்தியை மேற்கொள்ள முடியும். அந்த வகையில், சூழலுக்கு எந்த வகையிலும் பாதிப்பு இல்லாத வகையில் எமது நாட்டில் மின் உற்பத்தியை மேற்கொள்ள முடியும். எமது நாட்டில் நாளுக்கு நாள் மின் பாவனை அதிகரித்துக்கொண்டு போவதற்கு மின்சாரம்மூலம் இயங்கக்கூடிய அதிகளவான வாகனங்கள் எமது நாட்டுக்குக் கொண்டுவரப்படுவதும் ஒரு காரணமாகும். இதனால் நாங்கள் நிலக்கரிமூலம் மின்சாரத்தை உற்பத்தி செய்வதைவிட, புதுப்பிக்கத்தக்க சக்திமூலம் மின்சாரத்தை உற்பத்தி செய்வதில் அதிக கவனம் செலுத்தி இருக்கின்றோம். மக்களுக்கு மின்சாரத்தை விநியோகிக்க வேண்டிய கடப்பாடு எங்களுக்கு இருக்கின்றது. அந்த வகையில், இதற்கான கொள்முதலை நாங்கள் மேற்கொண்டு இருக்கின்றோம். இது வழமையாக நடைபெறுகின்ற ஒரு செயற்பாடுதான். கடந்த காலங்களில் வெளிப்படைத் தன்மை இல்லாமல் tenders call பண்ணப்பட்டன; வெளிப்படைத் தன்மை இல்லாமல் தனிநபர்களுக்கு நிலக்கரியை இறக்குமதி செய்வதற்கான அனுமதிகள் வழங்கப்பட்டன என்று கௌரவ அமைச்சர் அவர்கள் கூறியிருந்தார். அதன் சுமையை இன்று மக்கள் அனுபவிக்கிறார்கள்.

ஊழலற்ற நாடுகளின் பட்டியலில் எமது நாடு 14 இடங்கள் முன்னேறியிருப்பதை அண்மையில் வெளியான ஊழல் குறிகாட்டி சுட்டெணில் காணலாம். ஆனால், நாங்கள் ஊழல் செய்துவிட்டதாக இன்று எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் கூறுகின்றார்கள். அவ்வாறென்றால், உலகளாவிய அமைப்புகள் கணிக்கின்ற கணிப்புகள் எல்லாம் பொய்யா? எதிர்கட்சியினர் கூறுவதுதான் உண்மையா? என நாங்கள் கேட்கின்றோம். ஊழல் அற்ற நாடுகளின் பட்டியலில் தற்போது எமது நாடு 107ஆவது இடத்தில் இருக்கின்றது. அதுவும் ஒரு வருடத்தில் 14 இடங்கள் முன்னோக்கி நகர்ந்திருக்கிறோம். இந்த முன்னோக்கி நகர்தல் என்பது படிப்படியாக முன்னோக்கி நகர்ந்துகொண்டுதான் செல்லுமே ஒழிய, பின்நோக்கி நகராது என்பதை நாங்கள் திடமாகக் கூறுகின்றோம். நாங்கள் கூறவில்லை, உலக நாடுகளிலுள்ள பல அமைப்புகள் கூறுகின்றன, எமது நாடு துரிதமாக மீண்டெழுந்து வருகின்றது என்று. அதை மக்களும் நம்புகிறார்கள். அதனால்தான் இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கு இருக்கின்ற மக்களின் ஆதரவு மென்மேலும்

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

அதிகரித்துக்கொண்டு போகின்றது. தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின்மீது நாட்டு மக்களுக்கு இருக்கின்ற நம்பிக்கை ஒவ்வோர் ஆண்டும் அதிகரித்துச் செல்கின்றது என்பது எங்களுக்குத் தெரியும்.

அடுத்து, எதிர்க்கட்சியினர் முன்வைத்த கூற்றுகளைப் பார்ப்போம். ஆறு மாதங்களில் இந்த ஆட்சி கவிழ்ந்துவிடும் என்று நாங்கள் ஆட்சியமைத்தபோது எதிக்கட்சியினர் கூறினார்கள். இவ்வாறு இவர்கள் பொய் கூறிக்கொண்டு இருக்கிறார்கள். இவர்களது வாயிலிருந்து வருவது பொய் என்பதை மக்கள் நாளுக்கு நாள் உணர்கிறார்கள். அதனால்தான் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் மீதான நம்பிக்கை அதிகரித்த வண்ணம் இருக்கின்றது. முன்னைய காலங்களில் ஆளும் கட்சிக்கு வட மாகாணத்திலோ, தமிழ் மக்கள் மத்தியிலோ, எந்தவோர் ஆதரவும் இல்லை. ஆனால், இந்த முறை தேசிய மக்கள் சக்தி சார்பில் வட மாகாணத்திலிருந்து பலர் பாராளுமன்றத்துக்குத் தெரிவுசெய்யப்பட்டு இருக்கிறார்கள். இன்று வட மாகாணத்தைச் சேர்ந்த பலர் அரசாங்கத்தில் அங்கம்வகிக்கிறார்கள். இந்த அரசாங்கத்தின் மீதான நம்பிக்கை மென்மேலும் வலுவடைந்துகொண்டு செல்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களோ அல்லது கௌரவ பிரதமர் அவர்களோ வட மாகாணத்துக்கு விஜயம் செய்யும்போது, அனைத்து மக்களும் ஒன்றுபட்டு ஆதரவு தெரிவிக்கின்றார்கள். அவ்வாறு அந்த மக்களின் உள்ளங்களிலிருந்து ஆதரவு வருவதற்குக் காரணம், எங்களது அரசாங்கத்தின் செயற்பாடுகள்தான். எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் பொய்யான தகவல்களைக் கூறும்போது, அது பொய்யென நாட்டு மக்கள் உணர்கின்றார்கள். தங்களுடைய எதிர்க்கட்சியை அழித்துக்கொள்ளும் நிலைக்கு அவர்கள் தள்ளப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

நேற்றைய தினம் இந்தச் சபையில் கூறியிருந்தார்கள், நாங்கள் ஏதோ நிழல் அமைச்சுப் பதவிகளை ஏற்றதாக. இவ்வாறு வதந்திகளைப் பரப்புகின்றார்கள். ஆளுநரை நியமித்தது இந்த நாட்டின் சனாதிபதி அவர்கள். நாங்கள் ஆளுநர் அவர்களுக்குப் பக்கபலமாக நிற்பதுடன், அவர் வினைத்திறனாக இயங்குவதற்கு எமது ஆதரவையும் வழங்குவோம். அடிக்கடி நாங்கள் ஆளுநர் அவர்களைச் சந்திப்போம். இவர்கள் யாழ்ப்பாணத்தில் வாக்குகளைப் பெற்றுவிட்டு, கொழும்பில் அதிசொகுசு வீடுகளில் வாழ்கின்றார்கள். யாழ்ப்பாணத்துக்கு வருவதில்லை. அங்கு எங்கேயாவது கூட்டம் என்றால் மட்டும்தான் வருவார்கள். இவர்கள் இந்த உயரிய சபையில் பிழையான தகவல்களைக் கூறுகின்றார்கள். "இவர்கள் கூறுவதைக் கூறட்டும்! உங்களது கடமைகளை நேர்மையாகச் செய்யுங்கள்! உங்களுக்கான ஆதரவு பெருகும்" என்று மக்கள் எங்களிடம் கூறுகிறார்கள். நேற்றுக்கூட, வட மாகாணத்தில் இருந்து தொலைபேசிமூலம் தொடர்புகொண்டு இவ்வாறு தெரிவித்திருந்தார்கள். எனவே, இவர்கள் பாராளுமன்றத்துக்கு வந்து கத்திவிட்டுச் செல்ல வேண்டியதுதான். இவர்கள் கூறிய கருத்துகளுக்குப் பதிவிடப்பட்டுள்ள commentsஐப் பார்த்தால், அவை இவர்களுக்கு எதிர்மறையாகத்தான் இருக்கின்றன. நாளுக்கு நாள் தேசிய மக்கள் சக்திக்கான ஆதரவு தமிழ் மக்கள் மத்தியில் அதிகரிக்குமென்ற திடமான நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. ஏனெனில், தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த நாட்டு மக்கள் எவருக்கும் துரோகம் செய்யாது. தமிழ், சிங்களம், முஸ்லிம் என்று பிரித்துப் பார்க்காது, அனைவரையும் இந்த நாட்டு மக்கள் என்றுதான் எமது அரசாங்கம்பார்க்குமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.46]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

பல்லின மக்கள் செறிந்து வாழும் கற்பிட்டி பிரதேசத்தின் நுரைச்சோலைப் பகுதியிலே 'லக்விஜய' நிலக்கரி மின் உற்பத்தி நிலையம் அமையப்பெற்றுள்ளது. இந்தப் பிரதேசமானது மீன் வளமுள்ள, மரக்கறி உற்பத்தி செய்யக்கூடிய வளம் மிக்கதொரு பிரதேசமாகும். அங்கு அனல்மின் நிலையம் அமைக்கப்படும்போது, அப்பிரதேச மக்கள் பாரிய ஆர்ப்பாட்டங்களில் ஈடுபட்டனர். அது அரச அபிவிருத்திக்கு எதிரானதல்ல. மாறாக, சூழல் பாதுகாக்கப்பட வேண்டும், மீன் வளம் காக்கப்பட வேண்டும், பயிர்கள் மற்றும் மரங்கள் அழிவிலிருந்து பாதுகாக்கப்பட வேண்டும், பிரதேச மக்கள் நோய்நொடியின்றி ஆரோக்கியமாக வாழ வேண்டும் என்ற பொது நோக்கின் அடிப்படையில் மேற்கொள்ளப்பட்டதாகும். இந்த மக்கள் எதிர்ப்புக்கு அன்றைய அரசாங்கம் வழங்கிய உத்தரவாதம் யாதெனில், தரமான நிலக்கரியைப் பயன்படுத்துவதன்மூலம் சூழல் மாசடைதல் கட்டுப்படுத்தப்படும், அந்தப் பிரதேச மக்களுக்குத் தொழில்வாய்ப்புகள் வழங்கப்படும் என்பதுதான். எனினும், தொழில்வாய்ப்புகள் சமத்துவமான முறையில் வழங்கப்படவில்லை. இன்று தரமான நிலக்கரிப் பாவனை தொடர்பான சந்தேகம் எழுந்துள்ளது. எனவே, எதிர்வரும் காலத்தில் நிலக்கரி கொள்வனவு விடயத்தில் 'தரமான நிலக்கரி' என்ற விடயத்தை முதன்மைப்படுத்தி tender கோரப்பட வேண்டும் என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். கடந்த காலங்களில் மட்டுமல்ல, இப்பொழுதும் அங்குள்ள மக்கள் பல்வேறு நோய்களுக்கு உட்பட்டு மிகவும் கஷ்டப்படுகின்றார்கள். எனவே, இது ஒழுங்குபடுத்தப்பட வேண்டும் என்பதை நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று இந்த நாட்டில் பாதுகாப்பு கேள்விக்குறியாக்கப் பட்டு இருக்கின்றது. அண்மையில் ஜிந்துப்பிட்டியில் சலூன் ஒன்றில் இடம்பெற்ற துப்பாக்கிச் சூட்டுச் சம்பவத்தில் வெள்ளிமலை, பண்டாரவள்ளிப் பகுதியைச் சேர்ந்த சகோதரர் சஹ்ரின் என்பவர் மரணமடைந்தார். அவர் ஷஹீதுடைய அந்தஸ்தைப் பெற வேண்டுமென நாங்கள் 'துஆ' செய்கின்றோம். அந்தச் சம்பவத்தில் படுகாயமடைந்த சகோதரர் சமீம் ICUஇல் இருக்கிறார். அவர் விரைவாக குணமடைய வேண்டுமென நான் பிரார்த்திக்கின்றேன். இவ்வாறான சம்பவங்கள் நாட்டில் பாரிய பிரச்சினைகளை உருவாக்கிக்கொண்டு இருக்கின்றன. ஆளும் தரப்பினர் கூறுவதுபோல், மக்கள் இந்த அரசாங்கத்துக்கு மிகுந்த நம்பிக்கையோடுதான் வாக்களித்தார்கள். அதாவது, இவ்வாறான நிலைமைகளிலிருந்து நாட்டைப் பாதுகாப்பார்கள் என்று அவர்கள் நினைத்தார்கள். ஆனால்,

இன்று பாதுகாப்பு விடயத்தில் பல கேள்விக்குறிகள் இருக்கின்றன. எனவே, எதிர்காலத்தில் இது சம்பந்தமாக நல்ல முடிவுகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றோம்.

புனித அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகளின் விடுவிப்பு சம்பந்தமாக அண்மையில் கௌரவ வெளிநாட்டலுவல்கள் அமைச்சர் அவர்கள் கருத்துக் கூறியிருந்தார். அதாவது, அல்-குர்ஆன் பிரதிகள் பாதுகாப்பு சம்பந்தமான விடயங்களுக்காகத் தடுத்துவைக்கப்படவில்லை என்றும் ஒருசில முஸ்லிம் அமைப்புகளால் தெரிவிக்கப்பட்ட சிபாரிசின் அடிப்படையில்தான் அவை தடுத்துவைக்கப்பட்டு இருக்கின்றன என்றும் சொல்லியிருந்தார். இவற்றை எல்லாம் சரி செய்வதற்காகத்தான் மக்கள் உங்களுக்கு வாக்களித்து இருக்கிறார்கள். இவ்வாறு கூறுவதை விடுத்து, இந்த அல்-குர்ஆன் பிரதிகளை விரைவாக விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும்.

நான் இந்த Sitting weekஇல் இது சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்களுடன் பேசியபோது, அடுத்த Sitting weekஇல் முஸ்லிம் MPsஐயும் அழைத்து, உரிய தரப்புக்களோடு பேசி, இவ்விடயம் சம்பந்தமாக விரைவாக முடிவெடுப்பதாகக் கூறினார். இது தொடர்பில் நீங்கள் விரைவாக முடிவெடுத்து, இந்த அல்-குர்ஆன் பிரதிகளை விடுவிப்பீர்களென நாங்கள் நம்புகின்றோம். நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் கோரியதற்கு அமைய, அவர் உரிய அமைச்சுக்கு உத்தரவிட்டு, அவற்றை விரைவாக விடுவிப்பாரென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் அந்தக் கூட்டத்தை விரைவாக நடத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கடந்த காலங்களில் இவ்வாறான கூட்டங்கள் நடத்தப்படவில்லை. அதனால் என்ன நடக்கின்றது என்று எங்களுக்குத் தெரியவில்லை. ஒரு கூட்டத்தை ஒழுங்குசெய்து, சகல முஸ்லிம் MPமார்களுடனும் பேசி, இந்த விடயத்தைத் தீர்க்கக்கூடிய நிலைக்கு இந்த அரசாங்கம் வந்திருக்கிறது. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் கௌரவ அமைச்சர் அவர்களுக்கும் இந்த இடத்தில் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இளவங்குளம் பாதை திறப்பு சம்பந்தமாக வீதி அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சருடனும் சுற்றாடல் அமைச்சருடனும் விரைவில் கலந்துரையாடல் ஒன்று நடைபெற இருக்கின்றது. இந்தப் பாதை திறப்பு சம்பந்தமாக அண்மையில் நான் பாராளுமன்றத்தில் கேள்வி எழுப்பியபோது, கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் குறிப்பிட்டதுபோல், இன்றும் நாங்கள் இது சம்பந்தமாகக் கதைத்தோம்; மன்னாருக்கு வந்தபோதும் கதைத்தோம். விரைவாக கூட்டமொன்றை நடத்தி, இந்த வீதியைத் திறப்பது சம்பந்தமான முடிவொன்றை எடுப்பதாக அவர் கூறியிருந்தார். அவரது இவ்வாறான செயற்பாடுகளை வரவேற்பதுடன், அவருக்கு இந்த இடத்தில் நன்றியையும் கூறிக்கொள்கின்றேன். எனவே, புனித அல்-குர்ஆன் பிரதிகளின் விடுவிப்பு மற்றும் இளவங்குள வீதி திறப்பது தொடர்பில் விரைவாக முடிவுகளை எடுத்து, எமது மக்களிடத்தில் நம்பிக்கையை ஏற்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அண்மையில் ஏற்பட்ட பாரிய வெள்ளத்தால் அல்-குர்ஆன் பிரதிகள் சேதமடைந்துள்ளன. எனவே, இந்த அல்-குர்ஆன் பிரதிகளின் விடுவிப்பு மிக விரைவாக நடைபெற வேண்டும். இளவங்குளம் பாதை திறக்கப்படாமையால் நாட்டினுடைய ஒரு பகுதியின் முன்னேற்றம் தடுக்கப்படுகின்றது. வட மாகாணத்துக்கு இந்தப் பாதை ஊடாகப் பயணிக்கும்போது கிட்டத்தட்ட 80 கிலோமீற்றர் தூரம் குறைவு. அவ்வாறு இருக்கின்றபோது, இந்த வீதியைத் திறப்பதில் ஏன் இவ்வளவு காலதாமதம்? எனக் கேட்கின்றேன். நான் ஏற்கனவே கூறியதுபோல, நீதிமன்றத்தில் சிலர் இந்தப் பாதையை மூடுவதற்கு ஒத்துக்கொண்டாலும், இதனை மூடவிட முடியாது என்பதில் மக்கள் உறுதியாக இருக்கிறார்கள். அந்தப் பாதையை மூடுவது தொடர்பில் நீதிமன்றத் தீர்ப்பு இல்லை என்பதை நான் அன்று தெளிவாகக் குறிப்பிட்டேன். எனவே, இது தொடர்பாக சம்பந்தப்பட்ட அமைச்சு விரைவாக முடிவொன்றைப் பெற்றுத்தர வேண்டுமென இந்த இடத்தில் கேட்டு, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගල් අඟුරු ටෙන්ඩරය පිළිබඳව විපක්ෂය කරන චෝදනාවක් සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන යෝජනාවක් තමයි අපි අද විවාදයට ලක් කරන්නේ. මම හිතන විධියට, මේ සම්බන්ධව ඇත්තටම අපට තවත් කථා කරන්න දේවල් ඉතුරු වෙලා නැහැ. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා විසින් මේ ක්‍රියාවලිය පිළිබඳව ඉතාම පැහැදිලිව විස්තර කළා. විපක්ෂය ඇත්තටම කතන්දරයක් නේ, මේ කියන්නේ. වෙන මොකක්වත් නොවෙයි, කතන්දරයක් තමයි විපක්ෂය ඉදිරිපත් කරන්නේ. නිශ්චිතව කොතැනද වංචාවක් සිද්ධ වෙලා තිබෙන්නේ, ටෙන්ඩර් ක්‍රියාවලියේ මොකක්ද වැරදියට සිද්ධ වෙලා තිබෙන්නේ, අර කිව්වා වාගේ කාට හරි, කුමන හෝ ආයතනයකට මේ සැපයුමට සම්බන්ධ වෙන්න බැරිකමක් මතු වෙලා තිබෙනවාද, එහෙම කවුරු හරි appeal කරලා තිබෙනවාද යනාදිය සම්බන්ධයෙන් කිසිදු අදහසක්, කිසිම චෝදනාවක් විපක්ෂය පැත්තෙන් මතු වෙන්නේ නැහැ. ඒ වෙනුවට ඒගොල්ලන් කතන්දරයක් හදනවා. අද උදේ ඉඳන්ම ඒගොල්ලන් එක කථාවක් තමයි හදන්නේ. මොකක්ද, ඒ කථාව? ඒ කථාවෙන් කියන්න හදනවා, ගල් අඟුරුවල ප්‍රමිතිය බාල වීම නිසා අනිවාර්යයෙන් වංචාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියලා. සරලව ඒක තමයි කතන්දරය.

මීට ඉස්සෙල්ලාත් ගල් අඟුරු නැව් ඇවිල්ලා තිබෙනවා. ප්‍රමිතිය බාල වීම නිසා ඒවා reject කරලා තිබෙනවා. ඒවා ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ පමණක් සිද්ධ වෙච්ච දෙයක්වත්, කුමාර ජයකොඩි ඇමතිතුමා යටතේ පමණක් සිද්ධ වෙච්ච

[ගරු නිම්ෂා ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

දෙයක්වත් නොවෙයි. මෙතුමන්ලාගේම, මේ විපක්ෂයේම ඉන්න මහත්වරුන්ගේ පක්ෂවල ආණ්ඩු තිබුණු කාලයේදීත් ඒ සිද්ධිය ඒ විධියටම සිදු වෙලා තිබෙනවා. එහෙම කිව්වාම කියනවා, ඒ කාලයේ සිද්ධ වෙච්ච දේවල් අද කාලයේත් සිද්ධ වන බව කියනවාය කියලා. අපි කියන්නේ නැහැ, ඒ කන්ටේනර් reject වෙච්ච එක අනිවාර්යයෙන් වංචාවක්ය කියලා. ඔබතුමන්ලා ඒක පැහැදිලි කර ගන්න. ඔබතුමන්ලාගේ පාලන කාල තුළ කන්ටේනර් reject වෙච්ච හැම අවස්ථාවකදීම වංචාවක් වුණාය කියලා චෝදනාවක් අපි ඉදිරිපත් කරන්නේ නැහැ. සමාවෙන්න, කන්ටේනර් නොවෙයි නැව්; නැව් reject වෙච්ච අවස්ථා. කන්ටේනර් කථාවකුත් පටලවනවා නේ, ගෙනැල්ලා. ඒ නිසා ඒකත් පැටලෙනවා. නැව් reject වෙච්ච එක වංචාවක්ය කියලා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ, ඒක මේ ක්‍රියාවලිය තුළ වෙන්න පුළුවන් දෙයක් කියන එකයි. ඒක ඔබතුමන්ලාගේ රජයන් යටතේත් සිදු වෙලා තිබෙනවා. මේ වෙලාවේදීත් ගල් අඟුරුවල ප්‍රමිතිය බාල විය හැකියි. ගල් අඟුරු වෙන රටවලින් ගෙනෙන්නේ. ලංකාවේ ගල් අඟුරු mine කරන්නේත් නැහැ. ගල් අඟුරු අපට වෙන රටකින් තමයි ගෙනෙන්න සිදු වෙන්නේ. ඒ නිසා තමයි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ ගල් අඟුරු සැපයුම සිද්ධ කරන්නේ. ඒක නේ, ඒ සම්බන්ධව දෙන්න පුළුවන් ආරක්ෂාව. වෙන මොකක්ද, ඒ සම්බන්ධව දෙන්න පුළුවන් ආරක්ෂාව? වෙන මොකක්ද ඒ සම්බන්ධයෙන් අපට ගන්න පුළුවන් පියවර? ලංකාවේ ගල් අඟුරු නැත්නම්, අපේ රජය ගල් අඟුරු mine කරන්නේත් නැත්නම්, අපට ගල් අඟුරු ආකරත් නැත්නම්, වෙන කොහේ හරි ගල් අඟුරු ආකරයක තිබෙන ගල් අඟුරු තමයි අපට ගෙනෙන්නට වෙන්නේ. එහෙම ගල් අඟුරු ගෙනෙන ක්‍රියාවලිය තුළ යම්කිසි ආරක්ෂාවක් තිබෙන්නට ඕනෑ, අපට මොකක් හරි පාඩුවක් වෙනවා නම් ඒක recover කර ගන්න; ඒ පාඩුව නැවත අපට අය කර ගන්න පුළුවන් ආකාරයේ වගන්ති තිබෙන්නට ඕනෑ. ඒකට තමයි penalty clause එකක් තිබෙන්නේ. කවුරු හරි සැපයුම්කරුවෙකුට අපට අවශ්‍ය ප්‍රමිතියට ගල් අඟුරු සපයන්න බැරි වුණොත් රජය ඒකට දඩයක් අය කරනවා. ඒ දඩය ගැනත් ඒ කොන්ත්‍රාත්තුව තුළම තිබෙනවා. ඒ නිසා මට තේරෙන්නේ නැහැ, මේ තරම් සරල කාරණයක් විපක්ෂය මොන හේතුවකට මෙච්චර සංකීර්ණ කරගෙන දඟලනවාද කියලා.

ඇත්තටම මම හිතන විධියට මේ ගැන මොකක් හරි නිශ්චිත හේතුවක් තිබෙන්න ඕනෑ. එකම නිශ්චිත චෝදනාවයි නේ, අද මතු වුණේ. මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා, ඇමතිතුමාගේ බිරිඳගේ අම්මාගේ, ඒ කියන්නේ නැන්දම්මාගේ account එකට මේ ගනුදෙනුවට අදාළව කවුරු හරි සල්ලි දැම්මා ලු කියලා. ඒක තමයි මේ වංචා, දූෂණ සම්බන්ධයෙන් ආපු එකම චෝදනාව. වෙන කිසිම විධියක නිශ්චිත චෝදනාවක් ඉදිරිපත් වෙන්නේ නැහැ. එතකොට ඒ වංචාව, දූෂණය බරපතළ චෝදනාවක් නේ. අපිත් කලබල වෙනවා නේ, අපේ ඇමතිතුමාගේ නැන්දම්මාගේ account එකට අදාළව ඒ වාගේ ගනුදෙනුවක් වුණාය කිව්වාම; එතුමාටත් වගකීමක් තිබෙනවා නේ. ඒක බරපතළ චෝදනාවක්; පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරමින් කරන චෝදනාවක්. ඒ නිසා එතුමා ඇවිල්ලා කියන්න ඕනෑ, මොකක්ද account එක, කීයක් දමා තිබෙනවාද, මොකක්ද ප්‍රශ්නය කියලා. ඒ ගැන එතුමා මේ සභාවට ඇවිල්ලා කියන්න. ඒක නේ, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ වගකීම; විපක්ෂයේ වගකීම. නමුත්, තවමත් එතුමා නැහැ. එතුමා ඒක කියලා ගියා, ගියාමයි දැනුත් නැහැ. දැන් විවාදය අවසන් වෙන්නත් ළඟයි. මේකද වංචා, දූෂණ සම්බන්ධයෙන් විපක්ෂයේ වගකීම? එහෙම account එකක් තිබෙනවා නම්, ඒ ගැන විස්තර මෙතැන කියන්න බැරි නම්, අඩු ගණනේ Bribery Commission එකට ලබා දෙන්න. මොනවා හරි තොරතුරු ලබා දෙන්න එපායැ. මොකක්ද මේ කරන විහිළුව? විපක්ෂයේ කාර්යභාරය තමන් විසින්ම විහිළුවකට ලක් කර ගන්නවා නේ. මේ වාගේ නාඩගම් නැටුවාට පස්සේ ඔබතුමන්ලාව seriously ගන්නේ කවුද? අපිටත් දුකයි.

දෙවැනි කාරණය මේකයි. මම හිතන විධියට, මේ කාරණය අපි මතු කර ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි මෙහෙම වෙන්නේ කියන එක අපි මතු කර ගන්න ඕනෑ. ගරු ඇමතිතුමා බොහොම පැහැදිලිව ඒ ගැන ප්‍රකාශ කළා. නමුත්, ඒ ගැන ඊටත් වඩා පැහැදිලි කර ගන්න ඕනෑ කියලා මට හිතෙනවා. මේ ගනුදෙනුව, මේ coal tender එක ඩොලර් මිලියන 150ක ටෙන්ඩර් එකක්. ඒ කියන්නේ, මේ රජයට ගල් අඟුරු සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවෙකුට අතිවිශාල මුදලක් ලැබෙනවා. බලශක්තිය සම්බන්ධව මේ වාගේ සැපයුම් අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සැපයුම්වල තිබුණු අක්‍රමිකතා නිසා අපේ විදුලි බිල වැඩි වීම සම්බන්ධයෙන් සාකච්ඡාවකුත් රටේ තිබෙනවා. ඒක නේ, ප්‍රශ්නය. ඒක නේ, දැන් මේ හැමෝම කියන්නේ, ඩීසල් බලාගාරවලට අරක දුන්නා, මෙතැනට අරක දුන්නා කියලා. ඒක හරි. එහෙම ප්‍රශ්න තිබෙනවා. එතකොට අපිට තේරෙන දේ මොකක්ද? මේ බලශක්ති ක්ෂේත්‍රයේ සැපයුම් සම්බන්ධව ගැටලු කාලයක් තිස්සේ, ආණ්ඩු ගණනාවක් යටතේ තිබිලා තිබෙනවා. එතකොට අපේ වගකීම මොකක්ද? අපේ වගකීම තමයි, සැපයුම් සම්බන්ධව තිබෙන මේ ගැටලුව විසඳන එක. ඒක transparent කරන එක; විනිවිදභාවයකට ගෙනෙන එක. පුළුවන් තරම් අඩු මිලට, රජයට පාඩුවක් නොවන ආකාරයට සැපයුම කරන එක තමයි අපේ වගකීම වෙන්නේ. ඒකට තමයි අපි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පාවිච්චි කරන්නේ. එහෙම කරලා තිබියදී මේ මන්ත්‍රීවරුන් මෙතැනට ඇවිල්ලා මොකක්ද කරන්නේ? ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් කවුරුවත් challenge කරලාත් නැහැ, නඩු දාලාත් නැහැ, appeal කරලාත් නැහැ.

එහෙම කිසිම ගැටලුවක් නැහැ. නමුත් මෙතුමන්ලා මේ මොකක්ද කරන්නේ? අර ඇමතිතුමා කිව්වා වාගේ, ඇත්තටම මේ සැපයුම් මීට ඉස්සෙල්ලා ලබා දුන්නේ දේශපාලනඥයින්ගේ අභිමතයට; දේශපාලනඥයින්ගේ කැමැත්තට. කැබිනට් තීරණවලින්ම නොවෙයි, ටෙන්ඩර් ලබා දෙන්නේ. ටෙන්ඩර් එක approve කරනවා, කැබිනට් එක. ඒක වෙනම වැඩක්. නමුත් tender process එක යටතේ තමයි තීරණය කරන්නේ, කවුද සැපයුම්කරුවා කියලා. කැබිනට් එකේදී ඇමතිවරයාගේ, නැත්නම් මුදල් ඇමතිවරයාගේ, ඒ කාගේ හෝ කැමැත්තට, එනම් දේශපාලනඥයා කැමැති සැපයුම්කරුවාට තමයි දුන්නේ. එතැන තමයි කොමිස් එක තිබෙන්නේ. දේශපාලනඥයා කැමැති සැපයුම්කරුවාට තමයි ටෙන්ඩර් එක ලබා දුන්නේ. ඒකටයි Cabinet Paper එකක් දමන්නේ. ඇයි හංගන්නේ? ඒකටයි Cabinet Paper එකක් දමන්නේ. ඒකට තමයි 2023-2024 අවුරුද්ද සඳහාත් Cabinet Paper එකක් දමා තිබෙන්නේ. Tenders call කරලා සැපයුම්කරුවෙක් තෝරා ගෙන ඒ සැපයුම්කරුට දෙන්නේ නැතුව වෙන කෙනෙකුට දුන්නා. ඒක ඇමතිවරයාගේ තීරණය. වෙන මොකක්ද? Cabinet Paper එක කියන්නේ ඒකට. හරිද? එහෙම කරලා අපට ඇඟිල්ල දිගු කරනවා, අපි ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරියටම කළාට පසුව. මොකක්ද, මේකේ තේරුම?

අපි මෙතැනදී තේරුම් ගත යුත්තේ මොකක්ද? නිශ්චිත කරගන්න මේ කාරණය. පසුගිය අවුරුදු කිහිපය තුළ Cabinet Paper එකට අනුව, ඒ කියන්නේ ඇමතිවරයාගේ කැමැත්තට පමණක් ලබා දීපු සැපයුම්කරුවෙක් හිටියා. නමුත් ඒ සැපයුම්කරුවාට මෙවර ටෙන්ඩර් එක අහිමි වෙලා තිබෙනවා; ඩොලර් මිලියන 150ක් අහිමි වෙලා තිබෙනවා. ඒකටද, හිටපු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් මෙතැන කථා කරන්නේ? අරගොල්ලන්ගේ නියෝජිතයන්ද මේ ඉන්නේ? ප්‍රජාතන්ත්‍රවාදයට, මහජන සංවාදයට - public discourse එකට - මොන හානියක්ද,

මේ සිද්ධ කරන්නේ මේ මන්ත්‍රීතුමන්ලා මෙතැනට ඇවිල්ලා? ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදීවයි මෙතැනට ඇවිල්ලා ඉන්නේ. ඔබතුමන්ලා විපක්ෂයේ වෙන්න පුළුවන්. නමුත් ඔබතුමන්ලා මන්ත්‍රීවරුන්. ඔබතුමන්ලා එක එක්කෙනාගේ සල්ලිවලට විකිණෙන්න ඕනෑ නැහැ; සමාගම් වෙනුවෙන් මෙතැන කථා කරන්න අවශ්‍ය නැහැ. ඔබතුමන්ලා ජනතා පරමාධිපත්‍යය, නම්බුව ආරක්ෂා කරන්න; මන්ත්‍රීවරු හැටියට වැඩ කරන්න; මහජන අභිලාෂය වෙනුවෙන් කටයුතු කරන්න. එහෙම කටයුතු කරන්නේ නැතුව මේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කර කර ඔබතුමන්ලා එක සමාගමක් වෙනුවෙන් මේ කරන විකාරය මොකක්ද? එක සමාගමක් වෙනුවෙන් තමයි මේ සියල්ල කරන්නේ.

අපිට ඒ සමාගමත් එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි මේක තේරුම් ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමාගමකට සුදුසුකම් තිබෙනවා නම්, ඒ ක්‍රියාවලියට අදාළ pricing කරනවා නම්, ටෙන්ඩර් කොන්දේසි දෙනවා නම්, -අපි මේ දිලිත් ජයවීර මන්ත්‍රීතුමාගේ සමාගමටත් දුන්නා කියලා ජනාධිපතිතුමා කිව්වේ.- අපිට ප්‍රශ්නයක් නැහැ. අපි දේශපාලනිකව කිසිම දෙයක් බලන්නේ නැහැ. Tender conditions qualify කරනවා නම්, ඒකට අදාළව නම් එන්නේ, ඕනෑ කෙනෙකුට ටෙන්ඩර් එක ගන්න පුළුවන්. එහෙම තමයි වෙන්න ඕනෑ. ඔබතුමන්ලා මේ කරන්නේ මොකක්ද? මේ Debate එක සම්බන්ධව විතරක් නොවෙයි, බලශක්තිය සම්බන්ධව පවත්වන ඕනෑම සාකච්ඡාවක් ගැන බලන්න. මේ quality එක තිබෙනවා, මේ ලක්ෂණය තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලබා දී තිබෙන කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න.

අපි මේ කාරණය අවධාරණය කරගන්නම ඕනෑ. ඔබතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය, මහජන සංවාද අවකාශය විහිළුවක් කරනවා. ඔබ ඔය වැඩේ නවත්වන්න. විපක්ෂය හැටියට ඇත්තටම ආණ්ඩුවට විවේචනයක් කරන්න, විහිළු කරන්නේ නැතුව. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ වලංගුභාවය තමන් විසින්ම සල්ලිවලට විකුණලා නැති කර ගන්නවා. ඔය වැඩේ ගැන නම් ඇත්තටම අපට කනගාටුයි. නමුත් කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා විපක්ෂයේ කාර්යභාරය ඉෂ්ට කරන්න, මේ වාගේ විහිළුකාර debates කරන්න එන්නේ නැතුව.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව පටන් ගන්නකොටම මම කියන්න කැමැතියි, විපක්ෂයේ කාර්යභාරය වන්නේ ආණ්ඩුවක් හැටියට සිදු කරන ගනුදෙනුවල අඩුපාඩු පෙන්වා දෙන එක, ඒවායේ වංචා, දූෂණ සිදු වෙලා තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවට ඒ ගැන අවධාරණය කරමින් ඒවා පෙන්වා දෙන එකයි කියන කාරණය. මෙතැන කවුරුහරි සල්ලිවලට විකිණිලාද කියලා මම දන්නේ නැහැ. එහෙම කවුරුහරි සල්ලිවලට විකිණිලා ඉන්නවා නම්, කියන්න ඕනෑ කවුද එහෙම සල්ලිවලට විකිණිලා මෙතැන කථා කරන්නේ කියලා. එහෙම නම්, ඒ අයගේ නම් කියන්න ඕනෑ. එහෙම නැතුව සල්ලිවලට විකිණිලා ඉන්නවා කියලා නිකම් කිව්වාට තේරුමක් නැහැ; ඕවායෙන් වලක් නැහැ. මොකද, ඔබතුමන්ලා බලයට ගෙනා කට්ටියටම තමයි ඔබතුමන්ලා චෝදනා කරන්නේ. අපි කවුරුවත් ඔය කියන කට්ටියට ඡන්දය දුන්නේත් නැහැ; අපි දේශපාලන සහයෝගයෙන් වැඩ කරලාත් නැහැ. ඔබතුමන්ලා තමයි 2005දී දුටුගැමුණුලා, අර ගැමුණුලා, මේ ගැමුණුලා කියලා කට්ටිය බලයට ගෙනැල්ලා වාඩි කරලා, මේක විනාශ කළේ. ඒකේ පංගුකාරයෝ ඔබ. ඒ නිසා අපිට චෝදනා කරගෙන එන්න එපා, ඒවායේ කොටස්කාරයෝ කියලා. ඔයගොල්ලන්ම බලයට ගෙනා අයට දැන් ඔයගොල්ලන්ම බණිනවා. ඒ නිසා ඔයගොල්ලන්-ඔයගොල්ලන්ම විසඳා ගන්න ඒවා වෙනම තැනකදී.

මෙතැන සමගි ජන බලවේගයේ කාටවත් දූෂණ චෝදනා නැහැ. මෙතැන සමගි ජන බලවේගයේ කාටවත් නඩු ඇත්තේත් නැහැ. අපේ ආණ්ඩු පැවැති කාලයේවත් අපේ කාගේවත් ඇඟවල්වල ලේ ගෑවිලාත් නැහැ, අත්වල සල්ලි ගෑවිලාත් නැහැ. ඒ නිසා අපි පිරිසිදුව මේ කටයුතු කරනවා. **ඔබතුමන්ලා** බලයට ගෙනා කට්ටිය හැම එකක්ම ගාවගෙන ඉන්නේ. ඒකේ ඔබතුමන්ලාටත් කෑල්ලක් තිබෙනවා. ඒ කෑල්ල අමතක කරන්න එපා.

මෙම විවාදය පටන් ගන්නකොට අපේ ඇමතිතුමා කිව්වා හොඳ කථාවක්. එතුමා කිව්වා, කොට මිනිස්සු විශ්වාස කරන්න එපා කියලා. ඇයි එහෙම කථාව පටන් ගත්තේ කියලා මම දන්නේ නැහැ. කොට මිනිහා එක්ක එකතු වෙලා ගේම් එක ගහලා දැන් ඇමතිතුමා අත්හැරලා කොට මිනිහා මාරු වුණාද දන්නේ නැහැ. මොකද, කථාව පටන් ගන්නකොටම කිව්වේ, කොට මිනිස්සු විශ්වාස කරන්න එපා කියලා. එතකොට අපට ප්‍රශ්නයක් තිබෙනවා, කවුද ඒ කොට මිනිහා? ඇමතිතුමාව අමාරුවේ දාපු කොට මිනිහා කවුද? ඒකත් එතුමාට කියන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු ප්‍රශ්නයේදී මෙතුමන්ලා අහනවා, මොකක්ද පාඩුව කියලා. විදුලිබල මණ්ඩලය 2026 පෙබරවාරි 19 වාර්තාවක් නිකුත් කරලා තිබෙනවා. ඒ වාර්තාව අත්සන් කරලා තිබෙන්නේ, Engineer Kumara, General Manager, Ceylon Electricity Board. ඔහු මොකක්ද කියන්නේ? ඔහු කියනවා, ගල් අඟුරු ආපු නැව් අටෙන් මේ වනකොට රුපියල් මිලියන 7,672ක් පාඩු වෙලා තිබෙනවාය කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන 7.6ක පාඩුවක්. ඒ බව කියන්නේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන්. එතකොට පාඩුවක් නොවෙයිද වෙලා තිබෙන්නේ, ඒ ඩීල් එකෙන්? එම වාර්තාවේ කියනවා, තවම දඩය - penalty එක - claim කරන්නේ නැතුව ලූ, ඒ පාඩුව ගණනය කරලා තිබෙන්නේ කියලා. ඒකට තවම දඩය එකතු කරලා නැහැ. එතකොට ඒක පාඩුවක් නොවෙයිද? ඒ පාඩුව ගැන කථා කරන එක කොම්පැනිය වෙනුවෙන් කථා කරන එකක්ද? එතකොට ඒ මේ රටේ ජනතාවගේ මුදල් නොවෙයිද? ජනතාවට සහන ලබා දෙන්න තිබෙන මුදල් නොවෙයිද ඒ පාඩු වෙලා තිබෙන්නේ? ඒක ගැන කියනකොට ඇයි තමුන්නාන්සේලාට රිදෙන්නේ? ඇයි, තමුන්නාන්සේලා භූමිතෙල් ගාපු ගැරඬි වාගේ දඟලන්නේ? පාඩු ගැන කථා කරන්න එපාද? එහෙම නම් තමුන්නාන්සේලා ඕනෑ මගඩියක් කරනකොට විපක්ෂයේ අපි කටවහගෙන ඉඳලා යන්න ඕනෑ? පාර්ලිමේන්තුවේ

[ගරු මුජිබුර් රහුමාන් මහතා ]

එහෙමද තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙන්නේ? තමුන්නාන්සේලා තරම් විනිවිදභාවය ගැන කථා කළේ නැහැ නේ, කවුරුවත්. තමුන්නාන්සේලා තරම් වංචා, දූෂණ ගැන කවුරුවත් කථා කළේ නැහැ. තමුන්නාන්සේලා කිව්වේ, විනිවිදභාවයකින් වැඩ කරනවා කියලා නේ.

ඒ ගල් අඟුරු ටෙන්ඩරයේ තිබෙනවා කොන්දේසි කිහිපයක්. ඒ කොන්දේසි කිහිපයේ තිබෙන එක කොන්දේසියක් තමයි, බාල ගල් අඟුරු තිබුණොත් Agreement එක cancel කරන්න පුළුවන් කියලා. දැන් ආපු නැව් අටේම තිබෙන්නේ බාල ගල් අඟුරු කියලා තහවුරු වෙලා තිබෙනවා. ඊළඟට, නියමිත දිනට ආවේ නැත්නම් ගිවිසුම cancel කරන්න පුළුවන්. එහෙම නම් දැන් එම ගිවිසුමේ කොන්දේසි දෙකක් එම සමාගම කඩලා තිබෙනවා. ප්‍රධාන කොන්දේසි දෙකක් කඩලා තිබෙනවා. ඒ කියන්නේ, ආපු නැව් අටේම තිබුණේ බාල අඟුරු. නැව් ආවේ පරක්කු වෙලා. එහෙම නම් ඇයි, එම ගිවිසුම අවලංගු කරන්නේ නැත්තේ? ඇයි ඒ? මොකද, ඩීල් එක seal කරපු හින්දාද අවලංගු කර ගන්න බැරි? ඇයි, අවලංගු කරන්න බැරි? ප්‍රධාන කොන්දේසි දෙකක් කඩලා නේ තිබෙන්නේ? එහෙම කොන්දේසි කඩලා තිබියදී ඇයි අවලංගු නොකරන්නේ?

තමුන්නාන්සේලා විනිවිදභාවය - පාරදෘශ්‍යභාවය - ගැන කථා කරනවා නේ. නීතියේ ආධිපත්‍යය ගැන කථා කරනවා නේ. නීතියට පිටින් කිසි දෙයක් කරන්නේ නැහැයි කියලාත් කියනවා නේ. එතකොට එම ගිවිසුමේ තිබෙන ප්‍රධාන කොන්දේසි දෙකක් කඩලා තිබෙනවා නම් දැන් තමුන්නාන්සේලාට පුළුවන් ගිවිසුම අවලංගු කරන්න. ගිවිසුමේ තිබෙනවා, කොන්දේසි කැඩුවොත් අවලංගු කරන්න පුළුවන් කියලා. නමුත්, ගිවිසුම අවලංගු නොකර ඉන්නේ ඇයි? ඒ නිසා තමයි අපි ප්‍රශ්න කරන්නේ. අපි ප්‍රශ්න කළාම කේන්ති ගන්න එපා. ඒවාට තර්කානුකූල උත්තර දෙන්න. ඇයි, කේන්ති ගන්නේ? රජයේ මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස ඇමතිතුමා මාධ්‍ය සාකච්ඡාවේදී පිළිගත්තා නේ, ඒ නැව් ඔක්කෝගෙම ගෙනා ගල් අඟුරු තත්ත්වයෙන් බාලයි කියලා. එය ආණ්ඩුව පිළිගන්නවා නේ. මෙතැන ඉන්න කවුරු හරි දැන් නැඟිටලා කියනවාද ඒ ආපු නැව් අටේම තිබුණේ බාල ගල් අඟුරු නොවෙයි කියලා. කවුද කියන්නේ? කවුරුවත් කියන්නේ නැහැ නේ. එහෙම නම් ඔක්කෝම පිළිගන්නවා බාල ගල් අඟුරු ගෙනාවා කියලා. බාල ගල් අඟුරු ගෙනාවා නම් ගිවිසුම අවලංගු කරන්න පුළුවන් නේ. ඔබතුමන්ලාගේ මාධ්‍ය ප්‍රකාශකතුමා ගිය සතියේ කිව්වේ, බාල ගල් අඟුරු තමයි තිබුණේ කියලා. එතුමා කිව්වා, penalty එකක් ගහනවා කියලා. Penalty එකක් ගහන්නේ බාල හින්දා නේ. නැත්නම් penalty එකක් ගහන්න ඕනෑ නැහැ නේ. දැන් CEB එක කියනවා, ආපු ගල් අඟුරු නැව් අටම ෆේල් කියලා. මා ළඟ මේ තිබෙන්නේ ඒ CEB එකේ වාර්තාව. ඒගොල්ලෝ කියනවා, අද දවස වන කොට බිලියන 7.6ක loss එකක් තිබෙනවා කියලා. ඒ loss එක කවුද ගෙවන්නේ?

දැන් 9වන නැව ඇවිල්ලා තිබෙනවා. 9වන නැවේ තිබෙන ගල් අඟුරු තවම ගොඩබාලා නැහැ. තවත් ගල් අඟුරු නැව් 20ක් එන්න තිබෙනවා. මේ විධියට දිගටම බාල ගල් අඟුරු ආවොත් මේ අලාභය, මේ පාඩුව රුපියල් බිලියන ගණනින් -විශාල ප්‍රමාණයකින්- වැඩි වෙනවා. මේ පාඩුව අය කර ගන්න දැන් තමුන්නාන්සේලාට සිදු වෙලා තිබෙනවා, සියයට 13කින් විදුලි බිල වැඩි කරන්න. ඒක මහජනතාවගේ හිස මතටයි දාන්නේ. ඒක තමුන්නාන්සේලා ගෙවන්නේ නැහැ. ඒක ඇමතිතුමා භාර ගන්නේ නැහැ. ඒක ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරු බෙදා ගන්නේ නැහැ. ඒකට කැබිනට් අනුමැතිය දීපු ඇමතිවරු ටික ඒ අලාභය ගෙවනවාද? නැහැ. මහා භාණ්ඩාගාරය දෙන්නේත් නැහැ. ජනතාවගේ විදුලි බිලට ඒ පාඩුව එකතු කරලා ඒක ජනතාවගෙන් තමයි අය කර ගන්නේ. ඒක අපෙන් අය කර ගන්නා හින්දා තමයි අපට කථා කරන්න සිදු වෙලා තිබෙන්නේ. ඇමතිවරු ඒ අලාභය ගෙවනවා නම් අපි කවුරුවත් කථා කරන්නේ නැහැ. එහෙම නම් අපට අවශ්‍යතාවකුත් නැහැ, ඒ වෙනුවෙන් පෙනී සිටින්න. මිනිසුන්ට ගෙවන්න සිදු වන හින්දා තමයි අපි මේ ගැන කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සමාගම වෙනත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් blacklist වෙච්ච සමාගමක්. ඒක අපි ඔක්කෝම දන්නවා. මේ ටෙන්ඩර් එක ඒ සමාගමට ගන්න පුළුවන් විධියට අවශ්‍ය නිර්දේශ ටික හැදුවා. ඒ අවශ්‍ය ප්‍රමාණය - ගල් අඟුරු සංචිතය විධියට කලින් තිබුණු මෙට්‍රික් ටොන් මිලියන 1ක ප්‍රමාණය- ඒගොල්ලන්ට supply කරගන්න බැහැ. ඊට වඩා අඩු capacity එකක් තිබෙන සමාගමකට ඇයි ඒක දුන්නේ? ඒකයි ප්‍රශ්නය.

මීට කලින් ගල් අඟුරු සැපයුවේ නැති සමාගමකට, එහෙම capacity එකක් නැති සමාගමකට ගල් අඟුරු ගෙන්වන මේ ටෙන්ඩරය ඇයි ලබා දුන්නේ? එතැනින් තමයි මේ සැකය එන්නේ. එහෙම ලබා දීපු නිසා දැන් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය ඇති වුණාට පසුව අපි ඇවිල්ලා ප්‍රශ්න අහන කොට, අපි ඒක ගැන ප්‍රශ්න කරන කොට ආණ්ඩුවේ මෙතුමන්ලා කියනවා, ප්‍රශ්නයක් නැහැ කියලා. ප්‍රශ්නයක් තිබෙන හින්දා නේ, රුපියල් මිලියන හත්දහස් ගණනක අලාභයක් වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරන්නම්.

වී ගන්නත් ටෙන්ඩර් fix කරන්න හැදුවා. අන්තිමට ලොකු විරෝධයක් ඇවිල්ලා ඒක හකුළා ගත්තා. කන්ටේනර් 323 එළියට දැම්මා. ඒ ගැන සොයන්න ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. ඒ වාර්තාව තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. තවම ඒ වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයේ හංගාගෙන ඉන්නවා. ඒක දෙන්නේ නැහැ. මන්නාරමේ මෙගාවොට් 50 wind power ව්‍යාපෘතිය, ටෙන්ඩර් එක හම්බ වෙච්ච සමාගමට දුන්නේ නැහැ. Appeal එක reject වෙච්ච ධම්මික පෙරේරාට - ජනාධිපතිතුමාගේ යාළුවාට - ඒක දුන්නා. මොකද, වංචාවන් සිදු වෙලා නැහැ කියලා කියන්න. පසුගිය කාලයේ තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට පොරොන්දු ලබා දුන්නා, වංචා, දූෂණ නැති කරනවා, පාරදෘශ්‍යභාවයකින් වැඩ කරනවා, විනිවිදභාවයකින් වැඩ කරනවා, නීතියේ ආධිපත්‍යය ඇති කරනවා කියලා. එවැනි පොරොන්දු ගණනාවක් ලබා දුන් නමුත් අද වනකොට ඒ පොරොන්දු එකින් එක, එකින් එක "ගහට කපපු ඉනි" වාගේ ගසාගෙන යන ගතියක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවෙන් ඉදිරිපත් කරනවා, ගල් අඟුරු මිල දී ගැනීමේ ටෙන්ඩරය පිළිබඳව; ඒකේ අක්‍රමිකතා, වැරදි, වංචා, දූෂණ සිදු වෙලා තිබෙනවා කියන කාරණය. හැබැයි, මේ ඉදිරිපත් කරන යෝජනාවේ පටන් ගන්න තැන ඉඳලාම වැරදි සහගත කරුණුයි තිබෙන්නේ. අපි ප්‍රසම්පාදනය කරන්න ගන්නා ගල් අඟුරු මෙට්‍රික් ටොන් ප්‍රමාණයත් මිලියන 12.32ක් කියලා වැරදි විධියට වාර්තා කරලා තිබෙනවා.

ඊළඟට ඔවුන් මෙහි මතු කරන ප්‍රධාන කාරණා 4ක් තිබෙනවා. ඇත්තටම ඒ කාරණා 4ම අපට නිෂේධනය කරන්න පුළුවන් වැරදි. පළමුවැනි එක විධියට කියන්නේ, "විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රියාදාමයට පටහැනිව දූෂිතව ක්‍රියා කිරීම මඟින් ද" කියලායි. ඒක ඇතුළේ එකදු කරුණක්වත් නැහැ, ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩලා කියලා. එවැනි එක කරුණක්වත් නැහැ. මොකද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුළේ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ දින ගණන් වෙනස් කිරීමට අදාළ ඒවා පවා තිබෙනවා. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට අනුව අවස්ථානුකූලව වැඩ කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රසම්පාදන කමිටු විසින් ඒවා ඇගයීම් කරලා තිබෙනවා; කොච්චර ප්‍රමාණයක් ආවාද ආදි වශයෙන්. ඒ සඳහා ටෙන්ඩර්කරුවන් 10දෙනෙක් ඉදිරිපත් වුණා. ඒ තෝරා ගැනීමේදී, responsive bids අරගෙන, ඒවායෙන් අඩුම එකට තමයි අපි මේ ගිහින් තිබෙන්නේ. ඉතින් අපට තේරෙන්නේ නැහැ, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩලා තිබෙනවා කියන්නේ මොකක්ද කියලා. හැබැයි, මීට කලින් පැවැති ආණ්ඩු හැම එකකදීම වාගේ මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වෙනුවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හරහා කරපු දේවල් තමයි තිබුණේ. ඒ ගැන මේ විවාදය පුරාම ආණ්ඩුව පාර්ශ්වයෙන් කරුණු ඉදිරිපත් කළා. ඔබතුමන්ලාගේ ආණ්ඩු යටතේ තමයි ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරලා නොතිබුණේ.

ඒ වාගේම, 2022දී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද උපදේශවලට පටහැනිව ක්‍රියා කර තිබෙන බවක් ද කියනවා. එහෙම එකක් වෙලා නැහැ. 2022දී දුන්නු උපදේශය මොකක්ද? එම නිර්දේශයේ ප්‍රධාන වශයෙන්ම තිබෙන්නේ මොකක්ද කියලා මම කියන්නම්. මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:2 ඡේදයේ සඳහන් කරුණුවලට අගතියක් නොවන පරිදි සැපයුම්කරුගේ මූල්‍ය ශක්‍යතාව, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ආදි කරුණු සියල්ල සලකා බලා කියනවා, ඒ තරගකාරිත්වය වැඩි කිරීම සඳහා ලිහිල් කර, තරගකාරිත්වය උපරිම කර ගැනීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය කියලා. හැබැයි, ඒ වැඩේ කරලා තිබෙන්නේ 2023දී. ඉතින්, 2023දීත් යම් ලිහිල් කිරීමක් කරලා තිබෙනවා. අපේ ආණ්ඩුව කලේ තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන ගිය එකයි. කිසිදු වෙනසක් කරලා නැහැ.

මෙහි තුන්වැනි කාරණය තමයි, "සැපයුම්වල 'ගුණාත්මකභාවය සහතික කළ හැකි' විශ්වාසවන්ත ගල් අඟුරු සැපයුම්කරුවෙකු ..." යනාදි වශයෙන් සඳහන් කාරණය. ඉතින්, ඒක තමයි තෝරා ගන්නා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පිරිවිතර ඉදිරිපත් කරන්නේ. නමුත්, එයාගේ විශ්වාසවන්තභාවය කියලා විපක්ෂය අදහස් කරන්නේ, එයාගේ ගෙදරට ගිහින් කථා බහ කරලා විශ්වාසද කියලා බලන එකද කියා අපි දන්නේ නැහැ. ඒ කාලයේ ගොඩක් ගනුදෙනු එහෙම කරලා තිබෙනවා කියලාත් ආරංචි වෙනවා නේ. සැපයුම්කරු එනවා, අමාත්‍යාංශයේදී සාකච්ඡා කරනවා, ගෙවල්වල සාකච්ඡා කරනවා. විශ්වාසවන්තභාවය බැලීමට එවැනි දේවල් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී කරන්න බැහැ. විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට වඩා අපි යන්නේ පිරිවිතර අනුව කටයුතු කරන්නයි. මේ පිරිවිතරවලට අනුව අදාළ ටෙන්ඩර් එක ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ පිරිවිතරයන්ට අනුවයි. එතකොට, එතුමන්ලා කියන ඒ කාරණයත් වැරදියි.

හතරවැනි කාරණය විධියට කියනවා, ගල් අඟුරු නියමිත වේලාවට සැපයීමට සමාගම අසමත් වී ඇති බවක්. එහෙම වෙලා නැහැ. මොකද, කලින් අවස්ථාවේදී ටෙන්ඩර්කරු වන Potencia LLC-FZ කියන සමාගම, ඒ වන විට ඉවර වෙන්න තිබුණු එක ඉවර කරලා තිබුණේ නැහැ. ඔවුන්ගේ ඒ ඉතිරි කොටස ගොඩබෑම සඳහා යම් කාල වේලාවක් ගත්තා. ඒ අතරතුරදී තමයි මේ ටෙන්ඩරය අවසාන වෙන්නේ. මේ ටෙන්ඩරයට කියනවා, දෙසැම්බර් 23වන දා ගල් අඟුරු ලබා දෙන්න ඕනෑ කියලා. ඒ වාගේම, සැපයුම්කරු ඉල්ලා සිටිනවා, මේ විධියට වරාය සකස් කර දුන්නාට පස්සේ 30වන දා අපට මේක ලබා දෙන්න පුළුවන් කියලා. ඒ එකඟතාව අනුව තමයි කටයුතු කළේ. 30 කියන දිනයට අපි එකඟ වෙනවා; 30වන දාට ඔහු ගෙනැත් දෙනවා; ඒ අනුව 03වන දා බානවා. ඒ අනුව, ඒ කරුණු හතරම වැරදියි. ඒවා කිසිම පදනමක් ඇති දේවල් නොවෙයි. එහෙම ගැටලුවක් වෙලා නැහැ.

අපිත් කැමැතියි, ඇත්තටම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී, ආණ්ඩු කිරීමේදී අපේ වැරදි පෙන්වා දෙනවා නම්; අපේ අඩුපාඩු පෙන්වා දෙනවා නම්. මොනවා හෝ අඩුපාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒවා ගැන කථා කළ යුතු වෙනවා. පදනමක් සහිත, පිළිගත හැකි තොරතුරු මිසක් පිළිගන්න බැරි, කිසිම පදනමක් නැති, unauthenticated information මත අපට පිළිගන්න බැහැ මෙහෙම ගැටලුවක් වෙලා තිබෙනවා කියලා.

ඒ වාගේම, දිගින් දිගටම කියාගෙන ගියා, මේ Agreement එක cancel කරන්න, cancel කරන්න කියලා. ඒ ඇයි කියලා අපට තේරෙන්නේ නැහැ. මොකද, ඒක අවලංගු කරන්න නම් ඒ අදාළ ගිවිසුමේ තිබෙන කොන්දේසි කඩන්න ඕනෑ. මේ ගල් අඟුරු ගෙන්වීම වාගේ විෂයයක් වෙනත් භාණ්ඩයක් ගෙන්වනවා වාගේ එකක් නොවෙයි. ඒ බව ඉතාම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. Loading port එක සහ discharging port එක වැදගත් වෙන්නේ ඇයි? ගල් අඟුරුවල තිබෙන ආර්ද්‍රතාව, ජල වාෂ්ප ප්‍රමාණය පටවන අවස්ථාවට වඩා බාන අවස්ථාවේදී වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා තමයි Load Port Report එකත් අපි ගන්නේ. ඒ වාගේම, ඒ කියා තිබෙන නිර්ණායක ඇතුළේ තිබෙනවා නම්, ඒ තිබිලාත් ඒක කිලෝ කැලරි 5,900ට වඩා අඩු නම් කිසිම විධියකට භාර ගන්නේ නැහැ. ඒගොල්ලන්ගේ Lord Port Report එක ඒගොල්ලන් හදලා එවන්නේ. හැබැයි, මෙහෙන් ඒ පිළිබඳ තාක්ෂණික දැනුම තිබෙන අය තමයි පරීක්ෂා කර බලන්න ඕනෑ. ලංකා විදුලිබල මණ්ඩලයේත්, ලංකා ගල් අඟුරු සමාගමේත් එකඟතාව අනුව අපට ඒ සඳහා expertise නැහැ කියන තත්ත්වයේදීත්, ඒ වාගේම accredited lab එකක් නැති තත්ත්වයේදීත් විවෘත ලංසු කැඳවීමකින් තමයි මේ ගල් අඟුරු ගොඩබෑමේදී port එකේදී අදාළ වාර්තාව ලබා ගන්නේ. ඒ කියන්නේ, ඉන්දියානු සමාගමක් වන "කොටෙක්නා" කියන සමාගම. ඒ සාම්පල් ලබා ගන්නේත් ඒ ඉංජිනේරුවන් ඉදිරියේ ඒ

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා ]

අදාළ පාරදෘශ්‍යභාවය රැකෙන ආකාරයට. ඒගොල්ලන් වාර්තාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාර්තාවලට අනුව කැඩීමට ලක් වෙලා තිබෙන්නේ පළමු එක. ඒ අනුව අදාළ දඩය අය කර තිබෙනවා. ඒක තමයි මේක ඇතුළේ තිබෙන්නේ. අනෙක් ඒවායේ එහෙම නැහැ. විපක්ෂය අර කවුරුන් හෝ කොහේ හෝ කියනවා වාගේ report එකක් අරගෙන කථා කරනවාද කියලා අපි දන්නේ නැහැ. ඒක මත එය cancel කරන්න කියනවා නම්, මා හිතන්නේ, ඒක ඉතාම අදූරදර්ශී, විචක්ෂණශීලී නොවන එකක් කියලායි. ඒ කියන්නේ, එක් පැත්තකින් එය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අවභාවිතයක් වෙනවා. ඒකෙන් සැපයුම්කරුට අනවශ්‍ය වාසියක් ඇති වෙනවා. අපි ගිවිසුම කඩ කළා කියලා විශාල වන්දි ඉල්ලන්නත් ඉඩ තිබෙනවා. අපි දන්නවා, මේගොල්ලන්ගේ ආණ්ඩු කාලවලදී මෙවැනි දේවල් කර තිබෙන බව. අපි කවුරුත් දන්නවා, සුප්‍රසිද්ධ එයාර් බස් ගනුදෙනුවේදී කල්බදු - leasing - ගිවිසුමට ගිය වෙලාවේදීත් වංචා කරලා කියලා ඩොලර් මිලියන ගණනාවක ගැටලු ආවා කියලා. ඒ වාගේම, ඔවුන් වැරැදිකරු වෙලා තිබුණා ඒ රටවල. මට මතකයි, යහ පාලන ආණ්ඩුව කාලයේ කලබල වෙලා ඒ ගිවිසුම අවලංගු කළා. Leasing එකක් එහෙම cancel කරන්න බැහැ, ඒක පාර්ශ්විකව. ඒක cancel කරලා මොකද කළේ? රුපියල් මිලියන ගණනාවක පාඩු ලබා ගත්තා. අද සද්ද නැතිව ඉන්නවා. ඉතින්, මේ උත්සාහ කරන්නේ මොකටද? දැනුවත්භාවයෙන් ආණ්ඩුව අපහසුතාවට, අනතුරට පත් කිරීම සඳහා විය යුතුයි මෙවැනි arguments ගෙන එන්නේ.

අපි හිතනවා මෙන්න මෙහෙම. මේ විපක්ෂයේ උපාය මාර්ග, මේ ඉදිරිපත් කරන තර්ක ප්‍රධාන වශයෙන් ගත්තාම, අපි කවුරුත් දන්නවා, මේ විපක්ෂය වෙනස් කරලා ජාතික ජන බලවේගය ආණ්ඩුව හදන්න හේතු වුණු විවිධ කාරණා අතර ප්‍රධානම චෝදනාවක් තමයි වංචාව, දූෂණය, රාජ්‍ය මුදල් අවභාවිතය. ඒක ඉතාම පැහැදිලි කරුණක්. දැන් අපේ ආණ්ඩුව පත් වුණාට පසුව වංචාව, දූෂණය නැති ඉතාම නිවැරදි, යහපත් ආණ්ඩුකරණයක් පෙන්නුම් කිරීම නිසා ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් අපිව පිළිගනිමින් ඉන්නවා. හැබැයි, විපක්ෂය වැරදි උපක්‍රමයක් තෝරන්න උත්සාහ ගන්නවා. මොකක්ද, ඒ? මුල සිටම ඔවුන් ඒ ගැන හිතනවා. ඔවුන් උපක්‍රමය හැටියට තෝරන්න ඕනෑ, එහෙම නම් අපි ඉදිරියේදීත් වංචාව, දූෂණය නැති ආණ්ඩුවක් හදා ගන්නම්, ජාතික ජන බලවේගයට වඩා වෙනස් ආණ්ඩුවක් අපි හදන්නම් කියන එකයි. එවැනි උපාය මාර්ගයකට තමයි ඔවුන් යන්න ඕනෑ. ඒ වෙනුවට, මේ ආණ්ඩුව පටන් ගත්ත දා ඉඳලාම ඔවුන් උත්සාහ කළේ මේකටයි. ඒගොල්ලන් කළ වැරදි, වංචා සහ දූෂණ පිළිබඳව ඕනෑ තරම් විවිධ ආකාරයෙන් විගණන වාර්තා තුළින් ඔප්පු වෙලා තිබෙනවා. එම නිසා ඒගොල්ලන් ලෙහෙසි උපක්‍රමයක් තේරුවා. සමහර වෙලාවට ඒවා එක එක රටවලින් එන උපදේශ වෙන්න ඇති. අපි දන්නා විධියට ඒකට psychoanalysis කියනවා. ඒගොල්ලන් එවැනි උපදෙස් දෙනවා. සාමාන්‍යයෙන් එවැනි උපදෙස්වලට දුර්වල ආණ්ඩුවකට යම් බලපෑමක් කරන්න පුළුවන් වෙනවා. නමුත් විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, අපේ ආණ්ඩුවේ සිටින මේ මන්ත්‍රීවරු 159දෙනාම සාමූහිකව, ඒකමතිකවයි වැඩ කටයුතු කරන්නේ කියන එක. අපි එවැනි ආණ්ඩුවක්. ඒ නිසා මේ වාගේ බාල උපක්‍රමවලින් කවදාවත් අපිව යටපත් කරන්න ලැබෙන්නේ නැහැ. නමුත්, ඔවුන් උත්සාහ කරනවා, අපිත් දූෂිත ආණ්ඩුවක් කියලා පෙන්වන්න. ඒගොල්ලනුත් දූෂිතයි, අපිත් දූෂිතයි, ඔක්කෝම දූෂිතයි කියලා, දූෂිතයි කියන එක සාමාන්‍යකරණය කරන්න ඔවුන් උත්සාහ කිරීමක් තමයි මේ කරන්න හදන්නේ කියලා මම හිතනවා.

දෙවැනි කාරණය මේකයි. මම කලිනුත් කිව්ව ආකාරයට අස්ථාවර කිරීමේ ඒ උපාය මාර්ගයේදී ප්‍රධාන වශයෙන් ඒගොල්ලන් උත්සාහ කළා, ආර්ථිකමය වශයෙන් රට අස්ථාවර කරලා, මූල්‍ය ස්ථාවරත්වය බිඳ වට්ටවලා ආණ්ඩුව ගන්න; බලය නැවත ගන්න. රටේ මහජනතාව ඒ සඳහා කවදාවත් ඉඩ ලබා දෙන එකක් නැති වෙයි කියලා මම හිතනවා. හැබැයි, මේ ගල් අඟුරු ටෙන්ඩරය පිළිබඳ විවාදයේදී ඒ මූල්‍ය අස්ථාවරත්වය සහ වංචාවක්, පාඩුවක්, දූෂණයක් වෙලා තිබෙනවා කියන තර්කය ගෙනෙන ගමන්ම පීඩනයක් ලබා දෙන්න හදනවා, මම කලින් කිව්ව ගිවිසුම අවලංගු කරන්න කියලා. මේ ගිවිසුම අවලංගු කළොත් අපිට ඒකපාර්ශ්විකව මූල්‍ය පාඩුවක් සිද්ධ වෙනවා වාගේම ගල් අඟුරු සම්බන්ධයෙන් ඇති වන විදුලි බලය නිෂ්පාදනය කිරීමේ අනතුරකුත් ඇති වෙනවා. අපට ඉතාම වැදගත් වෙනවා, රටට විදුලිය සම්පාදනය කිරීම. ඒක ජාතික ආරක්ෂාවට අවශ්‍ය දෙයක් වාගේම එය රටේ අවශ්‍යතාව. ඒ නිසා අපි තීන්දු තීරණ ගන්නේ නිවැරැදි ආකාරයටයි, අනවශ්‍ය ආකාරයට නොවෙයි. නිවැරදි තොරතුරු මත, නීත්‍යානුකූලව, රාජ්‍ය තාන්ත්‍රිකභාවය පෙන්නුම් කරමින් තමයි අපි ඒ කටයුතු කරන්නේ. එම නිසා ඒ උත්සාහයත් අපි ව්‍යර්ථ කර තිබෙනවා.

ඒ වාගේම තව වැදගත් කාරණාවක් තිබෙනවා. විපක්ෂය ගොනු කරන තර්ක තුළ තිබුණා, ඉතාම පැටලිලි සහගත තර්කයක්. ඒ තර්කය තමයි, අපි මේ ලබා දුන්නු ටෙන්ඩරය හරහා බාල, ගුණත්වයෙන් අඩු ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවාය කියන එක. ඒ ගැන විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් පෙන්වා දුන්නා. අපි ඒකට කියනවා, substandard products කියලා; බාල ගල් අඟුරු ගෙනාවාය කියනවා. හැබැයි, මේ ගල් අඟුරු ටෙන්ඩරයේ එහෙම එකක් නැහැ. මේකේ තිබෙන්නේ පිරිවිතරයන්ගෙන් වෙනස්වීමක්, off specifications; specificationsවලින් වෙනස්වීමක් තිබෙන්නේ. ඒක substandard product එකක් නොවෙයි. එතකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන් අදහස් දක්වන හැම තිස්සේම උත්සාහයක් දැරුවා, මේවා බාල ගල් අඟුරු, බාල ගල් අඟුරු කියන්න. නැහැ, මේ තිබෙන්නේ අපි දුන්නු පිරිවිතර. ඒක එහෙමමයි. මේ ගල් අඟුරුවල තාප ජනන අගය 5900 kcal/kgට වඩා අඩු නම්, එක දශමයක් අඩු නම් අපි ඒ සඳහා වන්දි මුදල් අය කරනවා. ඒ විධියටම අය කිරීම් සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම, සැපයුම්කරුටත් මෙතැනදී ඉඩකඩක් තිබෙනවා. මේ ගිවිසුමේ ඒ සඳහා කොන්දේසියක් තිබෙනවා. ඒ අනුව, umpire sample එකක් අරගෙන ඒගොල්ලන්ට බලන්න පුළුවන්. ඒ සඳහාත් සැපයුම්කරු පෙනී ඉන්නවා කියලා අපට ආරංචි වුණා. අපේ පැත්තෙන්, අපේ තිබෙන වාර්තා මත අදාළ කටයුත්ත කළා. මෙතැන තිබෙන්නේ substandard product එකක් ගෙන්වීම නොවෙයි. ඒ කියන්නේ, බාල භාණ්ඩයක් ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ. අපි නිසි පරිදි මේ ප්‍රසම්පාදනයට ගියා. ඒ පිරිවිතරයෙන් ඇත් වෙලා තිබෙනවා. හැබැයි, අපි කවුරුත් දන්නවා, විපක්ෂය බාල භාණ්ඩ ගෙන්වපු අතීතයක් තිබුණාය කියන එක. ඔවුන් ඒවාට වැරදිකරුවන් වෙලාත් තිබෙනවා. සමහර අය හිරේ විලංගුවේ වැටිලාත් තිබෙනවා.

බාල බෙහෙත් පිළිබඳ ප්‍රශ්නය ගැන අපි කවුරුත් දන්නවා. ඒ වාගේම තමයි, බාල පොහොර පිළිබඳ ප්‍රශ්නය. එතැනදී පිරිවිතරයන් කඩලා තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, පැහැදිලිවම ඒවා බාල භාණ්ඩ. මේ කටයුත්ත තුළ ඔවුන් උත්සාහ කරනවා, අපිත් බාල භාණ්ඩ ගෙන්නුවාය කියලා පෙන්වන්න. ඒක සම්පූර්ණ වැරදියි. ප්‍රසම්පාදන ක්‍රියාවලියත්, මේ ගිවිසුමත් හරියට කියවා බැලුවොත් පැහැදිලිව පෙනෙනවා, මේ තුළ බාල භාණ්ඩයක් ගෙන්වීම සඳහා කිසිදු ප්‍රසම්පාදනයක් සිද්ධ කරලා නැහැ කියන එක. ඒ පිරිවිතර නිසි ආකාරයට අපි ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම නම් ඇත්තවශයෙන්ම මේ ක්‍රියාවලිය තුළ සිද්ධ වුණේ මොකක්ද? මේ ක්‍රියාවලියේදී මම කලිනුත් සඳහන් කළා වාගේ අපේ ප්‍රසම්පාදනය නිසි ක්‍රියා පිළිවෙළට

අනුගමනය කළා. ඒ අනුව තමයි, සැපයුම්කරුවන් දස දෙනෙක් ආවේ. අපි කවුරුත් දන්නවා, මේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සැපයුම්කරුවන් විවිධ උත්සාහයන් අනුගමනය කළා කියලා. හැබැයි, පළමුවැනි වතාවට 10දෙනෙකු පමණ මේ සඳහා ඉදිරිපත් කරලා, ලංසු තබා ගැනීමෙන් අපට පුළුවන්කම ලැබුණා, නිවැරදි ආකාරයට ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ගැළපෙන ආකාරයට කිසිදු නීතියක් උල්ලංඝනය වෙන්නේ නැතුව මේ කටයුත්ත සිද්ධ කරන්න.

ඒ වාගේම, ඉදිරිපත් වෙලා තිබෙන වාර්තා දිහා බැලුවාම මේ කාරණා පෙනී යනවා. විශේෂයෙන්ම ගල් අඟුරු ගොඩබෑමෙන් පසුව සහතික කිරීම පිළිබඳව ගත්තාම, පළමුවැනි නැවේ ගල් අඟුරු පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟුණා. ඒ නිසා අපි ඒකට දඩයක් අය කළා. එතකොට ප්‍රශ්න කරනවා, දෙවැනි නැව, තුන්වැනි නැව නවත්වන්නේ නැත්තේ ඇයි කියලා. මෙතැන තාක්ෂණික කාරණයක් තිබෙනවා. මොකද, breakwater එකක් නැති වරායක් අපට තිබෙන්නේ. ඒ වාගේම, වාරකන් කාලයේ ඒ වරායට ගල් අඟුරු ගොඩබාන්න බැහැ. එම නිසා ඒ සියලු කාරණා සැලකිල්ලට ගත්තාම, ගල් අඟුරු නැවක් ඇවිල්ලා අදාළ ගොඩබෑමට දින 5ක් විතර ගත වෙනවා. ඒ වාගේම එක නැවක් එනකොට අනෙක් නැව් ටිකත් එකින් එක එනවා. මේ වනකොට ගල් අඟුරු නැව් 10ක්, 12ක් විතර වාගේ ඇවිල්ලා තිබෙනවා. 9වැනි නැවේ ගල් අඟුරු ගොඩබාමින් තිබෙනවා. හැබැයි, මේ වාර්තා ලබා ගන්න කාලයක් ගත වෙනවා. Lord Port වාර්තාව ආවාට පසුව අපේ Discharge Port වාර්තාව ලබා ගෙන ඒවා මෙහාට එන්න දින 17ක් පමණ ගත වෙනවා. එවැනි අවස්ථාවකදී එකවර වාර්තා දෙකකම සඳහන් ගල් අඟුරුවල දළ කැලරි අගය කිලෝග්‍රෑමයකට කිලෝ කැලරි 5900ට වඩා අඩු වෙලා තිබුණා නම් අනිවාර්යයෙන්ම මේ ගිවිසුම් අවලංගු කිරීම හෝ අදාළ දඩ මුදල් නියම කිරීම කියන කාරණා අපිට කරන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම, විශේෂයෙන් මෙතැනදී තවත් භය නිර්මාණය කිරීම් සිද්ධ කරනවා, දඩ ගහන එක හරියන්නේ නැහැ, ගිවිසුම් අවලංගු කරන්න, අතීතයේදී එහෙම දේවල් වෙලා නැහැ කියලා. නමුත්, ආපස්සට ගිහින් බැලුවාම පෙනෙනවා, මේ දඩ ගැසීම් අනිවාර්යයෙන් අතීතයේදී සිදු වෙලා තිබෙන බව. ඒ අවස්ථාවලදී හරියට දඩය ගැහුවාද, ඒ දඩ හරියට අය කරලාත් නැහැ කියලා සමහර අදහස් මතු වුණා. හැබැයි, ගල් අඟුරු ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පමණක් නොවෙයි, ඕනෑම ප්‍රසම්පාදනයකදී එවැනි ගිවිසුමක් උල්ලංඝනය කළොත්; ගිවිසුම කඩ කළොත් ඒකට අනුව දඩ මුදල්, වන්දි මුදල් අය කරන්න ඕනෑ. 2014 වර්ෂයේදීම නැව් 7කට දඩ ගැහුවා කියලා අපිට වාර්තා ලබා දී තිබෙනවා. ඒ වාගේම තවත් භය කිරීමක් කරනවා, මේ ගල් අඟුරු ඉතාම බාලයි, මේවා පාවිච්චි කළොත් මේ යන්ත්‍රණය කඩා බිඳ වැටෙන්න පුළුවන් කියලා. නමුත්, අපි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඉතිහාසය අරගෙන බැලුවාම, විවිධ වූ හේතු නිසා එහි කටයුතු බිඳ වැටී තිබෙන බව පෙනී යනවා. එහෙම වුණේ ගල් අඟුරු නිසාද, වෙනත් තාක්ෂණික කාරණා නිසාද කියන්න අපි දන්නේ නැහැ. ඒ කඩා වැටීම් පිළිබඳව අපි හොයා බලන්න ඕනෑ. එහි plants තුනක් තිබෙනවා. 2011, 2014 ඉඳලා ගත්තාම, විවිධ අවස්ථාවලදී ඒ plants තුනෙහිම බිඳ වැටීම් සිදු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේකයි. අද විපක්ෂය ඉදිරිපත් කරපු යෝජනාවෙන් මතු පිට තර්ක කරන්න උත්සාහ කළා, අපේ ආණ්ඩුවත් දූෂිත ආණ්ඩුවක්, නිවැරදි දේ කරන්නේ නැහැ කියලා. එම නිසා ඒ වෙනුවෙන් විරෝධතාව ප්‍රකාශ කිරීම සඳහා වූ ප්‍රශ්නය එතුමන්ලා මතු කළා. හැබැයි, අපට පෙරළා අවස්ථාවක් ලැබුණා, ඒක එහෙම එකක් නොවෙයි කියලා කියන්නත්, විපක්ෂය අනුගමනය කරන මේ බාල උපක්‍රමය මොකක්ද කියලා මහජනතාවට හෙළිදරව් කරන්නත්. ඒ වාගේම මෙවැනි වංචාවක්, දූෂණයක් අපේ ආණ්ඩුව යටතේ සිදු වෙලා නැති තත්ත්වයකදී ඔවුන්ගේ අතීත භාවිතවලදී සිදු කරපු වංචා සහ ගැටලු සහිත තැන් මහජනතාවට හෙළිදරව් කරන්නත් අවස්ථාවක් ලැබුණා. ඒ නිසා මම නැවත නැවතත් අවධාරණය කරනවා, ජාතික ජන බලවේගය ආණ්ඩු කාලය තුළ කිසිදු ආකාරයකින් මහජන මුදල් අවභාවිත වෙන්නේ නැති බවත්, රාජ්‍ය මූල්‍ය විනය නිසි ආකාරයෙන් රකින බවත්. ඒ නිසාම තමයි 2025ප වසරේදී රාජ්‍ය මූල්‍ය විනය රැක ගනිමින් ඉතාම ස්ථාවර තත්ත්වයක් රට ඇතුළේ ඇති කරන්න අපිට පුළුවන් වුණේ. ඒ අනුව තමයි අපි ඉදිරියටත් වැඩ කටයුතු කරන්නේ කියා සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.28]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய அமர்வில் நிலக்கரி கொள்வனவு விடயம் வாதப் பிரதிவாதங்களுக்கு உட்படுத்தப்பட்டிருக்கின்றது. இந்த விவாதத்தில் நான் கலந்துகொள்ள எண்ணியிருக்கவில்லை; ஒரு பணிப்பின்பேரில் திடீரென கலந்துகொள்கிறேன். இந்த ஒத்திவைப்புப் பிரேரணையில் நான்கு விடயங்கள் சுட்டிக்காட்டப்பட்டிருப்பதை நான் அவதானித்தேன். ஒன்று, நிலக்கரி கொள்வனவில் முறையான நடைமுறை பின்பற்றப்படவில்லை; இரண்டாவது, அரசாங்க நிதி பற்றிய குழுவின் ஆலோசனை பின்பற்றப்படவில்லை; மூன்றாவது, நிலக்கரியின் தர நிர்ணயம் பேணப்படவில்லை; நான்காவது, வலுசக்திப் பாதுகாப்புக்குப் பாதிப்பு ஏற்பட்டமை என்பவைதான் அந்த நான்கு விடயங்கள்.

இன்று காலையில் இருந்து இதுவரை இங்கு நடைபெற்ற விவாதங்களை நான் அவதானித்துக் கொண்டிருந்தேன். எதிர்க்கட்சியின் கடைசிப் பேச்சாளர் நான் என நினைக்கிறேன். எதிர்க்கட்சியினர் பேசுகின்றபோது, அவர்களது பக்கத்தில் இருக்கும் நியாயங்கள் வெளிப்படுத்தப்பட்டது. அதேபோன்று, ஆளும் கட்சியினர் தங்கள் பக்கம் அவ்வாறான குற்றச்சாட்டுக்களுக்கான காரணங்கள் இல்லை என்று கூறினார்கள். ஆனால், நாங்கள் ஒரு விடயத்தைப் பார்க்க வேண்டும். கடந்த காலத்தில் அவை நடந்தது, இவை நடந்தது என்று சொல்லிக்கொண்டிருப்பதில் அர்த்தமில்லை. கடந்த காலத்தில் தவறுகள் இடம்பெற்ற காரணத்தால்தான் அந்த ஆட்சியாளர்களைப் பலவிதத்திலும் தோல்வியடையச் செய்து, இப்போது நீங்கள் 159 பேர் மூன்றில் இரண்டுக்கும் அதிகமான பெரும்பான்மையோடு ஆட்சிக்கு வந்திருக்கின்றீர்கள். மக்கள் உங்களிடமிருந்து அதிகமான விடயங்களை எதிர்ப்பார்த்துக் கொண்டிருக்கிறார்கள். ஊழல், மோசடி, இலஞ்சம் இல்லாத, Clean Sri Lanka என்ற அடிப்படையில் ஒரு சுத்தமான ஆட்சி நடைபெற வேண்டுமென்று அவர்கள் எதிர்பார்க்கின்றார்கள்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

எனவே, சில குறைபாடுகள், வழுக்கள் ஏற்பட்டால் அதனைச் சுட்டிக்காட்ட வேண்டிய கடப்பாடு எதிர்க்கட்சிக்கு இருக்கின்றது என்பதை நீங்கள் ஒத்துக்கொள்ள வேண்டும். அவ்வாறு சுட்டிக்காட்டப்படுகின்றபோது, அத்தகைய தவறுகளை அல்லது தப்புகளைத் திருத்திக்கொள்ளக்கூடிய வாய்ப்புகள் அதிகமாக இருக்கின்றன. அதைவிடுத்து, குற்றச்சாட்டுகளைச் சொல்பவர்கள்மீது மாற்றுக் கருத்துகளைச் சொல்லிக்கொண்டிருப்பதில் அர்த்தம் இருப்பதாக நான் உணரவில்லை.

இறுதியாகப் பேசிய கௌரவ முஜிபுர் ரஹுமான் அவர்களுடைய உரையில் கூறப்பட்ட சில விடயங்களை அவதானித்தேன். கொள்வனவு செய்யப்பட்ட நிலக்கரி தரமற்றதாக இருப்பதாகவும், அவ்வாறான நிலக்கரியை ஏற்றிக்கொண்டு 8 கப்பல்கள் வந்துவிட்டன, இன்னும் 20 கப்பல்கள் வரை வரவிருக்கின்றது என்றும் அவர் சுட்டிக் காட்டியிருந்தார். அவ்வாறு சுட்டிக்காட்டியபோதும் தொடர்ந்தும் தரமற்ற நிலக்கரியை இறக்குமதி செய்யப் போகின்றோமா? என்ற கேள்வி எழுந்திருக்கின்றது. எனவே, இந்த விடயத்தில் ஆளும் கட்சியினர் கவனம் செலுத்த வேண்டும். ஏனென்றால், நான் ஏற்கனவே குறிப்பிட்ட, இந்தப் பிரேரணையிலுள்ள நான்கு விடயங்கள் சம்பந்தமாக அதில் மாற்றங்கள், திருத்தங்களை ஏற்படுத்தக்கூடிய வழிகள் இருக்குமாக இருந்தால், அதனைச் செய்வதன்மூலமாக உங்கள்மீது சுமத்தப்படுகின்ற குற்றச்சாட்டுகளைக் குறைத்துக் கொள்ளலாம் அல்லது இல்லாமற் செய்துகொள்ளலாம் என்று சொல்ல விரும்புகின்றேன்.

கடந்த காலத்தைப்பற்றி நாங்கள் பேசுகின்றபொழுது, கடந்த காலத்தில் பல தவறுகள் இடம்பெற்றிருக்கின்றன என்பதனை நாங்கள் ஏற்றுக் கொண்டிருக்கின்றோம்; அதற்கான மக்கள் தீர்ப்பும் வழங்கப்பட்டிருக்கின்றது. அதனை நீங்களும் ஏற்றுக்கொள்ள வேண்டும். மக்கள் உங்களை மிகக் கூடுதலாக நம்பியிருக்கிறார்கள். இந்த விகிதாசாரப் பிரதிநிதித்துவ முறையில் 159 ஆசனங்களைப் பெறுவது என்பது சாதாரண விடயமல்ல. நான் நினைக்கின்றேன், வரலாற்றில் விகிதாசாரப் பிரதிநிதித்துவ முறையில் உங்களுக்குத்தான் மூன்றில் இரண்டு பெரும்பான்மையைவிட அதிகளவான ஆசனங்கள் கிடைத்திருக்கின்றன என்று. யுத்தத்தை வெற்றிகொண்ட மஹிந்த ராஜபக்ஷ அவர்களுக்குக்கூட 144 ஆசனங்கள்தான் கிடைத்தன. ஆகவே, உங்கள்மீது மக்கள் வைத்திருக்கின்ற நம்பிக்கை காரணமாக, உங்கள் மத்தியில் ஏற்படுகின்ற தவறுகளைச் சுட்டிக்காட்ட வேண்டிய பொறுப்பு எதிர்க்கட்சிக்கு இருக்கின்றது. அவற்றுக்கு உங்களுடைய அதீதமான தர்க்க ஆற்றலைப் பயன்படுத்தி வாதப்பிரதிவாதங்களில் ஈடுபட்டு அதனை வித்தியாசமாக அணுகுவதைவிட, தவறுகள் இருந்தால் அவற்றைத் திருத்திக்கொண்டு இன்னும் முன்னேற்றமான பாதையில் செல்வதுதான் பொருத்தமாக இருக்கும். அவற்றைச் சுட்டிக்காட்டாமல் மூடி மறைத்துக்கொண்டிருந்தால், தவறுகள் தொடர்வதற்கு வாய்ப்பு இருக்கின்றது.

ஆகவே, தவறுகளை அவதானித்துச் சுட்டிக்காட்ட வேண்டிய பொறுப்பு எதிர்க்கட்சிக்கு இருக்கின்றது என்பதைக் கூறிக்கொண்டு, மின்சாரத்துடன் சம்பந்தப்பட்ட இன்னுமொரு விடயத்தைச் சொல்ல நினைக்கின்றேன். மின்சாரத்தைப் பொறுத்தமட்டில் உண்மையில், அதிகஷ்டமான சில கிராமங்களுக்கு இன்னும் அந்த வசதி சென்றடையவில்லை. அந்தப் பிரதேசங்களில் யானை மற்றும் முதலைத் தொல்லை காணப்படுகின்றது. எனவே, இந்தப் பிரதேசங்களுக்கு மின்சாரத்தை விஸ்தரித்து, அந்தக் குக்கிராமங்களுக்கு அல்லது அதிகஷ்டப் பிரதேசங்களிலுள்ள சகலருக்கும் மின்சார ஒளியைக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். அண்மையில் யானைத் தாக்கம் காரணமாக, அதாவது மின்சார ஒளி குறைவான இடங்களில் யானை புகுந்து தாக்கியதன் காரணமாக, வாழைச்சேனையில் இரண்டு பேர் கொல்லப்பட்டிருக்கின்றார்கள்; மகிழவெட்டுவானில் தாய் ஒருவர் கொல்லப்பட்டிருக்கின்றார். இதேபோன்று, பல இடங்களில் யானைகள் அலைந்து கொண்டிருக்கின்றன. இதனைக் கட்டுப்படுத்துவதற்கு வலுசக்தி அமைச்சர், வன ஜீவராசிகள் அமைச்சரோடு இணைந்து பயணிக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணைக்கு மாற்றமாக இருந்தாலும், இன்னுமொரு விடயத்தையும் சொல்லுகின்றேன். இது அண்மையில் கல்வி அமைச்சரிடமும் சொன்ன ஒரு விடயம். அதாவது, கண் பார்வையற்ற மாணவர்கள் பொதுப் பரீட்சைகள் எழுதும்பொழுது, வரைபுகள், படங்கள் என்பன அவர்களுக்குப் புலப்படுவதில்லை. எனவே, பார்வையற்ற மாணவர்கள் பரீட்சை எழுதுகின்றபொழுது, வரைபு ரீதியான அல்லது படங்கள் ரீதியான விடயங்களைத் தவிர்த்து, அவர்களது பார்வையற்ற தன்மைக்கு இசைவாகக்கூடிய கேள்விகளை உள்ளடக்குவதன்மூலமாக போட்டிப் பரீட்சை, பல்கலைக்கழகப் பரீட்சை, க.பொ.த. உயர்தரப் பரீட்சை, க.பொ.த. சாதாரண தரப் பரீட்சை, புலமைப்பரிசில் பரீட்சை போன்றனவற்றில் அவர்கள் வெற்றி பெறுவதற்கு வாய்ப்பிருக்கின்றது என்பதையும் சுட்டிக் காட்ட விரும்புகின்றேன்.

இறுதியாக நான் ஆளும் கட்சியினரைக் கேட்டுக்கொள்ளக்கூடிய விடயம், தயவுசெய்து எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் எல்லோரும் பிழையானவர்கள் என்ற நோக்கத்தில் நீங்கள் சிந்திக்கக் கூடாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
முடிக்கின்றேன்.

ஆகவே, எதிர்க்கட்சியில் உள்ளவர்கள் சொல்லுகின்ற பயனுள்ள கருத்துகளை அல்லது சரியான கருத்துகளை ஏற்றுக்கொண்டு, சில தவறுகள் ஏற்பட்டாலும் அவற்றைத் திருத்திக்கொண்டு, நியாயமான வழியில் செல்ல வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අර්කම් ඉල්යාස් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.35]

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)

(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

2025-2026 අවුරුද්දට අදාළ ගල්අඟුරු ටෙන්ඩරය පිළිබඳව විවාදයක් පවත්වා එහි ඇත්තම කථාව රටට, ඒ වාගේම අපේ රටේ මහජනතාවට පැහැදිලි කිරීමට අපේ ආණ්ඩු පක්ෂයට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මේ යෝජනාව ගෙනාපු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාටත්, එය ස්ථිර කරපු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාටත් මා මුලින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ ටෙන්ඩරය පිළිබඳව සම්පූර්ණ කථාව අද දවස ඇතුළත කියන්න අපිට අවස්ථාව ලැබුණා.

අද දවස පුරා පැවැති සාකච්ඡාව අනුව, විපක්ෂය ගෙනාපු මේ යෝජනාවේ වැරදි එක්ක තමයි මටත් මුලින්ම කථාව පටන් ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ කියා මා හිතනවා. මොකද, 2015 ඉඳලා යහ පාලනය කියලා අවුරුදු 5ක් අපේ රටේ ආණ්ඩු කරපු කණ්ඩායමක් ඉන්නවා. හිටපු නියෝජ්‍ය ඇමතිලාත් ඒ කණ්ඩායමේ ඉන්නවා. ඒත් රටේ ගල්අඟුරු අවශ්‍යතාව කොච්චරද කියන එක දන්නේ නැති මන්ත්‍රීවරු, නියෝජ්‍ය ඇමතිවරු තමයි අපේ ලංකාවේ ඇත්තටම ඉඳලා තිබෙන්නේ. අන්තිමට ගල්අඟුරු ටොන් මිලියන 12.32ක් රටට අවශ්‍යයි කියාත්, ඒ වාගේම ටෙන්ඩරයක් ගියා කියාත් මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ අපේ රටේ ගල්අඟුරු අවශ්‍යතාව විධියට තිබුණේ ටොන් මිලියන 2.25යි. ඊට කලින් ටෙන්ඩරයෙන් ගල්අඟුරු ටොන් මිලියන දශම 6ක වාගේ ප්‍රමාණයක් ඉතිරිව තිබුණා. මේ අවුරුද්දේ අපි order කළේ ගල්අඟුරු ටොන් මිලියන 1.5යි කියන එක අඩුම ගණනේ tender document එකේ පළමුවැනි පිටුව කියෙව්වාත් අපට හොයාගන්න පුළුවන්කම තිබෙනවා. තමන්ගේ යෝජනාවම සම්පූර්ණයෙන් වරද්දාගෙන තමයි මේ ගොල්ලෝ විවාදය පටන් ගත්තේ කියලා මම හිතනවා.

මූල්‍ය ශක්‍යතාව, පළපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණාත්මක නෛතික බැඳීම වැනි කිසි දෙයක් නැති සමාගමකට මේ ටෙන්ඩරය දුන්නා කියලා ඊට පස්සේ කියා තිබෙනවා. මේ ගොල්ලෝ ඒකත් වරද්දාගත්තා කියා මා හිතනවා. සාමාන්‍යයෙන් මේක open tender එකක් නොවෙයි, closed tender එකක් - closed international tender එකක්. මේ ටෙන්ඩරය call කරන්න කලින් රටට, අපට, අපේ පිරිවිතරවලට හරියන ඒ වාගේම, ගුණාත්මකභාවය, මූල්‍ය ශක්‍යතාව, සැපයුමේ ප්‍රමාණාත්මකභාවය ඇතුළු සියලු දේවල් බලලා ඒකට අපි suppliersලා ප්‍රමාණයක් register කරගන්නවා. ඒ register කර ගත්ත suppliersලාට විතරයි මේ ටෙන්ඩරයට ඉල්ලුම් කරන්න පුළුවන්.

එම tender එකේදී මුලින්ම register කරපු කට්ටිය සම්බන්ධයෙන් ගත්තොත්, ඒ ගොල්ලන්ගේ සම්පූර්ණ සුදුසුකම් පිළිබඳව බලලා තමයි අපි ඒ ගොල්ලන් register කර ගත්තේ. ඒ අනුව දෙවැනි කරුණ ගත්තත්, ඒ ගොල්ලන් කියලා තිබෙන්නේ සම්පූර්ණ බොරුවක්. ඒ වාගේම විගණකාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ අපි වරද්දලා තිබෙනවා, කරලා නැහැ, ඒවා නොසැලකා හැර තිබෙනවා කියලා කියා තිබෙනවා. ඒ වාගේම, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ - COPF එකේ - ඒ නිර්දේශත් අපි වරද්දලා තිබෙනවා කියලා කියා තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ විශේෂයෙන්ම ඊට කලින් තිබිලා තිබෙන්නේ විගණකාධිපතිගේ වාර්තාව, 2022.09.30. එහි නිර්දේශ තිබෙනවා. එහි 7.2 වගන්තියේ කියලා තිබෙන්නේ, තිබෙන පිරිවිතර නීත්‍යානුකූල ක්‍රමයකට අඩු කරන්න, මෙහි තරගකාරිත්වය වැඩි කරන්න කියලා. ඒකට ලොකුම හේතුව තමයි 2022ට කලින් තිබුණු tender එකේදී අවුරුදු තුනක් සඳහා මෙට්‍රික් ටොන් එකක් ඩොලර් 324ක් වැනි මුදලකට විකුණන්න, ඒ වාගේ ගණනකට තමයි මේ ගොල්ලන් tender එක දෙන්න හැදුවේ. ඒක අහුවෙලා තමයි කිව්වේ, මේ වාගේ ලොකු ගණන්වලට යන්න එපා කියලා.

මේ අවුරුද්දේ අපි දුන්නේ, මෙට්‍රික් ටොන් එක ඩොලර් 98කට. ලොකු මුදලක් ඉතුරු කරලා තිබෙනවා. නිකම් හරි ඒ අවුරුදු තුනේ tender එක පාස් වෙලා තිබුණා නම්, අදත් අපි ගන්නේ මෙට්‍රික් ටොන් එක ඩොලර් 324කට. මම හිතන විධියට මේ වාගේ ගොඩක් දේවල් වෙනස් කරන්න කියලා විගණකාධිපති වාර්තාවෙන් නිර්දේශ දුන්නා. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කමිටුවේ මූලාසනය දැරුවා කියලා එතුමා කිව්වා. එතුමාගේ කමිටුවෙන් නිර්දේශ දීලා තිබෙන්නෙත්, කෙළින්ම විගණකාධිපතිතුමාගේ වාර්තාවේ තිබෙන නිර්දේශ ඒ විධියටම ක්‍රියාත්මක කරන්න කියලා. ඕනෑ නම් මම ඒකත් සභාගත කරන්නම්. ඒක මා ළඟ තිබෙනවා. ඒ සියලු කොන්දේසි අනුව තමයි 2023 tender එක අරන් ගියේ. 2023 tender එකේ කොන්දේසි කිසිම දෙයක් අපි වෙනස් කරලා නැහැ. ඒ විධියටම තමයි මේ අවුරුද්දේ අපේ ප්‍රසම්පාදනය කරලා තිබෙන්නේ. ඊට පසුව විගණකාධිපති වාර්තාවක් හෝ එහෙම නැත්නම් COPF එකේ වාර්තාවක් හෝ කිසිම දෙයක් ඇවිල්ලා නැහැ. සම්පූර්ණයෙන්ම කරුණු විකෘති කරලා මහජනතාවට කියනවා. නැති බයක් ඇති කරන්න හදනවා.

ඒ වාගේම තවත් දෙයක් අනිවාර්යයෙන්ම කියන්න ඕනෑ. අපේ ලංකාවේ මීට කලින් අවුරුදු 15ක ඉතිහාසයක් තිස්සේ tenders කිහිපයක් විශාල ප්‍රමාණයක් මේ ගොල්ලෝ දුන්නා. සමහර වේලාවට මේ ප්‍රසම්පාදනය හරියට කරන්නේ නැතුව tenders ගෙනාවා. ඉතින් මම ගොඩක් දේවල් කියන්න කැමැති නැහැ. දෙක තුනක් විතරක් කියන්නම්. ඇත්තටම 2014 කාලයේදී Gross Calorific Value - GCV - එක 5,900ට අඩු අගයට ඇවිල්ලා නැව් 7ක් reject වෙලා තිබුණා. එතැනින් නැව් 4ක් තමයි අපට මුදල් ගන්න පුළුවන් වුණේත්. ඒ ගන්න පුළුවන් වුණු මුදලත් ඉතාම සුළු අගයන්. ඩොලර් ලක්ෂ ගණන් තමයි ගත්තේ. අපි අද ඩොලර් මිලියන ගණන් දඩ වශයෙන් ගන්නකොට, ඒ ගොල්ලෝ ඩොලර් ලක්ෂ ගණනින් අරගෙන ලොකු පාඩු කළා. ඒ කාලයේ තිබුණු ප්‍රශ්නයක් තමයි 2015 සැප්තැම්බර් සිට අප්‍රේල් දක්වා නැව් වාර අංකය කිව්වොත්, 79 සිට 114 දක්වා නැව් වාර ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. දඩ මුදල වශයෙන් අය කර ගන්න ඕනෑ මුදල ගණනය කිරීමේ වැරැද්දක් නිසා, equationsවලට ගණන් හදා ගන්න බැරි වැරැද්දක් නිසා, වෙන මොකුත් නිසා නොවෙයි, එවකට සිටි රාජ්‍ය ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා ඩොලර් මිලියන 1.575ක් රජයට පාඩු කරලා තිබෙනවා; CEB එකට පාඩු කරලා තිබෙනවා. අද වෙනකම් නඩුව යනවා, තවම එම මුදල් හම්බ වුණේ නැහැ. ඒ මුදල් ලබා දෙන්න ඒ ගොල්ලන් ඒ කාලයේ මැදිහත් වුණා නම්, අපට ඒ මුදල් හරි අරගන්න තිබුණා. එහෙම නම්, තව ශතයක් හරි අපට විදුලි බිලෙන් අඩු කර ගන්න තිබුණා. අදාල ලේඛනය මම **සභාගත*** කරනවා. අදටත් ඒ මුදල නැහැ. Liberty Commodities කියන සමාගමත් එක්ක තවමත් නඩු කියනවා. ඒ මුදල් ටික අපට ලබා ගන්න පුළුවන් නම්, තව ශතයක් හරි අපට විදුලි බිලෙන් අඩු කර ගන්න පුළුවන් වෙනවා. විශේෂයෙන්ම ඒ වාගේ ගනුදෙනු තමයි මෙච්චර කල් සිද්ධ වෙලා තිබුණේ.

විශේෂයෙන්ම තව එකක් කියන්න ඕනෑ. බාල ගල් අඟුරු ගෙනාපු එක හරි කියලා අපි කවදාවත් කියන්නේ නැහැ. ගරු ලක්මාලි මන්ත්‍රීතුමියත් ඒ ගැන කිව්වා. ප්‍රසම්පාදන ක්‍රියාවලින් අපි ඉල්ලන standard එකට ගල් අඟුරු දුන්නේ නැත්නම් එය ඒ සමාගමේ වගකීමක්. ඒ කිසිම සමාගමක් වෙනුවෙන් අපි පෙනී හිටින්නෙත් නැහැ. ඒ වාගේම වැරදි දෙයක් කරලා තිබුණා නම්, අපි ඒ සමාගමට අදාළව කටයුතු කරනවා. මම කියාගෙන ආපු

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අර්කම් ඉල්යාස් මහතා ]

කරුණ මේකයි. මේක දිගින් දිගටම සිද්ධ වෙලා තිබෙනවා. මොකද, සමහර රටවල්වලින් ගල් අඟුරු එනකොට ඒ රටවල තිබෙන සමහර දේශගුණ විපර්යාස හෝ වෙනත් හේතු නිසා ගල් අඟුරුවල විවිධ standards වෙනස් වෙන්න පුළුවන්. 2011 ඉඳලා 2021 වෙනකම් විශාල ප්‍රමාණවලින් ගල් අඟුරුවලට විවිධ වශයෙන් දඩ මුදල් අය කරගෙන තිබෙනවා. මම කලින් කිව්වා වාගේ 2014 - 2016, ආසන්න වශයෙන් ගත්තොත්, 2020 - 2021 කාලයේ ඩොලර් මිලියන 5.6ක අගයක් දඩ වශයෙන් අය කරගෙන තිබෙනවා. 2021 - 2022 අවුරුද්දේ ඩොලර් මිලියන 8ක් දඩ වශයෙන් අරගෙන තිබෙනවා.

මේ ඔක්කෝම කලින් ඉඳලාම සිද්ධ වෙච්ච ක්‍රියාවලියක්. අප්‍රේල් වෙනකොට blackout එකක් එනවා, සැප්තැම්බර් වෙනකොට blackout එකක් එනවා කියමින් අපේ රටේ ජනතාව බය කරන්න මේ ගොල්ලෝ ගෙනෙන බොරු මගඩියක් කියන එක තමයි විශේෂයෙන් මේ වාගේ සිද්ධිවලදී අපට කියන්න තිබෙන්නේ. ඒ වාගේම 2025 - 2026 අපේ ප්‍රසම්පාදනය පිළිබඳව මම කථා කරන්න කැමැතියි. අපේ ආණ්ඩුව කවදාවත් වැරදි දෙයක් කරන්නේ නැහැ. විශේෂයෙන් මේ ප්‍රසම්පාදනයේදී කිසිම වෙනසක් කරලාත් නැහැ. සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූල විධියට, 2023 ප්‍රසම්පාදනයේ තිබුණු සියලු පිරිවිතරයන්ට අනුකූලව තමයි මේක කළේ. කිසිම දෙයක් වෙනස් කළේ නැහැ. මේ ගොල්ලන් කියන එකම වෙනස්කම තමයි ජාත්‍යන්තර ටෙන්ඩර් එක දවස් 42ක් විවෘත කරලා තිබෙන්න ඕනෑ, දවස් 21කින් ඒක close කළා කියන එක. දවස් 21කින් close කළේ, ජාතික ප්‍රසම්පාදන කමිටුවේ සම්පූර්ණ අනුමැතිය සහිතව. ඒ වෙලාවේත් අපේ register වෙච්ච suppliersලා 26දෙනාගෙන් කිහිපදෙනෙකු ඉල්ලීමක් කරලා තිබුණා, කාලය වැඩි කරන්න කියලා. ඒ වෙනුවෙනුත් දවස් 7ක කාලයක් ලබා දුන්නා. ඉතිහාසයේ වැඩිම පිරිසක් - 11දෙනෙකු - මේ ටෙන්ඩර් එකට සහභාගි වුණා. ඒ වාගේම අනෙක් අය කරනවා වාගේ අපි අභියාචනා කරන කාලය අඩු කළේත් නැහැ. දවස් 14ම තැබුවා. ඒ දවස් 14 ඇතුළතදී කිසිම අභියාචනයක් අපට ආවේත් නැහැ. මම හිතනවා, මොනවා හරි වැරැද්දක් වෙලා තිබුණා නම් අභියාචනාවක් හරි, නඩුවක් හරි එන්න තිබුණා කියලා. නමුත් එහෙම කිසිම දෙයක් ආවේ නැහැ. මොකද, සියයට 100ක් නිවැරදිව තමයි අපි ඒක කළේ.

ඒ වාගේම තව මන්ත්‍රීතුමෙක් කිව්වා, ඒගොල්ලන්ගේ කාලයේ රුපියල් කෝටි 1,000ක් අඩුවෙන් ටෙන්ඩර් එක කළා කියලා. විශේෂයෙන්ම ඒකත් මතක් කරන්න ඕනෑ. ඒගොල්ලන් 2024 - 2025 අවුරුද්දට අදාළව ටෙන්ඩර් එක හරියට කරලා තිබුණා. ටෙන්ඩර් එක හරියට කරලා සමාගමක් දිනලා තිබුණා. ඒ සමාගම දිනුවාට පසුව එක්කෙනෙක් ඇවිල්ලා මට මේ ගාණට දෙන්න පුළුවන් කියලා කියනවා. ඒ සමාගමට prequalifications කිසිම දෙයක් නැහැ; අවුරුදු තුනක් බිස්නස් එකේ හිටියේත් නැහැ. ටෙන්ඩර් එකට සහභාගි වෙන්නවත් බැරි කණ්ඩායමක් ඇවිල්ලා මෙන්න මේ ගාණට - දීලා තිබෙන ගාණට වඩා අඩු ගාණකට - අපට දෙන්න පුළුවන් කියලා තමන්ගේ ටෙන්ඩර් එක ලබා දෙනවා. ටෙන්ඩර් කමිටුවෙන් ඒක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා, මේක නීති විරෝධියි කියලා. ඉන් පසුව කැබිනට් මණ්ඩලයට ඒක ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලයෙන් ඒකට අනුමැතිය ලබා දීලා ඒ ගණනට ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් වැරදිම පූර්වාදර්ශයක් ලබා දෙනවා. එනම්, විදේශවල ඉන්න ආයෝජකයින්ට - suppliersලාට - අපේ රට ගැන තිබෙන විශ්වාසය නැති වීම. එම ටෙන්ඩර් එකෙන් දිනලා තිබුණු සමාගම ලංකාවේ විතරක් නොවෙයි, ඉන්දියාවේ විතරක් නොවෙයි, ලෝකයේම තිබෙන සමාගම් අතරින් මුල් දහයේ ඉන්න සමාගමක්. ඔවුන් ආයෙත් අපේ රටේ ටෙන්ඩරයකට ඉදිරිපත් වන්න හිතන්නේවත් නැහැ. අපි ටෙන්ඩර් එකට සහභාගි වෙලා වැඩක් නැහැ, අපි කොච්චර දින්නත් වැඩක් නැහැ, මේ ආණ්ඩුව කරන්නේ ඔවුන්ගේ හෙංචයියන්ට ටෙන්ඩර් එක දෙන එකයි කියලා ඔවුන් හිතනවා. ලංකාවේ ආණ්ඩුව එහෙම නමක් තමයි ජාත්‍යන්තරයට දීලා තිබුණේ. ඉතින්, අපි ඒවා සම්පූර්ණයෙන්ම වෙනස් කරලා, සියයට 100ක් නිවැරදිව ටෙන්ඩර් එක දිනපු සමාගමට අපේ ටෙන්ඩර් එක ලබා දුන්නා. මම හිතනවා, අපි ඒක හරි විධියටම කළා කියලා.

ඊළඟට තිබුණු තවත් චෝදනාවක් තමයි, ගල්අඟුරු බලාගාරයේ results අනුව ලොකු පාඩුවක් ඇති වෙලා තිබෙනවා කියන එක. වගු ටිකක් හදලා අපට පෙන්වනවා, මෙන්න, මෙච්චර රුපියල් මිලියන ගාණක පාඩුවක් අපට සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ සම්බන්ධයෙන් පළමුවෙන්ම කියන්න ඕනෑ දේ තමයි, පසුගිය අවුරුද්දේ ගල්අඟුරු මෙට්‍රික් ටොන් එකක් අරගෙන තිබුණු ගාණ ආසන්න වශයෙන් ඩොලර් 120යි. අපි මේ අවුරුද්දේ මෙට්‍රික් ටොන් එක ඩොලර් 98කට අරගෙන තිබෙනවා. අපි එතැනින්ම රුපියල් බිලියන 10.5ක්, ආසන්න වශයෙන් රුපියල් කෝටි 1,050ක ලාභයක් රටට අරගෙන දීලා තිබෙනවා.

ලක්විජය විදුලි බලාගාරය සම්බන්ධයෙන් මේගොල්ලන්ගේ ගණන් හැදීම ගත්තොත්, මම කියන්න ඕනෑ, ඇත්තටම standard එක තිබෙන්නේ Load Port එකේ calorific value එක අනුවයි කියන එක. Discharge Port එකේ value එක තමයි ඊට පසුව බලන්නේ. ඒ දෙකම ගළපා Discharge Port එකේ අගයන්ට තමයි අපි දඩ ගහනවාද, එහෙම නැත්නම් ඒක පිළිගන්නවාද, නැත්නම් ඒක reject කරනවාද කියන එක තීරණය කරන්නේ. ලක්විජය විදුලි බලාගාරයේ එක මීටරයක් තිබෙනවා. ඒකට කියන්නේ "bomb calorimeter" එක කියලා. සමහර වෙලාවට ඒගොල්ලන් ඒ මීටර් එකෙන් බලලා ගණන් හදලා අපට කියනවා, මෙන්න මෙච්චර පාඩුවක් තිබෙනවා කියලා. ඉතින්, මම ඒක එක්කත් සසඳා බැලුවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මට වැඩිපුර කාලයක් අවශ්‍ය වනවා, කථාව ඉවර කරගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. එම නිසා කෙටියෙන් කථාව අවසන් කළොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මට විනාඩි දෙක, තුනක් තිබුණා නම් ඇති.

විශේෂයෙන්ම මම bomb calorimeter එක ගෙන්වා ගත්තා, මේ අවුරුද්දට අදාළව විතරක් හරි බලමු කියලා. කලින් සමාගමෙනුත් shipments 11ක් ඇවිල්ලා තිබුණා. අලුත් සමාගමෙන් දැනට shipments 9ක් ඇවිල්ලා තිබුණා; 9 වැනි එක බාමින් ඉන්නවා. කලින් සමාගමේ shipments 11 results ටික මම අරගෙන බැලුවා. ඒකේත් කිලෝ කැලරි 5,900ට අඩු shipments 4ක් තිබෙනවා. එහෙම බැලුවොත් කලින් shipment එකෙනුත් ලොකු ගාණක දඩයක්; ආසන්න වශයෙන් කෝටි 100ක විතර දඩයක් එන්න ඕනෑ. නමුත් එහෙම දෙයක් වෙන්නේ නැහැ. ඇත්තම කථාව, plant එකේ performance එකයි, discharge port එකේ value එකයි තමයි අපි බලන්න ඕනෑ. ඉතින්, discharge

port එකෙන් අපට කියනවා නම් මේක pass වෙලා තිබෙනවා, මෙහි අදාළ limit එකේ පිරිවිතර අතර තිබෙනවා කියලා, ඒක තමයි අපට පිළිගන්න පුළුවන්. එහෙත් ඇත්තටම ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඒක අනිවාර්යයෙන්ම පිළිගන්න වෙනවා. ඒ ප්‍රශ්නය මොකක්ද?

Plant එකේ performance ඇත්තටම අඩු වෙලා තිබෙනවා. අපිත් plant එකේ නිලධාරින් එක්ක කථා කළා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. එතකොට අපට ඇති වන එකම සැකය මොකක්ද? Discharge port එකේ හරි, load port එකේ හරි, ඒ දෙකේම හරි reports manipulate කරලා තිබෙනවා ද කියන එක බලන්න ඕනෑ. Discharge port එකේ results බලන කොම්පැනිය විධියට 2023දී tender එක දිනපු කණ්ඩායමක් ඉන්නේ. ඉතින්, මේ පිළිබඳවත් හරියටම හොයා බලන්න ඕනෑ නිසා අපි අමාත්‍යාංශය හරහා විශේෂඥ කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ කමිටුව හරහා අපි පරීක්ෂණ කරනවා. කොහේ හරි වැරැද්දක් වෙලා තිබෙනවාද, report එකක් manipulate කරලා තිබෙනවාද, එහෙම නැත්නම් අපේ ගල්අඟුරු බලාගාරයේ මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා හරියටම හොයන්න අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම විශේෂඥයින් විධියට විශ්වවිද්‍යාල ආචාර්යවරුන් කිහිපදෙනෙකුත් මේ කමිටුවට පත් කරලා තිබෙනවා. ඒ බලාගාරයේ මොකක් හරි වැරැද්දක් වෙලා තිබෙනවා කියලා අපි පත් කරපු කමිටුව හරහා දැනගන්න ලැබුණොත්, අනිවාර්යයෙන්ම අපි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වනවා, දඩ මුදල් අය කරනවා. වැඩිම වුණොත්, මොකක් හරි ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණොත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර හෝ ඒ වැරදි කරපු අයට අනිවාර්යයෙන්ම අපි දඬුවම් ලබා දෙනවා. විශේෂයෙන්ම 2016දී ගන්න තිබුණු සල්ලි අපට තවම ගන්න බැරි වෙලා ඉන්නවා වාගේ නොවෙයි, අපි අනිවාර්යයෙන්ම අපේ කාලයේදී ඒ දඬුවම් ටික ලබා දෙනවා, කවුරුන් හෝ වැරැද්දක් කරලා තිබුණා නම්. ඒක අනිවාර්යයෙන්ම අපේ රජයක් යටතේ බලාපොරොත්තු වන්න. මොකද, අපි මහජනයාට වගකියන රජයක් විධියට ඒ කටයුතු අනිවාර්යයෙන්ම සිද්ධ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් දෙයක් කියන්න ඕනෑ. චෝදනාවක් කළා, මේ ප්‍රශ්නය නිසා විදුලි බිල වැඩි වෙයිද කියලා. ඇත්තම කථාව CEB එක PUCSL එකෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, විදුලි බිල 13.56කින් වැඩි කරන්න අවසර දෙන්න කියලා. ඒ report එක මගේ ළඟ තිබෙනවා. ගල්අඟුරුවල ප්‍රශ්නයක් නිසා නොවෙයි විදුලි බිල වැඩි කරන්න ඉල්ලන්නේ. CEB එකෙන් හැම කාර්තුවකටම අදාළව prediction එකක් කරනවා. ඒ prediction එකට තමයි ඒගොල්ලන් විදුලි බිල වැඩි කරන්න ඉල්ලන්නේ. මේක අතීතයේ ගත්තත් එහෙමයි.

අපේ ආණ්ඩුව ආවාට පස්සේ මුලින්ම CEB එකෙන් කිව්වා, ශත පහක් වැඩි කරන්න එපා, ඒ ගණනම තියන්න කියලා. PUCSL එකෙන් කිව්වා, සියයට 20ක් අඩු කරන්න ඕනෑ කියලා. ඒ අනුව අපි සියයට 20ක් අඩු කළා. ඊට පස්සේ CEB එකෙන් සියයට 18ක් වැඩි කරන්න අවසර ඉල්ලුවා. එහෙත් PUCSL එකෙන් කිව්වේ සියයට 15යි වැඩි කරන්න ඕනෑ කියලා. අපි ඒ සියයට 15 තමයි වැඩි කළේ. අන්තිම කාර්තුවේදී සියයට 11.9ක් වැඩි කරන්න ඕනෑ කියලා CEB එකෙන් කිව්වා. PUCSL එකෙන් කිව්වා, සියයට 6ක් අඩු කරන්න කියලා. අපි ඒ ගණනටම - බිංදුවටම - තියාගත්තා. මේ වතාවේත් එවැනි දෙයක් ඉල්ලා තිබෙනවා. මාර්තු අන්තිම වනකොට PUCSL එකේ report එක ඒවි. අපි බලාපොරොත්තු වනවා, එහෙම ලොකු වෙනසක් වෙන්නේ නැති වෙයි කියලා. අපි හිතනවා, මහජනතාවට එහෙම අනියත බියක් ඇති කර ගන්න ඕනෑ නැහැ කියලා. මොකද, විදුලි බිල වැඩි කරන්න අපට කිසිම වුවමනාවක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙම අවසන් කරුණ ගැන කියලා මගේ කථාව නතර කරන්නම්.

අපි ආණ්ඩුව ගන්නකොට කිව්වේ තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවා කියලා. විදුලි බිල අඩු කරනවා නම් ඒකට ක්‍රමවේදයක් තිබෙනවා. විශේෂයෙන්ම අපි cost-reflective method එකට තමයි විදුලිබල මණ්ඩලය අරගෙන යන්නේ. බොරුවට භාණ්ඩාගාරයට සල්ලි දාලා විදුලිබල මණ්ඩලය අරගෙන ගියොත් චක්‍රාකාරයෙන් රටේ මහජනතාවට තමයි මේ ණය බර එන්නේ. අනිවාර්යයෙන්ම cost-reflective ක්‍රමය අනුව අපි කටයුතු කරන්න ඕනෑ. ඒ cost-reflective method එක අනුව කටයුතු කරන්න නම් අපට විදුලි බිල අඩු කරන්න ක්‍රමයක් තිබෙන්න ඕනෑ. අද වෙනකන් අපි සපයන්නේ පරණ ආණ්ඩුවලින් වැඩි මුදලට ගන්න හදපු විදුලිය. අපි බලාපොරොත්තු වනවා, අපේ ජනන වියදම අඩු කරන්න. විශේෂයෙන්ම අපේ බිස්නස් එක ඩොලර් බිලියන 500ක් කියන්නේ, ඒකෙන් ඩොලර් බිලියන 400ක්ම යන්නේ ජනනයට. ඒ කියන්නේ සියයට 80ක්. ඒ සියයට 80 අඩු කර ගන්න එක තමයි අපේ plan එක. රුපියල් 24ට විවිධ සමාගම්වලට ගන්න තිබුණු සමහර සමහර දේවල් අපට රුපියල් 12ටත් වඩා අඩුවෙන් - විශේෂයෙන්ම සුළං විදුලි බලාගාර - දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ලංකාවේ හිතලාවත් නැතිව තිබුණු Battery Energy Storage System ටෙන්ඩර් එක රුපියල් 17කට වාගේ දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම තවත් විශේෂයෙන් කියන්න තිබෙන දෙයක් තමයි, රුපියල් 37කට වාගේ මුදලකට දෙන්න තිබුණු සූර්ය බලයෙන් නිපදවන විදුලිය ඒකකයක් රුපියල් 27ට අපි දෙන්නේ. අවුරුදු 20කට agreement sign කරලා තිබෙන්නේ. අදත් සියයට 60ක්, සියයට 70ක් පමණ රුපියල් 37ට, රුපියල් 27ට අපි විදුලිය ඒකකයක් දෙන්නේ ඔබතුමන්ලා හිටපු කාලයේ දීපු ටෙන්ඩර්, ඒ වාගේම අගයන්. අපි ඒක රුපියල් 17කට වාගේ අඩු කරලා තිබෙනවා. අපි පටන් ගත්ත projects ටික අපේ පොළොවේ පැළ කර ගත්තාට පස්සේ අවුරුදු දෙකක්, තුනක් පමණ වනකොට මෙන්න මේ ජනන වියදම අපට සියයට 30ට - තුනෙන් එකකට - අඩු කර ගන්න පුළුවන් වනවා. අපි ඒකට ජනතාවට වගකියනවා. බලශක්ති අමාත්‍යාංශය වශයෙන්, රජය වශයෙන් අපි ඒ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. කවදාවත් රටේ මහජනතාව මේ සම්බන්ධව කිසිම අනියත බියක් ඇති කර ගන්න ඕනෑ නැහැ. අපි මේකෙන් රට විශාල වශයෙන් වෙනස් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.50ට, 2026 මාර්තු 03වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.50க்கு, பாராளுமன்றம் 2026 மார்ச் 03, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.50 p.m. until 9.30 a.m. on Tuesday, 03rd March, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.